

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්
පියෙකු මෙන් මවක මෙන්

අරමුණක බැඳුණු
සාමූහික ශක්ති ප්‍රාකාරය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්

වාර්ෂික වාර්තාව 2025


ලියාපදිංචි අංකය PB289

4TH FULL PROOF

අරමුණක බැඳුණු සාමූහික ශක්ති ප්‍රාකාරය.

පරම්පරා ගණනාවක් මුළුල්ලේ ජාතිය සමඟ එක්ව පෙරට ආ අප, නොසැලෙන අරමුණක්, විශ්වසනීය ක්‍රියාපිළිවෙතක් සහ ප්‍රගතිය උදෙසා වූ අචල කැපවීමක් පෙරදැරි කරගෙන කටයුතු කර ඇත. සුරක්ෂිතභාවයේ ප්‍රතිඥාවක් ලෙසින් ඇරඹී අපගේ මෙහෙවර, විවිධත්වය සහ එකමුතුකම තුළින් ඔපමට්ටම් වූ පුළුල් දායකත්වයක් දක්වා පරිණාමය වී ඇති අතර, වර්තමානයේ අපගේ ශක්තිය ශ්‍රී ලංකාවේ සංවර්ධනයට තීරණාත්මක වන විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පෙළගස්වා ඇති බහුවිධ හැකියාවන්ගේ සුසංයෝගයයි.

පවුල් සුරක්ෂිත කිරීමේ සහ ව්‍යවසායකත්වයට සවියක් වීමේ සිට ආර්ථික ස්ථාවරත්වය හා ප්‍රජා යහපැවැත්ම උදෙසා දායක වීම දක්වා වූ අපගේ මෙහෙවර, අන්තර්-සම්බන්ධිත වූත් අරමුණු සහගත වූත් එකකි. උදාර උරුමයක පදනම මත පිහිටා, අවංකභාවයෙන් යුතුව පෙරට යන අප, එක් සමූහයක් ලෙස එක් පොදු අභිලාෂයකින් බැඳී සිටිමු. එනම්, නව අවස්ථා උදා කිරීම, ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සහ පොදු සමෘද්ධිය ළඟා කර දීමයි.

මේ ඔස්සේ අපගේ සියලු පාර්ශවකරුවන් උදෙසා තිරසාර වටිනාකමක් නිර්මාණය කිරීමට අපි නිරන්තරයෙන් කැපවී සිටිමු. අප සතු විවිධ වූ හැකියාවන් ඒකරාශී කරමින් ගනුදෙනුකරුවන්, ප්‍රජාවන් සහ සමස්ත ජාතිය වෙතම බෙදීයන පරිදි ප්‍රතිලාභ ලබා දීම අපගේ අපේක්ෂාවයි.

මන්ද යත්, සැබෑ ශක්තිය යනු ඒකීය වූවක් නොව ශ්‍රී ලංකාවේ අනාගතය සවිබල ගන්වන විවිධත්වයෙන් සහ එකමුතුකමෙන් පෝෂණය වූ අරමුණු සහගත බලවේගයක් වන බැවිනි.

පටුන

3
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වන අප ගැන

4 බලතල ව්‍යුහය
6 සමූහය පිළිබඳ හැඳින්වීම
8 වැදගත් සිදුවීම් - මූල්‍ය හා මෙහෙයුම්

11
නායකත්ව සමාලෝචනයන්

12 සභාපතිතුමාගේ පණිවිඩය
16 ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සමාලෝචනය
18 අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු

23
මෙහෙයුම් පරිසරය

24 මෙහෙයුම් පසුබිම සහ ඉදිරි දැක්ම

27
කාර්යසාධනය/ව්‍යාපාරික සමාලෝචනය

28 ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්
29 ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්
30 ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ්
32 ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
33 කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවට්) ලිමිටඩ්
35 ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පීඑල්සී

37
යහපාලනය සහ අධීක්ෂණය

38 ආයතනික පාලන වාර්තාව
41 විගණන කමිටු වාර්තාව
42 ආයෝජන කමිටු වාර්තාව 2025
44 අනුකූලතා වාර්තාව

45
මූල්‍ය ප්‍රකාශන

46 අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව
50 අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය
51 ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයාගේ වගකීම් ප්‍රකාශය
52 ස්වාධීන විගණන වාර්තාව
56 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
58 ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
60 ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය
64 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
66 අංශය අනුව සමාලෝචනය: මූල්‍ය තත්ත්වය
68 අංශය අනුව සමාලෝචනය: ආදායම් ප්‍රකාශය
70 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

183
පොදු තොරතුරු

184 ආයතනික තොරතුරු
185 වාර්ෂික මහා සභා රැස්වීමේ නිවේදනය

ඇමුණුම
- පෙරකලාසි පත්‍රය

මෙම වාර්ෂික වාර්තාව අන්තර්ජාලයෙන් කියවීමට
මෙතැනින් ස්කෑන් කරන්න
https://www.srilankainsurance.com/en/ about-us/
annual-reports



ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වන අප ගැන බිඳක්

බලතල ව්‍යුහය

විචක්ෂණශීලී මූල්‍ය ආයෝජන කළමනාකරණය හා උපායමාර්ගික වත්කම් භාරකාරත්වය කෙරෙහි අචල විශ්වාසය තැබූ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, අදටත් මෙරට ප්‍රමුඛතම සහ විශ්වාසනීය රාජ්‍ය ආයතනයක් ලෙස විරාජමාන වෙයි. කාර්යක්ෂම කළඹ කළමනාකරණය, තිරසාර කුලී ආදායම් උත්පාදනය, ප්‍රශස්ත පාලන පිළිවෙත් සහ අඛණ්ඩ මෙහෙයුම් විශිෂ්ටත්වය තුළින් දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වයක් අත්කර ගන්නා සංස්ථාව, එමඟින් ජාතික ආර්ථික සංවර්ධනයට සවිමත් සවියක් වෙමින් සියලු පාර්ශවකරුවන් වෙත තිරසාර වටිනාකමක් උදා කර දීමට නිරන්තරයෙන් කැපවී සිටියි.

රක්ෂණ කර්මාන්තය ජනසතු කළ 1961 වසරේදී, විශේෂිත නීතිමය විධිවිධාන යටතේ රටේ ජාතික රක්ෂණකරු ලෙස ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් (SLIC) ස්ථාපිත කරන ලදී. ඉන් අනතුරුව එළැඹී දශක දෙකක කාලය පුරා, ව්‍යවස්ථාපිත බලතල යටතේ ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන් මෙහෙයවමින් සහ දිවයින පුරා විසිරී සිටින සමස්ත ජනතාවගේ රක්ෂණ අවශ්‍යතා සපුරාලමින් ප්‍රමුඛතම රාජ්‍ය රක්ෂණකරු ලෙස ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් පෙරමුණ ගත්තේය.

1980 වසරේදී පෞද්ගලික රක්ෂණ සමාගම් වෙළඳපොළට පිවිසීමත් සමඟ, ඔවුන්ගේ ආක්‍රමණශීලී වෙළඳපොළ තරඟකාරිත්වයට සාර්ථකව මුහුණ දීම සඳහා වැඩි ස්වාධීනත්වයක් සහිතව 1993 වසරේදී ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් රජය සතු සීමිත වගකීම් සහිත සමාගමක් බවට පරිවර්තනය විය. වසර ගණනාවක් පුරා සැලකිය යුතු වත්කම් පදනමක් කළමනාකරණය කරමින් සහ ප්‍රබල මූල්‍ය කාර්ය සාධනයක් පෙන්නුම් කරමින් මෙරට විශාලතම සංයුක්ත රක්ෂණකරු ලෙස ස්ථාපිත වීමට සංස්ථාව සමත් විය. පෞද්ගලික රක්ෂණකරුවන් සමඟ පවතින තරඟකාරී වෙළඳපොළ තුළ ස්ථාවරව රැඳී සිටිමින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් සිය රක්ෂණ නිෂ්පාදන පෙළ සහ බෙදාහැරීමේ ජාලයන් නවීකරණය කළ අතර මානව සම්පත් සංවර්ධනය උදෙසාද ආයෝජනය කළේය.

රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ සංශෝධිත නීතිරීතිවලට අනුකූලව, 2024 පෙබරවාරි මාසයේදී ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර එකිනෙකින් වෙන් කිරීමේ ව්‍යුහාත්මක වෙනසක් සිදු වූ අතර එය සංස්ථාවේ ගමන් මගෙහි තීරණාත්මක හැරවුම් ලක්ෂයක් විය. එම ව්‍යාපාර ද්විත්වය ජීවිත හා ජීවිත නොවන (සාමාන්‍ය) රක්ෂණ ක්ෂේත්‍රයන් කෙරෙහි වෙන වෙනම අවධානය යොමු කරන අතර, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් දැනට මව් සමාගමක් ලෙස ක්‍රියාත්මක වේ. ඒ යටතේ කුලී ආදායම් උපයා ගැනීම හරහා සිය මූල්‍ය ආයෝජන කළඹ සහ වත්කම් කළමනාකරණය කිරීම සිදු කෙරේ.

වර්තමානය වන විට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් යනු ශක්තිමත් ආයතනික උරුමයක් සතු, උපායමාර්ගික ආයෝජන කළමනාකරණය සහ වත්කම් භාරකාරත්වය කෙරෙහි අවධානය යොමු කළ රජය සතු ආයතනයකි.


මෙම සුවිශේෂී මෙහෙවර ඉටු කරනු වස්, නවෝත්පාදනයන්හි පෙරමුණ ගනිමින් සහ අවදානම් අවම කිරීම කෙරෙහි සවිස්තරාත්මක අවධානයක් යොමු කරමින් විචක්ෂණශීලී ප්‍රාග්ධන කළමනාකරණයක නිරත වීමට සංස්ථාව කටයුතු කළේය. අපගේ ආයෝජන කළඹ ජාතික සංවර්ධන ප්‍රමුඛතාවයන් හා අනුකූල වන පරිදි පෙළගස්වා ඇති අතර, ආපදා අවදානම් මූල්‍යකරණය සම්බන්ධයෙන් රජයේ ආයතන සමඟ ද අපි සහයෝගිතාවයෙන් කටයුතු කළෙමු.

දැක්ම

ශ්‍රී ලංකාව සවිබල ගැන්වීමට කැපවෙන ආයතන සමූහයක් ලෙස පෙරමුණ ගනිමින්, ජාතික අභිවෘද්ධියේ උන්නතිය උදෙසා නායකත්වය සැපයීම.

මෙහෙවර

මෙරට වැදගත් ක්ෂේත්‍ර නියෝජනය කරන ප්‍රමුඛ ආයතන සමූහයක් ක්‍රමානුකූලව මෙහෙයවීම සහ වර්ධනය කිරීම මගින් දේශයට තිරසාර වටිනාකමක් එක් කරමින් සමස්ත ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම.



සමූහය ගැන

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්
පියෙකු මෙන් මවක මෙන්

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි ව්‍යුහාත්මක වෙන්වීමෙන් අනතුරුව, ජීවිත රක්ෂණ ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාම සඳහා පිහිටුවන ලදී.

100%

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි ව්‍යුහාත්මක වෙන්වීමෙන් අනතුරුව, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාම සඳහා පිහිටුවන ලදී.

100%

ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පීඑල්සී

මහජනතාවට සෞඛ්‍ය සේවා සහ රසායනාගාර සේවා සැපයීමේ නිරත, කොටස් වෙළඳපොළේ ලියාපදිංචි පොදු සමාගමකි.

51.34%

ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ්

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම දුව පෙට්‍රෝලියම් (LP) ගෑස් ආනයනකරු සහ බෙදාහරින්නා වේ.

99.94%

ලංකා හොස්පිටල්ස් ඩයග්නෝස්ටික්ස් ආයතනය

100%

සිලෝන් ඇසෙට් මැනේජ්මන්ට් කම්පැණි ලිමිටඩ්

යුනිට් ට්‍රස්ට් (Unit Trusts) සහ ආයෝජන කළඹ කළමනාකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ බලපත්‍රලාභී සහ නියාමනයට යටත් ආයතනයකි. මෙම සමාගම අරමුදල් අටක් කළමනාකරණය කරන අතර, ඉන් හතක් ශ්‍රී ලංකා රුපියල්වලින් ක්‍රියාත්මක වේ (හැටන් නැෂනල් බැංකුව මෙහි භාරකරු සහ භාරකාර බැංකුව ලෙස කටයුතු කරයි). මීට අමතරව, ශ්‍රී ලංකාවේ පවතින එකම ඩොලර් බැඳුම්කර අරමුදල (Dollar Bond Fund) ද මොවුන් විසින් කළමනාකරණය කරනු ලබයි (ඩොයිෂ් බැංකුව මෙහි භාරකරු සහ භාරකාර බැංකුව ලෙස කටයුතු කරයි).

18.6%

අනුබද්ධ සමාගම්

ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

නිවෙස්, වාණිජ සහ තොග පාරිභෝගිකයන් සඳහා අවශ්‍ය එල්.පී. ගෑස් (LP Gas) ගබඩා කිරීමේ කටයුතුවල නිරත වන ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් පූර්ණ අනුබද්ධිත සමාගමකි.

100%

කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවට්) සමාගම

දක්ෂිණ අධිවේගී මාර්ගයේ විවේක ස්ථාන (rest-stop facilities) හිමිකාරිත්වය දරන සහ ඒවා කළමනාකරණය කරන, එමෙන්ම මගීන් සඳහා විවිධ සේවාවන් සපයන, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් (SLIC) පූර්ණ අනුබද්ධිත ආයතනයකි.

100%

මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (ප්‍රයිවට්) ලිමිටඩ්

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් (SLIC) සඳහා වැටුප් කළමනාකරණ සේවා සැපයීම වෙනුවෙන්ම පිහිටුවා ඇති පූර්ණ අනුබද්ධිත ආයතනයකි. මෙය බාහිර වෙළඳපොළට හෝ බාහිර පාර්ශ්වයන් සඳහා කිසිදු භාණ්ඩයක් හෝ සේවාවක් සැපයීමට සම්බන්ධ නොවේ.

100%

සහකාර සමාගම්

සීබැන්ක් ඇසට් මැනේජ්මන්ට් ලිමිටඩ්

සීබැන්ක් ඇසට් මැනේජ්මන්ට් ලිමිටඩ් යනු ඒකක භාර (Unit Trusts) සහ ආයෝජන කළඹ කළමනාකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ බලපත්‍රලාභී සහ නියාමනයට යටත් ආයතනයකි. මෙම සමාගම ක්ෂේත්‍රයේ දැවැන්තයින් සිව්දෙනෙකු වන ලංකා බැංකුව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, කාසන්ස් කුමර්බැච් පීඑල්සී (Carson Cumberbatch PLC) සහ ඉන්දීය ඒකක භාරය (Unit Trust of India) සතු වේ.


26.5%

වැදගත් සිදුවීම් - මූල්‍ය හා මෙහෙයුම්


ඉපැයීම් විස්තරය	2025 රු. '000	2024 රු. '000	2023 රු. '000
ශුද්ධ ලිඛිත වාරිකය	**51,143,864**	42,974,723	35,958,206
අනෙකුත් මෙහෙයුම් ආදායම්	**111,186,880**	104,399,831	103,215,334
සමූහ ආදායම	**162,330,744**	147,374,554	139,173,540
ප්‍රතිලාභ සහ අලාභ	**(62,718,040)**	(53,729,316)	(43,569,457)
අනුබද්ධ සමාගම්වල සේවා පිරිවැය	**(92,664,300)**	(90,428,617)	(86,806,657)
ආයෝජන ආදායම	**37,975,682**	36,365,220	29,490,139
අනෙකුත් ආදායම්	**2,106,118**	(1,653,617)	2,121,153
අනෙකුත් මෙහෙයුම්, ආයෝජන සහ පරිපාලන වියදම්	**(25,329,800)**	(23,875,946)	(20,450,203)
බදු පෙර ලාභය	**21,700,404**	14,052,278	19,958,515
ආදායම් බදු වියදම	**(6,353,249)**	(4,964,899)	(6,203,340)
බදු පසු ශුද්ධ ලාභය	**15,347,155**	9,087,379	13,755,175
මූල්‍ය ප්‍රකාශයේ වැදගත් කරුණු			
වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	**50,445,263**	41,916,840	74,808,439
ආයෝජන	**359,322,063**	316,595,720	258,283,669
අනෙකුත් වත්කම්	**107,647,805**	76,488,233	56,278,463
මුළු වත්කම්	**517,415,131**	435,000,793	389,370,571
හිමිකම් සහ වගකීම්			
කොටස් ප්‍රාග්ධනය	**6,000,000**	6,000,000	6,000,000
ප්‍රාග්ධන සංචිත	**30,614,654**	24,894,015	22,828,004
නියාමන සීමා සහිත සංචිත (එක්වරක් ලැබූ අතිරික්තයෙන්)	**98,237**	98,237	98,237
පොදු සංචිත	**643,442**	643,442	643,442
විකිණීම සඳහා පවතින සංචිත (AFS Reserve)	**35,550,167**	25,185,469	9,578,134
ආදායම් සංචිත	**103,382,583**	90,517,901	83,559,686
පාලනය නොවන අයිතිය	**8,008,817**	7,422,979	13,233,465
මුළු ප්‍රාග්ධනය සහ සංචිත	**184,297,900**	154,762,043	135,940,968
වගකීම්			
රක්ෂණ ප්‍රතිපාදන - දිගුකාලීන	**250,885,449**	216,783,321	183,784,492
රක්ෂණ ප්‍රතිපාදන - (ජීවිත නොවන)	**26,458,482**	20,441,265	20,496,192
අනෙකුත් වගකීම්	**55,773,300**	43,014,164	49,148,919
මුළු වගකීම්	**333,117,231**	280,238,750	253,429,603
මුළු හිමිකම් සහ වගකීම්	**517,415,131**	435,000,793	389,370,571

2022 රු. '000	2021 රු. '000	2020 රු. '000	2019 රු. '000	2018 රු. '000	2017 රු. '000	2016 රු. '000
36,806,050	38,229,653	34,051,435	29,609,286	27,854,937	25,795,933	23,878,961
90,620,724	62,143,038	46,505,729	50,685,169	46,057,427	36,520,202	30,590,103
127,426,774	100,372,691	80,557,164	80,294,455	73,912,364	62,316,135	54,469,064
(36,451,490)	(42,254,912)	(34,887,794)	(31,269,726)	(28,406,723)	(26,025,130)	(21,870,191)
(77,123,398)	(63,422,161)	(40,053,742)	(39,119,884)	(38,690,904)	(32,980,251)	(22,867,093)
15,370,280	24,044,877	17,754,928	16,954,587	14,372,021	13,612,126	11,357,205
13,808,004	3,589,952	1,620,627	1,530,125	3,818,890	2,649,758	1,938,060
(26,866,923)	(16,692,204)	(15,500,345)	(20,026,730)	(14,584,079)	(10,592,844)	(9,212,981)
16,163,247	5,638,243	9,490,838	8,362,826	10,421,569	8,979,794	13,814,064
(3,579,214)	942,720	(2,560,510)	(3,848,989)	(2,818,669)	(2,412,210)	(3,329,128)
12,584,033	6,580,963	6,930,328	4,513,837	7,602,900	6,567,584	10,484,936
75,426,802	65,391,507	56,752,233	52,346,702	52,381,971	49,598,222	44,033,232
218,373,796	200,945,951	173,678,452	164,880,936	152,975,185	147,069,847	132,453,391
46,743,506	59,536,732	59,286,110	47,550,610	38,431,876	35,114,339	37,311,013
340,544,104	325,874,190	289,716,795	264,778,248	243,789,032	231,782,408	213,797,636
6,000,000	6,000,000	6,000,000	6,000,000	6,000,000	6,000,000	6,000,000
22,972,908	18,414,228	13,112,599	13,058,735	11,109,100	10,442,923	11,623,290
98,237	98,237	98,237	98,237	98,237	98,237	–
643,442	643,442	643,442	643,442	643,442	643,442	643,442
(246,970)	6,008,859	5,704,652	9,472,363	12,267,184	16,227,399	21,055,304
72,929,545	65,073,169	58,671,046	53,068,008	49,970,064	44,600,992	39,514,579
12,897,579	9,125,663	8,985,168	8,767,718	8,226,474	8,077,450	7,961,626
115,294,741	105,363,598	93,215,144	91,108,503	88,314,501	86,090,443	86,798,241
159,769,323	155,788,928	137,129,036	119,167,865	108,005,959	101,671,180	90,010,165
21,689,853	20,879,547	18,866,402	16,648,028	17,806,430	17,128,395	16,517,151
43,790,187	43,842,117	40,506,213	37,853,852	29,662,142	26,892,390	20,472,079
225,249,363	220,510,592	196,501,651	173,669,745	155,474,531	145,691,965	126,999,395
340,544,104	325,874,190	289,716,795	264,778,248	243,789,032	231,782,408	213,797,636


සමූහයේ ආදායම (රු. බි.)




සමූහයේ දළ ලිඛිත වාරික (GWP) (රු. බි.)




සමූහයේ බදු පසු ලාභය (රු. බි.)




සමූහයේ මුළු වත්කම (රු. බි.)



සාමාන්‍ය රක්ෂණ දළ ලිඛිත වාරික (GWP) (රු. බි.)



ජීවිත රක්ෂණ දළ ලිඛිත වාරික (GWP) (රු. බි.)



සමූහයේ ආදායම

රු. බිලියන 162

සමූහයේ දළ ලිඛිත වාරික (GWP)

රු. බිලියන 63

සමූහයේ බදු පසු ලාභය

රු. බිලියන 15

සමූහයේ මුළු වත්කම

රු. බිලියන 517

සාමාන්‍ය රක්ෂණ දළ ලිඛිත වාරික (GWP)

රු. බිලියන 30

ජීවිත රක්ෂණ දළ ලිඛිත වාරික (GWP)

රු. බිලියන 33



නායකත්ව සමාලෝචනයන්

සභාපති තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි ස්ථාවර මූල්‍ය ශක්තිය, පාරිභෝගික කේන්ද්‍රීය සේවා විශිෂ්ටත්වය මෙන්ම තිරසාර සංවර්ධනය උදෙසා වූ අපගේ අඛණ්ඩ කැපවීම සනිටුහන් කරන මෙම වාර්ෂික වාර්තාව මෙලෙස ඔබ වෙත ගෙන එන්නේ ඉමහත් සතුටිනි.



උපායමාර්ගික ගමන්මග

2024 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මක වූ නීතිමය වෙන්කිරීමත් සමඟ, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් (SLIC) සමූහ මට්ටමේ මව් සමාගමක් (Holding Entity) ලෙස ප්‍රතිව්‍යුහගත කෙරිණි. ඒ අනුව, එහි ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ මෙහෙයුම් ස්වාධීනව පවත්වාගෙන යාම සඳහා පිළිවෙළින් "ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්" (SLICLL) සහ "ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්" (SLICGL) යන සමාගම් ස්ථාපිත කරන ලදී. මෙම මෙම ව්‍යුහාත්මක ප්‍රතිසංවිධානය තුළින්, රක්ෂණ ඔප්පුහිමියන්ගේ මෙන්ම කොටස් හිමියන්ගේ ද උපරිම අභිලාෂයන් සුරක්ෂිත වන පරිදි සමූහ මට්ටමින් ශක්තිමත් උපායමාර්ගික අධීක්ෂණයක්, අවදානම් කළමනාකරණයක් සහ යහපාලනයක් තහවුරු කිරීමට සංස්ථාවට හැකි වී ඇති අතර, සමාගම සතු පුළුල් දේපළ වත්කම්වලින් ලැබෙන කුලී ආදායම උපරිම කර ගනිමින් තම ආයෝජන කළඹ වඩාත් සක්‍රීයව කළමනාකරණය කිරීමට ද මේ හරහා මනා අවස්ථාවක් උදා වී තිබේ.

අපගේ සියලුම අනුබද්ධ ආයතන තුළ ආයෝජන වර්ධනය, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පාලන ව්‍යුහයන් ශක්තිමත් කිරීම කෙරෙහි සුවිශේෂී ප්‍රමුඛත්වයක් 2025 වසරේදී ලබා දුන් අතර, සමූහය පුරා මූල්‍ය විනිවිදභාවය ඉහළ නැංවීමට සහ පාර්ශවකරුවන් සමඟ පවතින සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමට දැඩි වෙහෙසක් දරන ලදී. මෙම උපායමාර්ගික ප්‍රමුඛතාවන් මත පදනම්ව ප්‍රාග්ධන යෙදවීම, පිරිවැය කළමනාකරණය සහ පැහැදිලි වාර්තාකරණ ව්‍යුහයන් මෙහෙයවනු ලැබීය. එමඟින්, අපගේ තිරසාර ව්‍යාපාරික අරමුණු සමඟ සමපාත වන අයුරින්, අනුබද්ධ ආයතනවල කාර්යසාධනය සහ කළමනාකරණ ක්‍රියාමාර්ග පිළිබඳව විනයගරුක අධීක්ෂණයක් පවත්වා ගැනීමට අපට හැකි විය.

ප්‍රාග්ධන ශක්තිය

සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව සුවිශේෂී මූල්‍ය කාර්ය සාධනයක් අත්කර ගැනීමට සමත්ව ඇති අතර, එහිදී බදු පෙර ලාභය රුපියල් බිලියන 6.8 ක් සහ කොටස් හිමියන් වෙත උපලබ්ධි වූ ලාභය රුපියල් බිලියන 6.5 ක් ලෙස වාර්තා විය. එසේම සංස්ථාවේ මුළු වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 133.3 ක් දක්වා ඉහළ ගොස් තිබේ. අභියෝගාත්මක සාර්ව ආර්ථික පසුබිමක් පැවතියද, අපගේ උපායමාර්ගික ප්‍රමුඛතාවන් විනයගරුකව ක්‍රියාත්මක කිරීම, ශක්තිමත් අවදානම් කළමනාකරණය සහ විචක්ෂණශීලී ප්‍රාග්ධන සම්පාදනය තුළින් අබණ්ඩව තිරසාර ප්‍රතිලාභ උපයා ගැනීමට හැකි වූ බව මෙම විශිෂ්ට ප්‍රතිඵල මඟින් මැනවින් විදහා දක්වයි.

රාජ්‍ය ව්‍යවසායයක් ලෙස, ජාතික ආදායම ශක්තිමත් කිරීම උදෙසා අප දක්වන අඛණ්ඩ දායකත්වය පිළිබඳව අප නිහතමානීව ආඩම්බර වන්නෙමු. ඒ අනුව වගකිවයුතු ආයතනික පුරවැසියකු ලෙස අපගේ භූමිකාව ප්‍රත්‍යක්ෂ කරමින්, 2025 වසරේදී රුපියල් බිලියන 1.5 ක මුදලක් රජයේ ඒකාබද්ධ අරමුදල වෙත බැර කිරීමට අපට හැකි විය. විචක්ෂණශීලී ආයෝජන කළමනාකරණය සහ ස්ථාවර කුලී ආදායම මත පදනම් වූ මෙම සාර්ථකත්වය, රක්ෂණ ඔප්පුහිමියන්ගේ මෙන්ම කොටස් හිමියන්ගේ ද උපරිම අභිලාෂයන් සුරක්ෂිත කරමින් වෙළඳපල අස්ථාවරත්වයන් හමුවේ සාර්ථකව ඉදිරියට යාමට සංස්ථාව සතු ඔරොත්තු දීමේ හැකියාව සහ අනුවර්තන ශක්තිය මනාව සනිටුහන් කරයි. ඉදිරියටත්, විනයගරුක ආයෝජන ප්‍රවේශයන්, ඩිජිටල් පරිවර්තනය සහ පාරිභෝගික සේවා විශිෂ්ටත්වය ඔස්සේ මෙම ප්‍රගතිශීලී ගමනාවාව අඛණ්ඩව පවත්වා ගැනීමටත්, එමඟින් අපගේ සියලුම පාර්ශවකරුවන් වෙනුවෙන් දිගුකාලීන වටිනාකම් නිර්මාණය කරමින් ජාතික සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමට නිරන්තරයෙන් දායක වීමටත් අප කැපවී සිටින්නෙමු.

සමස්තයක් ලෙස සමූහය ද 2025 වසරේදී සුවිශේෂී කාර්ය සාධනයක් ප්‍රදර්ශනය කළ අතර, එහිදී සමූහ ආදායම 11.2% කින් සහ දළ ලිඛිත රක්ෂණ වාරික (GWP) 22.5% කින් ඉහළ ගියේය. ඒ අනුව, සමූහයේ බදු පෙර ලාභය රුපියල් බිලියන 21.7 ක් සහ කොටස් හිමියන් වෙත උපලබ්ධි වූ ලාභය රුපියල් බිලියන 14.3 ක් ලෙස වාර්තා වූ අතර මුළු වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 517.4 ක් දක්වා වර්ධනය විය. අපගේ ආයෝජන කළඹෙහි පවතින ශක්තිමත්භාවය සහ විවිධාංගීකරණය මෙන්ම; රක්ෂණ, සෞඛ්‍ය සේවා, බලශක්ති, විවේක සහ ආධාරක සේවා යන ක්ෂේත්‍රයන් පුරා අඛණ්ඩ වටිනාකම් උත්පාදනය කිරීමට සමූහය සතු ඉහළ හැකියාව මෙමඟින් මැනවින් සනාථ වේ.

මව් සමාගම ලෙස, සමූහය පුරා ශක්තිමත් අධීක්ෂණයක් සහ යහපාලනයක් ක්‍රියාත්මක කරමින්, රටේ ආර්ථික ප්‍රගතිය පෝෂණය කිරීම සහ මහජන අවශ්‍යතා වෙනුවෙන් සේවය කිරීම උදෙසා වූ තම උපායමාර්ගික කාර්යභාරය ඉටු කිරීම සඳහා SLIC අබණ්ඩව කැපවී සිටී. ඒ අනුව, 2025 වසරේදී අපගේ මූල්‍ය බැඳීම් මැනවින් සපුරාලමින්, සමස්ත බදු වගකීම් ලෙස රුපියල් මිලියන 482 ක මුදලක් (සමාගම වෙනුවෙන්) ගෙවීමට අප පියවර ගෙන ඇත. එසේම, දිගුකාලීන ප්‍රතිලාභ තවදුරටත් ශක්තිමත් කරගැනීම සඳහා අපගේ ප්‍රධාන අනුබද්ධ සමාගම් වන SLICLL සහ SLICGL හි ආයෝජන කටයුතු වෙනුවෙන් නිරන්තරයෙන් ප්‍රමුඛත්වය ලබා දුන්නෙමු. අනාගතය දෙස බලන විට, අපගේ අනුබද්ධ ආයතන සහ සියලුම පාර්ශවකරුවන් උදෙසා මූල්‍ය වාර්තාකරණයේ විනිවිදභාවය ඉහළ නැංවීමටත්, පාලන ප්‍රමිතීන් තවදුරටත් ශක්තිමත් කිරීමටත් අප බලාපොරොත්තු වෙමු. එමෙන්ම, අප සතු මහජන සේවා වගකීම මෙන්ම කොටස් හිමියන්ගේ වටිනාකම් ද මැනවින් සමතුලිත කරමින්, විනයග රුක වර්ධනීය මුලපිරීම් ඔස්සේ ඉදිරියට යාමට අප නිරන්තරයෙන් කැපවී සිටින්නෙමු.

සාර්ව ආර්ථික ප්‍රවණතා

බැංකු පොලී අනුපාත පහත වැටීම නිසා ස්ථාවර තැන්පතු සහ බැඳුම්කරවලින් ලැබෙන ප්‍රතිලාභ අවම විය. එමෙන්ම, ප්‍රධාන සමාගම්වල ලාභ ලැබීමේ ශක්තිය ද ඉහළ මට්ටමක පැවතිණි. මේ හේතුවෙන්, ආයෝජකයින් තමන් සතු මුදල් (ප්‍රාග්ධනය) ස්ථාවර ආදායම් මාර්ගවලින් ඉවත් කර, වැඩි ලාභයක් සෙවීම සඳහා කොටස් වෙළඳපල වෙත නැවත යොමු කිරීමට පෙළඹුණි. සමාග ම්වල ලාභදායීත්වය ඉහළ යාමත් සමඟ කොටස් වෙළඳපල හරහා සාපේක්ෂව වැඩි ප්‍රතිලාභ ලැබීමේ විභවයක් නිර්මාණය වූ අතර, එමඟින් ආයෝජක සහභාගීත්වය සහ ප්‍රාග්ධන ගලා ඒම සැලකිය යුතු ලෙස තීව්‍ර විය. එහි ප්‍රතිඵලයක් ලෙස කොටස් දර්ශක වාර්තාගත මට්ටම් දක්වා ඉහළ ගිය අතර, එය සමස්ත වෙළඳපල තුළ සාධනීය සහ ශුභවාදී ප්‍රවණතාවක් තහවුරු කිරීමට මනා පිටිවහලක් විය.

පහළ මට්ටමක පැවති ස්ථාවර උද්ධමන අනුපාතය හේතුවෙන් මෙරට ගෘහස්ත ඒකකවල ක්‍රය ශක්තිය (Purchasing Power) සුරක්ෂිත වූ අතර, සැබෑ වැටුප් ක්ෂය වීම සීමා වීම නිසා පාරිභෝගිකයින්ට ඉහළ විශ්වාසයකින් යුතුව ව්‍යදම් කිරීමට මෙන්ම ඉතිරි කිරීමට ද අවස්ථාව උදාවිය. මිල පීඩනයන් ලිහිල් වීමත් සමඟ පුද්ගලයන් සතු සැබෑ වැය කළ හැකි ආදායම (Real Disposable income) වර්ධනය වූ අතර, එය භාණ්ඩ හා සේවා පරිභෝජනය ඉහළ නැංවීමට මෙන්ම දේශීය ඉල්ලුමේ පුළුල් වර්ධනයකට ද සෘජුවම හේතු විය. ගෘහස්ත ව්‍යදම්වල සිදු වූ මෙම වර්ධනය බහු අංශ හරහා නිෂ්පාදන ක්‍රියාවලිය උත්තේජනය කිරීමට සමත් වූ අතර, වෙළඳපල තුළ නිර්මාණය වූ ශක්තිමත් ඉල්ලුම සපුරාලීම සඳහා ව්‍යාපාරික ආයෝජන දිරිමත් කිරීමට ද හේතු විය. මේ හරහා සමස්ත නිමැවුම (Aggregate Output) ඉහළ ගොස් ජාතික ධනය නිර්මාණය වීමට දායකත්වයක් ලැබුණු අතර, එමඟින් පාරිභෝගික හැඟීම් මෙන්ම ආයතනික විශ්වාසය ද තවදුරටත් ශක්තිමත් විය.

මූල්‍ය ප්‍රතිපත්තිය

උද්ධමනය පහළ යාමේ සාධනීය පසුබිමට අනුපූරකව ක්‍රියාත්මක වූ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග (විශේෂයෙන්ම ආදායම් බදු සීමාවන් ඉහළ නැංවීම) බොහෝ ගෘහස්ත ඒකකවල ශුද්ධ වැටුප ඵලදායී ලෙස වැඩි කිරීමට සමත් විය. මේ හරහා පුද්ගලයන් සතු සැබෑ වැය කළ හැකි ආදායම මෙන්ම ක්‍රය ශක්තිය තවදුරටත් පුළුල් වූ අතර, එම අතිරේක ආදායම් වර්ධනය ශක්තිමත් පාරිභෝගික ඉල්ලුමක් ද නිර්මාණය කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස තම නිෂ්පාදන ධාරිතාව සහ ආයෝජන පුළුල් කිරීමට සමාගම් දිරිමත් වූ අතර, එය දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය තීව්‍ර කළ සාධනීය ගුණක බලපෑමක් වෙළඳපල තුළ බිහි කිරීමට මනා පිටිවහලක් විය.

මෙම හිතකර ආර්ථික වාතාවරණය හේතුවෙන් ගෘහස්ත ඒකකවල ආදායම් මට්ටම් සවිමත් වූ අතර, එමඟින් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් වී, පරිභෝජනය මෙන්ම ඉතිරි කිරීම් ඉහළ නංවා ගැනීමේ වැඩි හැකියාවක් ද උදා විය. ව්‍යාපාරික ප්‍රජාව සඳහා ද මෙය ශක්තිමත් ඉල්ලුමක්, ඉහළ විකුණුම් පරිමාවක් සහ නිෂ්පාදන ධාරිතාව පුළුල් කිරීම සඳහා වූ දිරිගන්වනසුලු පසුබිමක් නිර්මාණය කළේය. මෙම ප්‍රගතිය, සාර්ව ආර්ථික ස්ථාවරත්වය ආරක්ෂා කරගනිමින් ආර්ථික වර්ධනය උත්තේජනය කිරීම අරමුණු කරගනිමින් ඒකාබද්ධව ක්‍රියාත්මක වූ මූල්‍ය ස්ථාවරතා ක්‍රියාමාර්ග සහ ඉලක්කගත රාජ්‍ය මූල්‍ය සහනවල ඒකාබද්ධ බලපෑමේ සෘජු ප්‍රතිඵලයක් ලෙස සැලකිය හැකිය.

මෙම ක්‍රියාකාරිත්වයන් සාමූහිකව, ආර්ථික ප්‍රකෘතියට හා වර්ධනයට අදාළ හිතකර සාර්ව ආර්ථික පරිසරයක් ගොඩනැගීමට දායක වූ අතර, වෙළඳපල විශ්වාසය තහවුරු කරමින් පෞද්ගලික අංශයේ ප්‍රසාරණයට සහ රාජ්‍ය අංශයේ ප්‍රතිපත්තිමය ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය ස්ථාවර පදනමක් ද සකස් කරන ලදී.

දේශපාලන ස්ථාවරත්වය

මෙම කාලසීමාව තුළ පැවති දේශපාලන ස්ථාවරත්වය, දිගුකාලීන සැලසුම්කරණයට සහ ආයෝජන සඳහා අත්‍යවශ්‍ය වන පුරෝකථනය කළ හැකි ප්‍රතිපත්තිමය වටපිටාවක් නිර්මාණය කළේය. එසේම, ස්වෛරී ණය ශ්‍රේණිගත කිරීම "ණය පැහැර හැරීමේ" තත්ත්වයේ සිට ඉහළ නැංවීම, මූල්‍ය විනය සහ සාර්ව ආර්ථික කළමනාකරණයේ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය. විනිමය අනුපාත ස්ථාවරත්වය ද සමඟින් මෙම වර්ධනයන් රටේ අවදානම සැලකිය යුතු ලෙස අඩු කිරීමටත්, ආයෝජක විශ්වාසය තහවුරු කරමින් දේශීය හා විදේශීය ප්‍රාග්ධන ගලා ඒම දිරිමත් කිරීමටත් හේතු විය. මෙය තිරසාර දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට සහ පෞද්ගලික අංශයේ ප්‍රසාරණයට වඩාත් ශක්තිමත් පදනමක් සකස් කළේය.

ආර්ථික ක්‍රියාකාරකම් පණ ගැන්වීමත් සමඟ වර්ධනය වූ පුද්ගල ධනය සහ වැඩිවත් වූ ආයෝජන ප්‍රවණතා, අපගේ මෙහෙයුම් අංශයන්හි මූලික සේවාවන් සඳහා වූ ඉල්ලුම ඉහළ නැංවීමට මූලික විය. ඉහළ ගිය ගෘහස්ථ ආදායම සහ වත්කම් වර්ධනය හමුවේ පුළුල් රක්ෂණාවරණ සහ සෞඛ්‍ය සේවාවන් සඳහා වූ අවශ්‍යතාවය තීව්‍ර වූ අතර, කාර්මික නිෂ්පාදනය සහ පරිභෝජනය ප්‍රසාරණය වීම බලශක්ති අවශ්‍යතාව ඉහළ නැංවීමට ද බලපෑවේය.ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) අඛණ්ඩ මැදිහත්වීම් සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ ප්‍රතිපත්තිමය විශ්වසනීයත්වය තහවුරු කළ අතර, ලෝක වෙළඳපොළේ බොරතෙල් මිල පාලනය වීම උද්ඝමනකාරී පීඩනයන් සමනය කිරීමටත්, බාහිර මූල්‍යකරණ පීඩනයන් ලිහිල් කිරීමටත් මහෝපකාරී විය. මෙම සාධකයන්ගේ මනා සංකලනයෙන් නිර්මාණය වූ හිතකර වාතාවරණය, දිගුකාලීන ජාතික සංවර්ධනය උදෙසා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් (SLIC) රක්ෂණ, සෞඛ්‍ය සහ බලශක්ති ආයෝජනයන් සතු උපායමාර්ගික වැදගත්කම තවදුරටත් ප්‍රමුඛ කොට දක්වයි.

අවදානම් ස්වභාවය

වෙළඳපොළ අස්ථාවරත්වය හේතුවෙන් ඇතිවන ආයෝජන අවදානම්, ද්‍රවශීලතා අවදානම, ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු ඇතිවන පාලන හා අධීක්ෂණ අවදානම මෙන්ම අනුබද්ධ ආයතනයන්හි කාර්ය සාධන අවදානම, සංස්ථාව මුහුණ දෙන ප්‍රධාන ව්‍යවසාය අවදානම් වේ. අන්‍යෝන්‍ය වශයෙන් බැඳී පවතින මෙම අවදානම් හමුවේ, කොටස්කරුවන්ගේ වටිනාකම සුරැකීමට සහ රක්ෂිතයන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ඒකාබද්ධ වූත්, ඉදිරි දැක්මක් සහිත වූත් ප්‍රතිචාර දැක්වීම අත්‍යවශ්‍ය වේ.

සංස්ථාවේ වගකීම් සහ වගවීම් සහතික කරනු වස්, අපි පැහැදිලි වාර්තාකරණ ක්‍රමවේදයන් ස්ථාපිත කළ අතර, අනුබද්ධිත ආයතනවල වෙළඳපොළ උච්චාවචනයන් හෝ මෙහෙයුම් අඩුපාඩු මඟින් මතුවන තර්ජන කාලෝචිතව හඳුනාගෙන ඒවාට අවශ්‍ය පියවර ගැනීම සඳහා අධීක්ෂණ යාන්ත්‍රණයන් ද ශක්තිමත් කළෙමු. අපගේ අවදානම් කළමනාකරණ රාමුව මඟින් විවිධාංගීකරණය වූ වත්කම් වෙන්කිරීම, දැඩි ආතති පරීක්ෂණ (Stress testing) සහ අවස්ථා විශ්ලේෂණයන් කෙරෙහි අවධානය යොමු කරයි. තවද, අහිතකර තත්ත්වයන් යටතේ ද්‍රවශීලතාවය ආරක්ෂා කර ගැනීම සඳහා ශක්තිමත් හදිසි අරමුදල් සැලැස්මක් සකස් කර ඇති අතර, ක්‍රියාකාරී ආයෝජන කළඹ නැවත සමතුලිත කිරීම සහ විචක්ෂණශීලී ලෙස ප්‍රාග්ධනය යෙදවීම මඟින් වෙළඳපොළ අවදානම් අවම කිරීමට කටයුතු කර ඇත.

ඒ සමඟම, අපි අනුබද්ධිත මණ්ඩලවල කාර්ය සාධන අධීක්ෂණය සහ වගවීම තවදුරටත් තීව්‍ර කරමින් සිටින අතර, ව්‍යාපාරික ව්‍යුහයන් දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීමේ අරමුණු සමඟ පෙළගැස්වීමට කටයුතු කරමින් සිටිමු. එමෙන්ම, ව්‍යාපාරයේ මූල්‍ය සෞඛ්‍යය පිළිබඳ පැහැදිලි තක්සේරුවක් ලබාගැනීම සඳහා මූල්‍ය වාර්තාකරණයේ විනිවිදභාවය ද ඉහළ නංවා ඇත. මෙම සියලු ක්‍රියාමාර්ගයන්හි කේන්ද්‍රීය පදනම වන්නේ රඳවා ගැනීමේ සමාගම් (Holding Company) මට්ටමින් ශක්තිමත් ප්‍රාග්ධන පදනමක් පවත්වාගෙන යාමයි. සමූහයේ ස්ථාවරත්වයේ ප්‍රධාන ආරක්ෂක පවුර ලෙස අප සලකන මෙම ප්‍රාග්ධන පදනම, හදිසි ආර්ථික කම්පන දරා ගැනීමටත්, අවශ්‍ය අවස්ථාවන්හිදී අනුබද්ධ සමාගම්වලට සහාය වීමටත්, නියාමන අපේක්ෂාවන් සපුරාලීමටත් මහෝපකාරී වේ. එමෙන්ම අපගේ උපායමාර්ගික අරමුණු ක්‍රියාත්මක කිරීමේදී ආයෝජකයින්ගේ සහ මහජනතාවගේ විශ්වාසය අඛණ්ඩව පවත්වා ගැනීමට ද මෙය ශක්තිමත් අඩිතාලමක් සපයයි.

පාරිසරික, සමාජීය සහ ආයතනික පාලනය (ESG)

ජාතික ආර්ථික සංවර්ධනය උදෙසා පාරිසරික, සමාජීය සහ ආයතනික පාලන සාධක ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හී උපායමාර්ගික දිශානතියෙහි කේන්ද්‍රීය පදනම වන බවත්, එමඟින් ආයතනික ආයෝජන තීරණ, වත්කම් පරිහරණය සහ සමූහ මට්ටමේ අධීක්ෂණ ක්‍රියාවලීන් මෙහෙයවනු ලබන බවත් අධ්‍යක්ෂ මණ්ඩලය යළි තහවුරු කරයි. පාලන රාමුව ශක්තිමත් කිරීම, මූල්‍ය විනිවිදභාවය ඉහළ නැංවීම සහ ආයතනික අඛණ්ඩතාව ප්‍රවර්ධනය කිරීම මඟින් සමූහය පුරා ශක්තිමත් ප්‍රමිතීන් ස්ථාපිත කිරීමට අපි කැපවී සිටිමු. මීට අමතරව, ප්‍රාග්ධන වෙන්කිරීමේ ක්‍රියාවලියට තිරසාරත්ව නිර්ණායක ඒකාබද්ධ කිරීම, අනුබද්ධිත මණ්ඩලවල පැහැදිලි වගවීමක් බලාත්මක කිරීම සහ පාර්ශ්වකරුවන් සමඟ සක්‍රීයව සම්බන්ධ වීම මෙයට ඇතුළත් වේ. එමඟින් රක්ෂණ ඔප්පු හිමියන් සහ කොටස් හිමියන් වෙනුවෙන් දිගුකාලීන වටිනාකම් සුරක්ෂිත කරන අතරම, මැනිය හැකි සමාජීය සහ පාරිසරික ප්‍රතිලාභ අත්කර දීම සහතික කෙරේ.

ආයතනික සමාජ වගකීම (CSR)

ජාතික අවශ්‍යතාවලදී සහ අඛණ්ඩ ප්‍රජා සහභාගීත්ව ක්‍රියාවලීන්හිදී SLIC විසින් ඉටුකරනු ලබන ක්‍රියාශීලී භූමිකාව, ආයතනික සමාජ වගකීම උදෙසා වන අපගේ කැපවීම තහවුරු කරයි. ඒ අනුව, 2025 වසරේදී බලපෑ "දිට්වා" (Ditwah) සුළි කුණාටු ව්‍යසනය හමුවේ ජාතික සහන සේවා සඳහා දායක වෙමින් සමූහය විසින් රුපියල් මිලියන 500ක මූල්‍ය පරිත්‍යාගයක් රජයේ ඒකාබද්ධ අරමුදල වෙත පිරිනමන ලදී. තවද, ආපදාවට පත් ජනතාවට සහන සැලසීම උදෙසා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සහ මහරගම නගර සභාව සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක වෙමින්, සහන මධ්‍යස්ථානවල රැඳී සිටි පවුල් 1,000ක් සඳහා වියළි සලාක සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය බෙදා දීමට පියවර ගන්නා ලදී. මෙම ක්‍රියාමාර්ග, ජාතික ප්‍රමුඛතාවන් සමඟ අපගේ CSR වැඩසටහන් පෙළගැස්වීම හරහා ප්‍රජා ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීමටත්, සමූහයේ පුළුල් පාරිසරික, සමාජීය සහ ආයතනික පාලන (ESG) අරමුණු සමඟ සහසම්බන්ධ වෙමින් සමාජ සුභසාධනය ප්‍රවර්ධනය කිරීමටත් අප ලබා දෙන ප්‍රමුඛතාව පිළිබිඹු කරයි.


2026 ඉදිරි දැක්ම

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, මව් සමාගමක් ලෙස සාර්ථකව ප්‍රතිව්‍යුහගත වී ඇති අතර, ඒ හරහා සමූහයේ ආයෝජන කළඹ සක්‍රීයව කළමනාකරණය කිරීම සහ දේපළ වත්කම්වල උපරිම ඵලදායීතාව අත්කර ගැනීම කෙරෙහි සිය මෙහෙවර නැවත යොමු කර ඇත. මෙම උපායමාර්ගික මාරුව නියාමන අනුකූලතාව සහතික කරනවා පමණක් නොව, සමූහය පුරා වඩාත් කාර්යක්ෂම ප්‍රාග්ධන වෙන්කිරීමක්, පැහැදිලි වගවීමක් සහ සම්පත් ප්‍රශස්ත ලෙස පරිහරණය කිරීමට ද මඟ පාදයි. එමඟින්, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සහ ඔරොත්තු දීමේ හැකියාව තවදුරටත් තහවුරු කරමින්, රක්ෂණ ඔප්පු හිමියන්, කොටස් හිමියන් ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් වෙත අඛණ්ඩ වටිනාකමක් අත්කර දීමට අවශ්‍ය ශක්තිමත් පදනම SLIC විසින් සකස් කර ඇත.

අනාගතය දෙස බලන විට, අපගේ ආයෝජන උපායමාර්ග පිරිපහදු කිරීම, දේපළ කළඹ කළමනාකරණය වෘත්තීය මට්ටමට ඉහළ නැංවීම සහ අනුබද්ධිත ආයතන වෙත පැහැදිලි උපායමාර්ගික මඟපෙන්වීම් ලබා දීම මඟින් ක්‍රියාශීලී මව් සමාගමක් ලෙස ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි ශක්‍යතාවන් තවදුරටත් ශක්තිමත් කිරීමට අපි පියවර ගනිමින් සිටිමු. විශේෂයෙන්ම, 2026 වසරේදී සංස්ථාවේ සංගම් ව්‍යවස්ථාව සහ සමූහ ව්‍යුහය ඇතුළු ඉදිරි ක්‍රියාමාර්ග තීරණය කිරීම සඳහා මුදල්, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සමඟ සමීප සහයෝගීතාවයකින් කටයුතු කිරීමට අපි කැපවී සිටිමු. මෙහිදී සිදුකෙරෙන ඕනෑම ව්‍යුහාත්මක වෙනස්කමක් මඟින් ආයතනික පාලනය, විනිවිදභාවය සහ ජාතික සංවර්ධන අරමුණු බලගැන්වීම සඳහා වන සමූහයේ ධාරිතාව තවදුරටත් තහවුරු වන බව සහතික කරමි.

ප්‍රශංසාව

සංස්ථාවේ මෙම සාර්ථක ගමන්මග වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකාරීත්වය සහ සමස්ත කාර්ය මණ්ඩලය දැක්වූ නොමඳ කැපවීම මාගේ අවංක ඇගයීමට මෙන්ම කෘතඥතාවයට පාත්‍ර වේ. අත්කරගත් මෙම ප්‍රගතිය පදනම් කරගනිමින්, රක්ෂණ ඔප්පු හිමියන් ඇතුළු අපගේ සියලුම පාර්ශ්වකරුවන්ගේ විකාශනය වන අවශ්‍යතාවන් සපුරාලීමටත්, අනාගත අභියෝගයන්ට සාර්ථකව මුහුණ දිය හැකි වෘත්තීයමය මානව ප්‍රාග්ධනයකින් සන්නද්ධ කණ්ඩායමක් ගොඩනැඟීමටත් වන්නා වූ අපගේ අචල අධිෂ්ඨානය මම මෙයින් යළිත් තහවුරු කරමි.



නුසිත් කුමාරතුංග
සභාපති

ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය

මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව, යහපාලනය සහ ජීවිතයේ මෙන්ම දේපළවල වටිනාකම් සුරක්ෂිත කෙරෙන පාරිභෝගික කේන්ද්‍රීය ප්‍රවේශයක් වෙනුවෙන් අප සතු කැපවීම මෙන්ම, අප ලඟා කරගත් තිරසාර වර්ධනය පිළිබඳ මෙම වාර්ෂික වාර්තාව මඟින් සංක්ෂිප්තව කරුණු ඉදිරිපත් කෙරේ. තවද, ජාතික සංවර්ධනය වේගවත් කිරීම සහ සාර්ව ආර්ථික ස්ථාවරත්වය තහවුරු කිරීම උදෙසා ශ්‍රී ලංකා රජය සමඟ අප පවත්වාගෙන යනු ලබන නොමඳ සහයෝගීතාවය ද මෙමගින් මනාව ඉදිරිපත් කර ඇත.



4TH FULL PROOF

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය වෙනුවෙන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි ප්‍රධාන විධායක නිලධාරී සමාලෝචනය ඉදිරිපත් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයකි. ශ්‍රී ලංකාවේ වඩාත් ස්ථාවර සහ විවිධාංගීකරණය වූ රාජ්‍ය ව්‍යවසාය සමූහයක මව් සමාගම ලෙස අපගේ භූමිකාව තවදුරටත් තහවුරු කරමින්, සංස්ථාවේ පරිවර්තනීය ගමන් මගෙහි තීරණාත්මක සන්ධිස්ථානයක් සනිටුහන් කිරීමට මෙම වසර සමත් විය. නිරන්තරයෙන් විකාශනය වන නියාමන සහ ආර්ථික වටපිටාව හමුවේ මූල්‍ය ස්ථාවරත්වය සුරක්ෂිත කිරීම, යහපාලන ප්‍රමිතීන් ශක්තිමත් කිරීම සහ අපගේ පාර්ශවකරුවන් වෙනුවෙන් තිරසාර වටිනාකම් උත්පාදනය කිරීම කෙරෙහි අපි නිරන්තර අවධානය යොමු කළෙමු.

ඓතිහාසිකව, ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ සේවා යන ද්විත්වයම සපයන සංයුක්ත රක්ෂණකරුවෙකු ලෙස ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, දශක කිහිපයක සිට මෙරට රක්ෂණ ක්ෂේත්‍රය සවිබල ගැන්වීමෙහිලා සුවිශේෂී මෙහෙවරක් ඉටුකර ඇත. රක්ෂණ ව්‍යාපාර මෙහෙයුම් නීත්‍යානුකූලව වෙන් කිරීමෙන් අනතුරුව, සංස්ථාව වර්තමානයේදී අනුබද්ධිත සමාගම් හයකින් සමන්විත මව් සමාගමක් ලෙස ක්‍රියාත්මක වේ. ඒ අනුව, සිය වත්කම් සහ ආයෝජන කළඹ කළමනාකරණය කරන අතරම, අනුබද්ධ ආයතන සඳහා උපායමාර්ගික අධීක්ෂණය සහ පාලන මගපෙන්වීම් සැපයීම ද සංස්ථාව මගින් සිදු කරනු ලබයි.

2011 අංක 03 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නියාමන අවශ්‍යතාවලට අනුකූල වෙමින්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි රක්ෂණ බලපත්‍රය 2024 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරන ලදී. ඒ වෙනුවට, සංස්ථාව සතු පූර්ණ හිමිකාරිත්වයෙන් යුත් අනුබද්ධිත ආයතන දෙකක් වන ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වෙත පිළිවෙලින් ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ස්වාධීනව පවත්වාගෙන යාම සඳහා වෙන වෙනම බලපත්‍ර නිකුත් කෙරිණි. මෙම වෙනස්කිරීම් තුළින් නියාමන අනුකූලතාව තහවුරු වූ අතර, මෙහෙයුම් විනිවිදභාවය ඉහළ නැංවීමට මෙන්ම එක් එක් ව්‍යාපාරික අංශ කෙරෙහි වඩාත් තියුණු අවධානයක් යොමු කිරීමට ද අවස්ථාව සැලසුණි.


මෙම ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සාර්ථකව මෙහෙයුම්ගත කර ඇති අතර, සංස්ථාව මෙරට වඩාත්ම ස්ථාපිත සහ විවිධාංගීකරණය වූ රාජ්‍ය ව්‍යවසාය සමූහයක් ලෙස ස්ථානගත කිරීමේ අරමුණ ඇතිව, මව් සමාගමේ අවසාන දීර්ඝ කාලීන මෙහෙයුම් ආකෘතිය (Operating Model) පිළිබඳව මේ වන විට සාකච්ඡා වෙමින් පවතී. සංස්ථාව වර්තමානයේදී පූර්ණ හිමිකාරිත්වය සහිත අනුබද්ධිත සමාගම් පහකින් යුත් විවිධාංගීකරණය වූ කළඹක් අධීක්ෂණය කරයි. ඒවා නම් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්, ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, කැනොවින් හොටෙල් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ කළමනාකරණ සේවා රක්ෂණ (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමයි. මීට අමතරව, ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම සහ ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී යන සමාගම්වල බහුතර කොටස් හිමිකාරිත්වය ද සංස්ථාව සතුය. තවද, කැන්විල් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විධිමත් පරිදි භාණ්ඩාගාර ලේකම්වරයා වෙත පවරා දෙන ලදී.

විවිධාංගීකරණය වූ ව්‍යාපාර කළඹක ශක්තිය සහ විනයගරුක මූල්‍ය භාරකාරත්වය මැනවින් පිළිබිඹු කරමින්, සමාලෝචිත වර්ෂය තුළ සමූහය ඉතා ශක්තිමත් මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාවක් ප්‍රදර්ශනය කළේය. ඒ අනුව, සමූහ ආදායම 2024 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 182.1 සිට රුපියල් බිලියන 202.4 දක්වා වර්ධනය වූ අතර, දළ ලිඛිත වාරික ආදායම රුපියල් බිලියන 51.3 සිට රුපියල් බිලියන 62.8 දක්වා ඉහළ ගියේය. බදු පසු ශුද්ධ ලාභය ද පෙර වසරේ පැවති රුපියල් බිලියන 9.1 සිට රුපියල් බිලියන 15.3 දක්වා කැපී පෙනෙන වර්ධනයක් සනිටුහන් කළේය. සමූහයේ මුළු වත්කම් පදනම 2024 වසරේ පැවති රුපියල් බිලියන 435.0 සිට රුපියල් බිලියන 517.4 දක්වා ප්‍රසාරණය වූ අතර, සමූහයේ ශක්තිමත් ප්‍රාග්ධන තත්ත්වය සහ දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කරමින් මුළු හිමිකම් වටිනාකම රුපියල් බිලියන 184.3 දක්වා වර්ධනය විය.

සමාගම් මට්ටමින් ගත් කල, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් සිය උපායමාර්ගික ආයෝජන කළඹ සහ භාණ්ඩාගාර මෙහෙයුම් විචක්ෂණශීලීව කළමනාකරණය කිරීම හරහා ස්ථාවර මූල්‍ය මට්ටමක් පවත්වා ගැනීමට සමත් විය. වසර සඳහා සමාගම් ආදායම රුපියල් බිලියන 7.7 ක් වූ අතර, 2024 වසරේ රුපියල් බිලියන 3.6 ක් වූ බදු පසු ශුද්ධ ලාභය මෙම වසරේදී රුපියල් බිලියන 6.5 දක්වා ඉහළ ගියේය. මුළු වත්කම් රුපියල් බිලියන 133.3 දක්වාත්, මුළු හිමිකම් වටිනාකම රුපියල් බිලියන 127.2 දක්වාත් වර්ධනය වූ අතර, එමගින් සංස්ථාව සතු මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව සහ තිරසාර දිගුකාලීන වටිනාකම් උත්පාදනය කිරීමේ ශක්තිය මනාව පෙන්නුම් කෙරුණි. වසර තුළ සියලු ව්‍යවස්ථාපිත බදු බැඳීම් ඉටු කළ සමාගම, රජයේ බදු ආදායම සඳහා රුපියල් මිලියන 115 ක දායකත්වයක් ලබා දෙමින්, ජාතික ආර්ථික සංවර්ධනයට දායක වන වගකිවයුතු රාජ්‍ය ව්‍යවසායයක් ලෙස සිය භූමිකාව යළිත් තහවුරු කළේය.

අනාගතය දෙස බලන කල, මව් සමාගමේ දීර්ඝ කාලීන මෙහෙයුම් ආකෘතිය අවසන් කිරීම, ආයතනික පාලන ව්‍යුහයන් තවදුරටත් ශක්තිමත් කිරීම, ආයෝජන කාර්යසාධනය ප්‍රශස්ත කිරීම සහ අපගේ විවිධාංගීකරණය වූ ආයෝජන කළඹ හරහා උපරිම උපායමාර්ගික වටිනාකමක් අත්පත් කර ගැනීම කෙරෙහි අපගේ මූලික අවධානය යොමු වී ඇත. ජාතියේ තිරසාර වර්ධනයට සහ දීර්ඝ කාලීන ජාතික වටිනාකම් උත්පාදනයට දායක විය හැකි, මූල්‍යමය වශයෙන් ශක්තිමත් මෙන්ම උපායමාර්ගිකව නිසි ලෙස ස්ථානගත වූ රාජ්‍ය ව්‍යවසායයක් ලෙස ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් අඛණ්ඩව පරිණාමය වන බව සහතික කිරීමට අපි කැපවී සිටිමු.

අප ලබාගත් මෙම ප්‍රගතිය උදෙසා නිසි මගපෙන්වීමක් ලබා දුන් අධ්‍යක්ෂ මණ්ඩලයටත්, අඛණ්ඩව සහයෝගය දැක්වූ මුදල් අමාත්‍යාංශයට සහ භාණ්ඩාගාර ලේකම්වරයාටත් මගේ හෘදයාංගම කෘතඥතාව පළ කරමි. එමෙන්ම, අප කෙරෙහි විශ්වාසය තබා නොසැලෙන කැපවීමකින් යුතුව කටයුතු කළ අපගේ සේවක මණ්ඩලය ඇතුළු සියලුම පාර්ශවකරුවන් වෙත ද මාගේ ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කරගනිමි.



නලින් සුබසිංහ
ප්‍රධාන විධායක නිලධාරී

අධ්‍යක්ෂ මණ්ඩල විස්තරය



තුෂාර රුද්‍රිගෝ මහතා
අධ්‍යක්ෂ

සෝමදාස පලිහවඩන මහතා
අධ්‍යක්ෂ

රොහාන් බුල්ජන්ස් මහතා
අධ්‍යක්ෂ

නුසිත් කුමාරතුංග මහතා
සභාපති



දුෂ්මන්ත තොටවත්ත මහතා
අධ්‍යක්ෂ

නීල් උනම්බුවේ මහතා
(ජනාධිපති නීතිඥ)
අධ්‍යක්ෂ

සාරා දිසානායක මහත්මිය
ආයතනික කටයුතු ප්‍රධානී සහ
සමාගම් ලේකම්



නුසිත් කුමාරතුංග මහතා

සභාපති

අධ්‍යාපනය

නුසිත් කුමාරතුංග මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වතු කළමනාකරණය සහ තක්සේරුකරණය පිළිබඳ විද්‍යාවේදී (B.Sc.) උපාධියක් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකයෙකු (Fellow) මෙන්ම සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු ද වේ. මෙය මූල්‍ය හා ගිණුම්කරණය පිළිබඳ ඔහුගේ ශක්තිමත් වෘත්තීය පදනම විදහා දක්වයි.

අත්දැකීම්

කුමාරතුංග මහතා විගණන, බදුකරණය සහ ව්‍යාපාර උපදේශන සේවා ක්ෂේත්‍රයන්හි දශක තුනකට අධික පළපුරුද්දක් ඇති ගෞරවනීය මූල්‍ය වෘත්තිකයෙකි. "ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස්" (PricewaterhouseCoopers) ආයතනයෙන් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ ඒ මහතා, 2000 වසරේදී "නුසිත් කුමාරතුංග සහ සමාගම" නමින් වෘත්තීය සේවා ආයතනයක් ස්ථාපනය කළේය. එමගින් විශේෂයෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs) ඉලක්ක කරගනිමින් විගණන, බදු සැලසුම්කරණය සහ ව්‍යාපාර උපදේශන සේවා සපයනු ලබයි. මූල්‍ය, විගණන සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය උපදේශනය පිළිබඳ ගැඹුරු ප්‍රවීණතාවයක් සහිත ඒ මහතා 2024 ඔක්තෝබර් 18 වන දින සභාපතිවරයා ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

වෘත්තීය ජයග්‍රහණ

ලෝක බැංකුව සහ මුදල් අමාත්‍යාංශය මගින් ප්‍රතිපාදන සපයන ලද ධාරිතා වර්ධන සහ මූල්‍ය කළමනාකරණ පුහුණු වැඩසටහන් රැසක් මෙහෙයවා ඇති කුමාරතුංග මහතා, ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) අංශයේ සංවර්ධනය වෙනුවෙන් කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කර ඇත. බදු ප්‍රතිසංස්කරණ සහ ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය පිළිබඳ උපදේශක මණ්ඩල සඳහා සම්බන්ධ වෙමින් ඔහු ජාතික ආර්ථික කතිකාවතට ද සිය දායකත්වය ලබා දී ඇත.

නුසිත් මහතා මේ වන විට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්, මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (ප්‍රයිවට්) ලිමිටඩ්, ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට්ස් හෝල්ඩින්ග්ස් ලිමිටඩ්, නැෂනල් ට්‍රාන්ස්මිෂන් නෙට්වර්ක් සර්විස් ප්‍රොවයිඩර් (ප්‍රයිවට්) ලිමිටඩ්, බයෝමඩ් හයිඩ්‍රෝ පවර් (ප්‍රයිවට්) ලිමිටඩ්, ශ්‍රී ලංකා එනර්ජිස් එච් ආර් (ප්‍රයිවට්) ලිමිටඩ්, දැදුරුඔය මිනි හයිඩ්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ්, කුඹල්ගමුව මිනි හයිඩ්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ්, ශ්‍රී ලංකා එනර්ජිස් (ප්‍රයිවට්) ලිමිටඩ්, එසේම ඔහු ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී, LTL හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් සහ ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසද කටයුතු කරයි.



දුෂ්මන්ත තොටවත්ත මහතා

අධ්‍යක්ෂ

අධ්‍යාපනය

දුෂ්මන්ත තොටවත්ත මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකයෙකි (Fellow Member). ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධියක් සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත.

අත්දැකීම්

තොටවත්ත මහතා 2022 අගෝස්තු 22 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන රැසක මූල්‍ය කළමනාකරණය, ආයතනික පාලනය, උපායමාර්ගික කළමනාකරණය සහ මහජන සම්බන්ධතා යන ක්ෂේත්‍රයන්හි වසර 40කට අධික පුළුල් අත්දැකීම් සමුදායක් ඔහු සතුය.

පළපුරුදු නායකයෙකු වන ඒ මහතා, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ප්‍රමුඛ පෙළේ ආයතන රැසක ප්‍රධාන විධායක නිලධාරී (CEO), ප්‍රධාන මූල්‍ය නිලධාරී (CFO) සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක වැනි ජ්‍යෙෂ්ඨ විධායක තනතුරු හොබවා ඇති අතර, එමගින් ශක්තිමත් සහ විවිධාංගීකරණය වූ නායකත්ව පසුබිමක් විදහා දක්වයි.

වෘත්තීය ජයග්‍රහණ

තොටවත්ත මහතා වර්තමානයේ කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම (Canwill Holdings (Pvt) Ltd), කැනොවින් හෝටල් සහ ස්පා ලිමිටඩ් (Canowin Hotels) Spas Ltd) සහ L C B ෆිනෑන්ස් පීඑල්සී (L C B Finance PLC) යන ආයතනවල සභාපතිවරයා ලෙස කටයුතු කරයි. තවද ඔහු ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්, මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට්ස් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් යන ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසද සේවය කරයි. විවිධ ආයතන රැසක අධ්‍යක්ෂ මණ්ඩල සහ විධායක මට්ටමින් ඔහු ලබා දී ඇති දිගුකාලීන දායකත්වය මගින් නායකත්වය, මූල්‍ය භාරකාරත්වය සහ ආයතනික පාලනය පිළිබඳ ඔහුගේ සාර්ථක ඉතිහාසය මැනවින් පිළිබිඹු කෙරේ. 2017 වසරේදී මූල්‍ය අංශය වෙනුවෙන් පිරිනමන "IPM Sri Lanka People Leaders" සම්මානයෙන්ද ඔහු පිදුම් ලැබිය.



රොහාන් බුල්ජන්ස් මහතා

අධ්‍යක්ෂ

අධ්‍යාපනය

බුල්ජන්ස් මහතා ඕස්ට්‍රලියාවේ රෝයල් මෙල්බර්න් තාක්ෂණ ආයතනයෙන් (RMIT) තොරතුරු තාක්ෂණය පිළිබඳ ව්‍යාපාරික ශාස්ත්‍රපති (MBIT) උපාධියක් ලබා ඇත. ඔහුගේ මෙම අධ්‍යාපන පසුබිම තාක්ෂණය මත පදනම් වූ ව්‍යාපාරික නායකත්වය සහ උපායමාර්ගික නවෝත්පාදනයන් සඳහා ශක්තිමත් පදනමක් සපයයි.

වෘත්තීය සාරාංශය

බුල්ජන්ස් මහතා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්, මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට්ස් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් යන ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි.

4TH FULL PROOF

ඔහු විදුලි සංදේශ, ත්‍යාජ්‍ටික බලශක්ති, තෙල් සහ ගෑස්, මූල්‍ය සේවා සහ තොරතුරු තාක්ෂණ යන විවිධ ක්ෂේත්‍රයන්හි පුළුල් පළපුරුද්දක් ඇති ප්‍රමුඛ පෙළේ ජ්‍යෙෂ්ඨ වෘත්තිකයෙකි. දත්ත විශ්ලේෂණය, සයිබර් ආරක්ෂණය, ඩිජිටල් වාණිජ්‍යය සහ නැගී එන තාක්ෂණයන් පිළිබඳ සිය විශේෂඥතාව උපයෝගී කරගනිමින්, ඩිජිටල් පරිවර්තනය (Digital Transformation) හරහා ආයතනික උපාය මාර්ග මෙහෙයවීමට ඔහු සතු හැකියාව ඇගයීමට ලක්ව ඇත.

සේවා විශිෂ්ටත්වය වැඩිදියුණු කිරීම, පාරිභෝගික අත්දැකීම් ඉහළ නැංවීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සහ නව ආදායම් මාර්ග උත්පාදනය කිරීම සඳහා ව්‍යාපාරික අරමුණු සමඟ තොරතුරු තාක්ෂණ උපාය මාර්ග පෙළගැස්වීමේ සාර්ථක ඉතිහාසයක් ඔහු සතුය. මහා පරිමාණ පරිවර්තන ක්‍රියාවලීන්හිදී ඔහු ලබා දෙන නායකත්වය ආයතනික විශිෂ්ටත්වයට සහ තිරසාර වර්ධනයට නිරන්තරයෙන් දායක වී ඇත.

වෘත්තීය පළපුරුද්ද සහ විශේෂඥතාව

ව්‍යාපාරික නවෝත්පාදනයන් ඇති කිරීම, සේවා සැපයීම ප්‍රශස්ත කිරීම සහ පාරිභෝගික සබඳතා ශක්තිමත් කිරීම සඳහා ඉවහල් වන ව්‍යවසාය සහ ව්‍යාපාරික ව්‍යුහයන් (Enterprise and Business Architecture) සාර්ථකව ස්ථාපිත කිරීමට සහ මෙහෙයවීමට බුල්ට්ජෙන්ස් මහතා කටයුතු කර ඇත. 2025 ජනවාරි 1 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වූ ඒ මහතා, මැනිය හැකි ව්‍යාපාරික වටිනාකමක් ලබා දෙන තොරතුරු තාක්ෂණ මෙහෙයුම් ආකෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ විශේෂඥතාවක් දක්වයි.

ඔහු පහත ක්ෂේත්‍රයන්හි ගැඹුරු නිපුණතාවයකින් යුක්ත වේ:

- ව්‍යාපාරික අරමුණු සමඟ බද්ධ වූ ඩිජිටල් සහ තොරතුරු තාක්ෂණ උපාය මාර්ග සංවර්ධනය කිරීම.
- විදුලි සංදේශ වටිනාකම් දාමය (Telecom Value Chain) සහ බැංකු අංශය තුළ පරිවර්තනීය වෙනස්කම් මෙහෙයවීම.
- ආයතනික තරඟකාරී වාසි ඇගයීම සහ ඩිජිටල් අවස්ථා මෙන්ම අවදානම් හඳුනා ගැනීම.
- ශක්තිමත් ඩිජිටල් උපාය මාර්ග හරහා තිරසාර තරඟකාරී ස්ථානගතවීම් තහවුරු කිරීම.

ඔහුගේ තාක්ෂණික ප්‍රවීණතාවය කෘතිම බුද්ධිය (AI), වස්තු අන්තර්ජාලය (IoT), බ්ලොක්චේන් (Blockchain), මහා දත්ත (Big Data), වලාකුළු පරිගණකකරණය (Cloud Computing), ඩිජිටල් සේවා ස්ථාන විසඳුම් (Digital Workplace solutions), සංජානන පරිගණකකරණය (Cognitive Computing) සහ සමාජ මාධ්‍ය වේදිකා ඇතුළු නවීන ඩිජිටල් තාක්ෂණයන් රැසක් පුරා විහිදී පවතී.

ජාත්‍යන්තර අත්දැකීම්

එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඕස්ට්‍රේලියාව, ටැන්සානියාව, ඉන්දියාව, ඊජිප්තුව, සෞදි අරාබිය සහ ශ්‍රී ලංකාව යන රටවල විවිධ ආයතන සමඟ කටයුතු කර ඇති බුල්ජන්ස් මහතා, සතු ප්‍රබල ජාත්‍යන්තර අත්දැකීම් සමුදාය ඔහුගේ වෘත්තීය ජීවිතයට සුවිශේෂී වටිනාකමක් එක් කරයි. බහුසංස්කෘතික කණ්ඩායම් මෙහෙයවීමට මෙන්ම සංකීර්ණ හා මහා පරිමාණ ව්‍යාපෘති කළමනාකරණය කිරීමටත් ඔහු විශේෂ නිපුණතාවයක් දක්වයි. තාක්ෂණය පාදක කරගත්, පිරිවැය-ඵලදායී විසඳුම් ඔස්සේ ආයතනික ලාභදායීත්වය ඉහළ නැංවීමට ඔහු නිරන්තරයෙන් කැපවී කටයුතු කරයි.



නීල් උනම්බුවේ මහතා (ජනාධිපති නීතිඥ)

අධ්‍යක්ෂ

අධ්‍යාපන සුදුසුකම්

ජනාධිපති නීතිඥ උනම්බුවේ මහතා ඇමරිකා එක්සත් ජනපදයේ ජෝර්ජ් වොෂින්ටන් විශ්ව විද්‍යාලයෙන් සහ ඉතාලියේ ටියුරින් විශ්ව විද්‍යාලයෙන් පශ්චාත් උපාධි (Master's degrees) දෙකක් හිමිකරගෙන ඇත. සයිබර් නීතිය (Cyber Law), ගුවන් නීතිය (Air Law) සහ ත්‍යාජ්‍ටික ආරක්ෂණ ක්‍රමවේද (Nuclear Safeguards) පිළිබඳව ජාත්‍යන්තර විශේෂ පුහුණුවක් ලබා ඇති ඒ මහතා, සංකීර්ණ මෙන්ම නූතන ලෝකයේ නැගී එන නීති ක්ෂේත්‍රයන්හි හසළ විශේෂඥතාවයකින් හෙබි නිලධාරියෙකි.

වෘත්තීය පළපුරුද්ද

නීති ක්ෂේත්‍රයේ දශක තුනකට අධික අත්දැකීම් සහිත ජ්‍යෙෂ්ඨ නීති වෘත්තිකයෙකු වන උනම්බුවේ මහතා, නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙකු ලෙස සේවය කර විශ්‍රාම ලබා සිටියි. සිය සේවා කාලය තුළ ඔහු ඉහළ පෙළේ නීතිමය විමර්ශන, නියාමන අනුකූලතාව (Regulatory Compliance) සහ රජයේ උපදේශන කාර්යයන් සඳහා සිය සුවිශේෂී විශේෂඥ දායකත්වය ලබා දී ඇත.

ඔහු මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා රේගුව සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඇතුළු ප්‍රධාන රාජ්‍ය ආයතන සඳහා නීති උපදේශකත්වය සැපයීය. මීට අමතරව, පරමාණුක බලශක්ති අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ තවත් රජයේ ආයතන රැසක නීති උපදේශකවරයෙකු ලෙසද ඒ මහතා කටයුතු කර ඇත.

2025 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වූ ඔහු, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්, මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට්ස් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් යන ආයතනයන්හිද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි.

වෘත්තීය අත්දැකීම්

බුද්ධිමය දේපළ නීතිය, වාණිජ නීතිය සහ මූල්‍ය නීතිය පිළිබඳ ප්‍රමුඛ විශේෂඥයෙකු වන උනම්බුවේ මහතා, දැනට නීති වෘත්තියේ නියැලී සිටින අතර ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී (Sri Lanka Telecom PLC) සහ මොබිටෙල් සමාගමේ (Mobitel) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසද කටයුතු කරයි.



සෝමදාස පලිහවඩන මහතා

අධ්‍යක්ෂ

අධ්‍යාපන සුදුසුකම්

පලිහවඩන මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (B.Sc.) උපාධියක් ලබා ඇත. විශ්ලේෂණාත්මක විෂය ක්ෂේත්‍රයන්හි ඔහු ලැබූ එම අධ්‍යයන පදනම, බැංකුකරණය, භාණ්ඩාගාර මෙහෙයුම් සහ ප්‍රාග්ධන වෙළඳපොළ යන අංශයන්හි ඔහුගේ කීර්තිමත් වෘත්තීය ගමන් මගට ශක්තිමත් අඩිතාලමක් විය.

වෘත්තීය පළපුරුද්ද

බැංකුකරණය සහ ප්‍රාථමික අලෙවිකරණ මෙහෙයුම් (Primary Dealer Operations) පිළිබඳ වසර 51කට අධික අත්දැකීම් සමුදායක් සතු පලිහවඩන මහතා, ඉන් වසර 41ක්ම භාණ්ඩාගාර ගනුදෙනු කටයුතු (Treasury Dealing) සම්බන්ධයෙන් සුවිශේෂී පළපුරුද්දක් ලබා ඇත. 2025 ජුනි 30 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වූ ඒ මහතා, බැංකු, භාණ්ඩාගාර සහ ආයෝජන යන ක්ෂේත්‍රයන්හි සිය විශේෂඥ දැනුම ලබා දෙයි.

දැනට ෂර්වුඩ් කැපිටල් (Sherwood Capital) පුද්ගලික සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී/අධ්‍යක්ෂ ලෙස කටයුතු කරන ඔහු, මීට පෙර කැපිටල් එලායන්ස් (Capital Alliance) සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ධුරය හෙබවීය. තවද ඔහු ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්, මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට්ස් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් යන ආයතනයන්හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි. සෙලාන් බැංකුවේ දශක දෙකකට ආසන්න කාලයක් සේවය කළ පලිහවඩන මහතා, භාණ්ඩාගාර අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා ලෙස විශ්‍රාම ලැබූ අතර එහිදී ප්‍රාථමික අලෙවිකරු සහ රන් ආයෝජන ඒකකයන්හි ප්‍රධානියා ලෙස කටයුතු කළේය. මීට පෙර ලංකා බැංකුවේ ලන්ඩන් ශාඛාවේ ප්‍රධාන අලෙවිකරු (Chief Dealer) ලෙසද සේවය කළ ඔහු, සෙලාන් ඩිවලොප්මන්ට් පීඑල්සී (Seylan Development PLC) හි විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු සහ නියෝජ්‍ය සභාපතිවරයා ලෙසද කටයුතු කර ඇත.

වෘත්තීය ජයග්‍රහණ

භාණ්ඩාගාර ගනුදෙනු සහ රජයේ සුරැකුම්පත් වෙළඳපොළ ක්ෂේත්‍රයන්හි දශක හතරකට අධික නායකත්ව පළපුරුද්දක් පලිහවඩන මහතා සතු වේ. බැංකුකරණය, භාණ්ඩාගාර කළමනාකරණය, ප්‍රාථමික අලෙවිකරණ මෙහෙයුම් සහ ස්වෛරී සුරැකුම්පත් (Sovereign Securities) ආයෝජන පිළිබඳ අත්දැකීම් බහුල ඔහු, මූල්‍ය ආයතනයන්හි අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ පාලන කටයුතු (Governance) සම්බන්ධයෙන්ද සුවිශේෂී නිපුණතාවයකින් හෙබි නිලධාරියෙකි.



තුෂාර රොද්‍රිගෝ මහතා

අධ්‍යක්ෂ

අධ්‍යාපන සුදුසුකම්

රොද්‍රිගෝ මහතා වාණිජවේදී (B.Com) උපාධිධාරියෙකු වන අතර, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් (SLIDA) රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් (Master of Public Management) ද ලබා ඇත. ඒ මහතා ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (APFA) සාමාජිකයෙකු වන අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA Sri Lanka) විසින් වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරයෙකු ලෙස ද පිළිගෙන ඇත. මෙය රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ඔහු සතු විෂයය ප්‍රවීණත්වය සහ වෘත්තීය විශිෂ්ටත්වය මැනවින් පිළිඹිබු කරයි.

පළපුරුද්ද

ගිණුම්කරණය සහ වාර්තාකරණය, වත්කම් කළමනාකරණය, ආයතනික කටයුතු සහ රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණය ඇතුළු භාණ්ඩාගාර මෙහෙයුම් සම්බන්ධයෙන් දශක තුනකට ආසන්න රාජ්‍ය අංශයේ පළපුරුද්දක් රොද්‍රිගෝ මහතා සතු වේ. දැනට මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස සේවය කරන ඔහු, රජය සතු ව්‍යවසායයන් අධීක්ෂණය කිරීම මෙන්ම මූල්‍ය විනය සහ වගවීම ශක්තිමත් කිරීම උදෙසා ප්‍රමුඛ දායකත්වයක් ලබා දෙයි. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන පරීක්ෂකවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ ඒ මහතා, විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ, චෙන්නායි හි ශ්‍රී ලංකා නියෝජ්‍ය මහ කොමසාරිස් කාර්යාලයේ දෙවන ලේකම් සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පවතින දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු ජ්‍යෙෂ්ඨ තනතුරු රැසක් හොබවා ඇත.

රාජ්‍ය මූල්‍ය, රාජ්‍ය ව්‍යවසාය අධීක්ෂණය සහ විගණනය පිළිබඳ සිය විශේෂඥ දැනුම උපයෝගී කරගනිමින්, 2025 නොවැම්බර් 13 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහු අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. තවද, ඔහු රාජ්‍ය ආයතන කිහිපයක අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරන අතර, ආයතනික පාලනය සහ මූල්‍ය අධීක්ෂණය ශක්තිමත් කරමින්

විගණන කමිටු කිහිපයක සභාපතිත්වය ද හොබවයි. ඔහු ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්, මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට්ස් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් යන ආයතනවල ද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි.

වෘත්තීය ජයග්‍රහණ

සිය වෘත්තීය ජීවිතය තුළ රොද්‍රිගෝ මහතා පහත සඳහන් ක්ෂේත්‍රයන් වෙනුවෙන් සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇත:

- රාජ්‍ය ව්‍යවසායයන්හි මූල්‍ය වාර්තාකරණය සහ අනුකූලතා යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම.
- රාජ්‍ය ආයතන කෙරෙහි වන භාණ්ඩාගාර අධීක්ෂණ කටයුතු වඩාත් විධිමත් කිරීම සහ ඉහළ නැංවීම.
- රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ මූල්‍ය පාලනය (Fiscal Governance) ප්‍රවර්ධනය කිරීම.
- විනයගරුක වත්කම් කළමනාකරණයක් සහ රාජ්‍ය වගවීම තහවුරු කිරීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කිරීම.



සාරා දිසානායක මහත්මිය

ආයතනික කටයුතු ප්‍රධානී සහ සමාගම් ලේකම්

අධ්‍යාපන සුදුසුකම්

සාරා දිසානායක මහත්මිය ජෙනරාල් සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී (LL.B) උපාධියක් ලබා ඇත. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ සිය වෘත්තීය නීතිමය සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරියක ලෙස දිවුරුම් දුන් ඇය, බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍ය තාන්ත්‍රික පුහුණු ආයතනයෙන් (BIDTI) රාජ්‍ය තාන්ත්‍රිකභාවය සහ ලෝක කටයුතු පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද හිමිකරගෙන ඇත. එමඟින් ආයතනික පාලනය සහ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ඇය සතු පදනම තවදුරටත් ශක්තිමත් වේ.

වෘත්තීය පළපුරුද්ද

2025 ජූලි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාගම් ලේකම්වරිය ලෙස පත් වූ දිසානායක මහත්මිය, ආයතනික කටයුතු සහ සමාගම් ලේකම් අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි. සමාගම් පනත සහ අනෙකුත් අදාළ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම මෙන්ම යහපත් ආයතනික පාලන (Corporate Governance) පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම ඇයගේ වගකීම වේ.

ජනාධිපති නීතිඥ ඩබ්ලිව්. දයාරත්න මහතාගේ නීති උපදේශක කාර්යාලයේ (Chambers) කනිෂ්ඨ නීතිඥවරියක ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ ඇය, සිවිල් සහ අපරාධ නඩු කටයුතු සම්බන්ධයෙන් පළපුරුද්දක් ලබා ඇති අතර, විශේෂයෙන්ම ඉඩම් බෙදුම් නඩු, දේපළ නීතිය සහ වාණිජ නීතිය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත.

පසුව ඇය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම නීති සමාගමක් වන F J සහ G de Saram ආයතනයට අනුබද්ධ Corporate Services (Private) Limited හි ජ්‍යෙෂ්ඨ නීති නිලධාරිනියක ලෙස සේවය කළාය. එහිදී ඇය දේශීය හා බහුජාතික ආයතන 400කට අධික සංඛ්‍යාවක විවිධ ව්‍යාපාරික ක්ෂේත්‍රයන් (Portfolio) සම්බන්ධයෙන් අත්දැකීම් ලැබූ අතර, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි විදේශීය ආයතන ඇතුළුව ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොකළ පොදු සහ පෞද්ගලික සමාගම් 60කට වැඩි ප්‍රමාණයකට සමාගම් ලේකම් සේවා සැපයීමට සෘජුවම දායක වූවාය. ආයතනික හා වාණිජ නීතිමය කරුණු පිළිබඳ උපදේශනය, සංකීර්ණ කොටස් හිමිකාරිත්ව ව්‍යුහයන් හැසිරවීම, නීතිමය විමර්ශන (Due Diligence) සිදු කිරීම මෙන්ම නියාමන අනුකූලතාව සහ පාලන රාමු ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් ඇය සතු පළපුරුද්ද සුවිශේෂී වේ.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්ට සම්බන්ධ වූ දා සිට දිසානායක මහත්මිය ආයතනික පාලන ක්‍රියාවලීන් ශක්තිමත් කිරීමටත්, ව්‍යවස්ථාපිත අනුකූලතාව (Statutory Compliance) ඉහළ නැංවීමටත්, ආයතනික නෛතික හා කාර්මික සබඳතා පිළිබඳ කරුණු සඳහා සහාය වීමටත් විශාල දායකත්වයක් ලබා දී ඇත. ඇය සතු වෘත්තීය පළපුරුද්ද සහ නීතිමය විශේෂඥතාව, සමාගමේ පාලනය සහ උපායමාර්ගික අරමුණු සාර්ථක කර ගැනීම සඳහා මනා ශක්තියක් වේ.



මෙහෙයුම් පරිසරය

මෙහෙයුම් පසුබිම සහ ඉදිරි දැක්ම

ගෝලීය ආර්ථිකය

අස්ථාවර ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කරන ගෝලීය ආර්ථිකය, 2024 වසරේ වාර්තා කළ 3.3% ක වර්ධනයට සාපේක්ෂව 2025 වසරේදී 3.2% ක මන්දගාමී වර්ධනයක් අත්කර ගනු ඇතැයි පුරෝකථනය කෙරේ[1]. ගෝලීය ආර්ථික වර්ධන අනුපාතය වසංගතයට පෙර පැවති සාමාන්‍ය මට්ටම්වලට වඩා පහළ මට්ටමක පැවති අතර, සැපයුම් දාම වලට සිදුවන බාධා, බලශක්ති මිල ඉහළ යාම සහ වෙළඳ ගැටුම් හේතුවෙන් පැන නැඟුණු ස්ථාවර ගෝලීය උද්ධමනය පාලනය කිරීම සඳහා බලධාරීන්ට දැඩි මූල්‍ය ප්‍රතිපත්ති (Hawkish Monetary Policies) අනුගමනය කිරීමට සිදු විය. මෙමගින් ප්‍රාග්ධන ප්‍රවාහයන් සහ ණය ගැනීමේ පිරිවැය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් එල්ල විය. සංවර්ධිත ආර්ථිකයන් ධනාත්මක වුවද බිඳෙන සුළු ස්වභාවයක් ගත් අතර, නැගී එන ආර්ථිකයන් මුදල් අවප්‍රමාණය වීම, ඉහළ ආනයන පිරිවැය සහ බාහිර කම්පනයන්ට (External Shocks) ඇති ලැදියාව හමුවේ මිශ්‍ර කාර්ය සාධනයක් පෙන්නුම් කළේය[2]. භූ-දේශපාලනික ආතතීන් සහ ආරක්ෂණවාදී පිළිවෙත් හේතුවෙන් ඇති වූ භූ-ආර්ථික බණ්ඩනය (Geoeconomic Fragmentation) තුළින් ප්‍රතිවාදී ආර්ථික කලාප නිර්මාණය වූ අතර, එමගින් උපරිම ආර්ථික කාර්යක්ෂමතාව සාක්ෂාත් කර ගැනීමට බාධා එල්ල විය.

2025 වසරේදී ගෝලීය ආර්ථික ස්ථාවරත්වයට එල්ල විය හැකි ප්‍රධාන අභියෝග ලෙස, ඉහළ යන ගෝලීය තීරුබදු, වෙළඳ බණ්ඩනය, තීව්‍ර වන භූ-දේශපාලනික ආතතීන්, සංවර්ධිත ආර්ථිකයන්හි පවතින ඉහළ ණය බර සහ නැගී එන ආර්ථිකයන් වෙත විදේශ සෘජු ආයෝජන (FDI) ගලා ඒම අඩාල වීම හඳුනාගෙන ඇත[3]. කෙසේ වෙතත්, යුරෝපය සහ ඇමරිකා එක්සත් ජනපදය අභිබවා යමින් වේගයෙන්ම වර්ධනය වන ප්‍රධාන ආර්ථිකය ලෙස ඉන්දියාව සිය ප්‍රමුඛත්වය තහවුරු කර ගත්තේය.


ශ්‍රී ලංකා ආර්ථිකය

ආර්ථික අර්බුදයෙන් පසු සිදුකළ ඒකාබද්ධ කිරීම්, ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ, ශක්තිමත් බදු පද්ධතියක්, විනයගරුක රාජ්‍ය වියදම් පාලනය සහ ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්වීම යන කරුණු හේතුවෙන් 2024 වසරේදී 5% ක ආර්ථික වර්ධනයක් අත්කර ගැනීමට හැකි විය. මෙය 2025 වසර සඳහා ශක්තිමත් ආරම්භයකට මග පාදා ඇත. ජාත්‍යන්තර මූල්‍ය ආධාර වැඩසටහන් යටතේ වන ප්‍රතිසංස්කරණ අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර, අනාගත මූල්‍ය සහ ණය තිරසාරභාවය (Fiscal and Debt Sustainability) සහතික කිරීම සඳහා වන ප්‍රතිපත්තිමය මගපෙන්වීම් ද සහිතව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමග සම්බන්ධීකරණයෙන් ඉතා සංකීර්ණ, බහු-අදියර සහ බහු-ණයහිමි රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක් මේ වන විට සිදුවෙමින් පවතී.

ලංකා වාණිජ මණ්ඩලයේ වාර්ෂික ප්‍රමුඛතම සමුළුව වන "2025 ශ්‍රී ලංකා ආර්ථික සමුළුව", ණය අර්බුදයෙන් පසු යථා තත්ත්වයට පත්වීම, ස්ථාවරත්වය නැවත ස්ථාපිත කිරීම සහ ආයෝජක විශ්වාසය තහවුරු කිරීම කෙරෙහි ජාතික න්‍යාය පත්‍රය යොමු කළ අතර, රටේ ආර්ථික ස්ථාවරත්වය උදෙසා ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ අත්‍යවශ්‍ය භූමිකාව එහිදී අවධාරණය කෙරිණි.

සක්‍රිය ආර්ථික ක්‍රියාකාරකම් මධ්‍යයේ, සාර්ව ආර්ථික ස්ථාවරත්වයක් සහ ඩිජිටල් පරිවර්තනය තුළින් නැගී එන නව අවස්ථා දක්නට ලැබීම දිරිගන්වන සුළුය. එහෙත්, බාහිර කම්පනයන්ට පහසුවෙන් ගොදුරු විය හැකි බිඳෙන සුළු ආර්ථිකයක් හමුවේ, අනාගතය පිළිබඳ සුබවාදී බලාපොරොත්තු තබාගත යුත්තේ ප්‍රවේශම් සහගතවය.

දළ දේශීය නිෂ්පාදිත වර්ධන වේගය (%)



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුව – 2025

නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ (FIT) රාමුව මත පදනම්ව, දේශීය මිල ස්ථායිතාව ළඟා කර ගැනීම සහ පවත්වාගෙන යාම ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන වගකීම වේ. මීට සමගාමීව, උද්ධමන ඉලක්කයන් හා සැසඳෙන පරිදි කෙටිකාලීන පොලී අනුපාත මෙහෙයවීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව තහවුරු කිරීම ද අපේක්ෂා කෙරේ[4].

2025 වසරේදී මහ බැංකුව තනි ප්‍රතිපත්ති පොලී අනුපාත යාන්ත්‍රණයකට අවතීර්ණ වූ අතර, ඒ යටතේ පැවති ද්විත්ව ප්‍රතිපත්ති අනුපාත (ස්ථාවර තැන්පතු පහසුකම් අනුපාතය – SDFR සහ ස්ථාවර ණය පහසුකම් අනුපාතය - SLFR) වෙනුවට "එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතය" (OPR) හඳුන්වා දෙන ලදී. ආර්ථික නිමැවුම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව තහවුරු කිරීම සඳහා 2025 වසරේ භාවිත කළ ප්‍රධාන ප්‍රතිපත්ති මෙවලම මෙය විය. ආර්ථික පුනරුදය උදෙසා සහය වෙමින් උද්ධමනය ඉලක්කගත මට්ටමක පවත්වා ගැනීම සඳහා මැනවින් පාලනය කරන ලද ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් 2025 වසරේදී අනුගමනය කරන ලදී. මෙහිදී ධනාත්මක සැබෑ පොලී අනුපාත පවත්වා ගැනීම සහ බාහිර සංචිත ස්වාරක්ෂක යළි ගොඩනැඟීම කෙරෙහි අවධානය යොමු කළ අතර, දේශීය හා ගෝලීය අවදානම් තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් අවශ්‍ය ප්‍රතිපත්තිමය සංශෝධනයන් ක්‍රියාත්මක කරන ලදී.

උද්ධමන ප්‍රවණතාව

2024 වසරේ අගභාගයේ සිට 2025 වසරේ මුල් භාගය දක්වා දුර්ලභ මිල අවප්‍රමාණ (deflationary) තත්ත්වයක් නිරීක්ෂණය වූ අතර, 2025 පෙබරවාරි මාසයේදී එය සිය අවම මට්ටම වූ -4.2% ලෙස වාර්තා විය. බලශක්ති මිල ගණන්හි තියුණු පහළ යාම, දේශීය මුදලේ අගය ශක්තිමත් වීම (currency appreciation), පරිපාලනමය තීරණ මත බලශක්ති මිල අඩු කිරීම සහ රෝ ඉල්ලුම යන කරුණු මෙම තත්ත්වය සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත. මෙහිදී ආහාර උද්ධමනය පහත වැටුණු අතර ආහාර නොවන උද්ධමනය ද පාලිත මට්ටමක පවත්වා ගනු ලැබීය. 2025 වසරේ වැඩි කාලයක් පුරා මතුපිට උද්ධමනය (Headline Inflation) සහ මූලික උද්ධමනය (Core Inflation) යන දෙකම 2025 වසරේ වැඩි කොටසක් තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) 5% ඉලක්ක මට්ටමට වඩා පහළ මට්ටමක පැවතුණි. කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI,2021=100) මත පදනම් වූ වාර්ෂික පදනම මත මනින ලද මතුපිට උද්ධමනය 2025 දෙසැම්බර් මාසයේදී 2.1% ක් ලෙස නොවෙනස්ව වාර්තා විය. "දිට්වා" (Ditwah) සුළි කුණාටුව හේතුවෙන් 2025 දෙසැම්බර් මාසයේදී මිල ගණන්වල සැලකිය යුතු මාසික ඉහළ යාමක් පෙන්නුම් කළද, වාසිදායක සංඛ්‍යානමය පදනම් බලපෑම හේතුවෙන් වාර්ෂික උද්ධමනය ස්ථාවරව පැවතුණි. බලශක්ති මිල සංශෝධන, ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන්වල අස්ථාවරත්වය සහ දේශීය ඉල්ලුම යථා තත්ත්වයට පත්වීම මත පදනම්ව, 2026 මැද භාගය වන විට උද්ධමනය ක්‍රමයෙන් 5% ක ඉලක්කගත මට්ටම දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කෙරේ[5]. මහ බැංකුවේ දැඩි

[1] *IMF 2025 ඔක්තෝබර් ලෝක ආර්ථික ඉදිරි දැක්ම*

[2] *ගෝලීය ආර්ථික ඉදිරි දැක්ම - ඩෙලොයිට් ඉන්සයිට්ස් - www.deloitte.com*


[3] *ගෝලීය ආර්ථික ඉදිරි අපේක්ෂාවන් - ලෝක බැංකු සමූහය/2025 ජූලි යාවත්කාලීන ලෝක ආර්ථික දැක්ම*

[4] *වෙළඳපොළ මෙහෙයුම් වාර්තාව 2025 ජූනි - ශ්‍රී ලංකා මහ බැංකුව*

[5] *ශ්‍රී ලංකාව: විස්තීරණ අරමුදල් පහසුකම යටතේ වන විස්තීරණ විධිවිධානයෙහි සිව්වන සමාලෝචනය., කාර්යසාධන නිර්ණායක අදාළ වීමේ නිදහස් කිරීම් සහ ඒවායේ සංශෝධන සඳහා වන ඉල්ලීම්, සහ මූල්‍ය සහතික කිරීම් පිළිබඳ සමාලෝචනය - මාධ්‍ය නිවේදනය; කාර්ය මණ්ඩල වාර්තාව; සහ ශ්‍රී ලංකාව වෙනුවෙන් විධායක අධ්‍යක්ෂවරයාගේ ප්‍රකාශය; IMF හි රට පිළිබඳ වාර්තා අංක 25/162; 2025 ජූනි 16*

මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග, ගෝලීය උද්ධමනය පහත වැටීම, අඩු වූ වෙළඳ භාණ්ඩ මිල ගණන් සහ ස්ථාවර රුපියල යන සාධක 2025 වසර පුරා උද්ධමනය මනාව කළමනාකරණය කිරීමට ඉවහල් විය.

උද්ධමනය: CCPI (කොළඹ පාරිභෝගික මිල දර්ශකය) සහ NCPI (ජාතික පාරිභෝගික මිල දර්ශකය) (%)



මූලාශ්‍රය: https://www.cbsl.gov.lk/ පාරිභෝගික මිල උද්ධමනය මැනීමේ දර්ශක – 2025 දෙසැම්බර් 31

ගෙවුම් ශේෂය

බාහිර ණය සේවාකරණ කාලසටහන, ජංගම ගිණුම් පථය, ප්‍රාග්ධන සහ මූල්‍ය ගලා ඒම්, දළ නිල සංචිත, විනිමය අනුපාත ප්‍රතිපත්තිය, ප්‍රතිපත්ති අනුපාත සහ දේශීය ඉල්ලුම 2025 වසරේදී මෙම අංශයට බලපෑ ප්‍රධාන සාධක විය. ප්‍රතිපත්ති සම්පාදකයින් පුරෝකථනය කළ හැකි බාහිර මූල්‍යකරණය, සංචාරක ඉපැයීම් ඉහළ නැංවීම, ප්‍රේෂණ නාලිකා ශක්තිමත් කිරීම සහ ආනයන හා අපනයන අංශ දැඩි අවධානයෙන් යුතුව කළමනාකරණය කිරීමට ප්‍රමුඛත්වය ලබා දුන්හ.

2024 වසරේ වාර්තා වූ ශක්තිමත් සංචාරක ඉපැයීම් සහ ඇමරිකානු ඩොලර් බිලියන 6.6 ක් වූ ප්‍රේෂණ, ජංගම ගිණුම් අතිරික්තයට (ඩොලර් බිලියන 3.2) සහාය විය. ආනයන සීමා යම් දුරකට ලිහිල් කිරීම හේතුවෙන් 2025 වසරේදී ආර්ථිකය සුළු වෙළඳ හිඟයක් පෙන්නුම් කළේය. එහිදී ආනයන වාර්ෂිකව (YoY) 26.7% කින් ඩොලර් බිලියන 2.15 දක්වා ඉහළ ගිය අතර, අපනයන වාර්ෂිකව 0.7% කින් ඩොලර් බිලියන 1.15 දක්වා පහත වැටුණි. මෙම හිඟයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පාරිභෝගික භාණ්ඩ, විශේෂයෙන්ම පුද්ගලික භාවිත වාහන ආනයනය ඉහළ යාමයි. 2025 වසරේ පළමු භාගයේදී රුපියල 10.7% කින් අවප්‍රමාණය වූ අතර, 2025 ජූනි මස අවසානය වන විට දළ නිල සංචිත ඇමරිකානු ඩොලර් බිලියන 6.08 ක මට්ටමකට පැමිණියේය.

සමස්තයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂය කෙටි කාලීනව සැලකිය යුතු අතිරික්තයක් සහ කළමනාකරණය කළ හැකි මට්ටමක පවතින බාහිර ණය සේවාකරණයක් සමඟින් යහපත් වර්ධනයක් පෙන්නුම් කළේය. මධ්‍ය හා දිගුකාලීන වශයෙන් ඇති විය හැකි පීඩනයන් වළක්වා ගැනීම සඳහා අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන මූල්‍ය හා ප්‍රතිපත්තිමය විනය මඟින් තහවුරු කෙරෙන, පරීක්ෂාකාරී මෙන්ම සුභවාදී ආකල්පයක් ඉදිරියටත් පවතී.

රක්ෂණ අංශය

රක්ෂණ කර්මාන්තය රුපියල් ට්‍රිලියන 1.4 කට අධික වත්කම් ප්‍රමාණයක් කළමනාකරණය කරන අතර, ස්ථිර කාර්ය මණ්ඩලය, රක්ෂණ නියෝජිතයින් සහ උපදේශකයින් ඇතුළුව 69,000 කට අධික රැකියා නියුක්තියක් සඳහා දායකත්වය සපයයි. එමෙන්ම වාර්ෂිකව ගෙවනු ලබන හිමිකම් පෑම්වල වටිනාකම රුපියල් බිලියන 172 ඉක්මවයි. 2025 වසර අවසානය වන විට, ක්‍රියාත්මක වන රක්ෂණ සමාගම් 29 ක් පුරා උපයා ඇති මුළු වාරික ආදායම රුපියල් බිලියන 380 ක් දක්වා ළඟා වූ අතර, එය වසර තුළ ඉලක්කම් දෙකක (double-digit) වර්ධනයක් සනිටුහන් කළේය.

මෙම ශීඝ්‍ර වර්ධනය සඳහා මූලික වශයෙන් හේතු වූයේ, පුළුල් රක්ෂණ ආවරණයක් ලබා දීම සඳහා වූ උපායමාර්ගික ප්‍රවේශයත් සමඟම, ප්‍රාරක්ෂණ (Underwriting) සහ හිමිකම් පියවීම් ක්‍රියාවලීන් සඳහා කෘත්‍රිම බුද්ධිය (AI) සහ ස්වයංක්‍රියකරණ තාක්ෂණය භාවිත කිරීම ඉහළ යාමයි.

විශේෂයෙන්ම හිමිකම් ගෙවීම් කළමනාකරණයේදී, සිය පසු-කාර්යාල (back-office) ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා තාක්ෂණය භාවිත කරමින් ඩිජිටල් පරිවර්තනයක් කරා රක්ෂණකරුවන් යොමු වෙමින් සිටී. මේ අතර, බලාත්මක කිරීමේ බලතල තවදුරටත් පුළුල් කිරීමේ අරමුණින් රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනතට යෝජිත සංශෝධන ඇතුළත් කරමින්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) සිය අධීක්ෂණ කටයුතු ශක්තිමත් කරමින් සිටියි.

සාර්ව ආර්ථික හා දේශපාලනික තත්ත්වයන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වෙත ඇති කළ බලපෑම

පොලී අනුපාතවල පැවති පහත වැටීමේ ප්‍රවණතාව, ආයතනික ඉපැයීම්වල දක්නට ලැබුණු ශක්තිමත් වර්ධනය ද සමඟ එක්ව, කොටස් වෙළඳපොළ දෙසට ආයෝජකයින් ආකර්ෂණය කර ගනිමින් ඔවුන්ගේ ආයෝජන හැසිරීම් රටාවන්ට සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. ස්ථාවර ආදායම් උපකරණවල ප්‍රතිලාභ අනුපාත පහත වැටීමත් සමඟ, ආයතනික ලාභදායිතාවයේ සිදුවූ වර්ධනය ද හමුවේ, ආයෝජන විකල්පයක් ලෙස කොටස් වෙළඳපොළ සාපේක්ෂව වඩාත් ආකර්ෂණීය තත්ත්වයට පත් විය. මෙම වටපිටාව ආයෝජක සහභාගීත්වය ඉහළ නැංවීමට සහ කොටස් වෙළඳපොළ වෙත ගලා එන ප්‍රාග්ධනය වර්ධනය කිරීමට හේතු වූ අතර, එමඟින් කොටස් වෙළඳපොළ දර්ශක සර්වකාලීන ඉහළම මට්ටම් කරා මෙහෙයවමින් වෙළඳපොළ තුළ ධනාත්මක ප්‍රවණතාවක් (positive market sentiment) තහවුරු කිරීමට දායක විය.

පහළ මට්ටමක පැවති උද්ධමනය, පුද්ගල මූර්ත පිරිවැය කළ හැකි ආදායම (real disposable income) ඉහළ නැංවීමට සහ මිලදී ගැනීමේ බලය ආරක්ෂා කිරීමට උපකාරී වෙමින් ආර්ථික ගමන්තාව තවදුරටත් ශක්තිමත් කළේය. භාණ්ඩ හා සේවා මිල ඉහළ යාම හේතුවෙන් ගෘහස්ථ ආදායම් ක්ෂය වීම සීමා වීමත් සමඟ, පරිභෝජන මට්ටම් ඉහළ ගිය අතර එය වඩාත් පුළුල් ආර්ථික ක්‍රියාකාරීත්වයක් උත්තේජනය කිරීමට හේතු විය. මේ හරහා ඇති වූ වියදම් සහ ඉතුරුම් රටාවන්හි වර්ධනය, බහුවිධ අංශ හරහා ඉහළ ආර්ථික වර්ධනයක් සහ ධනෝත්පාදනයක් ඇති කිරීමට දායක වූ අතර, පාරිභෝගික මෙන්ම ව්‍යාපාරික විශ්වාසය ද ඉහළ නැංවීය.

රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය ද ආර්ථික වර්ධනය වේගවත් කිරීමෙහිලා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය. ආදායම් බදු නිදහස් කිරීමේ සීමාවන් (income tax thresholds) ඉහළ නැංවීම හේතුවෙන් පුද්ගලයින්ගේ ශුද්ධ වැටුප් ආදායම ඉහළ ගිය අතර, එමඟින් පිරිවැය කළ හැකි ආදායම් මට්ටම් තවදුරටත් වර්ධනය විය. මෙම අතිරේක ආදායම ඉහළ පාරිභෝගික ඉල්ලුමක් නිර්මාණය කළ අතර, එය නිෂ්පාදනය, ආයෝජන සහ සමස්ත දළ දේශීය නිෂ්පාදිතයේ (GDP) වර්ධනය සඳහා රුකුලක් විය. මෙලෙස පරිභෝජනය ශක්තිමත් වීමෙන් ඇති වූ ගුණාකාරක බලපෑම (multiplier effect) ආර්ථික ගමන්තාව තවදුරටත් තහවුරු කිරීමට සමත් විය.

සාර්ව ආර්ථික දෘෂ්ටි කෝණයකින් බලන කල, දේශපාලන ස්ථාවරත්වය විසින් දිගුකාලීන සැලසුම්කරණය සහ ආයෝජන තීරණ සඳහා අත්‍යවශ්‍ය වන්නා වූ, පුරෝකථනය කළ හැකි සහ හිතකර ප්‍රතිපත්තිමය වටපිටාවක් නිර්මාණය කරන ලදී. මෙරට ස්වෛරී ණය ශ්‍රේණිගත කිරීම 'ණය පැහැර හැරීමේ' (default) මට්ටමේ සිට ඉහළ නැංවීම, වැඩිදියුණු වූ මූල්‍ය විනය සහ සාර්ව ආර්ථික කළමනාකරණය පිළිබඳ සාධනීය සංඥාවක් වූ අතර, එමඟින් රටේ පවතින අවදානම් සහගත තත්ත්වය පිළිබඳ ප්‍රතිරූපය අවම විය. විනිමය අනුපාතිකයේ ස්ථායීතාව ද සමඟින් මෙම සාධක ආයෝජක විශ්වාසය තවදුරටත් ඉහළ නැංවීමටත්, දේශීය මෙන්ම විදේශීය ආයෝජන දිරිමත් කිරීමටත්, තිරසාර දළ දේශීය නිෂ්පාදිතයේ (GDP) වර්ධනයක් පවත්වා ගැනීමටත් දායක විය.

ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් වීමත් සමඟ ධනෝත්පාදන මට්ටම් ඉහළ ගිය අතර, ආයෝජන වේගවත් වෙමින් අත්‍යවශ්‍ය සේවාවන් සඳහා වන ඉල්ලුම ද ඊට සාපේක්ෂව වර්ධනය විය. පුළුල් වූ ආර්ථික සහභාගීත්වය සහ වත්කම් සමුච්චය වීම හේතුවෙන් පුද්ගලයින් සහ ව්‍යාපාර ආරක්ෂා කර ගැනීම සඳහා වන රක්ෂණ ආවරණවල අවශ්‍යතාව දැඩි ලෙස මතු වූ අතර, පුද්ගල ආදායම් මට්ටම් ඉහළ යාම සහ ජනවිකාස වෙනස්වීම් හමුවේ සෞඛ්‍ය සේවාවන් සඳහා වන ඉල්ලුම ද ඉහළ ගියේය. මීට සමගාමීව, කාර්මික ක්‍රියාකාරකම් සහ පරිභෝජනය වර්ධනය වීම බලශක්ති අවශ්‍යතා ඉහළ යාමට හේතු විය. සමස්තයක් ලෙස ගත් කල, මෙම ප්‍රවණතාවන් රක්ෂණ, සෞඛ්‍ය සහ බලශක්ති යන අංශයන්හි ඉල්ලුම ඉහළ නැංවීමට මඟ පෑදූ අතර, දිගුකාලීන ආර්ථික වර්ධනය සහ ස්ථාවරත්වය තහවුරු කිරීමෙහිලා එම අංශ සතු වැදගත්කම තවදුරටත් ශක්තිමත් කළේය.

මූල්‍ය විනය ශක්තිමත් කිරීම, ප්‍රතිපත්තිමය විශ්වසනීයත්වය ඉහළ නැංවීම සහ බාහිර මූල්‍යකරණය සඳහා ඇති ප්‍රවේශය තහවුරු කිරීම මඟින් මෙරට සාර්ව ආර්ථික ස්ථායීතාව නැවත ස්ථාපනය කිරීමෙහිලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) වෙතින් අඛණ්ඩව ලැබුණු සහාය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය. මීට සමගාමීව, උග්‍ර වෙමින් පැවති භූ-දේශපාලනික ආතතීන් මෙන්ම ඇමරිකා එක්සත් ජනපදය විසින් පනවනු ලැබූ වෙළඳ තීරුබදු (US trade tariffs) හමුවේ වුවද, ගෝලීය බොරතෙල් මිල ස්ථාවර මට්ටමක පැවති අතර එය පහළ යෑමේ ප්‍රවණතාවක් ද පෙන්නුම් කළේය. බලශක්ති මිල ගණන්හි දක්නට ලැබුණු මෙම මධ්‍යස්ථභාවය, උද්ධමනකාරී පීඩන පාලනය කිරීමටත්, ආනයන වියදම් අවම කිරීමටත්, ආර්ථිකය මත පැටවී තිබූ ගෙවුම් ශේෂ බර ලිහිල් කිරීමටත් බෙහෙවින් උපකාරී විය.

මෙම හිතකර සාධකයන්හි ඒකාබද්ධ බලපෑම හේතුවෙන්, පුරෝකථනය කළ හැකි නිෂ්පාදන පිරිවැය, විනිමය අනුපාතිකයේ වර්ධනය වූ ස්ථායීතාව සහ තිරසාර පාරිභෝගික විශ්වාසය මඟින් සනිටුහන් වූ සාපේක්ෂව ස්ථාවර ආර්ථික වටපිටාවක් නිර්මාණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙහෙයුම් වියදම් පහළ යෑමෙන් සහ ලාභ ආන්තික වර්ධනය වීමෙන් ආයතනික අංශය ප්‍රතිලාභ ලැබූ අතර, පුද්ගලයන්ගේ මූර්ත ආදායම් සහ මිලදී ගැනීමේ බලය ද තවදුරටත් ශක්තිමත් විය. ව්‍යාපාර සහ ගෘහස්ථ යන අංශ දෙකෙහිම ඉපැයීම්වල දක්නට ලැබුණු මෙම ප්‍රගතිය, ඉහළ ඉතුරුම් අනුපාත, වර්ධනය වූ පරිභෝජනය සහ ආයෝජන සඳහා වූ ඉහළ ධාරිතාවක් බවට පරිවර්තනය විය.

එලෙසම, ප්‍රතිපත්තිමය සහාය, හිතකර බාහිර සාධක සහ සාර්ව ආර්ථික ස්ථායීතාව යන සියල්ලේ සංකලනය වඩාත් ආකර්ෂණීය ආයෝජන පරිසරයක් පෝෂණය කිරීමට සමත් විය. මෙලෙස ඉපැයීම් පිළිබඳ පුරෝකථනය කිරීමේ හැකියාව ඉහළ යෑම සහ ආර්ථික අවිනිශ්චිතතාවයන් අවම වීම, දේශීය මෙන්ම විදේශීය ආයෝජකයින් දිරිමත් කිරීමට හේතු වූ අතර, එමඟින් ප්‍රාග්ධන සම්පාදනය ශක්තිමත් කරමින් සමස්ත ආර්ථික වර්ධනය තවදුරටත් වේගවත් කරන ලදී.

දේශගුණික විපර්යාසයන්හි බලපෑම

මෙරට ඉතිහාසයේ වාර්තා වූ වඩාත්ම විනාශකාරී ස්වාභාවික ව්‍යසනයන්ගෙන් එකක් වන "දිට්වා" (Ditwah) සුළි කුණාටුව, දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක 25 ම වෙලාගනිමින් දැඩි විනාශයක් සිදු කළේය. මෙහි සමස්ත ආර්ථික බලපෑම ඇමරිකානු ඩොලර් බිලියන 4.1 ක් ලෙස පුරෝකථනය කර ඇති අතර, එය 2024 වසරේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් (GDP) සියයට 4 කට ආසන්න ප්‍රමාණයකි. මෙමඟින් සිදු වූ දේපළ හා නිෂ්පාදන හානි හේතුවෙන් කෘෂිකර්මාන්තය, නිවාස සහ යටිතල පහසුකම් යන අංශ වෙත සැලකිය යුතු මට්ටමේ බලපෑමක් එල්ල විය. මෙම තත්ත්වය හමුවේ, රක්ෂණ ක්ෂේත්‍රය වෙතින් ඉදිරිපත් වූ සමස්ත හිමිකම් පෑම්වල වටිනාකම රුපියල් බිලියන 58.5 ක් පමණ විය. කෙසේ වෙතත්, රුපියල් බිලියන 986.46 ක් ලෙස තක්සේරු කරන ලද සමස්ත භෞතික හානිවල වටිනාකම සමඟ සංසන්දනය කිරීමේදී, රක්ෂණාවරණ මඟින් ආවරණය වී තිබුණේ සමස්ත අලාභයෙන් සියයට 6 කට ආසන්න සුළු ප්‍රතිශතයක් පමණක් වන අතර, ඉතිරි සියයට 94 කට වඩා වැඩි ප්‍රමාණයක් පැවතියේ රක්ෂණය නොකළ මට්ටමකය.

2026 වසර සඳහා ආර්ථික ඉදිරි දැක්ම

පසුගිය වසර දෙකක කාලය පුරා ක්‍රියාත්මක කරන ලද සාර්ව ආර්ථික ස්ථායීකරණ වැඩපිළිවෙළ සමඟ ඒකාබද්ධ වූ අඛණ්ඩ මූල්‍ය ඒකාබද්ධතාව, පරිභෝජන වර්ධනය, සංචාරක ඉපැයීම් සහ විදේශ ප්‍රේෂණ මඟින් මෙහෙයවනු ලබන මධ්‍යස්ථ ආර්ථික පුනර්ජීවනයක් කරා මඟ පාදනු ඇතැයි අපේක්ෂා කෙරේ. එමඟින් 2026 වසරේදී පරීක්ෂාකාරී මෙන්ම සුභවාදී ආර්ථික වර්ධනයක් ළඟා කර ගත හැකි වනු ඇත. කෙසේ වෙතත්, අර්බුදයට පෙර පැවති දළ දේශීය නිෂ්පාදිතයේ (GDP) සහ ඒක පුද්ගල ආදායම් වර්ධන මට්ටම් කරා වේගයෙන් ළඟා වීම (rapid convergence) සඳහා වඩාත් ශක්තිමත් පෞද්ගලික අංශයේ ආයෝජන සහ අපනයන විවිධාංගීකරණය අත්‍යවශ්‍ය වේ. මීට සමගාමීව රාජ්‍ය ආදායම් උත්පාදනය ද සමඟින්, ප්‍රතිපත්තිමය විශ්වසනීයත්වය සහ ප්‍රතිසංස්කරණ නිසි ලෙස ක්‍රියාත්මක කිරීම, ආර්ථිකයේ ක්‍රමානුකූල මෙන්ම ස්ථාවර ගමන්තාවක් පවත්වා ගැනීම සඳහා වන ප්‍රධාන නිර්ණායක වේ.

රජයේ ණය සේවාකරණ කටයුතු මධ්‍යයේ, අනාගත ආර්ථික වර්ධනය කළමනාකරණය කිරීමෙහිලා 'දිට්වා' සුළි කුණාටුවෙන් පසු සිදු කෙරෙන පුනරුත්ථාපන කටයුතු තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මන්දයත්, යටිතල පහසුකම් නැවත ගොඩනැඟීම, විපතට පත් ප්‍රදේශ ස්ථාවර කිරීම, ජීවනෝපාය මාර්ග නැවත ස්ථාපනය කිරීම සහ අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා රජයේ අරමුදල් ප්‍රතිශෝධනය කරමින් වෙනතකට යොමු කිරීමට සිදු විය හැකි බැවිනි. මේ වෙනුවෙන් රජය විසින් 'ශ්‍රී ලංකාව යලි ගොඩනැඟීමේ අරමුදල' ස්ථාපිත කර ඇති අතර, එම ප්‍රයත්නයන් මෙහෙයවීම සඳහා ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරික නායකයින් සහ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් ද පත් කර ඇත.

රාජ්‍ය පාලනයේ සිදුවන ප්‍රායෝගික සාධනීය වෙනස්කම්, ශක්තිමත් මූල්‍ය පරිපාලනය සහ ස්ථාවර ප්‍රතිපත්තිමය මඟපෙන්වීම් මධ්‍යයේ, විවිධ ආර්ථික වටපිටාවන් සාර්ථකව ජයගනිමින් පෞද්ගලික අංශයේ සක්‍රීය දායකත්වය සමඟින්, ක්‍රමානුකූල එහෙත් තිරසාර ලෙස වර්ධනය වන ආර්ථික උන්නතියක් ඉදිරි වසර තුළ අපගේ අපේක්ෂාවයි.

4TH FULL PROOF



කාර්යසාධන සහ ව්‍යාපාරික සමාලෝචනය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්

ජීවිත සුරක්ෂිත කිරීම, සෞඛ්‍ය ආවරණය ශක්තිමත් කිරීම සහ පවුල් හා ගෘහ ඒකක වල ආර්ථික ස්ථාවරත්වයට අත්වැලක් වන කාලානුරූපී ප්‍රතිලාභ ගෙවීම් ලබාදෙමින්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් (SLICLL) තවත් සාර්ථක වසරක් සාර්ථක ලෙස නිමාවට පත් කළේය.

ව්‍යාපාරික සමාලෝචනය

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ජීවිත රක්ෂණකරු ලෙස දශක හයකට අධික ප්‍රෞඩ උරුමයකට හිමිකම් කියන SLICLL ආයතනය, 2024 වසරේ සිදු වූ ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසුව සිය ව්‍යාපාර කළඹ තවදුරටත් ශක්තිමත් කර ගත්තේය. එහිදී, අනපේක්ෂිත හදිසි අවස්ථාවන්හිදී තම ආදරණීයයන්ගේ ජීවනෝපාය සුරක්ෂිත කර ගැනීම සඳහා මහජනතාව මෙම සුවිශේෂී අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගන්නා බව සහතික කරනු වස්, ජීවිත රක්ෂණය පිළිබඳ පණිවිඩය ව්‍යාප්ත කිරීම කෙරෙහි සමාගම දැඩි අවධානයක් යොමු කළේය. 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ දිගුකාලීන ජීවිත රක්ෂණකරුවෙකු ලෙස ක්‍රියාත්මක වන මෙම සමාගමේ ලාභය, මහා භාණ්ඩාගාරය හරහා ජාතික සංවර්ධන ව්‍යාපෘති වෙත යොමු කෙරේ. එමඟින් රක්ෂණ ඔප්පුහිමියන් ද ජාතික ආර්ථික ස්ථාවරත්වයේ සක්‍රීය හවුල්කරුවන් බවට පත් වෙයි.

මෙහෙයුම් ක්‍රියාවලිය

තිරසාර වර්ධනය සහ මූල්‍ය ප්‍රවේශ්‍යතාව පිළිබඳ දැඩි කැපවීමකින් යුතුව ක්‍රියා කරන SLICLL, නාගරික මෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන, ප්‍රමාණවත් සේවාවන් නොලබන ප්‍රජාවන් වෙත සහනදායී සහ සියලු දෙනා ඇතුළත් කරගත් රක්ෂණ නිෂ්පාදන පිරිනැමීම සඳහා සෘජු මෙන්ම ඩිජිටල් මාධ්‍ය ඔස්සේ සිය සේවා ව්‍යාප්තිය පුළුල් කළේය. සමාගම සිය හිමිකම් පියවීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට සහ පාරිභෝගික සන්නිවේදනය ශක්තිමත් කිරීමට අඛණ්ඩව කටයුතු කළේය. බහු-මාධ්‍ය සේවා සම්බන්ධතා ස්ථාන (Omnichannel Touchpoints) හේතුවෙන් පාරිභෝගිකයින්ට තම නිවෙස්වල සිටම රක්ෂණ නිෂ්පාදන පරිශීලනය කිරීමට අවස්ථාව ලැබුණු අතර, ඩිජිටල් ද්වාර (Digital Portals) හරහා වාරික මුදල් ගෙවීමට පහසුකම් සැලසීම හේතුවෙන් රක්ෂණ ඔප්පු අහෝසි වීමේ අනුපාතිකය අවම කර ගැනීමට ද හැකි විය.

කිසිදු වෙනස්කොට සැලකීමකින් තොරව, අන්‍යෝන්‍ය විශ්වාසය සහ ගෞරවය පෙරදැරි කරගනිමින් කටයුතු කිරීමට සමාගම සිය සේවකයින් පුහුණු කරන අතර, සෑම පාරිභෝගික සන්නිවේදනයකදීම වගවීම සඳහා ඔවුන් බැඳී සිටී. කණ්ඩායම් හැඟීම, වෘත්තීය කැපවීම සහ විශිෂ්ටත්වය කරා ලඟාවීමේ අභිප්‍රාය සමාගමේ නොවෙනස් වන ලක්ෂණයක් වන අතර, සේවකයින්ගේ පෞද්ගලික සංවර්ධනය සහ වෘත්තීය අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීම සඳහා අන්‍යෝන්‍ය සහයෝගීතාව සහ අනුග්‍රහය නිරන්තරයෙන් හිමිවේ. රක්ෂණ ක්ෂේත්‍රයේ සහ සමාගමේ නීති රීති හා රෙගුලාසි දැඩි ලෙස පිළිපදිමින්, SLICLL හි අභිප්‍රේරිත කාර්ය මණ්ඩලය සියලු පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් අඛණ්ඩව සපුරාලීමට සහ ඒවා ඉක්මවා යාමට සමත්ව ඇත.

මෙහෙයුම් ප්‍රතිඵල

සමාගම රුපියල් බිලියන 60.8 ක මුළු ආදායමක් උපයා ඇති අතර, එහි දළ ලිඛිත රක්ෂණ වාරිකය රුපියල් බිලියන 32.6 ක් ද, ශුද්ධ උපචිත රක්ෂණ වාරිකය රුපියල් බිලියන 31.3 ක් ද විය. එසේම, බදු පසු ලාභය රුපියල් බිලියන 2.3 ක් ලෙස වාර්තා විය. මීට අමතරව, සමාගම සිය ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය 523% ක් දක්වා ඉහළ නංවා ගැනීමට සමත් වූ අතර, ජීවිත රක්ෂණ අරමුදල රුපියල් බිලියන 246.9 ක මට්ටමකට ළඟා විය.

අනාගත අපේක්ෂා

මෙතෙක් අවධානයට ලක්නොවූ ජීවිත රක්ෂණ වෙළඳපොළ කොටස් වෙත අඛණ්ඩව ළඟා වීමට SLICLL අපේක්ෂා කරන අතර, එක් එක් පුද්ගලයාගේ අවශ්‍යතා සහ ජීවන චක්‍ර තේරීම්වලට අනුරූප වන පුළුල් නිෂ්පාදන පරාසයක් පිරිනැමීමට කටයුතු කරනු ඇත. සුවිශේෂී මෙන්ම සෘජු පාරිභෝගික සේවාවක් සපයන ව්‍යාපාරයක් වශයෙන්, සේවක කුසලතා නංවාලීම, නායකත්ව ගුණාංග ප්‍රගුණ කිරීම මෙන්ම, අනාගතයට සූදානම් ව්‍යාපාරයක් සහ ඉහළ අභිප්‍රේරණයකින් හා කුසලතාවයෙන් යුත් කණ්ඩායමක් බිහිකිරීම උදෙසා ඩිජිටල් පරිවර්තනයක් කරා යොමුවීම වෙනුවෙන් සමාගම ආයෝජනය කරනු ඇත.



ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්

ව්‍යාපාරික සමාලෝචනය

2025 වසරේදී සාර්ව ආර්ථිකයේ දක්නට ලැබුණු ස්ථාවර ප්‍රගතිය සහ ආනයන සීමාවන් ලිහිල් කිරීම, ආර්ථික වර්ධනය මෙන්ම රක්ෂණ සඳහා වූ ඉල්ලුම ඉහළ නැංවීමට හේතු විය. ව්‍යාපාරික වර්ධනය සහ ඔරොත්තු දීමේ හැකියාව මැනවින් සමතුලිත කරමින්, ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයක් සහ පාර්ශවකරුවන්ගේ විශ්වාසය තහවුරු කිරීමට සමාගම සමත් වූ අතර, ජාතික සංවර්ධනය උදෙසා තමන් ඉටුකරන ප්‍රමුඛ කාර්යභාරයද මෙහිදී යළිත් අවධාරණය කළේය.

රජයේ ඩිජිටල්කරණ වැඩපිළිවෙළට සමගාමීව, ඩිජිටල් තාක්ෂණික හැකියාවන් පුළුල් කිරීම, ක්‍රියාවලි විධිමත් කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව නැංවීම වෙනුවෙන් සමාගම තම ආයෝජන ප්‍රමුඛතා හැඩගස්වා ගන්නා ලදී. විශේෂිත ඉංජිනේරු කුසලතා අවශ්‍ය වන, ශීඝ්‍රයෙන් වර්ධනය වන මහා පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘතිවල නියැලී සිටින රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් (PPPs) සඳහා පුළුල් දේපළ සහ වගකීම් රක්ෂණ විසඳුම් අවශ්‍ය විය. මේ සම්බන්ධයෙන් සමාගම සතු පරිපූර්ණ නිෂ්පාදන පෙළ වෙළඳපොළ තුළ කැපී පෙනුණු අතර, එය සමාගමේ මූල්‍ය කාර්යසාධනය ශක්තිමත් කිරීමටද දායක විය.

මීට සමගාමීව, ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුවක් තුළ හිඳිමින්, සේවක කුසලතා නංවාලීම සහ ආයතනික කඩිසරකම කෙරෙහි සමාගම අවධානය යොමු කළේය. පවතින සහ අනාගත රක්ෂණ ඔප්පුහිමියන්ගේ අවශ්‍යතාවලට වගකීම් සහගත ලෙස ප්‍රතිචාර දැක්වීම උදෙසා පුනුණුව, අධ්‍යාපනය සහ නායකත්ව සංවර්ධනය වෙනුවෙන් ආයෝජනය කරමින්, අනාගතයට සූදානම් ශ්‍රම බලකායක් රඳවා ගැනීමට සමාගම කටයුතු කළේය. සමාගම සතු ස්ථාවර ප්‍රාරක්ෂණ විසඳුම් සහ ව්‍යාපාරික අඛණ්ඩතාව, මෙම ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයට මෙන්ම මෙරට සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ පෙරමුණේ රැඳී සිටීමට මහෝපකාරී විය.

මෙහෙයුම් ක්‍රියාවලිය

පාරිභෝගික අවශ්‍යතාවලට ගැළපෙන පරිදි සකස් කළ නිෂ්පාදන පෙළක් පිරිනමන අතරම, සමාගමේ ව්‍යාපාරික ක්‍රියාවලිය ප්‍රධාන වශයෙන් පදනම් වී ඇත්තේ පාර්ශවකරුවන්ගේ ප්‍රතිපෝෂණ සක්‍රීයව රැස්කරමින්, ඔවුන්ට සවන්දීම, අධ්‍යනය කිරීම සහ අඛණ්ඩව යාවත්කාලීන වීම මතය. මේ උදෙසා සමීක්ෂණ, සේවාදායක සංසද, හවුල්කාර උපදේශන සහ ඉදිරි පෙළ සේවකයින්ගේ අත්දැකීම් හා නිරීක්ෂණ ඇතුළු බහු විධ මාධ්‍යයන් භාවිත කරනු ලබයි. නිවැරදි තීරණ ගැනීමට, ප්‍රමුඛතා හඳුනා ගැනීමට, අවදානම් තක්සේරු කිරීමට මෙන්ම වැදගත්කම තීරණය කිරීමට මේවා මහෝපකාරී විය. ව්‍යාපාරික උපායමාර්ග සකස් කිරීමේදී මෙහෙයුම් සීමාවන් සහ සේවා හිඩැස් හඳුනා ගැනීමට ඩිජිටල් පරිවර්තනය මඟින් මනා සහයෝගයක් ලැබුණි.

මානව සම්පත

සමාගමේ 1,829 ක් වන සමස්ත සේවක මණ්ඩලය දිවයින පුරා විසිරුණු ශාඛා 143 ක් ඔස්සේ සේවය සපයන අතර, 2025 වසරේදී නවක සාමාජිකයින් 207 දෙනෙකු සමාගම සමඟ අලුතින් සම්බන්ධ වී ඇත. සමස්ත ශ්‍රම බලකාය තුළ කාන්තා නියෝජනය 37.9% ක් වන අතර කළමනාකරණ තනතුරු අතරින් 27.4% ක් දරනු ලබන්නේ කාන්තාවන් විසිනි. සමාගම සතු සේවක රඳවා ගැනීමේ අනුපාතය 99.2% ක ඉතා ඉහළ මට්ටමක පවතින අතර, සෑම සේවකයෙකුගේම සාමාන්‍ය සේවා කාලය වසර 12 ක් වැනි දිගු කාලයක් පැවතීම සුවිශේෂී වේ.

මෙහෙයුම් ප්‍රතිඵල

SLICGL සමාගම, 19.6% ක වර්ධනයක් සනිටුහන් කරමින් රුපියල් බිලියන 30.3 ක ඉහළම දළ උපචිත වාරික (GWP) ආදායමක් අත්පත් කර ගැනීමට සමත් වූ අතර, එමඟින් තම වෙළඳපොළ නායකත්වය තවදුරටත් තහවුරු කර ගන්නා ලදී. සමස්ත රක්ෂණ ක්ෂේත්‍රය තුළම දැඩි ප්‍රතිරාවයක් ඇති කළ මෙම ජයග්‍රහණය, 2025 වසරේදී මෙරට දළ දේශීය නිෂ්පාදිතයට (GDP) රක්ෂණ ක්ෂේත්‍රයෙන් ලැබුණු ඉහළම දායකත්වය වාර්තා කිරීමටද මහෝපකාරී විය. 20.7% ක වෙළඳපොළ කොටසක් හිමිකරගත් මෝටර් රථ රක්ෂණ ක්ෂේත්‍රය, මෙවරත් සමාගමේ ප්‍රධානතම ආදායම් උපයන්නා (Torchbearer) ලෙස පෙරමුණ ගත්තේය. මීට අමතරව, සමාගමේ ශ්‍රේෂ්ඨ පතුය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා මෝටර් රථ නොවන රක්ෂණ අංශයන්ද ඉහළ දායකත්වයක් ලබා දුන්නේය. ප්‍රධාන වශයෙන් 'දිට්වා' (Ditwah) සුළි කුණාටුව හේතුවෙන් රක්ෂණ හිමිකම් ඉල්ලීම් ප්‍රමාණය ඉහළ ගියද, සමාගමේ සමස්ත වත්කම් 25.2% කින් වර්ධනය වී රුපියල් බිලියන 64 ක් දක්වා ඉහළ ගිය අතර, ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය 120% ක සෞඛ්‍ය සම්පන්න මට්ටමක පවත්වා ගැනීමට හැකි විය. බදු පෙර ලාභය රුපියල් බිලියන 3.2 ක් ලෙසත්, බදු පසු ලාභය රුපියල් බිලියන 2.5 ක් ලෙසත් වාර්තා විය. එමෙන්ම, සමාගමේ ඒකාබද්ධ මෙහෙයුම් අනුපාතය 100% ට වඩා අඩු මට්ටමක පැවතීම, අවදානම් තක්සේරුකරණයේ පූර්ණත්වය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව මනාව තහවුරු කරයි.

ඉදිරි දැක්ම

වැඩිදියුණු කරන ලද රක්ෂණ හිමිකම් අත්දැකීම් ඔස්සේ තිරසාර ප්‍රාරක්ෂණ ලාභදායිතාවයක් (Underwriting profitability) ළඟා කර ගැනීමට සමාගම අඛණ්ඩව කටයුතු කරන අතර, ව්‍යාපාරික ක්‍රියාවලීන් සරල කිරීම කෙරෙහි නිරන්තරයෙන් අවධානය යොමු කරනු ඇත. සමස්ත ව්‍යාපාරික සහ අවදානම් තක්සේරුකරණ කටයුතු පුරා දත්ත මත පදනම් වූ තීරණ ගැනීමේ සංස්කෘතිය අඛණ්ඩව කා වද්දමින්, ඩිජිටල් පරිවර්තන ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කරනු ඇත. ජාතික රක්ෂණකරු වශයෙන් අපෙන් අපේක්ෂා කරන මූල්‍ය ශක්තිය සහ විශ්වසනීයත්වය රැකගැනීම, ප්‍රාග්ධන ඔරොත්තු දීමේ හැකියාව සහ දිගුකාලීන රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂාව තහවුරු කරන ප්‍රධානතම කේන්ද්‍රස්ථානය (Pivot point) වනු ඇත. මේ හරහා, අනාගත සුරක්ෂිතතාව වෙනුවෙන් රක්ෂණයේ ඇති සුවිශේෂී මෙන්ම විවිධ වූ ප්‍රතිලාභ (Myriad aspects) සමාජගත කරමින්, ජාතික ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම උදෙසා සමාගම පෙරමුණ ගෙන කටයුතු කරනු ඇත.



ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ්

ශ්‍රී ලංකාවේ විශාලතම එල්පී ගෑස් (LPG) සැපයුම්කරු වන ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් (LGLL හෝ සමාගම ලෙස මෙහි සඳහන් කර ඇති), දිවයින පුරා විහිදුණු අලෙවි නියෝජිතයන් සහ නිවසටම බෙදා හැරීමේ පුළුල් ජාලය ඔස්සේ, ඇස්තමේන්තුගත නිවාස මිලියන 4.5 කට අධික සංඛ්‍යාවකට සේවා සපයයි. රජය සතු ප්‍රමුඛ බලශක්ති සමාගමක් වන ලිට්‍රෝ, නේවාසික, වාණිජ මෙන්ම කාර්මික අවශ්‍යතා සඳහා අවශ්‍ය එල්පී ගෑස් නිෂ්පාදනය, ආනයනය සහ බෙදා හැරීමේ සමස්ත ක්‍රියාවලියම මෙහෙයවනු ලබයි.

ව්‍යාපාරික ක්‍රියාකාරිත්වය

2025 වසර පුරාම ලිට්‍රෝ සමාගම සිය ශක්තිමත් මෙහෙයුම් ධාරිතාව සහ සැපයුම් දාමයේ ඔරොත්තු දීමේ හැකියාව මැනවින් ප්‍රදර්ශනය කළේය. එහිදී කෙරවලපිටිය එල්පී ගෑස් (LPG) ගබඩා සංකීර්ණයේ ඇති, එක් එකක් මෙට්‍රික් ටොන් 2,000 බැගින් වූ ගෝලාකාර ටැංකි හතරෙහිම සමස්ත ධාරිතාව 100% ක් හෝ ඊට වැඩි මට්ටමකින් භාවිතයට ගැනීමට සමාගම සමත් විය. ඒ අනුව, එම පර්යන්තය සතු මෙට්‍රික් ටොන් 8,000 ක සමස්ත ගබඩා ධාරිතාව 2025 වසරේදී උපරිම ලෙස සක්‍රීයව පැවතුණි. ආනයනය කිරීම, සැකසීම, ගබඩා කිරීම සහ දිවයින පුරා බෙදා හැරීම දක්වා විහිදෙන මෙම ශක්තිමත් අගය දාමය, දේශීය, වාණිජ මෙන්ම කාර්මික ක්ෂේත්‍රයන් ද ආවරණය කරමින් ශ්‍රී ලංකාව පුරා අඛණ්ඩ සැපයුමක් තහවුරු කරයි.

සමාගමේ අඛණ්ඩ යටිතල පහසුකම් සංවර්ධනය සහ නවීකරණ කටයුතු මැනවින් පිළිබිඹු කරමින්, 2025 වසර අවසානය වන විට රුපියල් මිලියන 341.32 ක ප්‍රාග්ධන වත්කම් කටයුතු ක්‍රියාත්මක වෙමින් පැවතුණි. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 15 (SLFRS 15) යටතේ ප්‍රවාහන හා බෙදාහැරීමේ කටයුතු (Logistics & Delivery) භාණ්ඩ හෝ සේවා සැපයීමේ අනිවාර්ය අංගයක් ලෙස ඇතුළත් කර ඇති බැවින්, ඒ වෙනුවෙන් අයකර ගන්නා ලද ගාස්තු දැන් සෘජුවම ආදායම ලෙස හඳුනා ගැනේ. මෙමගින් අදාළ ගිණුම්කරණ පිළිවෙත, ලිට්‍රෝ සමාගමේ (LGLL) ඒකාබද්ධ බෙදාහැරීමේ ආකෘතිය සමඟ සමපාත වන අතර, එහි සේවා සැපයුම් ක්‍රියාවලියේ වාණිජ සහ මෙහෙයුම් සහසම්බන්ධතාව තවදුරටත් ශක්තිමත් කරයි.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම එල්පී ගෑස් (LPG) ආනයන හා අපනයන ආයතනය ලෙස, රටේ සමස්ත එල්පී ගෑස් ජී අවශ්‍යතාවයෙන් 80% කට අධික ඇස්තමේන්තුගත වෙළෙඳපොළ ප්‍රතිශතයක් නතු කර ගැනීමට සමාගම සමත්ව ඇත.

කාර්යපටිපාටිය

සැපයුම් අඛණ්ඩතාව රඳා පවතින්නේ, කිසිදු අනපේක්ෂිත බාධාවකින් තොරව පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම සහතික කිරීම උදෙසා, විවිධ ප්‍රධාන සාධක රාශියක් මනාව සම්බන්ධීකරණය වූ ශක්තිමත් කාර්ය පටිපාටියක් මතය.

මිලකරණය

විවිධාකාර ගෝලීය මිල අස්ථාවරත්වයන්ගෙන් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීමට සමත් පාරිභෝගික කේන්ද්‍රීය මිලකරණ උපාය මාර්ගයක් සමාගම සතුව ඇත. විශේෂයෙන්ම භූ දේශපාලනික කම්පන, ආරක්ෂක අවදානම්, නැව්ගත කිරීමේ සහ රක්ෂණ සේවා අඩාල වීම් මෙන්ම අහිතකර කාලගුණික තත්ත්වයන් (අධික ශීතල හෝ දැඩි වියළි කාලගුණය) නිසා සෘතුමය වශයෙන් ඉල්ලුමෙහි ඇති වන වෙනස්වීම්වලින් පාරිභෝගිකයා මුදා ගැනීමට මෙමගින් මනා පිටිවහලක් ලැබේ.

සෞඛ්‍යය සහ ආරක්ෂාව

සමාගම සතු ගබඩා ටැංකි, නල මාර්ග සහ පොම්පාගාර අනිවාර්යයෙන්ම කලින් කලට නැවත පරීක්ෂාවට හා ඇගයීමට ලක් කිරීම (Periodic Requalification) හරහා මෙහෙයුම්වල සුරක්ෂිතභාවය සහ නීතිමය ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට ලිට්‍රෝ සමාගම කැපවී කටයුතු කරයි. මෙම ක්‍රමානුකූල පරීක්ෂණ සහ සහතික කිරීමේ ක්‍රියාවලිය විධිමත් පියවර, සේවක පුහුණුව සහ සජීවී අධීක්ෂණය මත පදනම් වන බැවින්, අනතුරු සිදුවීමේ ඉඩකඩ බෙහෙවින් අවම වේ. අවසාන වශයෙන් මෙමගින් සේවක මණ්ඩලය, අවට ප්‍රජාව සහ සමස්ත වත්කම් ආරක්ෂා කරන ශක්තිමත් වැළැක්වීමේ ක්‍රමවේදයක් ගොඩනැඟේ. එබැවින්, රට පුරා විහිදුණු මෙම සංකීර්ණ මෙහෙයුම් පද්ධතිය ක්‍රමවත්ව පාලනය කිරීම සඳහා ආරක්ෂණ කළමනාකරණය අතිශයින්ම වැදගත් වේ.

වත්කම් අඛණ්ඩතාව උපායමාර්ගික ප්‍රමුඛතාවයක් ලෙස සලකනු ලබන අතර, එහිදී සාර්ථකව ප්‍රති-සුදුසුකම් ලබන උපකරණ නැවත ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ දැඩි ආරක්ෂණ සහ කාර්ය සාධන පරීක්ෂණවලින් සමත් වීමෙන් පසුව පමණි. එලෙසම, එම පරීක්ෂණ අසාර්ථක වන වත්කම් භාවිතයෙන් ඉවත් කර, යළි සකස් කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම සිදු කරනු ලබයි. පූර්ව ආරක්ෂණ නඩත්තු කටයුතු, තත්ත්වයන් මත පදනම් වූ මැදිහත්වීම් සහ ඉලක්කගත ප්‍රාග්ධන ආයෝජන ඒකාබද්ධ කෙරෙන මෙම විනයගරුක ජීවන චක්‍ර ප්‍රවේශය මගින්, දිගුකාලීන විශ්වසනීයත්වය තහවුරු වන අතර සැලසුම් නොකළ බිඳවැටීම් අවම කර සමාගමේ බෙදාහැරීමේ යටිතල පහසුකම් කෙරෙහි පාර්ශවකරුවන් තබා ඇති විශ්වාසය තවදුරටත් ශක්තිමත් කරයි.

සමාගම විසින් වත්කම්වල ගුණාත්මක ස්ථාවරත්වය සැමවිටම උපායමාර්ගික ප්‍රමුඛතාවයක් ලෙස සලකනු ලබයි. එහිදී, නැවත සහතික කිරීමේ පරීක්ෂණවලින් සාර්ථක වන උපකරණ පමණක් දැඩි ආරක්ෂණ සහ කාර්ය සාධන ඇගයීම්වලින් පසුව නැවත ප්‍රාග්ධන වත්කම් ලෙස එක් කරගන්නා අතර, අසාර්ථක වන වත්කම් භාවිතයෙන් ඉවත් කර අලුත්වැඩියා කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම සිදු කෙරේ. පූර්ව ආරක්ෂණ නඩත්තු කටයුතු, වත්කම්වල පවතින තත්ත්වයන් මත පදනම් වූ මැදිහත්වීම් සහ ඉලක්කගත ප්‍රාග්ධන ආයෝජන මනාව ඒකාබද්ධ කෙරෙන මෙම විනයගරුක ජීවන චක්‍ර ප්‍රවේශය මගින්, දිගුකාලීන විශ්වසනීයත්වය සහතික කෙරේ. එමෙන්ම, මෙමගින් සැලසුම් නොකළ බිඳවැටීම් අවම වන අතර, සමාගමේ බෙදාහැරීමේ යටිතල පහසුකම් කෙරෙහි පාර්ශවකරුවන් තබා ඇති විශ්වාසය තවදුරටත් ශක්තිමත් කරනු ලබයි.

ලිට්‍රෝ ගෑස් සමාගම සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳව දැඩි කැපවීමක් පෙන්වන අතර, එය මහජන විශ්වාසය මත බෙහෙවින් රඳා පවතී. සමාගම තුළ ශක්තිමත් ආරක්ෂණ සංස්කෘතියක් පැවතීම නිසා අනතුරු අවම වන අතර, පාරිසරික බලපෑම් අවම කරමින් වත්කම් ආරක්ෂා කිරීමටත්, දිගුකාලීන බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කිරීමටත් මනා පිටිවහලක් ලැබේ.

නියාමන අනුකූලතාව

සැපයුම් අඛණ්ඩතාව සුරක්ෂිත කිරීම, පිරිවැය කාර්යක්ෂමතාව උපරිම කිරීම සහ ආරක්ෂාව මෙන්ම නියාමන ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සඳහා, රජයේ ප්‍රසම්පාදන නීතිරීතිවලට අනුකූලවන පරිදි දැඩි පාලනයක් සහිතව සමාගමේ ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරේ.

2007 අංක 07 දරන සමාගම් පනත සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සපුරා අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කෙරෙන අතර, ආයතනයේ මූල්‍ය වාර්තාකරණය සහ ආයතනික පාලන (Corporate Governance) කුළුණු, ශක්තිමත් අනුකූලතා රාමුවක් මත පදනම්ව ඇත. මෙම විනයගරුක ප්‍රවේශය, ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධති, ස්වාධීන විගණන අධීක්ෂණය සහ විධිමත් හෙළිදරව් කිරීමේ පිළිවෙත් මගින් තවදුරටත් තහවුරු කෙරේ. එමගින් කොටස් හිමියන්, නියාමන ආයතන සහ අනෙකුත් සියලුම පාර්ශවකරුවන් වෙනුවෙන් මූල්‍ය දත්තවල නිරවද්‍යතාව, නියාමන අනුකූලතාව මෙන්ම විනිවිදභාවය ද සහතික කරනු ලබයි.

සමාගමේ අඛණ්ඩ මෙහෙයුම් ක්‍රියාවලිය, උපායමාර්ගිකව වැදගත් වන ව්‍යාපාරික කොන්ත්‍රාත්තු සමූදායක් මත රඳා පවතී. ද්‍රවීකෘත පෙට්‍රෝලියම් ගෑස් සැපයුම, සිලින්ඩර සැපයුම, වත්කම්වල තත්ත්වය මත පදනම් වූ අධීක්ෂණය සහ දිය යට නඩත්තු කටයුතු, මිනිස්බල සැපයුම මෙන්ම සිලින්ඩර කපාට සැපයුම ඒ අතර වේ. මේ සෑම ගිවිසුමක්ම පැහැදිලි කාර්ය සාධන දර්ශක, අවදානම් බෙදාගැනීමේ වගන්ති සහ අනුකූලතා අවශ්‍යතාවලින් සමන්විත වේ. මෙම ගිවිසුම් මගින් තිරණාත්මක යෙදවුම් සහ සේවාවන් සුරක්ෂිත කරන අතර, සැපයුම්කරුවන් සක්‍රීයව කළමනාකරණය කිරීමටත් නඩත්තු පද්ධතිය ක්‍රමවත්ව පවත්වාගෙන යාමටත් ඉඩ සලසයි. මෙම ගිවිසුම්ගත යාන්ත්‍රණයන් සමස්ත වටිනාකම් දාමය පුරා සැපයුම් විශ්වසනීයත්වය, පිරිවැය කාර්යක්ෂමතාව සහ ආරක්ෂාව ද තහවුරු කරනු ලබයි.

අවදානම් අවම කිරීම

විදේශ විනිමය අවදානම - ආනයන පිරිවැය පියවීම සඳහා අවශ්‍ය විදේශ මුදල් රැස් කර තබා ගැනීමට සමාගම විසින් විශේෂ විදේශ විනිමය ගිණුමක් ක්‍රියාත්මක කරනු ලබයි. එහිදී, විනිමය අලාභයන් අවම වන පරිදි ගෙවීම් පියවීම සඳහා දිනකට ඇමරිකානු ඩොලර් මිලියන 1ක් දක්වා වටිනාකමකින් යුත් තොග මිලදී ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමිව ඇත. මෙම දෛනික ප්‍රතිසන්ධාන යාන්ත්‍රණය සැලසුම් කර ඇත්තේ, වෙළෙඳපොළ බලපෑම් අවම කිරීමට සහ විදේශ විනිමය අනුපාතවල නිතර සිදුවන උච්චාවචනයන්ට නිරාවරණය වීම වැළැක්වීමටය.

ද්‍රවශීලතා අවදානම අවම කරනු ලබන්නේ, 2025 වසරේදී රුපියල් බිලියන 21.28ක් දක්වා ඉහළ අගයක් ගත් මුදල් සහ කෙටි කාලීන තැන්පතු ප්‍රමාණවත් මට්ටමකින් පවත්වාගෙන යාමෙනි. එලෙසම, ණය අවදානම කළමනාකරණය කරනු ලබන්නේ පාරිභෝගිකයන් සඳහා දැඩි ණය සීමාවන් පැනවීම සහ ඉහළ ණය ශ්‍රේණිගත කිරීම් සහිත මූල්‍ය ආයතන අතර තැන්පතු විවිධාංගීකරණය කිරීම (බෙදා හැරීම) මගිනි.

සැපයුම් අවදානම් කළමනාකරණය ප්‍රධාන වශයෙන් පදනම් වී ඇත්තේ, සමාගම සිය සැපයුම් දාමය සමඟ අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන ශක්තිමත් සබඳතා මතය. එම සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමට සහ නංවාලීමට සමාගම නිරන්තරයෙන්ම සමීප අධීක්ෂණයකින් යුතුව කටයුතු කරනු ලබයි.

මානව සම්පත්

සමාගම දැනට ස්ථිර සේවකයන් 193 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් සේවයේ යොදවා ඇති අතර, නව බඳවා ගැනීම් සිදු කරනු ලබන්නේ ආයතනික අවශ්‍යතා මත පදනම්ව පමණි. එලෙස බඳවා ගන්නා සේවකයන් රාජකාරි සඳහා අනුයුක්ත කිරීමට පෙර, ඔවුන් වෙත විධිමත් පුහුණුවක් සහ කුසලතා වර්ධනය කිරීමේ වැඩසටහන් ලබා දීමට සමාගම පියවර ගනු ලබයි.

ප්‍රතිඵල

2025 වසර සඳහා නියම කර තිබූ අපේක්ෂිත ප්‍රතිඵල සහ අරමුණු සාර්ථකව ළඟා කර ගැනීමට සමාගම සමත් විය.

කාර්ය සාධන සංක්ෂිප්තය

ද්‍රවීකෘත පෙට්‍රෝලියම් ගෑස් විකුණුම් පරිමාව සියයට 5.3 කින් වර්ධනය වීම සහ විනයගරුක මිල කළමනාකරණය හේතුවෙන් සමාගම ඉතා ශක්තිමත් මූල්‍ය කාර්ය සාධනයක් අත්කර ගැනීමට සමත් විය. ඒ අනුව, පෙර වසරට සාපේක්ෂව සියයට 6.4 ක වර්ධනයක් පෙන්නුම් කරමින්, රුපියල් බිලියන 94.57 ක ආදායමක් වාර්තා කිරීමට සමාගමට හැකි විය. ඉහළ විකුණුම් මට්ටම මෙන්ම ඵලදායී පිරිවැය සහ ආන්තික පාලන ක්‍රමවේදයන් මැනවින් පිළිබිඹු කරමින් සමාගමේ ලාභදායීතාව ද කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. එහිදී 2024 වසරේ රුපියල් බිලියන 2.25 ක් වූ ශුද්ධ ලාභය, 2025 වසරේදී රුපියල් බිලියන 5.52 ක් දක්වා කැපී පෙනෙන ලෙස වර්ධනය වී ඇත.

ආදායම් සංයුතිය


එල්.පී. ගෑස් අලෙවිය **රු.බි. 90.07**	සිලින්ඩර් ඇතුළු කිරීම සහ හැසිරැවීමේ ගාස්තු **රු.බි. 2.84**
බෙදාහැරීමේ ගාස්තු **රු.බි. 1.36**	ස්ථානගතකිරීම් සහ නඩත්තු **රු.මි. 176.73**
සවිකිරීම් සහ අමතර කොටස් **රු.මි. 123.11**	සිල්ලර ඉන්ධන (අධිවේගීමාර්ග පිරවුම් මධ්‍යස්ථානය) **රු.මි. 8.84**

ආදායම් සංයුතිය

සමාගමේ සමස්ත ආදායම ප්‍රධාන වශයෙන්ම උත්පාදනය වන්නේ දේශීය ද්‍රවීකෘත පෙට්‍රෝලියම් ගෑස් අලෙවියෙනි. ස්ථාවර ගෘහස්ථ පරිභෝජන පරිමාවන් සහ සිල්ලර සිලින්ඩර බෙදාහැරීමේ පුළුල් ජාලය හේතුවෙන්, සමස්ත ආදායමෙහි විශාලතම කොටස සතු කර ගැනීමට එය සමත්ව ඇත. මීට අමතරව, වාණිජ හා කාර්මික අංශ වෙත සිදුකරන තොග විකුණුම් මෙන්ම පර්යන්ත සහ ප්‍රවාහන සේවාවන් හරහා ද සැලකිය යුතු ද්විතීයික ආදායමක් උපයා ගනු ලබයි. සමාගමේ ඒකාබද්ධ ආනයන, ගබඩා සහ බෙදාහැරීමේ ආකෘතිය මැනවින් පිළිබිඹු කරමින්, අයකර ගන්නා ලද බෙදාහැරීමේ ගාස්තු ද දැන් ඍජුවම සමාගම් ආදායම ලෙස හඳුනා ගනේ.

මූල්‍ය තත්ත්වය

ඍජු පිරිවැයට පසු මෙහෙයුම් ලාභදායීත්වය මැනවින් ඉස්මතු කරමින්, රුපියල් බිලියන 10.49 ක දළ ලාභයක් (දළ ලාභ ආන්තිකය සියයට ඍණ 11.1 කි) සහ රුපියල් බිලියන 6.58 ක මෙහෙයුම් ලාභයක් සමඟින් ලිට්‍රෝ සමාගම ස්ථාවර මූල්‍ය ශක්තියක් ප්‍රදර්ශනය කර ඇත. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ශක්තිමත්භාවය, කැපී පෙනෙන ලෙස වැඩිදියුණු වූ මුදල් සංචිත තුළින් මැනවින් පැහැදිලි වන අතර, එහිදී ද්‍රවශීල වත්කම් රුපියල් බිලියන 21.28 දක්වා ඉහළ ගොස් ඇත. එමෙන්ම, සමාගම සතු තොග වටිනාකම රුපියල් බිලියන 4.15 ක් ලෙස පැවතීම, බෙදාහැරීමේ අඛණ්ඩතාව සහ කෙටි කාලීන මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධන ආවරණයක් සපයයි.



ඉදිරි දැක්ම

පර්යන්ත ධාරිතාව ඉහළ නැංවීම සහ බෙදාහැරීමේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම උදෙසා සිදු කරනු ලබන ප්‍රාග්ධන ආයෝජන, 2026 වසරේදී සමාගම මූලික වශයෙන් අවධානය යොමු කරන උපායමාර්ගික ප්‍රමුඛතාවන් වේ.

ඔක්සිජන් සිලින්ඩර සඳහා ගෙවන ලද රුපියල් මිලියන 20.0 ක අත්තිකාරම් මුදලකට බලපාන පරිදි පවතින නඩු කටයුතු, 2026 වසරේදී විසඳෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. සමාගම මෙම නඩු විභාගයන්හි ප්‍රගතිය සක්‍රීයව නිරීක්ෂණය කරමින් සිටින අතර, අවසාන අධිකරණ තීන්දුව ලැබෙන තෙක් ඊට ගැළපෙන පරිදි මූල්‍ය ප්‍රකාශන තුළ අවශ්‍ය ප්‍රතිපාදන සලසා ඇත.

කැන්විල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම සතු කොටස් අයිතිය විකිණීමෙන් මහා භාණ්ඩාගාරයෙන් සමාගමට ලැබිය යුතු, රුපියල් බිලියන 5.0 ක් වූ ජංගම නොවන ලැබීම් සාර්ථකව අයකර ගැනීමට හැකි වනු ඇතැයි අප පූර්ණ විශ්වාසයකින් පසුවෙමු. සැලකිය යුතු මූල්‍ය වත්කමක් නිරූපණය කරන මෙම මුදල, එකඟ වූ පියවීම් කොන්දේසි යටතේ අයකර ගැනීමෙන් පසු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දීර්ඝකාලීන හිමිකම් පෑමක් ලෙස පිළිබිඹු වනු ඇත.

→

ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (LTLL) 2010 වසරේදී පිහිටුවන ලද්දේ, පෙර පැවති ෂෙල් (Shell) සමාගමට අයත්ව තිබූ කෙරවලපිටිය ද්‍රවීකෘත පෙට්‍රෝලියම් ගෑස් (LPG) ගබඩා පර්යන්තය අත්පත් කර ගැනීමෙන් පසුවය.

ව්‍යාපාරික ස්වභාවය

මෙය මෙට්‍රික් ටොන් 2,000 බැගින් වූ ගෝලාකාර LPG ගබඩා ටැංකි හරහා සමස්තයක් ලෙස ටොන් 8,000 ක ධාරිතාවයකින් යුත් පර්යන්තයක් ක්‍රියාත්මක කරන, රටේ ප්‍රධානතම ජාතික LPG ගබඩා සහ සමුද්‍රීය බෑමේ මධ්‍යස්ථානය වෙයි. රට තුළ අඛණ්ඩ ගෑස් සැපයුමක් සහතික කරනු වස්, ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් (LGLL) වෙනුවෙන් LPG ආරක්ෂිතව ගබඩා කිරීම සහ සිලින්ඩර පිරවීම ඇතුළු තොග ගබඩාකරණ සහ පසු-අන්ත තාක්ෂණික සේවාවන් (Back-end technical services) සැපයීම මෙහි මූලික අරමුණයි. විශාල නෞකා මඟින් රැගෙන එන ගෑස් තොග සෘජුවම අක්වෙරළේදී (Offshore) බාර ගැනීමට මෙම පර්යන්තයට ඇති හැකියාව හේතුවෙන් සැපයුම ස්ථාවර කිරීමටත්, සැපයුම් දාමයේ ඇති වන බාධාවන් (Logistical bottlenecks) අවම කිරීමටත් හැකි වන අතර, එමඟින් එහි සහෝදර සමාගම වන ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් මෙහෙයවන සිල්ලර බෙදාහැරීමේ ජාලයට මනා දායකත්වයක් ලැබේ.

මෙහෙයුම් ක්‍රියාවලියි

පැය 24ක් වැනි කෙටි කාලයක් තුළ මෙට්‍රික් ටොන් 4,000 ක LPG ප්‍රමාණයක් ගොඩබෑම් කළ හැකි “සාම්ප්‍රදායික බෝයි මූරිං” පහසුකමකට හිමිකම් කියන සහ එය ක්‍රියාත්මක කරන දකුණු ආසියාවේ එකම LPG සමාගම වන්නේ මෙම පර්යන්තයයි. අහිතකර කාලගුණික තත්ත්වයන් පවතින අවස්ථාවලදී, ගෑස් රැගත් නෞකා කොළඹ වරාය වෙත හරවා යැවීමට කටයුතු කෙරෙන අතර, එහිදී එම LPG තොග මාර්ග බවුසර් මඟින් පර්යන්තය වෙත ප්‍රවාහනය කරනු ලබයි.

2025 වසරේදී සමාගම සිය උපායමාර්ගික අවධානය “යටිතල පහසුකම් ජීවන චක්‍ර කළමනාකරණය” වෙත යොමු කළ අතර, එහිදී සිය පැරණි යටිතල පහසුකම් වෙනුවට නවීන ගබඩා සහ මුදාහැරීමේ පහසුකම් ප්‍රතිස්ථාපනය කිරීමට පියවර ගන්නා ලදී. මීට අමතරව, එමෙන්ම, සමාගම සතු අතිරේක ගබඩා ධාරිතාවන් සහ ශ්‍රී ලංකාවේ වරායන් පිහිටා ඇති උපායමාර්ගික භූගෝලීය පිහිටීම උපයෝගී කර ගනිමින්, ශ්‍රී ලංකාව කලාපීය බලශක්ති මධ්‍යස්ථානයක් ලෙස ස්ථානගත කිරීම උදෙසා ප්‍රති-අපනයන අවස්ථාවන් ගවේෂණය කිරීමටද සමාගම කටයුතු ආරම්භ කළේය.

ප්‍රතිඵලය

නෞකාවලින් ගෑස් ගොඩබෑම සහ පිරවුම් කම්හල් වෙත ගෑස් සැපයීම යන ක්‍රියාවලීන් දෙකෙහිදීම කිසිදු බාධාවකින් තොරව අඛණ්ඩව සේවාව සැපයීමට (Zero downtime) පර්යන්තය සමත් විය. දත්ත මත පදනම් වූ දැඩි වැළැක්වීමේ නඩත්තු වැඩපිළිවෙළක් අනුගමනය කිරීම හේතුවෙන් 100% ක උපරිම ක්‍රියාකාරී කාලයක් තහවුරු කර ගැනීමට හැකි වූ අතර, එය මෙම ක්ෂේත්‍රය තුළ ලැබූ සුවිශේෂී ජයග්‍රහණයකි. ප්‍රශස්ත ලොජිස්ටික්ස්/සැපයුම් දාම කළමනාකරණය සහ නිසි නඩත්තුව හේතුවෙන් ආරක්ෂක හා පාරිසරික ප්‍රමිතීන් ඉහළින්ම රැකගැනීමට හැකි වූ අතර, එමඟින් නියාමන ආයතන සහ ප්‍රාදේශීය ප්‍රජාවන් සමඟ පවතින සබඳතා තවදුරටත් ශක්තිමත් විය. මෙම සමස්ත ක්‍රියාවලීන්හි සාර්ථක ප්‍රතිඵලයක් ලෙස, ජාතික බලශක්ති සුරක්ෂිතතාව මෙන්ම රටේ LPG බෙදාහැරීමේ ජාලය ශක්තිමත් කිරීම උදෙසා පර්යන්තයෙන් ලැබුණේ සුවිශේෂී දායකත්වයකි.

2025 ජාතික ආරක්ෂක සම්මාන උළෙලේදී, ආරක්ෂණ කාර්යසාධනයේ විශිෂ්ටත්වය උදෙසා බඨඔබ සමාගම ජාතික ඇගයීමට හා පිළිගැනීමට ලක්විය.

ඉදිරි දැක්ම

LGTL සමාගම, ව්‍යාපාර ව්‍යාප්ති ශක්‍යතා අධ්‍යයන සහ ජාත්‍යන්තර ඉදිකිරීම් ටෙන්ඩර් කැඳවීම කෙරෙහි අවධානය යොමු කරන අතර, නව වෙළඳපොළවල් කරා ප්‍රවේශ වීම සඳහා ඇති අවස්ථා අඛණ්ඩව ගවේෂණය කරනු ඇත. මීට අමතරව, බඨඔබ සමාගමේ රජය සතු කොටස් පැවරීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙමින් පවතින අතර, එම සමස්ත ක්‍රියාවලිය කළමනාකරණය කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය පිහිටුවා ඇත.



කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ශ්‍රී ලංකාවේ ප්‍රථම අධිවේගී මාර්ගය වන දකුණු අධිවේගී මාර්ගයේ 44 වන කිලෝමීටර් කණුව ආශ්‍රිතව, කළුතර දිස්ත්‍රික්කයේ වැලිපැන්න ප්‍රදේශයේ අධිවේගී මාර්ගය දෙපසටම විහිදෙන පරිදි පිහිටුවා ඇති 'කැනොවින් ආකේඩ්' (Canowin Arcade) සංකීර්ණය, කොළඹ සහ දකුණු පළාත අතර ගමන් ගන්නා ජනතාව වෙත සේවා සපයන ආසියාවේ ප්‍රථම 'හරිත විවේකාගාරය' (Green Rest) ලෙස හඳුන්වා දිය හැකිය. පරිසර හිතකාමී සංකල්පයන්ට ප්‍රමුඛතාව ලබා දෙමින් නිර්මාණය කර ඇති මෙම විවේක පරිශ්‍රය, සරල එහෙත් කාර්යක්ෂම තිරසාර සැලසුම් ක්‍රමවේද සහ නඩත්තු ක්‍රියාවලීන් අනුගමනය කරමින් LEED GOLD හරිත ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකර තිබීම විශේෂත්වයකි.

ව්‍යාපාරික මෙහෙයුම්

සංචාරකයින්ගේ විවිධ වූ රුචිකත්වයන් ස අවශ්‍යතා සපුරාලීම උදෙසා ප්‍රවේශමෙන් තෝරාගත් අවන්හල් 25 කින් කැනොවින් ආකේඩ් සංකීර්ණය සමන්විත වේ. එහි අභ්‍යන්තර සේවාවන්ට අමතරව, මනරම් ලෙස භූමි අලංකරණය කරන ලද අසුන් පැනවූ පරිශ්‍රයන්, එළිමහන් සනීපාරක්ෂක පහසුකම්, සියලුම වර්ගයේ වාහන සඳහා වූ පුළුල් රථගාල් සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා රෝද පුටු පහසුකම් ද මෙහි සපයා ඇත.

තිරසාරභාවය මුල් කරගනිමින් නිමවා ඇති මෙම LEED GOLD සහතිකලත් ගොඩනැගිල්ල සහ ඒ ආශ්‍රිත සේවාවන්හි සුවිශේෂී ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ:

- කාර්යක්ෂම ජල ප්‍රවාහ පාලන උපකරණ සහ වැසි ජලය රැස් කිරීමේ ක්‍රමවේද මගින් පරිශ්‍රය තුළ ජලය භාවිතය 40% කින් අඩු කිරීම මගින් ජල සංරක්ෂණය
- ජලයෙන් සිසිලනය වන වායුසමීකරණ පද්ධති, කාර්යක්ෂම ආලෝකකරණය සහ පරාවර්තක වීදුරු භාවිතය මගින් බලශක්ති පරිභෝජනයෙන 23% කින් ඉතිරි කිරීම.
- ඉදිකිරීම් අපද්‍රව්‍යවලින් සියයට 80 කට වඩා වැඩි ප්‍රමාණයක් පරිසරයට මුදා නොහැර ප්‍රතිචක්‍රීකරණය හෝ නැවත භාවිතය සඳහා යොමු කිරීම.
- ඉදිකිරීම් ද්‍රව්‍යවලින් 40% ක් දේශීය මූලාශ්‍රවලින් සපයා ගැනීම.
- 2003 පරිසර ආරක්ෂණ නියෝජිතායතනයේ (EPA) ඉදිකිරීම් පිළිබඳ පොදු අවසර පත්‍රය අවසාදිත සහ බාදන පාලනය කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
- ඉදිකිරීම් කටයුතු සඳහා භාවිත කරන ලද සමස්ත ද්‍රව්‍ය ප්‍රමාණයෙන් 20%ක් ආවරණය වන පරිදි ප්‍රතිචක්‍රීකරණය කරන ලද ද්‍රව්‍ය බහුලව භාවිත කර ඇත.
- ගොඩනැගිල්ලේ විදුරු මුහුණත (Glass façade) මඟින් සමස්ත ආසන ධාරිතාවෙන් 80%කට පමණ ස්වාභාවික දිවා ආලෝකය සහ පරිදර්ශක දසුන් (Panoramic views) ලබා ගැනීමට පහසුකම් සලසා ඇත.
- ඕසෝන් ස්ථරය ක්ෂය වීම වැළැක්වීම උදෙසා, ක්ලෝරෝෆ්ලෝරෝ කාබන් (CFC) අඩංගු නොවන ශීතකාරක භාවිතයට පියවර ගෙන ඇත.
- අභ්‍යන්තර නිමවුම් කටයුතු සඳහා අවම වාෂ්පශීලී කාබනික සංයෝග (Low VOC - <50g/l) සහිත පින්තාරු සහ සීලන්ට් ද්‍රව්‍ය භාවිත කර තිබේ.
- තාප දූපත් ආචරණය (Heat Island Effect) පාලනය කිරීම සඳහා ඉහළ සූර්ය පරාවර්තක දර්ශකයකින් (SRI >78) යුත් වහලවල් සවිකර ඇත.

මෙහෙයුම් ක්‍රියාවලිය

වෙළෙඳුන් තෝරා ගැනීම, ආහාරවල ගුණාත්මකභාවය පවත්වා ගැනීම, සෞඛ්‍ය හා ආරක්ෂණ ප්‍රමිතීන් තහවුරු කිරීම සහ මානව ප්‍රාග්ධනය කළමනාකරණය උදෙසා ශක්තිමත් මෙහෙයුම් ක්‍රියා පටිපාටියක් ස්ථාපනය කර ඇත.

වෙළෙඳුන්

ආකේඩ් (The Arcade) හි සැපයුම් දාම කළමනාකරණ කටයුතු, අනුමත ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි සහ මාර්ගෝපදේශවලට අනුකූලව කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවට්) ලිමිටඩ් (Canowin Hotels and Spas (Pvt) Ltd) විසින් මෙහෙයවනු ලබයි. සැපයුම්කරුවන් මූලාශ්‍රගත කිරීම, ලියාපදිංචිය, ප්‍රසම්පාදන කටයුතු, කොන්ත්‍රාත් ප්‍රදානය සහ අධීක්ෂණ කටයුතු ක්‍රමානුකූලව සිදු කරනු ලබන අතර, කොන්ත්‍රාත්ගත බැඳීම්වලට අනුකූලව උසස් ප්‍රමිතියෙන් යුතු භාණ්ඩ හා සේවා සැපයීම සහතික කිරීම සඳහා වන මෙහෙයුම් රාමු සකස් කර ඇත.

සමස්තයක් ලෙස වෙළෙඳුන් 68 දෙනෙකු 2025 වර්ෂය සඳහා ලියාපදිංචිව සිටින අතර, ආරක්ෂක සේවා, පළිබෝධ පාලන සේවා සහ සනීපාරක්ෂක අපද්‍රව්‍ය බැහැර කිරීමේ සේවාවන් සැපයීම සඳහා වන වාර්ෂික මිල ගිවිසුම් හා කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට යටත්ව සිදු කර ඇත.



තවද, අත්සන් කරන ලද ගිවිසුම් යටතේ නියෝජිතයින් සමඟ ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත්තු පහතින් ලැයිස්තුගත කර ඇත. අදාළ නියෝජිතයින් සමඟ එළඹ ඇති ගිවිසුම් පදනම් කර ගනිමින් මෙම කොන්ත්‍රාත්තු අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබේ.

සෞඛ්‍යය සහ ආරක්ෂාව

මතුගම මහජන සෞඛ්‍ය පරීක්ෂක අංශය විසින් 2025 වසර පුරාම සෞඛ්‍ය, ආරක්ෂාව සහ ආහාර සුරක්ෂිතතා අනුකූලතාව පිළිබඳව දැඩි අධීක්ෂණයක් පවත්වාගෙන යන යයි. ව්‍යවස්ථාපිත සනීපාරක්ෂක හා ආහාර සුරක්ෂිතතා ප්‍රමිතීන් පිළිපැදීම තහවුරු කිරීම සඳහා ස්ථාවර කාලසටහනකට අනුව මාසික පරීක්ෂණ පවත්වන ලද අතර, ප්‍රමිතීන්ට අනුකූල නොවන බවට නිරීක්ෂණය වූ සියලුම කරුණු නියාමන අවශ්‍යතාවලට අනුකූලව කඩිනමින් සහ ක්‍රමානුකූලව විසඳීමට පියවර ගැනුණි. එහිදී කිසියම් නීති උල්ලංඝනය කිරීමක් හඳුනාගත් අවස්ථාවන්හිදී, ප්‍රමාදයකින් තොරව නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ අතර, අවශ්‍ය වූ විට රජයේ නීතිරීතිවලට අනුකූලව නිසි බලධාරීන් විසින් ව්‍යවස්ථාපිත දඩ මුදල් ද පනවන ලදී. මෙම යහපත් පිළිවෙත් හේතුවෙන් අඛණ්ඩ නියාමන අනුකූලතාවය තහවුරු වූ අතර, මෙහෙයුම් අවදානම අවම කර ගනිමින්, මහජන සෞඛ්‍යය ආරක්ෂා කිරීමට සහ ආයතනයේ මෙහෙයුම් බලපත්‍රය පවත්වාගෙන යාමට සංවිධානය සතු කැපවීම තවදුරටත් තහවුරු විය.

සේවක බඳවා ගැනීම්

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්ට (SLIC) බඳවා ගැනීමේ පටිපාටීන්ට අනුකූල වන පරිදි, අන්තර්ජාලය සහ අනෙකුත් අදාළ මාධ්‍ය ඔස්සේ පළ කරනු ලබන රැකියා ප්‍රචාරණ දැන්වීම් මඟින් සේවකයින් බඳවා ගැනීම සිදු කරනු ලබයි.

ප්‍රතිඵලය

සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) සහ එකතු කළ අගය මත බද්ද (VAT) රහිතව, 2025 වසරේදී විවේක කාමර ප්‍රවේශ පත්‍ර පද්ධතිය මඟින් රුපියල් 85,502,174 ක පමණ ආදායමක් උපයා ඇත. මෙය 2025 වසර පුරාම පාරිභෝගිකයින්ගේ අඛණ්ඩ පැමිණීමක් පැවති බවට පැහැදිලි සලකුණකි. ආහාර අලෙවිසැල් බාහිර පාර්ශවයන් විසින් පවත්වාගෙන යනු ලබන බැවින් සහ ඒවායේ ආදායම් උත්පාදනය හෝ ඇණවුම් සංඛ්‍යාවන් වෙත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්ට (SLIC) සෘජු ප්‍රවේශයක් නොමැති බැවින්, එම අලෙවිසැල්වල පිරිවැටුම දැනට වාර්තාගත නොවේ.

ආකේඩ් සාප්පු සංකීර්ණය 2025 වසරේදී රුපියල් 182,483,448 ක ශුද්ධ ලාභයක් උපයා ඇත.

	වටිනාකම (රු.)	උත්පාදන මාර්ග
ආදායම	234,175,253	1. කුලී ආදායම 2. සේවා ආදායම 3. ථීයරද්දප ප්‍රවේශ පත්‍ර ආදායම 4. ප්‍රවර්ධන වැඩසටහන් ආදායම 5. මූල්‍ය ආදායම
දළ ලාභය	165,995,844	
ශුද්ධ ලාභය	182,483,448	

ඉදිරි දැක්ම

ගොඩනැගිල්ලේ බාහිර පෙනුම ප්‍රතිසංස්කරණය කිරීම (නැවත පින්තාරු කිරීම) මෙන්ම වායු සමීකරණ පද්ධතිය සහ අපද්‍රව්‍ය පිරිපහදු යන්ත්‍රාගාරය ඉලක්ක කරගත් පිළියම් යෙදීමේ කටයුතු ද ඇතුළත්, පුළුල් නඩත්තු ප්‍රතිසංස්කරණ වැඩසටහනක් 2026 වසරේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මෙම ප්‍රාග්ධන ප්‍රතිසංස්කරණ සැලසුම් කර ඇත්තේ ගොඩනැගිල්ලේ මූලික ව්‍යුහය සහ අත්‍යවශ්‍ය සේවාවන් යථා තත්ත්වයට පත් කිරීම සඳහා මෙන්ම, මෙහෙයුම් හා පාරිසරික ප්‍රමිතීන්ට අනුකූල වෙමින් කාලයත් සමඟ සිදුවන ක්ෂය වීම් හා පිරිහීම්වලට පිළියම් යෙදීම සහ එහි පරිසරය වඩාත් ආකර්ෂණීය මට්ටමකට ඉහළ නැංවීම සඳහා ය.

මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන 2026 ප්‍රාග්ධන අයවැය තුළ වෙන් කර අනුමත කර ඇති අතර, ප්‍රසම්පාදන කටයුතු සහ ව්‍යාපෘති සැලසුම්කරණය ද ස්ථාපිත ආයතනික පාලන රාමුවට අනුකූලව නියමිත කාලසටහනට අනුව ප්‍රගතියක් අත්කර ගනිමින් පවතී. මෙම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා පූර්ණ වශයෙන් ප්‍රතිපාදන වෙන් කර ඇති බැවින්, ආයතනයේ ලාභදායිත්වයට හෝ ද්‍රවශීලතාවට කිසිදු අහිතකර බලපෑමක් එල්ල නොවනු ඇතැයි අපේක්ෂා කරන අතර, ඒ හේතුවෙන් මෙහෙයුම් කටයුතුවලට සැලකිය යුතු බාධාවක් මතු නොවේ.

සැලසුම් සහගතව සිදුකෙරෙන මෙම ප්‍රතිසංස්කරණ මඟින් මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමටත්, නඩත්තු කටයුතු නිසා සිදුවන අක්‍රිය කාලය (Downtime) සහ හදිසි අලුත්වැඩියා පිරිවැය අවම කර ගැනීමටත් හැකි වන අතර, සේවා ගුණාත්මකභාවය සහ කුලී නිවැසියන්ගේ තෘප්තිමත්භාවය ද තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම වැඩිදියුණු කිරීම් මඟින් අදාළ වත්කම්වල දිගුකාලීන අගය ශක්තිමත් වන අතර, සමාගමේ දේපළ කළඹ (Property Portfolio) මනා ලෙස කළමනාකරණය කිරීමේ වගකීමට ද එය මනා පිටිවහලක් වනු ඇත. එබැවින්, 2026 නඩත්තු වැඩසටහන යනු වත්කම්වල ප්‍රමිතිය හා පැවැත්ම මෙන්ම සේවාවල අඛණ්ඩතාව සහතික කිරීම වෙනුවෙන් සිදුකරන ලද විචක්ෂණශීලී සහ අගය එකතු කරන (ප්‍රතිලාභී) ආයෝජනයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට සැලකිය හැකිය.

ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී

LANKA HOSPITALS

ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී (LHC) යනු පුළුල් පරාසයක විභිදුණු වෛද්‍ය විශේෂඥතාවන් ඔස්සේ උසස් තත්ත්වයේ සායනික සේවාවන් සැපයීම සම්බන්ධයෙන් කීර්තියක් උසුලන, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම පෞද්ගලික සෞඛ්‍ය සේවා සපයන්නෙකි. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව රෝගී කේන්ද්‍රීය සත්කාර පිරිනැමීම උදෙසා මෙම සමූහය, නවීන රෝහල් යටිතල පහසුකම්, උසස් වෛද්‍ය තාක්ෂණය සහ බහුවිධ විශේෂඥ වෛද්‍ය කණ්ඩායමක දායකත්වය ඒකාබද්ධ කර ඇත. එහි ඒකාබද්ධ සේවා ආකෘතිය, හදිසි සහ දැඩි සත්කාර, විශේෂඥ බාහිර රෝගී සේවා මෙන්ම අතිරේක රෝග විනිශ්චය සේවා (Ancillary diagnostics) දක්වා විහිදෙන අතර, එමඟින් කලාපයේ සංකීර්ණ වෛද්‍ය ප්‍රතිකාර සඳහා වන ප්‍රධානතම යොමු මධ්‍යස්ථානයක් ලෙස සමාගම ස්ථානගත වී ඇත.

ව්‍යාපාරික සමාලෝචනයි

ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී ආයතනය, සස් තත්ත්වයේ රෝගීන් කේන්ද්‍රකරගත් සත්කාරයන් සමඟින් අති නවීන රසායනාගාර රෝග විනිශ්චය සේවා, විශේෂඥ වෛද්‍ය උපදේශන, විශිෂ්ට නේවාසික පහසුකම් මෙන්ම සහායක වෛද්‍ය සේවාවන් මැනවින් මුසු කරමින්, ලෝක මට්ටමේ සෞඛ්‍ය සේවාවක් අඛණ්ඩව පිරිනැමීමට කටයුතු කළේය. අපේක්ෂිත සායනික ප්‍රතිඵල සාර්ථකව ළඟා කර දීමටත්, බාධාවකින් තොරව පාරිභෝගිකයාට සුවපහසු රෝගී අත්දැකීමක් (Seamless patient experience) තිළිණ කිරීමටත් මෙම සමස්ත ක්‍රියාවලිය ඉවහල් විය. එමඟින් ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම සෞඛ්‍ය සේවා සපයන්නෙකු ලෙස තමන් සතු සුවිශේෂී වෘත්තීය අනන්‍යතාවය යළි යළිත් තහවුරු කිරීමට සමාගම සමත් විය.

සෞඛ්‍ය සේවා

පිරිනමනු ලබන සේවාවන්	පිළිකා සත්කාරක මධ්‍යස්ථානය (Cancer Care), ප්‍රවේණි-මූත්‍ර රෝග වෛද්‍ය මධ්‍යස්ථානය (Genito Urology), අස්ථි රෝග සායනික මධ්‍යස්ථානය (Orthopedic), ස්නායු ශල්‍ය වෛද්‍ය මධ්‍යස්ථානය (Neuro Surgical), සාඵල්‍යතා මධ්‍යස්ථානය (Fertility) සහ වෘක්කීය/වකුගඩු සත්කාරක මධ්‍යස්ථානය (Kidney Care).
නේවාසික රෝගී සේවාව	සමාගම මෙම මූල්‍ය වර්ෂය තුළදී නේවාසික රෝගීන් 26,322 දෙනෙකු සඳහා සේවා සැපයීමට අපේක්ෂා කරයි.
බාහිර රෝගී සේවාව	වසර පුරා බාහිර රෝගී උපදෙස් සහ ප්‍රතිකාර ලබාගැනීම උදෙසා පැමිණීම් 347,692 ක් පමණ වාර්තා වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.
හදිසි අනතුරු හා සත්කාරක සේවා	පැය 24 පුරා ක්‍රියාත්මක හදිසි ප්‍රතිකාර සේවා, ඕනෑම අවස්ථාවක සේවයට සූදානම් විශේෂඥ වෛද්‍යවරුන් (24/7 On-Call Specialists), දිවයින පුරා විහිදුණු ගිලන්රථ සේවා සහ දැඩි කම්පන සත්කාරක සේවා (Trauma Care).
සමස්ත ශල්‍යකර්ම දායකත්වය	රෝගී සුවපත්භාවය වෙනුවෙන් වසර තුළ සැලසුම් කර ඇති සමස්ත ශල්‍යකර්ම සංඛ්‍යාව 170,700 ඉක්මවයි.
ලබාදෙන රෝග විනිශ්චය සහ ප්‍රතිබිම්බණ සේවා (Diagnostics & Imaging)	පරීක්ෂණාගාර සේවා: ව්‍යාධිවේදී (Pathology) සහ ක්ෂුද්‍ර ජීව විද්‍යා (Microbiology) ඇතුළු පරීක්ෂණ රැසක් සිදුකෙරෙන ජාත්‍යන්තර ඇගයීමට ලක්වූ රසායනාගාර පහසුකම්. ප්‍රතිබිම්බණ සේවා (Imaging): MRI" CT" x-ray සහ අතිධ්වනි (Ultrasound) පරිලෝකන සේවා. න්‍යෂ්ටික වෛද්‍ය විද්‍යාව: පිළිකා සහ හෘද රෝග නිවැරදිව හඳුනාගැනීම සහ ප්‍රතිකාර කිරීම සඳහා වන සුවිශේෂී සේවාවන්. එන්ඩොස්කොපි සහ ලැපරොස්කොපි: අවම කැපුම් සහිත (Minimally invasive) නවීන රෝග විනිශ්චය ක්‍රමවේද. හෘද ප්‍රතිබිම්බණ සේවා: එකෝකාඩියෝග්‍රෑම් (Echocardiograms), කාඩියැක් MRI සහ CT ඇන්ජියෝග්‍රැම් සේවා. ගැමා කැමරා සහ නියුරෝ නැවිගේෂන්: පිළිකා සහ ස්නායු රෝග පිළිබඳ සියුම් පරීක්ෂණ සඳහා වන අතිනවීන තාක්ෂණික පහසුකම් (Gama Camera) Neuro Navigation).

වෛද්‍ය අවශ්‍යතා සපයා ගැනීමේදී මතු වූ බාධාකාරී තත්ත්වයන් මෙන්ම අභියෝගාත්මක සාර්ව ආර්ථික වටපිටාවක වුවද ක්‍රියාත්මක වෙමින්, රෝහල විසින් රෝගී සත්කාරක සේවාවන්හි ගුණාත්මකභාවය සහ කාර්යක්ෂමතාව (ඵලදායීතාව) තවදුරටත් ඉහළ නැංවීමට කටයුතු කරන ලදී. ඒ අනුව, 2025 වසරේදී නව විශේෂඥ වෛද්‍ය ක්ෂේත්‍ර, අතිනවීන ප්‍රතිකාර ක්‍රමවේද සහ වැඩිදියුණු කළ ක්‍රියාවලීන් හඳුන්වා දෙමින් සේවා නවෝත්පාදනය උදෙසා රෝහල සක්‍රීයව අවතීර්ණ විය. එහි ප්‍රතිඵලයක් ලෙස රෝගීන් වෙනුවෙන් පහත සඳහන් සේවාවන් අලුතින් හඳුන්වා දෙන ලදී:

- ලංකා ලයිෆ්ලයින් (Lanka LifeLine): විශේෂිත කම්පන සහ හදිසි අනතුරු සත්කාරක සේවාව (Trauma Care)
- ලංකා කෙයාර් (Lanka Care): රෝහල් මට්ටමේ උසස් සායනික නිවාස සත්කාරක සේවා
- අණුක රෝග විනිශ්චය හැකියාව
- නව කැතීටර්කරණ විද්‍යාගාරයක් ආරම්භ කිරීම

ක්‍රියාවලිය

රෝහලේ සමස්ත මෙහෙයුම් කටයුතු දැඩි ලෙස නිර්වචනය කරන ලද සායනික පාලන රාමුවක් යටතේ ක්‍රියාත්මක වේ. සායනික විශිෂ්ටත්වය, වගවීම, රෝගී ආරක්ෂාව, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පූර්ණ නියාමන අනුකූලතාවය සහතික කිරීම උදෙසා මෙමඟින් ක්‍රියාවලීන් අඛණ්ඩව ප්‍රශස්තකරණය කරනු ලබයි. මෙම පාලන රාමුව වුහගත කර ඇත්තේ පාලනය සහ නායකත්වය, සායනික ඵලදායීතාව, රෝගී ආරක්ෂාව, රෝගියා කේන්ද්‍ර කරගත් සත්කාර සේවා, තොරතුරු කළමනාකරණය, පුහුණුව හා අධ්‍යාපනය මෙන්ම අඛණ්ඩ කාර්යසාධන අධීක්ෂණය සහ ඇගයීම වැනි ප්‍රධාන කුළුණු මත පදනම්වය. ඒ අනුව, රෝගියෙකු ඇතුළත් කර ගැනීමේ සිට මුදා හැරීම දක්වා වූ සමස්ත රෝගී ගලායාම සාක්ෂි පාදක කරගත් ප්‍රොටෝකෝල සහ ප්‍රමිතිගත සායනික මාර්ගෝපදේශ මඟින් පාලනය වේ.

තත්ත්ව සහතිකකරණ පද්ධති මඟින් ප්‍රතිඵල, අහිතකර බලපෑම් සහ අනුකූලතාවයන් නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලබයි. පද්ධතියට ඒකාබද්ධ කර ඇති ඩිජිටල් සෞඛ්‍ය වාර්තා සහ තත්කාලීන කාර්යසාධන උපකරණ පුවරු මඟින් කාලෝචිත සායනික තීරණ ගැනීමට සහ මෙහෙයුම් අධීක්ෂණයට මනා පිටුවහලක් සැපයෙන අතර, අත්‍යවශ්‍ය ඖෂධ සහ පරිභෝජන ද්‍රව්‍ය සුරක්ෂිත කරන විනයගරුක සැපයුම් දාමයක් හා තොග පාලන ක්‍රමවේදයක් මඟින් ද එය තවදුරටත් ශක්තිමත් වේ.

ආසාදන වැලැක්වීම, උපකරණ නඩත්තුව සහ පහසුකම් කළමනාකරණය සඳහා දැඩි සම්මත මෙහෙයුම් පටිපාටි (SOPs) සහ විගණන චක්‍ර අනුගමනය කරනු ලබයි. එමෙන්ම, නිතිපතා පවත්වන පුහුණු වැඩසටහන්, බහුවිධ සමාලෝචන සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) මත පදනම් වූ වගවීම් මඟින් මෙහෙයුම් ක්‍රියාවලීන්, සායනික හොඳම ප්‍රායෝගික පිළිවෙත් සහ නියාමන අපේක්ෂාවන් සමඟ නිරන්තරයෙන් යාවත්කාලීන වන බව සහතික කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමස්ත සායනික නායකත්වය දක්වා පැහැදිලි අධීක්ෂණයක් සපයන අතර, එමඟින් අඛණ්ඩ උසස් තත්ත්වයේ සත්කාර සේවාවන් සැපයීම, සායනික අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහ රෝගීන්ගේ මෙන්ම අනෙකුත් සියලුම පාර්ශවකරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම තහවුරු කරනු ලබයි.

ආසාදන වැළැක්වීම (Infection Prevention)

රෝහල් පරිශ්‍රය පුරා ක්‍රියාත්මක වන අත් සනීපාරක්ෂක රීති, පුද්ගලික ආරක්ෂක උපකරණ (PPE) නිසි ලෙස භාවිත කිරීම සහ දැඩි විෂබීජහරණ ක්‍රියාවලීන් නියාමනය කරනු ලබන පුළුල් පාලන රාමුවක් මඟින් ආසාදන වැළැක්වීමේ සහ පාලනය කිරීමේ කටයුතු මෙහෙයවනු ලබයි. ක්ෂුද්‍රජීවී ප්‍රතිරෝධය අවම කිරීම අරමුණු කරගනිමින් අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිජීවක ඖෂධ කළමනාකරණ වැඩසටහන් (Antibiotic Stewardship Programmes) මඟින් මෙම ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කෙරේ. මීට අමතරව, සායනික පරිසරය තුළ රෝගීන් හුදකලා කිරීම, රෝගී තත්ත්වයේ බරපතලකම අනුව වර්ගීකරණය කිරීම (Triaging), සමාන රෝග ලක්ෂණ සහිත රෝගීන් කණ්ඩායම් වශයෙන් වෙන් කර ප්‍රතිකාර කිරීම (Cohorting) සහ පාලිත සංචරණය ඇතුළු සම්මත මෙන්ම බෝවීම වැළැක්වීමේ පූර්වාරක්ෂණ ක්‍රමවේදයන් ද මෙහිදී ක්‍රියාත්මක කරනු ලබයි. මෙම පියවරයන් ආසාදන පාලන විගණන, සමීක්ෂණ සහ අහිතකර සිදුවීම් කළමනාකරණ පද්ධති (Incident Management Systems) මඟින් අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබන අතර, රෝගීන්ට සහ කාර්ය මණ්ඩලයට ආරක්ෂිත මෙන්ම සනීපාරක්ෂක වටපිටාවක් සහතික කිරීම උදෙසා සියලුම සායනික සහ සායනික නොවන අංශ පුරා පවත්වාගෙන යනු ලබන ක්‍රමවත් පිරිසිදු කිරීමේ සහ විෂබීජ නාශක ප්‍රොටෝකෝල මඟින් ද මෙයට පූර්ණ සහායක් සපයයි.

පර්යේෂණ සහ අධ්‍යාපනය

ලංකා හොස්පිට්ල්ස් ඇකඩමිය (Lanka Hospitals Learning Academy) හරහා සායනික සහ සායනික නොවන ක්ෂේත්‍රයන්හි ව්‍යක්තීය නිපුනතාවන් වර්ධනය කරමින්, ජාතික සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකභාවය සහ ප්‍රජා යහපැවැත්ම ඉහළ නැංවීම සඳහා රෝහල අඛණ්ඩව සක්‍රීය දායකත්වයක් ලබා දෙයි. රෝග වැළැක්වීමේ සත්කාර ප්‍රවර්ධනය කිරීම සහ පොදු සෞඛ්‍ය ගැටලු පිළිබඳ මහජන දැනුවත්භාවය වර්ධනය කිරීම අරමුණු කරගත් අධ්‍යාපනික වැඩසටහන් රැසක් සමූහය විසින් ක්‍රියාත්මක කරන ලදී. ඒ යටතේ පසුගිය වසර තුළ සිදු කළ සුවිශේෂී කාර්යයන් කිහිපයක් පහත දැක්වේ:

- භෞතචිකිත්සක දෙපාර්තමේන්තුව මෙහෙයවූ කාර්යක්ෂමතා විද්‍යා (Ergonomics) දේශන මාලාව සහ මාර්ගගත වැඩසටහන්.
- ලෝක භෞතචිකිත්සක දිනයට සමගාමීව හැව්ලොක් සිටි මෝල් (Havelock City Mall) පරිශ්‍රයේ පැවැත්වූ සැමරුම් වැඩසටහන්.
- ලෝක ඖෂධවේදීන්ගේ දිනය නිමිත්තෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) නිලධාරීන් වෙනුවෙන් පැවැත්වූ වැඩමුළු.
- කාන්තා සුවතා මධ්‍යස්ථානය මගින් මෙහෙයවන ලද විශේෂ "කාන්තා සුවතා" වැඩසටහන.
- පියයුරු පිළිකා හඳුනාගැනීමේ සහ දැනුවත් කිරීමේ සෞඛ්‍ය සායනය.

සේවක බඳවා ගැනීම

උසස් රෝගී සත්කාරයක් සහ දිගුකාලීන ආයතනික ප්‍රගතියක් උදෙසා කැපවුණු, දක්ෂ ශ්‍රම බලකායක් ගොඩනැගීම සහ පවත්වාගෙන යාම සමූහයේ මානව සම්පත් උපායමාර්ගයේ ප්‍රධාන අරමුණයි. ශක්තිමත් සේවායෝජක ප්‍රතිරූපයක් (Employer Brand) මගින් ඉහළ දක්ෂතා සහිත ව්‍යක්තිකයන් ආකර්ෂණය කර ගැනීම, අඛණ්ඩ පුහුණු වැඩසටහන් හා අනුප්‍රාප්ති සැලසුම් මගින් සේවකයින්ගේ අභ්‍යන්තර හැකියාවන් වර්ධනය කිරීම සහ පවතින කම්කරු නීති රීතිවලට අනුකූලව විනිවිදභාවයකින් යුත් බඳවා ගැනීමේ ක්‍රියාවලියක් පවත්වාගෙන යාම සඳහා මෙහිදී ප්‍රමුඛත්වය ලබා දෙයි. මෙම ප්‍රයත්නයන් හරහා මානව ප්‍රාග්ධන ආයෝජනය සමූහයේ උපායමාර්ගික ඉලක්ක සමඟ ඒකාබද්ධ කරමින් මෙහෙයුම් විශිෂ්ටත්වය තහවුරු කෙරේ.

පුහුණුව සහ සංවර්ධනය

සමූහයේ පුහුණු සහ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක වන්නේ ආයතනික උපායමාර්ග, දෙපාර්තමේන්තු ප්‍රමුඛතා, පුද්ගලික සංවර්ධන සැලසුම් සහ පාරිභෝගික අත්දැකීම් විශ්ලේෂණය කරමින්, සේවකයින්ගේ කුසලතා පරතරයන් සහ ඉගෙනුම් ප්‍රමුඛතා හඳුනා ගන්නා විධිමත් අවශ්‍යතා තක්සේරු රාමුවක් මත පදනම්වය.

උපදේශකවරුන් මෙහෙයවන සැසි, ප්‍රායෝගික වැඩමුළු සහ ඩිජිටල් ඉගෙනුම් වේදිකා ඒකාබද්ධ වූ "මිශ්‍ර ඉගෙනුම් ආකෘතියක්" (Blended Learning Model) හරහා, එක් එක් රැකියා භූමිකාවට, නිපුණතා මට්ටමට සහ ව්‍යාපාරික අරමුණුවලට ගැළපෙන නමාශීලී පුහුණු අවස්ථා සලසා දෙයි.

නිපුණතා රාමු (Competency Frameworks) ඇසුරින් සකස් කෙරෙන මෙම පුහුණු සැලසුම් මගින් නායකත්ව සංවර්ධනය, කළමනාකරණ හැකියාව සහ ඉදිරි පෙළ සායනික හා සේවා විශිෂ්ටත්වය කෙරෙහි විශේෂ අවධාරණයක් යොමු කරමින් මිනුම් කළ හැකි ඉගෙනුම් ප්‍රතිඵල අපේක්ෂා කරයි. පසුගිය වසර තුළ විධායක නායකත්වය, ජ්‍යෙෂ්ඨ සහ මධ්‍යම කළමනාකාරීත්වය මෙන්ම ඉදිරි පෙළ කාර්ය මණ්ඩලය ඉලක්ක කරගනිමින් ප්‍රධාන වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කෙරිණි. එම පුහුණුවෙන් ලද දැනුම ප්‍රායෝගිකව ආයතනික කාර්ය සාධනය ඉහළ නැංවීමට දායක වූ බව සහතික කර ගැනීම සඳහා වැඩසටහනෙන් පසු ඇගයීම් සහ කාර්ය සාධන දර්ශක (Performance Metrics) ද භාවිත කෙරිණි. පවතින සායනික ප්‍රමිතීන්, නියාමන අවශ්‍යතා සහ පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන්ට අනුකූලව මෙම විෂයමාලා සහ ඉගැන්වීම් ක්‍රමවේද නිරන්තර සමාලෝචනයට ලක් කෙරේ.

සේවක සෞඛ්‍යය සහ ආරක්ෂාව

සේවකයින්ගේ සහ රෝගීන්ගේ ශාරීරික හා මානසික සෞඛ්‍යය සුරක්ෂිත කිරීම වෙනුවෙන් සමූහය විසින් පුළුල් ආරක්ෂණ සහ යහපැවැත්මේ රාමුවක් ස්ථාපිත කර ඇත. මෙය ISO 45001 වැනි ජාත්‍යන්තර ප්‍රමිතීන්, Joint Commission International (JCI) ප්‍රතිනතය සහ අදාළ සියලුම නියාමන අවශ්‍යතාවලට පූර්ණ ලෙස අනුකූල වෙමින් ක්‍රියාත්මක වේ. විධිමත් ආරක්ෂණ කළමනාකරණ පද්ධතියක් මගින් අනතුරු වැළැක්වීම, හඳුනාගැනීම සහ ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලීන් පාලනය කරන අතර, රෝගී ආරක්ෂණ කමිටුව (Patient Safety Committee) මගින් ආරක්ෂණ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම, පද්ධතිමය අවදානම් හඳුනා ගැනීම සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය කිරීම සිදු කරයි.

එමෙන්ම, දෙපාර්තමේන්තු මට්ටමින් ක්‍රියාත්මක වන ගුණාත්මක කවයන් කමිටුව සමඟ එක්ව පවතින දුර්වලතා විමර්ශනය කරමින් අවශ්‍ය ප්‍රතිකර්ම ක්‍රියාත්මක කරන අතර, නිතිපතා සිදුකරන විගණන සහ සිදුවීම් සමාලෝචන හරහා අඛණ්ඩ ගුණාත්මක වර්ධනයක් තහවුරු කරයි. විධිමත් සිදුවීම් කළමනාකරණ ප්‍රොටෝකෝල (Incident Management Protocols) මගින් සිදුවීම් කාලෝචිතව වාර්තා කිරීම, ඒවායේ මූල හේතු විශ්ලේෂණය කර නිවැරදි කිරීමේ පියවර ගැනීම සහ අඛණ්ඩ පුහුණු වැඩසටහන් හරහා ආයතනය පුරා සුරක්ෂිත සේවා සංස්කෘතියක් පවත්වාගෙන යෑම සහතික කෙරේ.

ප්‍රතිඵලය

2025 වසරේදී ලංකා හොස්පිට්ල්ස් ආයතනය සායනික, මෙහෙයුම් සහ සංවිධානාත්මක යන අංශයන්ගෙන් සුවිශේෂී ප්‍රගතියක් අත්කර ගත් අතර, උපායමාර්ගික ආයෝජන හරහා රෝගී සත්කාරක සේවාවන් සහ ආයතනික ස්ථාවරත්වය මැනිය හැකි ලෙස ඉහළ නැංවීමට සමත් විය. මූල්‍යමය වශයෙන්, වඩාත් සංකීර්ණ වෛද්‍ය ප්‍රතිකාර සේවාවන් සැපයීම (High case mix complexity), ඇඳන් භාවිතයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ විනයගරුක පිරිවැය කළමනාකරණය තුළින් සිය ආදායම් පදනම සහ ලාභ ප්‍රමාණයන් ශක්තිමත් කර ගැනීමට සමූහයට හැකි විය. එමගින්, ආයතනයේ ද්‍රවශීලතාවයට බාධාවක් නොවන පරිදි සායනික තාක්ෂණය සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා නැවත ආයෝජනය කිරීමට අවශ්‍ය පසුබිම නිර්මාණය විය.

විශේෂඥ වෛද්‍ය සේවාවන් පුළුල් කිරීම සහ ශක්තිමත් බහුවිධ ප්‍රතිකාර ක්‍රමවේද (Multidisciplinary care pathways) හේතුවෙන් සායනික ප්‍රතිඵල සැලකිය යුතු ලෙස වර්ධනය විය. ප්‍රමිතිගත ප්‍රොටෝකෝල අනුගමනය කිරීම, විශේෂඥ වෛද්‍ය සංචිතය පුළුල් කිරීම සහ රෝග විනිශ්චය මෙන්ම චිකිත්සක තාක්ෂණයන් වෙනුවෙන් සිදුකළ ආයෝජන හේතුවෙන් රෝහලේ සායනික දර්ශක ඉහළ ගියේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, නියමිත ශල්‍යකර්ම (Elective cases) සඳහා රෝගීන්ට රෝහලේ රැඳී සිටීමට සිදුවන කාලය අවම වූ අතර, දැඩි සත්කාරක ප්‍රතිකාර අවශ්‍ය රෝගීන් සඳහා වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබා දීමට හැකි විය.

ගුණාත්මකභාවය, ආරක්ෂාව සහ ජාත්‍යන්තර ප්‍රතිනතයන් පවත්වා ගැනීම ආයතනික කාර්ය සාධනයේ ප්‍රමුඛස්ථානයක පැවතුණි. ජාත්‍යන්තර ප්‍රමිතීන් සමඟ අඛණ්ඩව පෙළගැසීම සහ දැඩි අභ්‍යන්තර විගණන ක්‍රියාවලීන් හරහා රෝගී ආරක්ෂණ පිළිවෙත් තවදුරටත් ශක්තිමත් කෙරිණි. එහිදී රෝගී ආරක්ෂණ කමිටුව සහ දෙපාර්තමේන්තු ගුණාත්මක කවයන් කාලෝචිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනිමින් පවතින අඩුපාඩු මඟහරවා ගැනීමට කටයුතු කළේය. මෙම පාලන ක්‍රමවේදයන් හේතුවෙන් සිදුවීම් නැවත සිදුවීම අවම වූ අතර, නියාමන සහ ප්‍රතිනතන අවශ්‍යතාවලට අනුකූල වීම තවදුරටත් තහවුරු විය.

ඉදිරි දැක්ම

2025 වර්ෂය ස්ථාවරත්වය තහවුරු කරගත් වසරක් වූ අතර, එය 2026 වසරේ ක්‍රියාත්මක කිරීමට නියමිත පුළුල් පරිවර්තන වැඩසටහන සඳහා ශක්තිමත් පදනමක් දැමීය. මෙම වැඩසටහන යටතේ රෝහලේ ප්‍රධාන අංශ ප්‍රතිසංස්කරණය කිරීම, පහසුකම් ඉහළ නැංවීම සහ රෝහල් පරිශ්‍රයට නව මුහුණුවරක් ලබා දීම ඇතුළු සුවිශේෂී ව්‍යාපෘති රැසක් සැලසුම් කර ඇත.

4TH FULL PROOF



යහපාලනය හා අධීක්ෂණය

ආයතනික පාලන වාර්තාව

පාලන රාමුව

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය සහ ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ මනා පරිචයන්ට අනුකූලව සමාගම යහපත් පාලන රාමුවක් ස්ථාපිත කර ඇත. මෙම රාමුවට අධ්‍යක්ෂ මණ්ඩල අධික්ෂණ පද්ධතියක්, අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු, විධිමත් ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, සහ පැහැදිළි නිශ්චිත වාර්තාකරණ ව්‍යූහයන් මගින් සහය වේ.

පාලන රාමුව, සමාගමේ කටයුතු සිදු කිරීමේදී අඛණ්ඩතාව, විනිවිදභාවය, වගවීම සහ ව්‍යත්තිමයභාවය පිළිබඳ ඉහළම ප්‍රමිතීන් සහතික කරමින් පිළිගත් මනා පරිචයන් සමඟ ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතා ඒකාබද්ධ කරයි. පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීමට සහ සමාගමේ සහ එහි සමූහයේ දිගුකාලීන තිරසාරතාවයට සහාය වීමට එය නිර්මාණය කර ඇත.

සමාගම අදාළ සියලුම නීති, රෙගුලාසි සහ පාලන අවශ්‍යතාවන්ට අනුකූල වන බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී. මූල්‍ය වාර්තාකරණය, අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනයන්හි අඛණ්ඩතාව සුරක්ෂිත කිරීම සඳහා සුදුසු පද්ධති ක්‍රියාත්මක වන බව ද අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.

සමාගම බහුවිධ අංශ හරහා ක්‍රියාත්මක වන විවිධ පරිපාලිත සමාගම් කළඹක් සමඟ, එහි සාම්ප්‍රදායික රක්ෂණ මෙහෙයුම් වලින් ප්‍රධාන වශයෙන් ආයෝජන හිමිකාරිත්වය සහ දේපළ කළමනාකරණ ආයතනයක් ලෙස ක්‍රියා කිරීම දක්වා සංක්‍රමණය වී ඇත. ඒ අනුව, පාලන රාමුව සමූහ ව්‍යුහය ඵලදායී අධික්ෂණය සහ පාලනය සහතික කිරීම දක්වා විහිදේ.

අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය සහ වගකීම්

වාර්තා කරන දිනය වන විට අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් හය (06) දෙනෙකුගෙන් සමන්විත විය. අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන වශයෙන්ම විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වන අතර ඔවුන් උපායමාර්ගය, කාර්යසාධනය හා සම්පත් පිළිබඳ ගැටළු දරා ගැනීමට ස්වාධීන විනිශ්චය ලබාදෙන ඉහළ මට්ටමේ ව්‍යත්තිකයන් වෙති. අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය මගින් සිය වගකීම් ඵලදායීව මුදා හැරීමේදී අවශ්‍ය කුසලතා, අත්දැකීම් සහ ස්වාධීනත්වය පිළිබඳ සුදුසු සමබරතාවක් පිළිබිඹු කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත් වේ.

රජයට අයත් ව්‍යවසායක් ලෙස, අධ්‍යක්ෂ මණ්ඩලය මහජන බැදියාවන් හී භාරකරුවෙක් ලෙස කටයුතු කරන අතර, සමාගම රජයේ ප්‍රතිපත්තිමය අරමුණු හා වාණිජමය විනයට අනුකූල ආකාරයෙන් කළමනාකරණය කරන බව සහතික කරයි.

සංග්‍රහයට අනුකූලව, අධ්‍යක්ෂ මණ්ඩලය නායකත්වය හා උපායමාර්ගික දිශානතිය ලබාදෙන අතර කළමනාකරණයේ ඵලදායී අධික්ෂණය සහතික කරයි. එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලය:

- සමාගමේ උපාය මාර්ගය සකස් කිරීම සහ අනුමත කිරීම;
- මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනය නියාමනය කිරීම;
- අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණාත්මතාව සහතික කිරීම;
- අදාළ නීති, රෙගුලාසි සහ පාලන අවශ්‍යතාවලට අනුකූලතාව සහතික කිරීම; සහ
- සමාගමේ සහ එහි පරිපාලිත සමාගම්වල කාර්යසාධනය අධික්ෂණය කිරීම සඳහා වගකීමට බැඳී සිටී.

සමාගම් ලේකම්

යහ පාලනය ඇති කිරීමේදී සහ අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටිවලට අනුකූලතාවය සහතික කිරීමේදී සමාගම් ලේකම් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. සමාගම් ලේකම් පාලන කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් ලබාදීම සහ අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කරන බව සහතික කිරීම සඳහා වගකිව යුතුය.

සංග්‍රහයට අනුකූලව, සමාගම් ලේකම්ගේ උපදෙස් හා සේවාවන් සඳහා සියලුම අධ්‍යක්ෂවරුන්ට ප්‍රවේශය ඇත. සමාගම් ලේකම් පත්කිරීම සහ ඉවත් කිරීම සමස්ථයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ කාරණයකි.

අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු

අධ්‍යක්ෂ මණ්ඩලය නියමිත මාසික රැස්වීම් සමඟ නිතිපතා රැස්වන අතර, අවශ්‍ය පරිදි අමතර රැස්වීම් ද කැඳවනු ලබයි. තීරණ ගැනීමේදී ඵලදායී ලෙස සහභාගී වීමට පහසුකම් සැලසීම සඳහා අධ්‍යක්ෂවරුන්ට ප්‍රමාණවත් කාලයක් සහ තොරතුරු ලබා දෙන බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.

දැනුවත් සාකච්ඡා පැවැත්වීමට හැකියාව ඇති කරමින්, රැස්වීම්වලට පෙර අධ්‍යක්ෂවරුන්ට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ලැබේ. අධ්‍යක්ෂවරයෙකුට රැස්වීමකට සහභාගී වීමට නොහැකි වූ විට, න්‍යාය පත්‍ර අයිතම පිළිබඳ අදහස් සභාපති, ප්‍රධාන විධායක නිලධාරී හෝ සමාගම් ලේකම් හරහා කල්තියා දැනුම් දිය හැකිය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි රැස්වීම් පැවැත්වීම සඳහා කටයුතු නිසි ලෙස සටහන් කරන බවත් සහ තීරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන බවත් සහතික කරන ව්‍යුහගත ක්‍රියාවලියක් ස්ථාපිත කර ඇති ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු

සංග්‍රහයට අනුකූලව, සිය වගකීම් මුදාහැරීමේදී සහයවීමට සහ ප්‍රධාන ක්ෂේත්‍ර පිළිබඳ ස්වාධීන අධික්ෂණය සහතික කිරීමට, අධ්‍යක්ෂ මණ්ඩලය අනුකමිටු ස්ථාපිත කර ඇත. මෙම අනුකමිටු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ පැහැදිලි, නිශ්චිත විෂය ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක වේ.

ආයතනික අනු කමිටු

ආයෝජන කමිටුව (IC):

ආයෝජන තීරණ අනුමත ප්‍රතිපත්ති, අවදානම් පරාමිති, සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සිදුකරන බව සහතික කරමින් සමාගමේ ආයෝජන කටයුතුවල අධික්ෂණය ලබා දේ.

විගණන කමිටුව (AC):

සංග්‍රහයට අනුකූලව ස්ථාපිත කර ඇති විගණන කමිටුව මූල්‍ය වාර්තාකරණයේ අඛණ්ඩතාව, අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය, සහ ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතාවන්ට අනුකූලතාව සහතික කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ. එමෙන්ම මෙම කමිටුව අභ්‍යන්තර විගණකගේ ස්වාධීනත්වය ද අධීක්ෂණය කරයි.

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව:

සමාගමේ මානව සම්පත් ප්‍රතිපත්ති සහ ව්‍යවහාර එහි උපායමාර්ගික අරමුණු සමඟ පෙළ ගැසෙන බව සහතික කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ. මෙම කමිටුව පාරිශ්‍රමික ප්‍රතිපත්ති, කාර්යසාධන කළමනාකරණය සහ අනුප්‍රාප්තික සැලසුම්කරණය අධීක්ෂණය කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ කමිටු රැස්වීම් - 2025

2025 වර්ෂය තුළ දී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් දොලහක් (12) පවත්වා ඇත.

අධ්‍යක්ෂගේ නම	සහභාගී වූ රැස්වීම් ගණන
නුසිත් කුමාරතුංග මහතා	12
දුෂ්මන්ත තොටවත්ත මහතා	12
රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා, 2025 අගෝස්තු 01 දින ඉල්ලා අස්විය	06
රජිව් ධර්මේන්ද්‍ර මහතා 2025 ජනවාරි 01 දින පත්කළ හා 2025 ජූනි 23 ඉල්ලා අස්විය	04
නිල් උනම්බුවේ මහතා ජනාධිපති නීතිඥ 2025 ජනවාරි 01 දින පත්කළ	11
රොහාන් බුල්ජන්ස් මහතා 2025 ජනවාරි 01 දින පත්කළ	12
සෝමදාස පලිහවඩන මහතා 2025 ජූනි 30 දින පත්කළ	08
අජිතා බටගොඩ මහත්මිය 2025 අගෝස්තු 13 දින පත්කළ සහ 2025 නොවැම්බර් 13 දින ඉල්ලා අස්විය	02
තුෂාර රොද්‍රිගෝ මහතා 2025 නොවැම්බර් 13 දින පත්කළ	03

විගණන කමිටු රැස්වීම් (AC) - 2025

2025 වර්ෂය තුළ දී විගණන කමිටු රැස්වීම් තුනක් (03) පවත්වා ඇත.

අධ්‍යක්ෂගේ නම	සහභාගී වූ රැස්වීම් ගණන
දුෂ්මන්ත තොටවත්ත මහතා (කමිටුවේ සභාපති)	03
රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා 2025 අගෝස්තු 01 දින ඉල්ලා අස්විය	02
රොහාන් බුල්ජන්ස් මහතා 2025 ජනවාරි 01 දින පත්කළ	03
තුෂාර රොද්‍රිගෝ මහතා 2025 නොවැම්බර් 13 දින පත්කළ	01

සටහන: වාර්ෂික වාර්තාවේ දිනයට, පහත සාමාජිකයින් මෙම කමිටුවේ (AC) සේවය කර ඇත:

ඩී තොටවත්ත මහතා - විගණන කමිටුවේ සභාපති

ආර් පී බුල්ජන්ස් මහතා

බී ඒ ටී රොද්‍රිගෝ

ආයෝජන කමිටු රැස්වීම් - 2025

2025 වර්ෂය තුළ දී ආයෝජන කමිටු රැස්වීම් අටක් (08) පවත්වා ඇත. රැස්වීම විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් විසින් මෙහෙයවන ලදී

අධ්‍යක්ෂගේ නම	සහභාගී වූ රැස්වීම් ගණන
රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා, (කමිටුවේ සභාපති) 2025 අගෝස්තු 01 දින ඉල්ලා අස්විය	04
දුෂ්මන්ත තොටවත්ත මහතා	08
නුසිත් කුමාරතුංග මහතා	08
රජිව් ධර්මේන්ද්‍ර මහතා 2025 ජනවාරි 01 දින පත්කළ හා 2025 ජූනි 23 ඉල්ලා අස්විය	01
සෝමදාස පලිහවඩන මහතා (2025 සැප්තැම්බර් 04 සිට කමිටුවේ සභාපති) 2025 ජූනි 30 දින පත්කළ	05
අජිතා බටගොඩ මහත්මිය 2025 අගෝස්තු 13 දින පත්කළ සහ 2025 නොවැම්බර්13 දින ඉල්ලා අස්විය	–
තුෂාර රොද්‍රිගෝ මහතා 2025 නොවැම්බර්13 දින පත්කළ	01

මානව සම්පත් කමිටු රැස්වීම් - 2025

2025 වර්ෂය තුළ දී මෙම කමිටුව රැස්වීම් එකක් (01) පවත්වා ඇත. රැස්වීම විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් විසින් මෙහෙයවන ලදී.

අධ්‍යක්ෂගේ නම	සහභාගී වූ රැස්වීම් ගණන
නිල් උනම්බුවේ මහතා (කමිටුවේ සභාපති) 2025 ජනවාරි 01 දින පත්කළ	01
නුසිත් කුමාරතුංග මහතා	01
දුෂ්මන්ත තොටවත්ත මහතා	01
සෝමදාස පලිහවඩන මහතා 2025 ජූනි 30 දින පත්කළ	01

තොරතුරු ප්‍රවාහය

ඵලදායී තීරණ ගැනීම සඳහා සහාය වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට කාලීන, නිවැරදි සහ සවිස්තරාත්මක තොරතුරු සපයනු ලැබේ. අධ්‍යක්ෂවරුන්ට ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට ප්‍රවේශය ඇති අතර අවශ්‍ය අවස්ථාවලදී සමාගමේ වියදමින් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගත හැකිය.

අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ආරක්ෂිතව සහ කාලීනව බෙදා හැරීම සඳහා සමාගම විද්‍යුත් වේදිකා භාවිතා කරයි. නිසි වාර්තා තබා ගැනීම සහ තීරණ පසු විපරම් කිරීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සහ අනු කමිටු රැස්වීම්වල වාර්තා පවත්වා ගෙන යනු ලබන අතර බෙදා හරිනු ලැබේ.

මූල්‍ය වාර්තාකරණය

සමාගමේ මූල්‍ය තත්ත්වය හා කාර්යසාධනය පිළිබඳ සමබර හා අවබෝධ කරගත හැකි තක්සේරුවක් ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් වගකීමට බැඳී සිටී. අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබයි.

අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලනයන්

අධ්‍යක්ෂ මණ්ඩලය අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණය පිළිබඳ ඵලදායී පද්ධතියක් ස්ථාපිත කිරීම හා පවත්වා ගැනීම සඳහා වගකීමට බැඳී සිටී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වසර තුළ සහ මෙම වාර්තාවේ දිනය දක්වා මෙම පද්ධතිවල ඵලදායිත්වය සමාලෝචනය කර ඇති බව සහතික කරයි.

සමාගම පාලනය, අවදානම සහ අනුකූලතා ව්‍යූහයක් තුළ ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුවක් යොදා ගනී. මූලික අවදානම් හඳුනාගෙන පහත වර්ගීකරණයන්, එනම් උපායමාර්ගික, මූල්‍ය, මෙහෙයුම් (කීර්තිනාම අවදානම ඇතුළුව) සහ උවදුරු අවදානම හරහා කළමනාකරණය කෙරේ.

විගණන කමිටුව තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වාර්තාකරන, ස්වාධීන අභ්‍යන්තර විගණන කාර්යයක් ක්‍රියාත්මක වේ. විගණන කමිටුව නිරන්තරව අභ්‍යන්තර විගණන සොයා ගැනීම් සමාලෝචනය කරන අතර සුදුසු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන බවට සහතික වේ.

විගණන කමිටු වාර්තාව

විගණන කමිටුව (AC) සමාගමේ මූල්‍ය තත්ත්වය නිවැරදිව නියෝජනය කරන බව සහතික කරමින් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාව අධීක්ෂණය කිරීම සඳහා මූලිකව වගකීමට බැඳී සිටී. ඊට අමතරව, මෙම කමිටුව සදාචාරාත්මක ප්‍රමිති සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සමාගම ක්‍රියාත්මක වන බව සහතික කරයි. විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කරන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් මෙහෙයවනු ලබයි. සමාගම් ලේකම්වරයා රැස්වීම්වල ලේකම්වරයා වශයෙන් කටයුතු කරයි. විගණන කාර්යයන් විගණන කමිටුව වෙත වාර්තා කරනු ලැබුව ද, ඒවායේ මෙහෙයුම් ස්වාධීනත්වය පැහැදිලි රාජකාරි වෙන් කිරීමක් තුළින් ආරක්ෂා කෙරේ.

විගණන කමිටුවට මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනයන්, අනුකූලතාව සහ බාහිර විගණන අධීක්ෂණය කිරීම ඇතුළුව සිය වගකීම් ඵලදායීව ඉටු කිරීමට සමාගම ශක්තිමත් කරමින් මූල්‍යකරණය, විගණනය, සහ රක්ෂණයේ ප්‍රවීනත්වය සහිත ජ්‍යෙෂ්ඨ වෘත්තිකයින් සහය වේ.

කාර්ය පරාසය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් (SLIC) විගණන කමිටුවේ විෂය නිර්දේශය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තියේ පැහැදිලිව දක්වා ඇත. මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (2023) මගින් ඒකාබද්ධව නිකුත් කරන ලද "ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය" සහ "2021 දි නිකුත්කළ රජයට අයත් ව්‍යවසාය සමාගම් සම්බන්ධ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ" ඇතුළුව විගණන සඳහා මඟ පෙන්වන මූලධර්ම සහ මනා පරිචයන් සමඟ පෙළ ගැසේ. ප්‍රඥප්තියේ විෂයපථයට මූල්‍යකරණය, ගිණුම්කරණය, ප්‍රසම්පාදනය, නීතිමය අනුකූලතාව සහ සාදාචාර වැනි ක්ෂේත්‍ර හරහා සමාගමේ අනාවරණ පද්ධති සහ අභ්‍යන්තර පාලනයන්ගේ වැඩිකළ අධීක්ෂණය ඇතුළත් වේ. එමෙන්ම එය කළමනාකාරිත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත ව්‍යාපාර අවදානම් කළමනාකරණය නියාමනය හා සම්බන්ධ වේ. කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට වගවන අතර සිය කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට නිරතුරුවම වාර්තා ලබා දේ.

කමිටුවේ රැස්වීම්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වසර තුළ, කමිටුවේ රැස්වීම් තුනක් (03) පවත්වන ලදී. කමිටු රැස්වීම්වල කටයුතු ප්‍රමාණවත් විස්තර සහිතව වාර්තා කරනු ලබන අතර එම වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට ද නිරතුරුව වාර්තා කරයි. ආරාධනය අනුව විගණකාධිපතිවරයාගේ නියෝජිතයින් මෙම රැස්වීමට සහභාගි වේ.

2025 දී රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ පැමිණීම පහත දක්වා ඇත:

අධ්‍යක්ෂවරයාගේ නම	සහභාගී වූ රැස්වීම් ගණන
දුෂ්මන්ත තොටවත්ත මහතා (කමිටුවේ සභාපති)	03
රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා 2025 අගෝස්තු 01 දින ඉල්ලා අස්විය	02
රොහාන් බුල්ජන්ස් මහතා 2025 ජනවාරි 01 දින සිට පත්කරන ලදී	03
තුෂාර රොද්‍රිගෝ මහතා 2025 නොවැම්බර් 13 දින සිට පත්කරන ලදී	01

බාහිර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා බාහිර විගණකවරයා වශයෙන් පත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වාර්ෂික විගණනයේ දී විගණකාධිපතිවරයාට සහාය ලබා දීම සඳහා සුදුසුකම් ලත් විගණකයකු වශයෙන් Messrs BDO Partners යන සමාගම විගණකාධිපතිවරයා විසින් පත් කරන ලදී. ඊට අමතරව, බාහිර විගණක විසින් ලබාදෙන සොයා ගැනීම් සහ නිර්දේශයන්ට කළමනාකරණ ලිපිය සහ කළමනාකරණයේ ප්‍රතිචාරය කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබීය.

විගණන කමිටුව සඳහා තොරතුරු ප්‍රවාහය

විගණන කමිටුවට කළමනාකාරිත්වයෙන් සහ බාහිර විගණකයන්ගෙන් ප්‍රමාණවත්, විශ්වසනීය සහ කාලෝචිත තොරතුරු ලැබී ඇති බව කමිටුව සහතික වේ. මෙය වගකීම් ඵලදායීව ඉටුකිරීමට විගණන කමිටුව ශක්තිමත් කරයි.

වත්කම් සහ වගකීම් තක්සේරු කිරීම සහ හානිකරණය

සාධාරණ අගය ගිණුම්කරණයේ වර්ධනීය විශ්වාසය සහ එහි සැලකිය යුතු බලපෑම සලකා බලමින්, සාධාරණ අගයන් තීරණය කිරීමේ දී භාවිත කරනු ලබන වැදගත් උපකල්පන විනිවිදව අනාවරණය කරන බවත්, සම්පූර්ණයෙන් සමාලෝචනය කරන බවත් සහ අවශ්‍ය පරිදි ඒවා ප්‍රශ්න කරන බවත් විගණන කමිටුව සහතික කරයි. ඊට අමතරව, හානිකරණය තක්සේරු කිරීම සඳහා පවතින ක්‍රියාපටිපාටි සතුටුදායක බව කමිටුව තහවුරු කරයි.

ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) යොදා ගැනීම

විගණන කමිටුව විසින් ආයතනය තුළ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRSs) යොදා ගැනීමේ ප්‍රගතිය අධීක්ෂණය කරයි. කමිටුව විසින් නිරන්තර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී මෙම ප්‍රමිති ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය සහ සංවර්ධනයන් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වරින් වර දැනුවත් කිරීම් ලබා දේ.

ස්වාධීන බාහිර උපදෙස්

විගණන කමිටුවේ ප්‍රඥප්තිය මගින් සුදුසු අවස්ථාවල දී ස්වාධීන බාහිර උපදෙස් ලබා ගැනීම සඳහා අවසර ලබා දේ.

විගණන නොවන සේවා

වසර තුළ, එවැනි සේවා ලබාදීම විගණකගේ ස්වාධීනත්වයට සහ විෂයමූලිකත්වයට බලපෑමක් නොමැති බව සහතික කිරීමට බාහිර විගණක විසින් ලබා දෙන සියලුම විගණන නොවන සේවා කමිටුව ඇගයීමට ලක් කර ඇත.

නිගමනය

පසුගිය වසර තුළ බාහිර විගණකයින්ගේ ඵලදායීත්වය හා ස්වාධීනත්වය සමඟ කමිටුව සෑහීමකට පත් වේ. එමෙන්ම, ඔවුන් ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීම අනුමත කරන අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශන විශ්වසනීය බව සලකා බලයි. ඊට අමතරව, බාහිර විගණකයින්ගේ වාර්තාවේ අනාවරණය කළ පරිදි අදාළ සියලුම නීති සහ රෙගුලාසිවලට සම්පූර්ණ අනුකූලවීම සහතික කරමින් සමාගමේ අනුකූලතා රාමුව සම්බන්ධයෙන් කමිටුව සෑහීමට පත් වේ. සමාලෝචිත වසර තුළ හඳුනාගත් අනුකූල නොවීමේ සිදුවීම් සඳහා නිවැරදි කිරීමේ සහ වැලැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන ඇත.



දුෂ්මන්ත තොටවත්ත

සභාපති - විගණන කමිටු

2026 අප්‍රේල් 20

ආයෝජන කමිටු වාර්තාව - 2025

ආයෝජන කමිටුවේ අරමුණ

ආයෝජන කමිටුවේ අරමුණ වන්නේ අනුබද්ධිත සමාගම්වල මෙහෙයුම් යම් බිඳවැටීම් නොමැතිව පහසුවෙන් ක්‍රියාත්මක කරන අතර, රජයට අයත් ව්‍යවසාය මාර්ගෝපදේශවලට අනුව පාර්ශවකාර අපේක්ෂාවන්ට අනුකූලව සමාගමේ ආයෝජන කටයුතු ආරක්ෂිත, ලහදායි සහ ද්‍රවශීල බව සහතික කිරීමයි. එමෙන්ම, ආයෝජන කමිටුව විසින් ආයෝජන තීරණ ගැනීමේ ක්‍රියාවලිය ක්‍රමවත්, කාර්යක්ෂම, ඵලදායි සහ ක්ෂේත්‍රයේ මනා පරිචයන්ට අනුකූල වන බව සහතික කරයි.

විවිධ විනයන්හී වෘත්තිකයින්ගෙන් සමන්විත ආයෝජන කමිටුව ආයෝජන තීරණ ගැනීමේ එකඟතාවයට ලඟාවීමට පෙර විවිධ පරාශයක අංග සලකා බලයි. මෙම පුළුල් නිවාරණ ක්‍රියාවලිය මගින් ප්‍රසශ්ත ආයෝජන තීරණ ගන්නා බව සහතික කරන අතර එය ශක්තිමත් ආයෝජන ආදායම මගින් සනාථ කරයි. යෝග්‍ය ලෙස ආයෝජන තීරණ ගැනීම 2025 වසරේදී යහපත් ආයෝජන ආදායමක් උත්පාදනයට පහසුකම් සලසා ඇත. ආයෝජන හා බැඳි පවතින්නා වූ පද්ධතිමය අවදානම් අවම කරන බව සහතික කිරීම පිණිස වත්කම් පන්ති, කල්පිරීම් පැතිකඩ, සහ අංශ අතර ආයෝජන විවිධාංගීකරණය ආයෝජන කමිටුව විසින් ක්‍රියාත්මක කරන මූලික මූලධර්මයකි.

විශේෂ ආයෝජනයක පරමාර්ථ සපුරාලනු ලබන බව හෝ සපුරාලීම පරීක්ෂා කරන බව සහතික කිරීම සඳහා ආයෝජන අබණ්ඩව නියාමනය කෙරේ. ශේෂ පත්‍රයේ යෝග්‍යතාවය යහපත් බව සහතික කිරීම ආයෝජන කමිටුවේ මූලික අවධානයකි.

ආයෝජන උපායමාර්ග

2025 වසරේදී, දළ දේශීය නිෂ්පාදිතය ශක්තිමත් වර්ධනයක් පෙන්වා ඇති බැවින් හා ආර්ථික කටයුතු ඉදිරියට ගමන් කරන බැවින්, ශ්‍රී ලංකා ආර්ථිකය 2022 ආර්ථික අර්බුදයෙන් සිය ප්‍රතිසාධන ගමන්මගේ ඉදිරියට ගියේය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) වසර තුළ තවදුරටත් ශ්‍රී ලංකාවට සහය විය. ශ්‍රී ලංකා මහ බැංකුව 2025 දී මූල්‍ය ප්‍රතිපත්තිය ලිහිල් කිරීම දක්නට ලද අතර, මෝටර් රථ ආනයනයට පනවා තිබූ සීමාවන් රජය විසින් විවෘත කරනු ලැබූවද, විනිමය අනුපාතය බොහෝරට ස්ථාවරව පැවතුණි. සංචාරක ඉපයීම්, අපනයන හා ප්‍රේෂණ විදේශ විනිමය වෙළෙඳපොලේ ඇමෙරිකන් ඩොලර්වල ස්ථීර ප්‍රවාහයක් පවත්වා ගෙන යන ලදී.

දිත්වා සුලිකුණාටුවේ බලපෑම් ලෝක බැංකුව විසින් ඇ.ඩොලර් බිලියන 4.1ක් ලෙස තක්සේරු කරන ලදී. මෙම බලපෑම සම්පූර්ණයෙන්ම අනපේක්ෂිත වූ අතර ආර්ථිකය කෙරෙහි දරුණු ප්‍රතිචාරයක් එල්ල කර ඇත. කෙසේවෙතත්, මෙරට ආර්ථික වර්ධනයේ ඉදිරි අදියර සඳහා උත්ප්‍රේරකයක් වියහැකි පශ්චාත් ආපදා ප්‍රතිසාධන අපි අපේක්ෂා කරමු.

අබණ්ඩව මාස 11ක් සෘණාත්මකව පැවති උද්ධමනය 2025 තුළ ධනාත්මක බවට පත්විය. පශ්චාත් ආපදා ප්‍රතිසාධනය සිදුවන බැවින්, 5%ක් වූ මහ බැංකුවේ උද්ධමන ඉලක්කය 2026 දෙවන අර්ධය මුල් භාගයේදී ලඟා වෙනු ඇත.

පහළ පොලී අනුපාතවලින් ණය සඳහා ඉල්ලුමෙහි ප්‍රසාරණය දිරි ගන්වා ඇති බැවින් පුද්ගලික අංශයේ ණයවල සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. මහ බැංකුව අන්තර්බැංකු විනිමය වෙළෙඳපොලෙන් ඇ.ඩොලර් මිලදී ගැනීම දක්නට වූ බැවින් දළ නිල සංචිත තවදුරටත් වැඩි වෙමින් පැවතුණි.

2025 වසරේදී, ඵලදා චක්‍රය ක්‍රමයෙන් පහළට ගලපන ලද බැවින්, අඩු පොලී අනුපාත, ශක්තිමත් ආයතනික ඉපැයීම්, කලාපීය තරඟකරුවන් හා සසඳන විට ආකර්ශනීය තක්සේරු කිරීම් සහ ආදායම් බදු වාසි මත කොටස් වෙළඳපොළ උත්තේජනය වී සර්වකාලීන ඉහළම මට්ටමට ළඟා විය. වසර පුරාවට පැන නගින අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගැනීමට සමාගමේ ආයෝජන කමිටුව ඉක්මනින් කටයුතු කළේය.

නියාමනය සහ පාලනය

ආයෝජන රාජකාරී වෙළෙඳාම් උත්පාදනය වන, ඉදිරිපෙළ කාර්යාලයට, අවදානම් නියාමනය කරන මැදපෙළ කාර්යාලයට සහ නිරවුල් කිරීම සඳහා වගකියන පසුපෙළ කාර්යාලයට වෙන් කරන ලද අතර, ගණනය කරන ආයෝජන කාර්යසාධනය නිරන්තරව නියාමනය කර වාර්තා කෙරේ. ආයෝජන කමිටුව සමීපව වෙළෙඳපොල සංවර්ධනයන් නියාමනය කරන අතර ආයෝජන හා වෙළෙඳ අවස්ථා මත ප්‍රාග්ධනනීයකරණයට කඩිනමින් ප්‍රතිචාර දක්වයි.

සමාලෝචනයට යටත් වසර - ආයෝජන කටයුතුවල සාරාංශය

වසර තුළ ආයෝජන ආදායම රු. බිලියන 4.6ක් විය. වාර්තාකරණ කාලසීමාව තුළ, ආයෝජන ආදායම සමාගමේ මුළු ආදායමෙන් 68%කට දායක විය.


ආයෝජනයේ සුරක්ෂිතබව සහ ස්ථාවරත්වය

ක්‍රමානුකූල නොවන අවදානම් අවම කිරීම සහ තනි වත්කම් පන්ති මත ආයෝජනවල රඳාපැවැත්ම අඩු කිරීම සඳහා ආයෝජන කළඹ විවිධ අංශ සහ වත්කම් පන්ති හරහා මනාව විවිධාංගීකරණය කෙරේ.

පහත සඳහන් ප්‍රස්ථාරයෙන් 2025 දෙසැම්බර් 31 දිනට සමාගමේ ආයෝජන වත්කම් වෙන් කිරීම පැහැදිලි කරයි.

සමාගමේ ආයෝජන


2025 දෙසැම්බර් 31 දිනට අංශමය වෙන් කිරීම - ලැයිස්තුගත ස්කන්ධ හිමිකාර අරමුදල (%)



20206 සඳහා දැක්ම

ශ්‍රී ලාංකීය ආර්ථිකය මැතකාලීන ස්වභාවික ආපදාවෙන් පිඩාවට පත්වීමේ සිට 2026 දී ආපසු යථා තත්වයට පැමිණ, ස්ථාවර වෙමින් වි හැඩයක් තුළ නැවත නිර්මාණය වනු ඇති බව අපි අපේක්ෂා කරමු.

2026 වසර තුළ ඉහළ මට්ටම් සාක්ෂාත්කර ගත හැකි වන බවට ආයෝජන කමිටුවට විශ්වාසය.



සෝමදාස පලිහවඩන

සහාපති - ආයෝජන කමිටුව

අනුකූලතා වාර්තාව

අනුකූලතා ප්‍රකාශය

සිමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් අදාළ නීති, රෙගුලාසි, රජයේ චක්‍රලේඛ, සහ ආයතනික යහ පාලනය පිළිබඳ පිළිගත් මූලධර්ම සම්පූර්ණ අනුකූලතාවය තුළ සිය කටයුතු පවත්වා ගැනීමට බැඳී සිටී. මෙම අනුකූලතා වාර්තාව සමාගමේ පසුගිය වාර්ෂික වාර්තාව තුළ යොදා ගත් වාර්තාකරණ ව්‍යවහාරවලට අනුකූලව සකස් කරන අතර, සංස්ථාවේ අනුකූලතා රාමුව පිළිබඳ දළ විශ්ලේෂණයක් සහ සමාලෝචිත මූල්‍ය වසර තුළ අනුකූලතාව ලබා දේ.

සිය මෙහෙයුම් ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසුව, සමාගම වර්තමානයේ ආයෝජන අවධානිත රජයට අයත් ව්‍යවසායක් ලෙස ක්‍රියාත්මක වන අතර රක්ෂණ ප්‍රතිරක්ෂණය හෝ රක්ෂණයට අදාළ ව්‍යාපාරික කටයුතුවල සහභාගි නොවේ. ඒ අනුව, සංස්ථාවේ අනුකූලතා රාමුව රජයට අයත් ව්‍යවසාය සහ ආයෝජනයට අදාළ කටයුතුවලට අදාළ ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතාවන් සමඟ පෙළ ගැසේ.

අධ්‍යක්ෂ මණ්ඩලය අනුකූලතාවය සහතික කිරීම සඳහා අවසාන වගකීම් දරන අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු, ජ්‍යේෂ්ඨ කළමනාකරණය සහ අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් මෙම කාර්යභාරය තුළ සහය වේ. සංස්ථාව තුළ ශක්තිමත් අනුකූලතාව, සදාචාර චර්යාව, විනිවිදභාවය සහ වගවීම පිළිබඳ සංස්කෘතියක්, ප්‍රවර්ධනය කිරීමට සුදුසු ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, සහ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණ ස්ථාපිත කර ඇත.

නෛතික සහ නියාමන අනුකූලතාව

2007 අංක 07 දරන සමාගම් පනත (සංශෝධිත පරිදි)

සංස්ථාව ආයතනික පාලනය, අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්, ගිණුම් වාර්තා පවත්වා කිරීම සහ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධ අවශ්‍යතා ඇතුළුව 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධානවලට අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි මගින් සහාය දක්වන ඵලදායී පාලන ව්‍යුහයක්, අනුකූලතාව සහතික කිරීම සඳහා ක්‍රියාත්මක වේ.

රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ සහ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ

රජයට අයත් ව්‍යවසායක් ලෙස, සමාගම අදාළ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තු චක්‍රලේඛ සහ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛවලට අනුකූල වේ. මූල්‍ය කළමනාකරණය, ආයෝජන කටයුතු, ප්‍රසම්පාදනය, අයවැයකරණය, සහ වාර්තාකරණය මෙම චක්‍රලේඛවලට අනුකූලව සිදු කර ඇත.

රජයට අයත් ව්‍යවසාය සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ

රජයට අයත් ව්‍යවසාය සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවලට අනුකූලවීම සමාගම අඛණ්ඩව සිදු කරයි. තීරණ ගැනීමේදී ඵලදායී අධීක්ෂණය, වගවීම සහ විනිවිදභාවය සහතික කරමින් ස්ථාපිත අධ්‍යක්ෂ මණ්ඩල කමිටු තුළින් අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරයි.

රජයට අයත් ව්‍යවසාය සඳහා මෙහෙයුම් අත්පොත

පාලනය හා මෙහෙයුම් ඵලදායිත්වය වැඩි කිරීමට සිදුකළ නිරන්තර සමාලෝචන සමඟ සමාගමේ අභ්‍යන්තර ක්‍රියාවලි සහ පාලනයන් රජයට අයත් ව්‍යවසාය සඳහා මෙහෙයුම් අත්පොත සමඟ පෙළ ගැසේ.

ආයෝජන පාලනය හා අධීක්ෂණය

සිය වර්තමාන වරමට අනුව, සමාගමේ මූලික කටයුතු ආයෝජන කළමනාකරණය හා අධීක්ෂණයට අදාළ වේ. ආයෝජන තීරණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ ප්‍රතිපත්ති මගින් පාලනය කරන අතර, ආයෝජන අනු කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරන අධීක්ෂණයට යටත් වේ. අදාළ නීති, චක්‍රලේඛ සහ ආයෝජන කමිටුවලට අදාළ අවදානම් කළමනාකරණ අවශ්‍යතාවන්ට අනුකූලතාව සහතික කිරීමට පද්ධති සහ පාලනයන් ක්‍රියාත්මකය.

කම්කරු සහ රැකියා නීතියට අනුකූලතාව

සංස්ථාව, සාප්පු හා කාර්යාල සේවක පනත, සේවකයින්ගේ රැකියා අවසන් කිරීමේ පනත, මාතෘ ප්‍රතිලාභ ආඥා පනත, සේවක අර්ථසාධක අරමුදල් පනත, සේවක භාර අරමුදල් පනත, පාරිතෝෂික ගෙවීම් පනත සහ ජාතික අවම වැටුප් සේවක පනත ඇතුළු සියලුම අදාළ කම්කරු හා රැකියා සම්බන්ධ නීතිරීතිවලට අනුකූල වී ඇත. ව්‍යවස්ථාපිත ගෙවීම් සහ සේවක ප්‍රතිලාභ නීතිමය අවශ්‍යතාවලට අනුකූලව පරිපාලනය කරන ලදී.

තොරතුරු දැනගැනීමේ අයිතිය හා සහ රාජ්‍ය භාෂා අනුකූලතාව

සමාගම තොරතුරු ඉල්ලීම් හැසිරවීම සඳහා ස්ථාපිත ක්‍රියාපටිපාටි තුළින් 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත සමඟ අනුකූල වී ඇත. සංස්ථාව සිය නිල සන්නිවේදන සහ ලේඛණගතකරණය තුළ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනත සමඟ අඛණ්ඩව අනුකූල වේ.

විගණනය, වගවීම, සහ පාර්ලිමේන්තු අධීක්ෂණය

2018 අංක 19 දරන ජාතික විගණන පනත සමඟ සංස්ථාව අනුකූල වී ඇති අතර, විගණකාධිපති විසින් පවත්වන ලද විගණන සමඟ සම්පූර්ණයෙන් සහයෝගී වේ. විගණන නිරීක්ෂණ විගණන කමිටුව විසින් සමාලෝචනය කරන අතර, නිවැරදි කිරීමේ කාර්යයන් අවශ්‍ය අවස්ථාවේදී ක්‍රියාත්මක කෙරේ. සමාගම රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කමිටුවේ අවශ්‍යතාවන් සමඟ අනුකූල වේ.

සදාචාර, දූෂණ විරෝධය සහ වංචා වැලැක්වීම

අල්ලස් පනත, වංචා වැලැක්වීමේ ආඥාපනත සහ 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනත ඇතුළුව සදාචාර, දූෂණ විරෝධය හා වංචා වැලැක්වීමට සම්බන්ධ අදාළ නීති සමඟ සමාගම අනුකූල වී ඇත.

නියාමනය හා සහතික කිරීම

අදාළ නීති, රෙගුලාසි සහ චක්‍රලේඛ සමඟ අනුකූලතාව අභ්‍යන්තර පාලනයන්, නිරන්තර සමාලෝචන හා කළමනාකරණ අධීක්ෂණය තුළින් නියාමනය කෙරේ. වැදගත් අනුකූලතා කරුණු ඇත්නම්, ස්ථාපිත පාලන මාර්ග තුළින් ජ්‍යේෂ්ඨ කළමනාකරණය හා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කෙරේ.

නිගමනය

වසර තුළ සිදුකළ අනුකූලතා සමාලෝචන මත පදනම් වී, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, සෑම වැදගත් අංශයකින්ම සමාලෝචිත මූල්‍ය වසර තුළ ආයෝජනය අවධානිත රජයට අයත් ව්‍යවසායක් ලෙස සිය මෙහෙයුම්වලට අදාළ වන්නා වූ අදාළ නීති, රෙගුලාසි සහ පාලන අවශ්‍යතාවන්ට අනුකූල වී ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.



මූල්‍ය ප්‍රකාශන

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි වාර්ෂික වාර්තාව

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2025 දෙසැම්බර් 31 න් අවසන්වූ වර්ෂය සඳහා සමාගමේ සහ සමූහයේ වාර්ෂික වාර්තාව, සමඟ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ විගණකගේ වාර්තාව කොටස්හිමියන් වෙත සතුටින් ඉදිරිපත් කර සිටී.

මෙම වාර්තාව සකස් කිරීමේදී, 2007 අංක 07 දරණ සමාගම් පනත, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත සහ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත හා ඒවාට කරන ලද සංශෝධන සහ ආයතනික පාලනය පිළිබඳ හඳුනාගත් ප්‍රශස්ථ අවශ්‍යතාවයන් වෙත නිසි ලෙස සලකා බැලීම සිදු කර ඇත.

කොටස් හිමිකාරත්වය පිළිබඳ තොරතුරු

2025 දෙසැම්බර් 31 දිනට, 99.98% ක කොටස් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම්වරයා සතුවේ. 2025 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය කොටස් දරන ලියාපදිංචි කොටස්හිමියන් 08 ක් විය. සමාගම සෑම අවස්ථාවකදීම සියලුම කොටස්හිමියන් වෙත සමානව සලකන බව සහතික කිරීමට සමාගම උත්සාහ ගනී.

අනුබද්ධ සමාගමේ නම	කොටස්හිමි ප්‍රතිශතය (%)
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්	100
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්	100
ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්	100
කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවට්) ලිමිටඩ්	100
මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (ප්‍රයිවට්) ලිමිටඩ්	100
ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ්	99.94
ලංකා හොස්පිටල් කෝපරේෂන් පීඑල්සී	51.34

ලියාපදිංචි කාර්යාලය

සමාගමේ ලියාපදිංචි කාර්යාලය හා ප්‍රධාන කාර්යාලය කොළඹ 02, වොක්ෂෝල් වීදියේ අංක 21, රක්ෂණ මන්දිරයන් හි පිහිටා ඇත.

සමාගමේ ප්‍රධාන කටයුතු

සමාගමේ මූලික කාර්යය වන්නේ සමාගමට සම්පූර්ණයෙන්ම අයත් පරිපාලිත සමාගම් පහක් එනම් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්, ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (ප්‍රයිවට්) ලිමිටඩ් සමඟ පරිපාලන සමාගම ලෙස කටයුතු කිරීමයි.

ඊට අමතරව, සමාගමට සැලකියයුතු කොටස් හිමිකාරිත්වයක් අයත් ලංකා හොස්පිටල් කෝර්පරේෂන් පීඑල්සී සහ ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ් යන සමාගම් වල පරිපාලන සමාගම ලෙස කටයුතු කරයි.

සමූහයේ මූලික කටයුතු

2024 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මකව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් මූලික කාර්යය වන්නේ දිගු කාලීන (ජීවිත) රක්ෂණ ව්‍යාපාරය පවත්වා ගෙන යාම වන අතර ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් සාමාන්‍ය රක්ෂණ මෙහෙයුම් කෙරෙහි අවධානය යොමු කිරීමයි. ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ද්‍රව පෙට්ට්‍රෝලියම් ගෑස් (LPG) ගබඩා කිරීමෙහි විශේෂඥයෙකු වන අතර, ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ් ගෘහස්ථ, වාණිජ හා තොග ආකාරයෙන් ද්‍රව පෙට්ට්‍රෝලියම් ගෑස් ආනයනය හා බෙදාහැරීම සඳහා වගකීමට බැඳී සිටී. ලංකා හොස්පිටල් කෝර්පරේෂන් පීඑල්සී සෞඛ්‍යාරක්ෂක සේවා සපයන අතර, මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (ප්‍රයිවට්) ලිමිටඩ් පඩිපත් කළමනාකරණ විසඳුම් ලබා දෙයි. එමෙන්ම, සීමාසහිත කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවට්) ලිමිටඩ් මූලික වශයෙන් දකුණු අධිවේගී මාර්ගයට අලෙවිසැල් හිමිකාරිත්වය දරමින් ඒවා කළමනාකරණය කරයි.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

සමාගමේ සහ සමූහයේ කටයුතු පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබාදීම පිණිස මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් වගකීමට බැඳී සිටී. අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් අතරට, වංචා හෝ දෝෂ හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශන වලින් තොර මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම. ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ අනුගමනය කිරීම සහ තත්වයන් යටතේ සාධාරණ ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීම සඳහා අදාළ අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම. පවත්වාගෙන යාම ඇතුළත් වේ.

මෙම වාර්ෂික වාර්තාව තුළ ඇතුළත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සමඟ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අදාළ සටහන්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවන්ට අනුකූලව සකස්කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි.

මූල්‍ය ප්‍රකාශන හා විගණකගේ වාර්තාව

2025 දෙසැම්බර් 31 න් අවසන්වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති මත පදනම්ව සකස් කරනු ලබයි. සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන ප්‍රධාන මූල්‍ය නිලධාරි සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු විසින් විධිමත්ව අත්සන් තබා ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ සහ සටහන් මගින් 2025 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එම දිනයෙන් අවසන් වන වසර සඳහා එහි කාර්යසාධනය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ඉදිරිපත් කරනු ලැබේ.

විගණකගේ වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා බාහිර විගණකවරයා වශයෙන් පත්කරන ලදී. 2025 දෙසැම්බර් 31 න් අවසන්වූ වර්ෂයේ සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ වාර්ෂික විගණනයේදී විගණකාධිපතිට සහයවීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(4) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති විසින් වරලත් ගණකාධිකාරී සමාගමක් වන Messrs. BDO Partners පත්කරනු ලැබ ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාවේ අත්‍යවශ්‍ය කොටසක් වන මූල්‍ය ප්‍රකාශ පිලිබඳ විගණකගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

විගණන හා අනෙකුත් ආශ්‍රිත සේවා සඳහා ගාස්තු

සමාලෝචිත වසර තුළ විගණන ගාස්තු ලෙස සහ අනෙකුත් අදාළ සේවා සඳහා ගෙවන ලද ප්‍රමාණ පහත දැක්වේ. මෙම ඡේදයෙන් අනාවරණය කෙරෙන කරුණු හැර විගණකවරුන්ට සමාගම සමඟ වෙනත් කිසිදු සම්බන්ධතාවයක් නොමැති බව අධ්‍යක්ෂවරු දැනුවත්ය.

	2025 රු '000	2024 රු '000
ව්‍යවස්ථාපිත විගණන ගාස්තු	**1,116**	1,690
විගණනයට අදාළ නොවන සේවා	**–**	726

ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශ සකස්කිරීම සඳහා යොදාගත් සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධති

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ අවදානම් කළමනාකරණ කාර්යය ක්‍රියාත්මක කර අධීක්ෂණය කර ඇත.

සමාගම යහපත් අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති සහ ක්‍රියාපරිපාටි ක්‍රියාත්මක කර ඇති අතර, එවැනි ප්‍රතිපත්ති සහ ක්‍රියාපරිපාටි සමාගමේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් නියාමනය කෙරේ. විගණන කමිටුව සමාගමේ අභ්‍යන්තර පාලන කාර්යය අධීක්ෂණය කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචිත වසර සඳහා සමාගමේ අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ කාර්යයෙහි ඵලදායිත්වය පිළිබඳ සෑහීමට පත් වේ.

අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය, මුදල් ප්‍රවාහය සහ නියාමන හා ව්‍යවස්ථාපිත සාධක සැලකිල්ලට ගනිමින් ඉදිරි කාලය තුළ සිය මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සම්පත් සමාගම සතුව තිබෙන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්වේ. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්මේ පදනම යොදා ගන්නා ලදී.

පිරිවැටුම

සමාලෝචිත වසර සඳහා සමාගමේ මුළු පිරිවැටුම රු. මිලියන 7,715ක් වූ අතර තුළනාත්මක සංඛ්‍යා සඳහා (2024) රු.මිලියන 10,914කි. තුළනාත්මක සංඛ්‍යා පසුගිය වසර සඳහා රක්ෂණ ව්‍යාපාරයේ එක් මාසයක ප්‍රතිඵලය සමන්විත වේ.

මූල්‍ය ප්‍රතිඵල සහ විසර්ජන

	2025 රු '000	2024 රු '000
බදු පෙර ලාභය (PBT)	**6,890,675**	3,546,102
අදායම් බදු වියදම්	**388,412**	89,537
බදු පසු ලාභය	**6,502,263**	3,635,639
අනෙකුත් විස්තිර්ණ ආදායම්	**–**	89,895
ආරම්භක සංක්‍රාන්තිය – අපේක්ෂිත ණය අලාභ	**1,992,049**	–
ඉදිරියට ගෙන ආ විසර්ජනය නොවන ලාභය	**44,991,048**	42,429,005
විසර්ජන සඳහා ඇති ලාභ	**49,501,262**	46,154,539
ගෙවන ලද ලාභාංශ	**1,487,146**	1,271,268
ජීවිත රක්ෂණයෙන් කොටස්හිමියන්ට අතිරික්තය	**–**	47,044
ප්‍රත්‍යාගණන සංචිතයෙන් මාරුකිරීම	**–**	459,652
ජීවිත අනුබද්ධ සමාගමට වත්කම් මාරුකරන අවස්ථාවේදී ප්‍රත්‍යාගණන සංචිතයේ උපලබ්ධිවීම	**–**	232,728
සාමාන්‍ය රක්ෂණ පරිපාලන සමාගමට වත්කම් මාරුකරන අවස්ථාවේදී ප්‍රත්‍යාගණන සංචිතයේ උපලබ්ධිවීම	**–**	265,717
බෝග රක්ෂණ බදු වියදම ගැලපීම	**–**	21,940
ඉදිරියට ගෙන ආ විසර්ජනය නොවන ලාභය	**48,014,116**	44,991,048

ලාභාංශ

2025 මූල්‍ය වසර සඳහා සමාගමේ කොටසකට රුපියල් 0.84 (එකතුව රුපියල් 503,699,838,77) ක අවසන් ලාභාංශයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රකාශ කිරීමට යෝජනා කර ඇත.

ලාභාංශ ගෙවීමට පෙර, එකී ප්‍රකාශිත අවසන් ලාභාංශ සඳහා 2007 අංක 07 දරණ සමාගම් පනතේ දරණ 57 වන වගන්තිය යටතේ නුබුන්වත් බව පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවය සමාගම විසින් සපුරාලිය යුතුය.

පරිත්‍යාග

2025 වර්ෂය තුළ දී, සමාගම විසින් කිසිදු පරිත්‍යාගයක් සිදු කර නොමැත.

බදු සඳහා ප්‍රතිපාදන

සමාගමේ බදු තත්ත්වය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කෙරේ.

සංචිත

වර්ෂය තුළදී සංචිතවල වෙනස්වීම ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ දක්වා ඇත.

වගකීම් සහ ප්‍රතිපාදන

සමාලෝචනයට ලක් වූ මූල්‍ය වර්ෂය තුළ සියලුම අදාළ වාර්තාකරණ අයිතම සඳහා ප්‍රමාණවත් වෙන්කිරීම් සිදුකළ බව තහවුරු කිරීමෙහිලා සියලු සාධාරණ පියවර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබ ඇත.

මෙම වාර්තාවේ දිනට මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණවත් ප්‍රතිපාදන සිදු නොකිරීමට හේතු වන කිසිදු තත්ත්වයක් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් නැත.

ආයෝජන

2025 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් දරන ආයෝජනවල වටිනාකම රු.මිලියන 103,542 ක් (2024 රු. මිලියන 85,912) විය. දරන ලද ආයෝජනවල සවිස්තරාත්මක විග්‍රහයක් මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කෙරේ.

දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ පිළිබඳ විස්තර විග්‍රහයක් වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

ආයෝජන දේපළවල සාධාරණ අගය

ආයෝජන දේපළ යටතේ වර්ගීකරණය කළ ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව වාර්තාකිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලෙස සමාගම සාධාරණ අගය ක්‍රමය භාවිතා කරයි. ඒ අනුව, ආයෝජන දේපළ සුදුසු පළපුරුද්ද සහිත ස්වාධීන වරලත් තක්සේරුකරුවෙක් වන, ඒ ඒ එම් ෆාතිහු මහතා (MRICS) විසින් තක්සේරු කර ඇත. එම ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵල ඒවා බල පවත්වන දිනය වන 2025 දෙසැම්බර් 31 දින සිට මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කරන ලදී.

වාර්තාකරණ දිනයෙන් පසු සිදුවන සිදුවීම්

වාර්තාකරන දිනයෙන් පසු සිදුවන සිදුවීම් මූල්‍ය ප්‍රකාශවලට සටහන් අංක 49 හි අනාවරණය කර ඇත.

සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී යොදා ගත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) 24 සම්බන්ධිත පාර්ශව තොරතුරු වාර්ථා කිරීමේ ප්‍රමිතියට අනුව සම්බන්ධිත පාර්ශව ගනුදෙනු මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව 2007 අක 07 දරන සමාගම් පනතට අනුකූලව සමාගමේ ප්‍රධාන කොටස්හිමියා වන භාණ්ඩාගාරයේ ලේකම් විසින් සිදුකරනු ලබන නාමයෝජනා මත පදනම් වී සියලුම අධ්‍යක්ෂවරු විධායක නොවන අධ්‍යක්ෂවරු ලෙස පත් කර ඇත.

2025 දෙසැම්බර් 31 දිනට නිල තත්වයේ සිටි සමාගමේ අධ්‍යක්ෂවරු පහත පරිදි වේ:

- පී එන් එස් කුමාරතුංග මහතා (2024 ඔක්තෝබර් 18 පත්කරන ලදී)
- ඩී තොටවත්ත මහතා (2022 අගෝස්තු 22 දින සිට පත්කරන ලදී)
- ආර් පී බුල්ජන්ස් මහතා (2025 ජනවාරි 01 දින සිට පත්කරන ලදී)
- එන් ඩී බී උනම්බූවේ මහතා, ජනාධිපති නීතිඥ (2025 ජනවාරි 01 දින සිට පත්කරන ලදී)
- එස් පලිහවඩන මහතා (2025 ජූනි 30 දින සිට පත්කරන ලදී)
- බී ඒ රොද්‍රිගෝ මහතා (2025 නොවැම්බර් 13 දින සිට පත්කරන ලදී)
- ඒ කොස්වත්ත මහතා (2019 දෙසැම්බර් 26 දින පතකළ අතර 2025 ජනවාරි 02 දින සිට ඉල්ලා අස්විය)
- කේ ආර් ධර්මේන්ද්‍ර මහතා (2025 ජනවාරි 01 දින සිට පත්කරන ලද අතර 2025 ජූනි 23 දින ඉල්ලා අස්විය)
- කේ ආර් පත්මප්‍රිය මහතා (2022 සැප්තැම්බර් 30 දින සිට පත්කරන ලද අතර 2025 අගෝස්තු 01 දින සිට ඉල්ලා අස්විය)
- එස් ඒ බටගොඩ මහතා (2025 අගෝස්තු 13 දින සිට පත්කරන ලද අතර 2025 නොවැම්බර් 13 දින සිට ඉල්ලා අස්විය)

මෙම වාර්තාවේ දිනයට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

1. පී එන් එස් කුමාරතුංග මහතා
2. ඩී තොටවත්ත මහතා
3. ආර් පී බුල්ජන්ස් මහතා (2025 ජනවාරි 01 දින සිට පත්කරන ලදී)
4. එන් ඩී බී උනම්බූවේ මහතා, ජනාධිපති නීතිඥ (2025 ජනවාරි 01 දින සිට පත්කරන ලදී)
5. එස් පලිහවඩන මහතා (2025 ජූනි 30 දින සිට පත්කරන ලදී)
6. බී ඒ රොද්‍රිගෝ මහතා (2025 නොවැම්බර් 13 දින සිට පත් කරන ලදී)

ආවර්තනයට යටත්ව හෝ වෙනත් ආකාරයෙන් විශ්‍රාමයාම සහ නැවත පත් කිරීම.

සාමාන්‍ය යෝජනා

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 92 වගන්තිය සමඟ කියවන 98 වගන්තිය යටතේ පලවින්නේගේ නුසිත් සමරසී කුමාරතුංග මහතා විශ්‍රාම යන අතර නැවත පත් කිරීම සඳහා සුදුසුකම් සපුරානු ලබයි.

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 92 වගන්තිය සමඟ කියවන 98 වගන්තිය යටතේ දුෂ්මන්ත තොටවත්ත මහතා විශ්‍රාම යන අතර නැවත පත් කිරීම සඳහා සුදුසුකම් සපුරාලනු ලබයි.

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 98 වගන්තිය යටතේ බස්තියන් කෝරාලලාගේ ඇන්තනී තුෂාර රොද්‍රිගෝ මහතා විශ්‍රාම යන අතර නැවත පත් කිරීම සඳහා සුදුසුකම් සපුරාලනු ලබයි.

විශේෂ යෝජනා

වයස අවුරුදු 73ක් වන සෝමදාස පලිහවඩන මහතා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්දේශිත පරිදි 2007 අංක 07 දරන සමාගම් පනතේ 211 වගන්තිය යටතේ නැවත-පත් කිරීම සඳහා සුදුසුකම් සපුරාලනු ලබයි.

2007 අංක 07 දරන සමාගම පනතේ 212 වගන්තිය යටතේ සෝමදාස පලිහවඩන මහතාගෙන් ඔහුට වයස අවුරුදු 72 ක් වන බවටත් 2026 ජූනි 07 දින 73ට ලඟා වෙන බවටත් සමාගමට විධිමත් දැනුම්දීමක් ලැබී ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය දැන්වීමේ දක්වා ඇති ආකාරයට සිය කොටස්හිමියන්ගේ අනුමැතියට යටත්ව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයට ඔහු පත් කිරීමට යෝජනා කර සිටී.

සමාගම් සමඟ ගිවිසුම්ගතවීම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම

ගිවිසුම්ගතවීම් සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කර ඇත. මෙම බැඳියාවන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී ද විධිමත් පරිදි අනාවරණය කර ඇත. අධ්‍යක්ෂවරු සමාගමේ කිසිදු කොටසක හිමිකාරත්වයක් නොලබයි.

අධ්‍යක්ෂවරුන්ගේ වේතන

වසර තුළ දී ගෙවන ලද අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු සහ පාරිශ්‍රමිකය රු. මිලියන 1.7ක් වූ අතර පසුගිය වසරේ (2024) වාර්තාකළ මෙය රු. මිලියන 1.8ක් විය.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව 2025 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 6.000 කි. 2025 දෙසැම්බර් 31 වන දිනට, කොටස් වලින් 99.98% ක් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාරයේ ලේකම් වෙත පවරන ලදී.

ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන්ගේ උපරිම දැනුවත්භාවය සහ විශ්වාස කරන පරිදි රජයට, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට සහ සේවකයින්ට අදාළ සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත දිනට ගෙවා ඇති බවට අධ්‍යක්ෂවරු සැහීමට පත් වෙති.

පරිසරය

අදාළ පාරිසරික නීති හා රෙගුලාසි සමඟ සමාගමේ මෙහෙයුම් සිදුකරනු ලබන අතර යම් හානිකර කටයුතුවල නිරත නොවේ.

නීති හා රෙගුලාසි සමඟ අනුකූලතාව

ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාවෙන් අනාවරණය කර ඇති පරිදි මූල්‍ය වර්ෂය තුළ සමාගම අදාළ සියලුම නීති සහ රෙගුලාසිවලට අනුකූල වී ඇත. අනුකූලතා දෙපාර්තමේන්තුව සමාගමේ අනුකූලතා කාර්යය නියාමනය කරන අතර විගණන කමිටුවට ඒ පිළිබඳ වාර්තා කරයි. තවද, කලින් කළ අනුකූලතා වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශනවල අනුමැතිය

විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026 අප්‍රේල් 10 දින අනුමත කරන ලදී.

වාර්ෂික මහ සභා රැස්වීම

වාර්ෂික මහා සභා රැස්වීම 2026 මැයි 25 වන දින පස්වරු 12.30ට කොළඹ 02 වොක්ස්හෝල් වීදියේ අංක 21 හි "රක්ෂණ මන්දිරය" හි පිහිටි ලියාපදිංචි කාර්යාලයේ සමාගමේ ශ්‍රවනාගාරයේදී පවත්වනු ලැබේ.

වාර්තාවේ අන්තර්ගත කරුණු පිළිගැනීම

2007 අංක 07 දරණ සමාගම් පනතේ 168(1)(ඔ) වගන්තියේ අවශ්‍යතාවය පරිදි මෙම වාර්තාවේ අන්තර්ගත කරුණු අධ්‍යක්ෂ මණ්ඩලය මෙහි ලා පිළිගනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

සාරා දිසානායක
සමාගම් ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්

නුසිත් කුමාරතුංග
අධ්‍යක්ෂ

දුෂ්මන්ත තොටවත්ත
අධ්‍යක්ෂ

අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පහත ප්‍රකාශයේ දක්වා ඇත.

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන පරිදි, එක් එක් මූල්‍ය වසර සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඒවා මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකවරුන්ගේ වගකීම් වාර්ෂික වාර්තාවේ ඇතුළත් විගණකවරුන්ගේ වාර්තාවේ පැහැදිළි කර ඇත.

2007 අංක 07 දරන සමාගම් පනතට අනුව, සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් ශේෂ පත්‍රයේ දිනයට සමාගමේ මූල්‍ය තත්ත්වය සමඟ එම දිනයෙන් අවසන් වන ගිණුම්කරණ කාල සීමාව සඳහා සමාගමේ ලාභය හෝ අලාභය හෝ ආදායම සහ වියදම්වල තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දෙන බව සහතික කිරීම සඳහා සමාගමේ අධ්‍යක්ෂවරුන් වගකීමට බැඳී සිටී. එමෙන්ම මූල්‍ය ප්‍රකාශවලින් සමාගමේ සමස්ථ කටයුතුවල තත්ත්වය පිළිබඳව සාධාරණ නිරූපනයක් ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS සහ LKAS), 2007 අංක 07 දරණ සමාගම් පනතට සහ 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනතට අනුකූලව සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇති බවට අධ්‍යක්ෂවරුන් සහතික විය යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති නිරන්තරයෙන්ම වශයෙන් භාවිතා කර ඇති බවටත් යහපත් විනිශ්චය සහ ඇස්තමේන්තු ක්‍රියාත්මක කර ඇති බවටත් අධ්‍යක්ෂවරු තහවුරු කරති. ඊට අමතරව, අනාගත කාලය සඳහා සිය මෙහෙයුම් පවත්වා ගැනීම සඳහා සමාගමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට අධ්‍යක්ෂවරුන්ට සාධාරණ අපේක්ෂාවක් ඇති අතර, එමනිසාම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩතා පැවැත්ම පිළිබඳ පදනම යොදා ගෙන ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

Sarah Disanayaka

සාරා දිසානායක

ආයතනික කටයුතු ප්‍රධානී සහ සමාගම් ලේකම්
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්

2026 අප්‍රේල් 06

ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ වගකීම් ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි මූල්‍ය ප්‍රකාශන සහ සමාගමේ සහ අනුබද්ධිත සමාගම්වල (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කරන ලදී:

i. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS/LKASs)

ii. 2007 අංක 07 දරන සමාගම් පනත

iii. 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී භාවිතාකළ ආකෘතීන් සහ එහි සිදුකළ අනාවරණ අදාළ නියාමකයින් විසින් නියම කරන ලද ආකෘති සමග අනුකූල වන අතර, එවා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල අනාවරණය කිරීමේ අවශ්‍යතාවන්ට ද අනුකූල වේ. අපගේ උපරිම දැනුම මත පදනම් වී, මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් මූල්‍ය ප්‍රකාශ, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් මූල්‍ය තොරතුරු සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ මූල්‍ය තත්ත්වය සහ මෙහෙයුම්වල ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහය, සාධාරණව නියෝජනය කරන බව අපි සහතික කරමු. ඊට අමතරව, සමාගමේ මෙහෙයුම් පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සම්පත් සමාගම සතුවන බව සහ මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අඛණ්ඩතා පැවැත්ම පදනම යොදා ගෙන ඇති බවද අපි සහතික කරමු.

කළමනාකරණය, සිය මූල්‍ය වාර්තාකරණ වගකීම් සපුරාලනු ලබන බවට සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී. ප්‍රධාන මූල්‍ය නිලධාරි ලෙස, මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති, ක්‍රියාපාටිපාටි සහ අභ්‍යන්තර පාලනය ස්ථාපිත කර පවත්වාගෙන යාම සඳහා මම වගකීමට බැඳී සිටිමි. මූල්‍ය ප්‍රකාශ සියලුම වැදගත් අංග අනුව නිවැරදි සහ සම්පූර්ණ බවට සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා කළමනාකරණය අභ්‍යන්තර පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කර ඇත. මූල්‍ය වාර්තා විශ්වාසනීය බවට සහ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමෙහිලා මනා පදනමක් සකස් කර දෙන බවට සහ වත්කම් නිසි පරිදි ගණන් බලන බවට සහ ආරක්ෂා කරන බවට සාධාරණ සහතිකයක් අභ්‍යන්තර පාලනයෙන් ලබාදෙන බව කළමනාකරණය විශ්වාස කරයි. ඊට අමතරව, වෙන් කිරීමෙන් පසු සමාගමේ මෙහෙයුම් ආදර්ශය අවසන් කරමින් පවතින බැවින්, ආයතනික පාලන රාමුව සංවර්ධනය කළ යුතුව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විගණන කමිටුවක් පත්කර ඇති අතර එය ස්වාධීන අධ්‍යක්ෂවරයකු විසින් මෙහෙයවනු ලබයි.

විගණන කමිටුව විසින් විගණන පසුවිපරම් කමිටු වාර්තා සහ මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කර ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව කොටස්හිමියන් වෙනුවෙන් විගණකාධිපති විසින් මූල්‍ය ප්‍රකාශ විගණනය කර ඇත. ස්වාධීන විගණකවරයාට විගණන කමිටුව වෙත සම්පූර්ණ හා නිදහස් ප්‍රවේශය ඇති අතර, කළමනාකරණයේ නියෝජනයක් සහිතව හෝ රහිතව එම කමිටුව හමුවිය හැකිය.

අපගේ උපරිම දැනුම අනුව,

i. මූල්‍ය ප්‍රකාශ සටහන්වල වෙනත් ආකාරයෙන් විස්තර කර ඇති පරිදි සමාගම අදාළ සියළුම නීති, රීති සහ රෙගුලාසි සහ මාර්ගෝපදේශවලට අනුකූලව වී ඇති බවට,

ii. මූල්‍ය ප්‍රකාශ සටහන්වල සහ විගණකාධිපති වාර්තාව තුළ වෙනත් ආකාරයෙන් විස්තර කර නොමැති නම් හැර, විශේෂ අනුකූල නොවීම් නොමැත.

iii. සමාගම විසින් ගෙවිය යුතු සියලුම බදු ගාස්තු හා සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් සහ සමාගමේ සියලුම දායක මුදල් වාර්තාකරණ දිනට ගෙවා ඇති බව හෝ අවශ්‍ය වන පරිදි වෙන්කර ඇති බවට,

iv. සංචිතකරණ සහ නුබුන්වත්භාවයට අදාළ මාර්ගෝපදේශවලට අනුකූල වී ඇති බව සහ සමස්ත සංචිත මූල්‍ය වටිනාකම, සම්මත කළ හැකි වත්කම් මගින් සම්පූර්ණයෙන්ම ආවරණය වී ඇත.

v. ස්කන්ධ ප්‍රාග්ධනය අදාළ රෙගුලාසි අනුව නියම කර ඇති අවම ප්‍රාග්ධන අවශ්‍යතාවන්ට ගැලපේ.



ශ්‍රියානි කුලසිංහ
ප්‍රධාන මූල්‍ය නිලධාරී

2026 අප්‍රේල් 10

ස්වාධීන විගණක වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. INF/A/SLIC/AR/2025/01 ඔබේ අංකය / உமது இல. / Your No

දිනය / திகதி / Date 23 April 2026

සභාපති

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්

සංශෝධිත 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව 2025 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් සහ එහි අනුබද්ධිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශ සහ අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපති වාර්තාව.

1 මූල්‍ය ප්‍රකාශ

1.1 මතය

2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් (සමාගම) සහ සමාගම සහ එහි අනුබද්ධිත සමාගම්වල (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ සිදු කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව නියමිත කාලයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබේ. මෙම විගණනය සිදු කිරීමේදී බාහිර පාර්ශව සඳහා සේවා සපයන වරලත් ගණකාධිකාරී සමාගමක් මා හට සහය විය.

මගේ මතය අනුව, මෙම මූල්‍ය ප්‍රකාශවලින් 2025 දෙසැම්බර් 31 දිනට සමාගමේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය හා එහි මූල්‍ය කාර්යසාධනය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ අදහසක් ලබා දේ.

1.2 මතය සඳහා වූ පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (SLAuSs) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන කොටසේ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මම විශ්වාස කරමි.

විශේෂ අවධානයට ලක් කළ යුතු කරුණු

සමාගම

මූල්‍ය ප්‍රකාශවලට සටහන් 47 කෙරෙහි මම අවධානය යොමු කරන අතර, ඉන් සමාගමේ නම වෙනස් කිරීමේ ක්‍රියාවලියේ තත්ත්වය විස්තර කරයි. එය 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 96 වගන්තියට සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ 80 වගන්තියේ අදාළ අවශ්‍යතාවන් සමඟ අනුකූලතාවයට යටත් වේ. මගේ මතය මෙම කරුණ සම්බන්ධයෙන් වෙනස් කර නොමැත.

සමූහය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්

මූල්‍ය ප්‍රකාශවලට සටහන් 47 සහ 48 කෙරෙහි මම අවධානය යොමු කරන අතර, ඉන් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 30 වගන්තියට අනුව වෙන් කිරීමට අදාළව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් හි පරිපාලන ක්‍රියාවලියේ තත්ත්වය සහ 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

කිරීමේ (සංශෝදන) පනතේ 53 වගන්තියට අනුව භාරගන්නා වෙන් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පරිපාලන ක්‍රියාවලියට අනුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් රක්ෂකයින් සඳහා නිකුත් කළ ආයතනික පාලන රාමු පිළිබඳ 2022 අංක 02 දරන නියෝගය (ප්‍රතිශෝධිත) පරිදි අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වයට අදාළ අවශ්‍යතාවන්ට අනුව අනුකූල නොවීම විස්තර කරයි. මගේ මතය මෙම කරුණ සම්බන්ධයෙන් වෙනස් කරනු නොලබයි.

සීමාසහිත කළමනාකරණ සේවා රක්ෂණ පුද්ගලික සමාගම

මූල්‍ය ප්‍රකාශවලට සටහන් 50.1 කෙරෙහි මම අවධානය යොමු කරන අතර, ඉන් සීමාසහිත කළමනාකරණ සේවා රක්ෂණ (පුද්ගලික) සමාගමේ අඛණ්ඩතා පැවැත්ම පදනම නොමැතිව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරයි. මගේ මතය මෙම කරුණ සම්බන්ධයෙන් වෙනස් කරනු නොලබයි.

1.3 සමූහයේ 2025 වාර්ෂික වාර්තාවේ ඇතුළත් වෙනත් තොරතුරු

වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති තොරතුරුවලින් අනෙකුත් තොරතුරු සමන්විත වන නමුත් මූල්‍ය ප්‍රකාශනවල සහ මෙම විගණන වාර්තාවේ දිනයට පසු මා වෙත ලැබීමට අපේක්ෂා කෙරෙන තොරතුරු එහි ඇති මාගේ විගණන වාර්තාව තුළ ඇතුළත් නොවේ. අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටී.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර එහි අන්තර්ගතය පිළිබඳව කිසිදු සහතික සහතික නිගමනයක් මම ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනය සම්බන්ධයෙන්, මගේ වගකීම වන්නේ අනෙකුත් තොරතුරු ලබාගැනීමට හැකි අවස්ථාවේදී හඳුනාගනු ලබන තොරතුරු කියවීම වන අතර, එසේ කරමින් අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ සැලකියයුතු ලෙස නොගැලපේද යන්න සහ විගණනය තුළ හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම සැලකියයුතු ලෙස වැරදියට සඳහන් කර ඇති බව පෙන්නුම් කරන්නේද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2025 වාර්ෂික වාර්තාව මම කියවීමේදී. එහි සැලකිය යුතු වැරදි ප්‍රකාශයන් ඇති බව මා නිගමනය කරන්නේ නම්, නිවැරදි කිරීම සඳහා පාලනය භාරව සිටින පුද්ගලයින්ට එම කරුණු දැනුම් දීම අවශ්‍ය වේ. තවදුරටත් වැදගත් නිවැරදි නොකළ වැරදි ප්‍රකාශයන් ඇත්නම් නියමිත වෙලාවට පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව තුළ විධිවිධානවලට අනුව මගේ වාර්තාවට ඒවා ඇතුළත් කරනු ලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යයයි කළමනාකරණය තීරණය කරන අභ්‍යන්තර පාලනයන් සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටී.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අඛණ්ඩ පැවැත්මක් ලෙස පවත්වා ගෙන යාමේ සමූහයේ හැකියාව තක්සේරු කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම්, හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය සඳහා වගකීම, පාලනය පවරා ඇති පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතෙහි 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගම සහ සමූහය විසින් සමාගමේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම සමාගම සහ සමූහය විසින් සිදුකල යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකාධිපතිගේ වගකීම්

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් ඇති විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයක කොටසක් ලෙස, මා විසින් විගණනය තුළ වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කරන අතර වෘත්තීයම ආවේණික සැකයක් පවත්වා ගතිමි. තවද:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගෙන තක්සේරු කර, එම අවදානම්වලට ප්‍රතිචාරාත්මකව විගණන පටිපාටි සැලසුම් කර ඉටු කරමින් මගේ විගණනය සඳහා පදනමක් ලබා ගැනීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගනිමි. වංචාවකින් ඇතිවන වැදගත් සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සොයා නොගැනීමේ අවදානම දෝෂයෙන් සිදුවන බලපෑමට වඩා ඉහළ වන අතර, වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ, වංචාව දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට සම්බන්ධවන බැවිනි.
- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබගන්නා ලද නමුත්, සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරමි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ කළමනාකරණය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ අදාළ හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගැයීමට ලක් කළෙමි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම්, ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකෘතිය කළ යුතුය. මගේ නිගමනයන් මගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගෙන ඇති විගණන සාක්ෂිය මත පදනම් වේ. කෙසේවුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළු මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර එයට පාදක වූ සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතයක් සෑදීමේ පදනමක් ලෙස සමූහය තුළ ආයතන හෝ ව්‍යාපාර ඒකකවල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබාගැනීමට සමූහයේ විගණනය සැකසුම් කර ක්‍රියාත්මක කළෙමි. සමූහයේ විගණන අරමුණ සඳහා ඉටුකළ විගණන කාර්යය පිළිබඳ විධානය, අධීක්ෂණය සහ සමාලෝචනය සඳහා මම වගකීමට බැඳෙමි. මාගේ විගණන මතය සඳහා මම තනිවම වගකීමට බැඳෙමි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය පවරා ඇති පාර්ශ්වයන් දැනුවත් කරන ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2 අනෙකුත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂිත විධිවිධාන දක්වා ඇත.

2.1.1 2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) (ඈ) වගන්තියට සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනීයන ආකාරයට නිසි මූල්‍ය ගිණුම්කරණ වාර්තා සමාගම විසින් තබා ඇත.

2.1.2 2018 අංක 19 දරණ විගණන පනතෙහි 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන පෙර වර්ෂය සමග අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පෙර වර්ෂයේදී මා විසින් සිදුකරන ලද සියලුම නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය:

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව, සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයකුට සමාගම සම්බන්ධ වූ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව සඳහන් කිරීම.

2.2.2 ඉහත දෑ හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව සඳහන් කිරීම:

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 96 වගන්තිය අනුව, රක්ෂකයෙක්, ලියාපදිංචි රක්ෂණ තැරැව්කරුවෙක් හෝ බලයලත් රක්ෂණ නියෝජිතයෙක් ට පමණක් අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව සිය නම, නිලය හෝ විස්තරය තුළ, රක්ෂණය, යන වචනය හෝ එහි යම් ව්‍යුත්පන්නයක් භාවිතා කිරීමට අවසර ලබා දේ.

2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝදන) පනතේ 53 වගන්තියට අනුකූලව සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව නිකුත් කළ වෙන් කිරීමේ මාර්ගෝපදේශ අනුව, සමාගම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ලෙස 2024 පෙබරවාරි 01 දින වෙන් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාගමට තවදුරටත් රක්ෂණ ව්‍යාපාරය පවත්වා ගත නොහැකි අතර, එහි නම වෙනස් කිරීමක් කිරීමට අවශ්‍ය ය.

උසාවි නඩු අංක SC SPL LA1 73/24 අවසන් වන තුරු ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් දීර්ඝ කිරීමක් ලබා දෙන ලද අතර එම නඩුව 2025 සැප්තැම්බර් 04 දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිශ්ප්‍රභා කරන ලදී. ඉන් පසුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ ගරු නීතිපතිගේ මතය ලබා ගැනීමට යටත්ව නමේ වෙනස සඳහා කැමැත්ත ලබා දෙන ලදී. වාර්තාකරන දිනයට, මෙම ක්‍රියාවලිය සිදු වෙමින් පවතී.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්‍යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව සඳහන් කිරීම.

2.2.4 2018 අංක 19 දරණ විගණන පනතෙහි 12 (උෆ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, සමාගමේ සම්පත්, සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව සඳහන් කිරීම.

එල් එස් ජයරත්න
විගණකාධිපති

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට	සටහන	සමූහය		සමාගම	
		2025 රු '000	2024 රු '000	2025 රු '000	2024 රු '000
වත්කම්					
මූල්‍ය ආයෝජන	5	**359,123,390**	316,397,047	**41,684,503**	45,242,308
උප සමාගම්වල සිදුකරන ලද ආයෝජන	6	**–**	–	**49,457,926**	39,924,534
ආශ්‍රිත සමාගම්වල ආයෝජන	7	**198,673**	198,673	**198,673**	198,673
දේපල, පිරියත සහ උපකරණ	8	**50,445,263**	41,916,840	**217,853**	215,202
භාවිත අයිතිය සහිත වත්කම්	9	**3,590,777**	1,256,637	**–**	–
ආයෝජන දේපළ	10	**3,966,688**	3,759,812	**18,708,604**	17,965,274
අස්පෘශ්‍ය වත්කම්	11	**3,426,288**	3,256,775	**–**	–
ඔප්පු හිමියන් වෙත ලබාදෙන ලද ණය	12	**2,344,122**	2,288,853	**–**	–
ලැබියයුතු ප්‍රතිරක්ෂණ	13	**7,268,039**	3,260,696	**–**	–
ලැබියයුතු වාරික	14	**7,470,308**	5,933,582	**–**	–
විලම්භිත බදු වත්කම්	15	**308,066**	254,677	**–**	–
අනෙකුත් වත්කම්	16	**28,095,472**	22,613,923	**10,823,062**	10,975,040
විලම්භිත වියදම්	17	**758,201**	732,566	**–**	–
මුදල් හා මුදලට සමාන දෑ	18	**50,419,844**	33,130,712	**12,232,045**	555,913
මුළු වත්කම්		**517,415,131**	435,000,793	**133,322,666**	115,076,944
වගකීම් හා කොටස්හිමියන්ගේ ස්කන්ධය					
ස්කන්ධය					
ප්‍රකාශිත ප්‍රාග්ධනය	19	**6,000,000**	6,000,000	**6,000,000**	6,000,000
නියාමන සීමා සහිත සංචිත		**98,237**	98,237	**–**	–
ප්‍රත්‍යාගණන සංචිත	20	**30,614,654**	24,894,015	**10,209,832**	10,428,987
විකිණීම සඳහා පවතින සංචිත/FVOCI සංචිත	21	**35,550,167**	25,185,469	**37,801,757**	21,037,732
ආදායම් සංචිත	22	**104,026,025**	91,161,343	**73,230,030**	70,206,962
සමාගමේ සාමාන්‍ය කොටස් හිමියන්ට අත්කරගත හැකි මුළු ස්කන්ධය		**176,289,083**	147,339,064	**127,241,619**	107,673,681
පාලනය නොවන අයිතිය	6.4	**8,008,817**	7,422,979	**–**	–
මුළු ස්කන්ධය		**184,297,900**	154,762,043	**127,241,619**	107,673,681

4TH FULL PROOF

දෙසැම්බර් 31 දිනට	සටහන	සමූහය		සමාගම	
		2025 රු '000	2024 රු '000	2025 රු '000	2024 රු '000
වගකීම්					
රක්ෂණ ගිවිසුම් වගකීම් - ජීවිත	23	**250,885,449**	216,783,321	**–**	–
රක්ෂණ ගිවිසුම් වගකීම් - ජීවිත නොවන	24	**26,458,482**	20,441,265	**–**	–
ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ		**3,805,627**	3,239,796	**–**	–
ප්‍රවර්තන බදු වගකීම්	25	**4,056,037**	2,539,500	**947,304**	907,421
විලම්බිත බදු වගකීම්	15	**11,443,925**	9,557,363	**4,434,770**	4,450,847
කල්බදු වගකීම්	9	**837,268**	1,021,591	**158,704**	547,991
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්	26	**3,447,447**	3,023,881	**–**	–
මිල ස්ථායිකරණය සඳහා වෙන් කිරීම	27	**327,629**	–	**–**	–
වෙනත් වගකීම්	28	**30,700,157**	22,708,944	**540,269**	1,497,004
මූල්‍ය වගකීම්	29	**1,155,210**	923,089	**–**	–
මුළු වගකීම්		**333,117,231**	280,238,750	**6,081,047**	7,403,263
මුළු වගකීම් සහ ස්කන්ධය		**517,415,131**	435,000,793	**133,322,666**	115,076,944


පිටු අංක 70 සිට 182 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්යය අංගයක් වේ.

2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.



ශ්‍රියානි කුලසිංහ
ප්‍රධාන මූල්‍ය නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදී.



නුසිත් කුමාරතුංග
සභාපති
කොළඹ



තුෂාර රොද්‍රිගෝ
අධ්‍යක්ෂ

NV/dm

2026 අප්‍රේල් 10

ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	සටහන	සමූහය		සමාගම	
		2025 රු '000	2024 රු '000	2025 රු '000	2024 රු '000
ආදායම	30	**202,412,544**	182,086,157	**7,715,406**	10,913,916
දළ ලිඛිත වාරිකය	31	**62,800,237**	51,264,470	**–**	3,589,653
නොඉපයූ දළ වාරික පිළිබඳ සංචිතයේ වෙනස	32.2	**(1,854,667)**	557,953	**–**	137,078
දළ ඉපයූ වාරිකය		**60,945,570**	51,822,423	**–**	3,726,731
ප්‍රතිරක්ෂණකරුවන්ට පවරන ලද වාරික	32.3	**(10,039,977)**	(8,280,428)	**–**	(319,941)
නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරික පිළිබඳ සංචිතයේ වෙනස	32.4	**238,271**	(567,272)	**–**	(134,991)
ශුද්ධ ඉපයූ වාරිකය	32	**51,143,864**	42,974,723	**–**	3,271,799
වෙනත් මෙහෙයුම්වෙතින් ලැබූ ආදායම	31.1	**111,186,880**	104,399,831	**–**	–
		162,330,744	147,374,554	**–**	3,271,799
වෙනත් ආදායම්					
ආයෝජන ආදායම්	33	**37,975,682**	36,365,220	**5,550,526**	6,313,117
ගාස්තු සහ කොමිස් ආදායම්	34	**143,308**	75,965	**–**	238
ශුද්ධ උපලබ්ධි/උපලබ්ධි නොවූ ලැබීම්	35	**1,484,423**	(26,054)	**–**	(137,891)
අනෙකුත් (වියදම්)/ආදායම	36	**478,387**	(1,703,528)	**2,164,880**	1,466,653
		40,081,800	34,711,603	**7,715,406**	7,642,117
ආදායම		**202,412,544**	182,086,157	**7,715,406**	10,913,916
ප්‍රතිලාභ, අලාභ සහ වියදම්					
ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම්	37	**(28,467,049)**	(23,498,359)	**–**	(2,005,398)
ප්‍රතිරක්ෂණය හා ශුද්ධ අත්පත්කර ගැනීමේ පිරිවැය	38	**(4,727,011)**	(3,821,575)	**–**	(339,855)
මිල ස්ථායිකරණය සඳහා වෙන් කිරීම	27	**(445,106)**	–	**–**	–
ගිවිසුම් වගකීම්වල වෙනස – ජීවිත අරමුදල		**(29,078,874)**	(26,409,382)	**–**	(1,834,641)
අනෙකුත් මෙහෙයුම් හා පරිපාලන වියදම්		**(25,329,800)**	(23,875,946)	**(824,731)**	(3,187,920)
අන්තර් සමාගම්වල පොලී වියදම්		**–**	–		–
අනුබද්ධිත ආයතනවල සේවා වියදම්		**(92,664,300)**	(90,428,617)	**–**	–
ශුද්ධ ප්‍රතිලාභ, අලාභ සහ වියදම්		**(180,712,140)**	(168,033,879)	**(824,731)**	(7,367,814)
බදු පෙර ලාභය	39	**21,700,404**	14,052,278	**6,890,675**	3,546,102
ආදායම් බදු වියදම	40	**(6,353,249)**	(4,964,899)	**(388,412)**	89,537
වර්ෂය සඳහා ශුද්ධ ලාභය		**15,347,155**	9,087,379	**6,502,263**	3,635,639

4TH FULL PROOF

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	සටහන	සමූහය		සමාගම	
		2025 රු '000	2024 රු '000	2025 රු '000	2024 රු '000
අනෙකුත් විස්තීර්ණ ආදායම					
ලාභ වලට වර්ගීකරණය නොවන අයිතම හෝ අලාභ					
දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණන මත ලාභය/අලාභය		**8,539,779**	2,965,656	**–**	3,035,403
භාවිතයට අයිතිය ඇති වත්කම්වල ප්‍රත්‍යාගණන මත ලාභය/අලාභය		**–**	347,173	**–**	–
දේපළ, පිරියත සහ උපකරණ සහ භාවිතයට අයිතිය ඇති වත්කම් සංචිත ප්‍රත්‍යාගණනය මත විලම්බිත බදු බලපෑම	40.2	**(2,781,089)**	(726,046)	**(219,155)**	(518,870)
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණනක ලාභ/(අලාභ)	26	**(249,681)**	(336,622)	**–**	110,698
ආයුගණනක ලාභ/(අලාභ) මත විලම්බිත බදු බලපෑම	40.2	**41,059**	69,591	**–**	(20,803)
ලාභකළ හැකි හෝ අලාභයට පසුව ප්‍රතිවර්ගීකරණය කරන ලද අයිතම හෝ					
විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස		**15,186,074**	26,644,317	**16,764,025**	11,257,109
විකිණීමට ඇති සංචිතයේ සාධාරණ අගය මත විලම්බිත බදු බලපෑම	40.2	**(2,927)**	(278,179)	**–**	(110,802)
වර්ෂයේ අනෙකුත් විස්තීර්ණ ආදායම, බද්දෙන් ශුද්ධ		**20,733,215**	28,685,890	**16,544,870**	13,752,735
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		**36,080,370**	37,773,269	**23,047,133**	17,388,374
වර්ෂය සඳහා ලාභය බෙදියන ආකාරය:					
සමාගමේ කොටස් හිමිකරුවන් සඳහා		**14,398,355**	8,466,020	**6,502,263**	3,635,639
අධිකාරිය නොමැති කොටස් හිමිකම		**948,800**	621,359	**–**	–
වසර සඳහා මුළු ශුද්ධ ලාභය		**15,347,155**	9,087,379	**6,502,263**	3,635,639
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම වෙන්කර ඇති ආකාරය:					
සමාගමේ කොටස් හිමියන් සඳහා		**35,113,486**	37,189,627	**23,047,133**	17,388,374
පාලනය නොවන අයිතිය		**966,884**	583,642	**–**	–
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		**36,080,370**	37,773,269	**23,047,133**	17,388,374
කොටසක මූලික/තනුක කළ ඉපයීම් (රු.)	41	**24.01**	14.12	**10.84**	6.06
කොටසක ලභාංශය (රු.)	42	**3.32**	2.12	**3.32**	2.12

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි.

පිටු අංක 70 සිට 182 දක්වා පිටුවල ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

කොළඹ

2026 අප්‍රේල් 10

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු '000	ප්‍රත්‍යාගණන සංචිතය රු '000	පොදු සංචිතය රු '000
සමුහය			
2024 ජනවාරි 01 දිනට ශේෂය	6,000,000	22,828,004	643,442
2022 අංක 14 දරන අධිභාර බදු පනත යටතේ අයකළ අධිභාර බදු සඳහා ගැලපීම	–	–	–
2024 ජනවාරි 01 දිනට ගලපන ලද ශේෂය	6,000,000	22,828,004	643,442
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම			
වර්ෂය සඳහා ලාභය	–	–	–
අනෙකුත් විස්තීර්ණ ආදායම, බද්දෙන් ශුද්ධ	–	2,596,258	–
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම	–	2,596,258	–
ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම	–	–	–
ගොඩනැගිල්ල ප්‍රත්‍යාගණනය මත අතිරික්තය මත ක්ෂයකිරීමේ මාරු කිරීම	–	(31,802)	–
අලෙවියට තබා ඇති සංචිතයට මාරු කිරීම - ජීවිත අරමුදල	–	–	–
ස්කන්ධය තුළ සෘජුවමවාර්තාකළ සමාගමේ හිමිකරුවන් සමඟ ගනුදෙනු			
පාරිතෝෂික ඇගයීමේ සංචිතයට ජංගම ගිණුමේ ශේෂට මාරු කිරීම	–	–	–
SLICLL සහ SLICGL යන අනුබද්ධ ආයතනවලට වත්කම් මාරුකරන අවස්ථාවේදී ප්‍රත්‍යාගණන සංචිතයේ උපලබ්ධිවීම	–	(498,445)	–
බෝග බදු වියදම ගැලපීම	–	–	–
පෙර වසරේ ගැලපීම	–	–	–
අනුබද්ධ ආයතන බැහැර කිරීම	–	–	–
ජීවිත රක්ෂණයෙන් කොටස්හිමියන්ට ආරෝපනය වන අතිරික්තය	–	–	–
ගෙවූ ලාභාංශ	–	–	–
	–	(530,247)	–
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය	6,000,000	24,894,015	643,442
2025 ජනවාරි 01 දිනට ශේෂය	**6,000,000**	**24,894,015**	**643,442**
2022 අංක 14 දරන අධිභාර බදු පනත යටතේ අයකළ අධිභාර බදු සඳහා ගැලපීම	**–**	**–**	**–**
ආරම්භක මාරුකිරීම් - අපේක්ෂිත ණය අලාභ	**–**	**–**	**–**
2025 ජනවාරි 01 දිනට ගලපන ලද ශේෂය	**6,000,000**	**24,894,015**	**643,442**
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම			
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	**–**	**–**	**–**
අනෙකුත් විස්තීර්ණ ආදායම, බද්දෙන් ශුද්ධ	**–**	**5,757,446**	**–**
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම	**–**	**5,757,446**	**–**
ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම	**–**	**(3,817)**	**–**
ස්ථායිකරණ අරමුදලෙන් මාරු කිරීම	**–**	**–**	**–**
ගොඩනැගිල්ල ප්‍රත්‍යාගණනය මත අතිරක්තය මත ක්ෂයකිරීමේ මාරු කිරීම	**–**	**(32,992)**	**–**
ජීවිත රක්ෂණයෙන් කොටස්හිමියන්ට ආරෝපනය කළ යුතු අතිරික්තය	**–**	**–**	**–**
ස්කන්ධය තුළ සෘජුව වාර්තාකළ සමාගමේ හිමිකරුවන් සමඟ ගනුදෙනු			
ගෙවූ ලාභාංශ	**–**	**–**	**–**
ඉඩම් බැහැර කිරීම මත ප්‍රත්‍යාගණන සංචිතයේ උපලබ්ධිවීම	**–**	**2**	**–**
	–	**(36,807)**	**–**
2025 දෙසැම්බර් 31 දිනට ශේෂය	**6,000,000**	**30,614,654**	**643,442**

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි.

පිටු අංක 70 සිට 182 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මුල්‍ය ප්‍රකාශණයන් හි අනිවාර්ය අංගයකි.

කොළඹ

2026 අප්‍රේල් 10

4TH FULL PROOF

විකිණීම සඳහා පවතින සංචිත රු '000	සීමානොකරන ලද සංචිත රු '000	නියාමන සීමාකළ සංචිත රු '000	ජීවිත රක්ෂණයෙන් අතිරික්තය රු '000	රඳවාගත් ඉපැයුම් රු '000	මුළු වටිනාකම රු '000	පාලනය නොවන අයිතිය රු '000	මුළු ස්කන්ධය රු '000
9,578,134	466,179	98,237	24,153,337	58,940,170	122,707,503	13,233,465	135,940,968
–	–	–	–	(327,826)	(327,826)	–	(327,826)
9,578,134	466,179	98,237	24,153,337	58,612,344	122,379,677	13,233,465	135,613,142
–	–	–	–	8,466,020	8,466,020	621,359	9,087,379
26,366,138	–	–	–	(238,789)	28,723,607	(37,717)	28,685,890
26,366,138	–	–	–	8,227,231	37,189,627	583,642	37,773,269
–	–	–	–	(459,652)	(459,652)	–	(459,652)
–	–	–	–	31,802	–	–	–
(10,758,803)	–	–	–	–	(10,758,803)	–	(10,758,803)
–	–	–	–	37,589	37,589	–	37,589
–	–	–	–	498,445	–	–	–
–	–	–	–	21,940	21,940	–	21,940
–	–	–	–	199,954	199,954	–	199,954
–	–	–	–	–	–	(6,393,646)	(6,393,646)
–	–	–	2,594,805	(2,594,805)	–	–	–
–	–	–	–	(1,271,268)	(1,271,268)	(482)	(1,271,750)
(10,758,803)	–	–	2,594,805	(3,535,995)	(12,230,240)	(6,394,128)	(18,624,368)
25,185,469	466,179	98,237	26,748,142	63,303,580	147,339,064	7,422,979	154,762,043
25,185,469	**466,179**	**98,237**	**24,106,293**	**65,945,429**	**147,339,064**	**7,422,979**	**154,762,043**
–	**–**	**–**	**–**	**24,654**	**24,654**	**–**	**24,654**
–	**–**	**–**	**–**	**–**	**–**	**–**	**–**
25,185,469	**466,179**	**98,237**	**24,106,293**	**65,970,083**	**147,363,718**	**7,422,979**	**154,786,697**
–	**–**	**–**	**–**	**14,398,352**	**14,398,352**	**948,800**	**15,347,152**
15,183,147	**–**	**–**	**–**	**(225,462)**	**20,715,131**	**18,084**	**20,733,215**
15,183,147	**–**	**–**	**–**	**14,172,890**	**35,113,483**	**966,884**	**36,080,367**
–	**–**	**–**	**–**	**3,817**	**–**	**–**	**–**
–	**–**	**–**	**–**	**117,477**	**117,477**	**–**	**117,477**
–	**–**	**–**	**–**	**32,992**	**–**	**–**	**–**
(4,818,449)	**–**	**–**	**–**	**–**	**(4,818,449)**	**–**	**(4,818,449)**
–	**–**	**–**	**–**	**(1,487,146)**	**(1,487,146)**	**(381,046)**	**(1,868,192)**
–	**–**	**–**	**–**	**(2)**	**–**	**–**	**–**
(4,818,449)	**–**	**–**	**–**	**(1,332,862)**	**(6,188,118)**	**(381,046)**	**(6,569,164)**
35,550,167	**466,179**	**98,237**	**24,106,293**	**78,810,111**	**176,289,083**	**8,008,817**	**184,297,900**

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු '000
සමාගම	
2024 ජනවාරි 01 දිනට ශේෂය	6,000,000
2022 අංක 14 දරන අධිභාර බදු පනත යටතේ අයකළ අධිභාර බදු සඳහා ගැලපීම	
2024 ජනවාරි 01 දිනට ගලපන ලද ශේෂය	6,000,000
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	
වර්ෂය සඳහා ලාභය	–
වෙනත් විස්තීර්ණ ආදායම්, බද්දෙන් ශුද්ධ	–
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම	–
ජීවිත සහ සාමාන්‍ය යන පරිපාලිත සමාගම්වලට වත්කම් මාරුකරන අවස්ථාවේදී ප්‍රත්‍යාගණන සංචිතයේ උපලබ්ධිවීම	–
ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම	–
විකිණීමට තබා ඇති සංචිතයට මාරු කිරීම - ජීවිත රක්ෂණ අරමුදල	–
ස්කන්ධය තුළ සෘජුව වාර්තාකළ සමාගමේ හිමිකරුවන් සමඟ ගනුදෙනු	
ජීවිත රක්ෂණයෙන් කොටස්හිමියන්ට ආරෝපනය වන අතිරික්තය	–
ගෙවූ ලාභාංශ	–
වෙන්කිරීම හේතුවෙන් මාරු කිරීම	–
බෝග බදු වියදම ගැලපීම	–
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය	6,000,000
2025 ජනවාරි 01 දිනට ශේෂය	**6,000,000**
ආරම්භක මාරුකිරීම් - අපේක්ෂිත ණය අලාභ	–
2025 ජනවාරි 01 දිනට ගලපන ලද ශේෂය	**6,000,000**
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	
වර්ෂය සඳහා ලාභය	–
අනෙකුත් විස්තීර්ණ ආදායම, බද්දෙන් ශුද්ධ	–
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම	–
ස්කන්ධය තුළ සෘජුව වාර්තාකළ සමාගමේ හිමිකරුවන් සමඟ ගනුදෙනු	
ජීවිත රක්ෂණයෙන් කොටස්හිමියන්ට ආරෝපනය කළ යුතු අතිරික්තය	–
ගෙවූ ලාභාංශ	–
2025 දෙසැම්බර් 31 දිනට ශේෂය	**6,000,000**

සටහන - 2024 ජනවාරි 31 දක්වා ජීවිත රක්ෂණ අරමුදලෙන් අතිරික්තය වෙන් කිරීමේ මාර්ගෝපදේශවලට අනුකූලව SLIC විසින් රඳවා ගන්නා ලදී.

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි.

පිටු අංක 70 සිට 182 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්‍ය්‍ය අංගයකි.

කොළඹ

2026 අප්‍රේල් 10

4TH FULL PROOF

මුළු ස්කන්ධය	රඳවාගත් ඉපයීම්	ජීවිත රක්ෂණයෙන් අතිරික්තය	නියාමන සීමාකළ සංචිත	සීමානොකළ සංචිත	විකිණීම සඳහා ඇති සංචිත/ පවතින FVOCI	පොදු සංචිතය	ප්‍රත්‍යාගණන සංචිතය
රු '000	රු '000	රු '000	රු '000	රු '000	රු '000	රු '000	රු '000
91,779,233	42,429,005	24,153,337	98,237	466,179	9,578,134	643,442	8,410,899
–							
91,779,233	42,429,005	24,153,337	98,237	466,179	9,578,134	643,442	8,410,899
3,635,639	3,635,639	–	–	–	–	–	–
13,752,735	89,895	–	–	–	11,146,307	–	2,516,533
17,388,374	3,725,534	–	–	–	11,146,307	–	2,516,533
–	498,445	–	–	–	–	–	(498,445)
(459,652)	(459,652)	–	–	–	–	–	–
313,291	–	–	–	–	313,291	–	–
–	47,044	(47,044)	–	–	–	–	–
(1,271,268)	(1,271,268)	–	–	–	–	–	–
(98,237)	–	–	(98,237)	–	–	–	–
21,940	21,940	–	–	–	–	–	–
107,673,681	44,991,048	24,106,293	–	466,179	21,037,732	643,442	10,428,987
107,673,681	**44,991,048**	**24,106,293**	**–**	**466,179**	**21,037,732**	**643,442**	**10,428,987**
(1,992,049)	**(1,992,049)**	**–**	**–**	**–**	**–**	**–**	**–**
105,681,632	**42,998,999**	**24,106,293**	**–**	**466,179**	**21,037,732**	**643,442**	**10,428,987**
6,502,263	**6,502,263**	**–**	**–**	**–**	**–**	**–**	**–**
16,544,870	**–**	**–**	**–**	**–**	**16,764,025**	**–**	**(219,155)**
23,047,133	**6,502,263**	**–**	**–**	**–**	**16,764,025**	**–**	**(219,155)**
–	–	–	–	–	–	–	–
(1,487,146)	**(1,487,146)**	**–**	**–**	**–**	**–**	**–**	**–**
127,241,619	**48,014,116**	**24,106,293**	**–**	**466,179**	**37,801,757**	**643,442**	**10,209,832**

4TH FULL PROOF

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා	සටහන	සමූහය		සමාගම	
		2025 රු '000	2024 රු '000	2025 රු '000	2024 රු '000
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ					
ගනුදෙනුකරුවන්ගෙන් ලද වාරිකය		**61,263,510**	51,621,821	**–**	4,735,089
ගෙවන ලද ප්‍රතිරක්ෂණ වාවිකය		**(9,474,146)**	(6,734,235)	**–**	(204,214)
ගෙවන ලද රක්ෂණ ප්‍රතිලාභ හා හිමිකම්		**(29,098,513)**	(24,676,386)	**–**	(1,946,707)
හිමිකම් හා ප්‍රතිලාභ සම්බන්ධයෙන් ප්‍රතිරක්ෂණ ලැබීම		**2,720,091**	1,701,529	**–**	117,754
ණයගැතියන්ගෙන් ලද මුදල්		**113,789,230**	106,830,718	**271,659**	269,521
භාවිතයට අයිතිය ඇති වත්කම් බැහැර කිරීමේ ලාභය		**(52,802)**	–	**(52,802)**	
සිලින්ඩර් තැන්පතු මත ලද/(ගෙවූ) මුදල්		**234,744**	62,891	**–**	–
සේවකයින් වෙනුවෙන් ගෙවන ලද මුදල්		**(3,369,696)**	(12,307,379)	**–**	–
සැපයුම්කරුවන් සඳහා ගෙවන ලද අත්තිකාරම්		**–**	(672,903)	**–**	–
ලද පොලිය		**30,096,548**	19,284,208	**2,613,103**	4,151,638
ලද ලාභාංශ		**1,851,496**	1,093,356	**2,698,806**	1,683,574
වෙනත් මෙහෙයුම් මුදල් ගෙවීම්		**(111,570,115)**	(98,338,358)	**(1,677,603)**	(3,084,201)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ	A	**56,390,347**	37,865,262	**3,853,163**	5,722,454
ගෙවන ලද විශ්‍රාම පාරිතෝෂික	26	**(352,673)**	(226,243)	**–**	(9,239)
ගෙවන ලද පොළී වියදම්		**(54,562)**	(431,172)	**–**	–
ගෙවන ලද ආදායම් බදු	25	**(5,556,848)**	(5,008,699)	**(583,761)**	(1,740,793)
ගෙවන ලද අධිභාර බදු		**(12,224)**	(327,826)	**–**	–
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය		**50,414,040**	31,871,322	**3,269,402**	3,972,422
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය					
මූල්‍ය ආයෝජන අත්පත් කර ගැනීම	5.5	**(6,742,953,539)**	(72,122,983)	**(6,635,727,263)**	(22,854,600)
මූල්‍ය ආයෝජනවලින් ලද මුදල		**6,712,211,368**	54,158,035	**6,645,868,705**	17,967,589
වෙනත් මූල්‍ය වත්කම්වල (ආයෝජනය)/ආපසු ගැනීම්		**(1,648,858)**	(433,884)	**–**	–
අනුබද්ධිත සමාගම් විකිණීම හේතුවෙන් ශුද්ධ මුදල් පිටතට ගලායාම	6.2.2	**–**	(141,582)	**–**	–
දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල		**19,878**	60,052	**–**	
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම	8	**(2,837,437)**	(1,712,476)	**(66,410)**	(40,073)
කාරක ප්‍රාග්ධනය මත දරන ලද වියදම		**(19,755)**	–	**–**	–
අස්පෘශ්‍ය වත්කම් අත්කර ගැනීම	11.2	**(242,091)**	(80,638)	**–**	(2,126)
ආයෝජන දේපළ අත්කර ගැනීම	10	**(97,759)**	(15,458)	**(96,752)**	–
නොනිමි ප්‍රාග්ධනය මත දරන ලද වියදම	8.1.3	**–**	(1,097,988)	**–**	–
ලබාදෙන ලද සේවක ණය		**(958,120)**	(57,841)	**–**	–
අයකළ සේවක ණය		**1,295,397**	1,231,073	**–**	–
රක්ෂණ ඔප්පුහිමියන්ට ලබාදුන් ණය	12	**(1,986,278)**	(3,871,307)	**–**	(1,893,260)
රක්ෂණ ඔප්පුහිමියන් විසින් පියවන ලද ණය	12	**2,420,140**	4,505,739	**–**	2,259,932
ලද ලාභාංශය		**402,258**	211,213	**–**	–
ලද පොලි		**4,373,988**	4,205,277	**–**	–
ආයෝජන කටයුතු සඳහා භාවිතා කළ ශුද්ධ මුදල්		**(30,020,808)**	(15,162,768)	**9,978,280**	(4,562,538)
මූල්‍ය කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ					
ගෙවන ලද ලාභාංශ	22.2	**(1,022,259)**	(1,271,268)	**(1,487,146)**	(1,271,268)
පාලනයට නොවන අයිතියවෙත ගෙවන ලද ලාභාංශ		**(381,046)**	(482)	**–**	–
ගෙවන ලද කල්බදු වාරිකය	9.2	**(2,376,412)**	(529,036)	**(84,404)**	(259,568)
නැවත ලබා ගත හැකි සමුච්චිත නොවූ වරණීය කොටස් මුදාහැරීමෙන් ලද මුදල		**–**	37,527	**–**	–
වෙන් කිරීම් මත SLIC වෙතින් ලද මුදල		**–**	–	**–**	(2,783,973)
බෝග බදු ගැලපීම		**–**	21,940	**–**	21,940
මූල්‍ය කටයුතු සඳහා භාවිතා කළ ශුද්ධ මුදල		**(3,779,717)**	(1,741,319)	**(1,571,550)**	(4,292,869)

දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා	සටහන	සමූහය 2025 රු '000	සමූහය 2024 රු '000	සමාගම 2025 රු '000	සමාගම 2024 රු '000
මූදල් හා මුදලට සමාන දෑ මත විනිමය අනුපාත වෙනසේ බලපෑම		**443,495**	(545,727)	**–**	(240)
මූදල් හා මුදලට සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		**17,057,011**	14,421,508	**11,676,132**	(4,883,225)
වසර ආරම්භයේදී මූදල් හා මුදලට සමාන දෑ		**32,207,623**	17,786,115	**555,913**	5,439,138
වසර අවසානයේදී මූදල් හා මුදලට සමාන දෑ (සටහන A)	18	**49,264,634**	32,207,623	**12,232,045**	555,913
සටහන A – මූදල් හා මුදලට සමාන දෑ විශ්ලේෂණය					
බැංකුවේ සහ අතැති මුදල්		**15,133,008**	6,946,446	**31,221**	9,239
කෙටිකාලීන ආයෝජන		**35,286,836**	26,184,266	**12,200,824**	546,674
*බැංකු අයිරාව		**(1,155,210)**	(923,089)	**–**	–
		49,264,634	32,207,623	**12,232,045**	555,913

වරහන් තුළ සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්වයි.

A මෙහෙයුම් කාර්යයන්ගෙන් ලැබෙන මුදල් ප්‍රවාහ සමඟ මෙහෙයුම් ලාභ සැසඳීම

	සමාගම 2025 රු '000	සමාගම 2024 රු '000
මෙහෙයුම්වලින් ලාභය	**6,854,779**	3,546,102
දිගුකාලීන රක්ෂණ අරමුදලේ වැඩිවීම	**–**	(1,834,641)
ක්ෂයකිරීම අයකිරීම	**63,759**	–
භානිකරණ අලාභය නිරවුල් කිරීම (ලාභ අලාභ)	**844,859**	–
භාවිතයට අයිතිය ඇති වත්කම් බැහැර කිරීමේ ලාභය	**(52,802)**	–
භෝග කේෂණ බදු ගැලපීම	**–**	21,940
ක්ෂයකිරීම අයකිරීම	**–**	94,698
ඔප්පු මත ලබාදුන් ණයෙන් ලද පොලී ආදායම	**–**	(383,541)
භාවිතයට අයිතිය ඇති වත්කම් පිරිවැය	**9,379**	35,406
භාවිතයට අයිතිය ඇති වගකීමේ අවලම්බන පොලිය	**30,266**	92,633
ආයෝජන ආදායම – උපලබ්ධි නොවූ ලාභ/(අලාභ)	**(202,265)**	(340,015)
පාරිතෝෂික වෙන් කිරීම	**–**	24,155
විදේශ විනිමය ගනුදෙනු මත ලාභ/(අලාභ)	**–**	240
පරිපාලිත සමාගම්වල ආයෝජන බැහැර කිරීම	**–**	10,399,358
කැන්විල් හෝල්ඩින්ග් මත භානිකරණය ආපසු හැරවීම	**–**	(100,642)
ආදායම් ප්‍රකාශය තුළ වාර්තාකළ සාධාරණ අගයේ ලාභය	**(938,304)**	(89,492)
ණය ගැතියන් වැඩිවීම/(අඩුවීම)	**1,671,450**	2,191,312
හිමිකම් වෙන් කිරීම්වල වැඩිවීම/(අඩුවීම)	**(3,475,626)**	(2,914,569)
ණය හිමියන් වැඩිවීම/(අඩුවීම)	**(952,332)**	(5,020,490)
මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	**3,853,163**	5,722,454

පිටු අංක 70 සිට 182 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශණයන් හි සංකලිත කොටසකි.

කොළඹ

2026 අප්‍රේල් 10

ඛණ්ඩමය සමාලෝචනය: මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට	2025						
	මව් සමාගම	ජීවිත නොවන රක්ෂණය	ජීවිත රක්ෂණය	සෞඛ්‍ය සේවා	බලශක්ති	වෙනත්	ඉවත්කිරීම්
	රු '000	රු '000	රු '000	රු '000	රු '000	රු '000	රු '000
වත්කම්							
මූල්‍ය ආයෝජන	41,684,503	43,555,266	264,090,468	9,791,645	–	–	1,508
පරිපාලිත සමාගම්වල ආයෝජනය	49,457,926	–		–	–	–	(49,457,926)
ආශ්‍රිත සමාගම්වල ආයෝජනය	198,673			–	–	–	–
දේපළ, පිරියත සහ උපකරණ	217,853	499,974	510,694	6,614,529	27,669,598	44,771	14,887,844
වත්කම් භාවිතා කිරීමේ අයිතිය	–	213,723	166,053	496,912	2,293,282	57,000	363,807
කල්බදු දේපළ	–	–	–	–	–	–	–
ආයෝජන දේපළ	18,708,604	–		–	–	1,363,000	(16,104,916)
අස්පෘශ්‍ය වත්කම්	–	115,714	100,472	216,289	–	1,008	2,992,805
ඔප්පු හිමියන්ට ලබාදුන් ණය	–	–	2,344,122	–	–	–	–
අය විය යුතු ප්‍රතිරක්ෂණ	–	5,967,241	1,300,798	–	–	–	–
අය විය යුතු රක්ෂණ වාරික	–	6,338,759	1,131,549	–	–	–	–
විලම්බිත බදු වත්කම්	–	308,066	–	–	–	–	–
අනෙකුත් වත්කම්	10,823,062	1,119,975	692,593	2,112,764	14,109,163	98,867	(860,952)
විලම්බිත වියදම්	–	758,201	–	–	–	–	–
මූදල් හා මුදලට සමාන දෑ	12,232,045	5,138,030	4,850,400	1,182,441	26,136,881	880,047	–
මුළු වත්කම්	133,322,666	64,014,949	275,187,149	20,414,580	70,208,924	2,444,693	(48,177,830)
වගකීම් සහ ස්කන්ධය							
වගකීම්							
රක්ෂණ ගිවිසුම් වගකීම් - ජීවිත	–	–	250,885,449	–	–	–	–
රක්ෂණ ගිවිසුම් වගකීම් - ජීවිත නොවන	–	26,458,482	–	–	–	–	–
භාවිතා කළ හැකි වගකීම්	158,704	228,586	177,825	234,965	36,998	190	–
ගෙවියයුතු ප්‍රතිරක්ෂණය	–	2,249,866	1,555,761	–	–	–	–
වර්තන බදු වගකීම්	947,304	122,436	240,482	538,717	2,207,098	–	–
විලම්හිත බදු වගකීම්	4,434,770	–	–	1,212,143	5,394,752	402,260	–
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම	–	1,600,955	1,072,256	494,508	269,535	10,193	–
මිල ස්ථායිකරණය සඳහා වෙන් කිරීම	–	–	–	–	327,629	–	–
අනෙකුත් වගකීම්	540,269	5,220,106	4,097,116	2,193,699	19,008,807	167,083	(526,923)
මූල්‍ය වගකීම්	–	583,870	205,126	366,214	1,440,000	–	(1,440,000)
මුළු වගකීම්	6,081,047	36,464,301	258,234,015	5,040,246	28,684,819	579,726	(1,966,923)
ස්කන්ධය							
ප්‍රකාශිත ප්‍රාග්ධනය	6,000,000	14,000,000	12,500,000	2,671,543	1,947,109	870,087	(31,988,739)
එකෝචිත අතිරික්කතයන් නියාමන සීමා කරන ලද සංචිත	–	1,000,000	98,237	–	–	–	(1,000,000)
ප්‍රත්‍යාගණන සංචිතය	10,209,832	185,236	223,243	1,485,320	11,049,130	24,940	7,436,953
අලෙවියට තබා ඇති සංචිත	37,801,757	7,588,377	(306,575)	–	–	–	(9,533,392)
ආදායම් සංචිත	73,230,030	4,777,035	4,438,229	11,217,471	28,527,866	969,940	(19,134,546)
පාලනය නොවන අයිතිය		–	–	–	–	–	8,008,817
මුළු ස්කන්ධය	127,241,619	27,550,648	16,953,134	15,374,334	41,524,105	1,864,967	(46,210,907)
මුළු වගකීම් සහ ස්කන්ධය	133,322,666	64,014,949	275,187,149	20,414,580	70,208,924	2,444,693	(48,177,830)

	2024							
එකතුව	මව් සමාගම	ජීවිත නොවන රක්ෂණය	ජීවිත රක්ෂණය	සෞඛ්‍ය සේවා	බලශක්තිය	වෙනත්	ඉවත්කිරීම්	එකතුව
රු '000	රු '000	රු '000	රු '000	රු '000	රු '000	රු '000	රු '000	රු '000
359,123,390	45,242,308	36,982,166	219,921,456	7,868,036	–	–	6,383,081	316,397,047
–	39,924,534	–	–	–	5,000,000	20,500,000	(65,424,534)	–
198,673	198,673	–	–	–	–	–	–	198,673
50,445,263	215,202	611,198	439,971	6,582,765	19,098,801	36,931,063	(21,962,160)	41,916,840
3,590,777	–	–	–	550,771	186,237	54,000	465,629	1,256,637
–	–	–	–	–	–	–	–	–
3,966,688	17,965,274	–	–	–	–	1,308,000	(15,513,462)	3,759,812
3,426,288	–	61,879	76,858	124,045	–	1,188	2,992,805	3,256,775
2,344,122	–	–	2,288,853	–	–	–	–	2,288,853
7,268,039	–	1,972,225	1,288,471	–	–	–	–	3,260,696
7,470,308	–	5,144,352	789,230	–	–	–	–	5,933,582
308,066	–	254,677	–	–	–	190	(190)	254,677
28,095,472	10,975,040	1,583,253	1,875,074	2,290,497	10,324,805	1,761,922	(6,196,668)	22,613,923
758,201	–	732,566	–	–	–	–	–	732,566
50,419,844	555,913	3,791,489	11,945,357	1,095,204	15,071,428	812,903	(141,582)	33,130,712
517,415,131	115,076,944	51,133,805	238,625,270	18,511,318	49,681,271	61,369,266	(99,397,081)	435,000,793
250,885,449	–	–	216,783,321	–	–	–	–	216,783,321
26,458,482	–	20,441,265	–	–	–	–	–	20,441,265
837,268	547,991	–	–	314,290	159,120	190	–	1,021,591
3,805,627	–	1,751,702	1,488,094	–	–	–	–	3,239,796
4,056,037	907,421	404,367	559,691	299,862	368,159	84	(84)	2,539,500
11,443,925	4,450,847	–	–	1,177,736	3,549,283	379,497	–	9,557,363
3,447,447	–	1,391,859	898,427	490,125	234,917	13,535	(4,982)	3,023,881
327,629	–	–	–	–	–	–	–	–
30,700,157	1,497,004	4,898,031	3,368,754	1,650,890	13,570,376	7,007,361	(9,283,472)	22,708,944
1,155,210	–	268,146	254,925	400,018	2,160,000	5,119,434	(7,279,434)	923,089
333,117,231	7,403,263	29,155,370	223,353,212	4,332,921	20,041,855	12,520,101	(16,567,972)	280,238,750
6,000,000	6,000,000	14,000,000	12,500,000	2,671,543	1,947,109	41,870,087	(72,988,739)	6,000,000
98,237	–	1,000,000	98,237	–	–	–	(1,000,000)	98,237
30,614,654	10,428,987	185,236	223,243	1,549,583	5,075,104	12,239,164	(4,807,302)	24,894,015
35,550,167	21,037,732	4,182,152	(34,415)	–	–	–	–	25,185,469
104,026,025	70,206,962	2,611,047	2,484,993	9,957,271	22,617,203	(5,260,086)	(11,456,047)	91,161,343
8,008,817	–	–	–	–	–	–	7,422,979	7,422,979
184,297,900	107,673,681	21,978,435	15,272,058	14,178,397	29,639,416	48,849,165	(82,829,109)	154,762,043
517,415,131	115,076,944	51,133,805	238,625,270	18,511,318	49,681,271	61,369,266	(99,397,081)	435,000,793

ඛණ්ඩමය සමාලෝචනය: ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා	2025						
	මව් සමාගම	ජීවිත නොවන රක්ෂණය	ජීවිත රක්ෂණය	සෞඛ්‍ය සේවා	බලශක්ති	වෙනත්	ඉවත්කිරීම්
	රු '000	රු '000	රු '000	රු '000	රු '000	රු '000	රු '000
දළ ලිඛිත වාරිකය	–	30,303,079	32,605,568	–	–	–	(108,410)
නොඉපයූ වාරිකය සඳහා සංචිතවල වෙනස	–	(1,854,667)	–	–	–	–	–
දළ ඉපයූ වාරිකය	–	28,448,412	32,605,568	–	–	–	(108,410)
ප්‍රතිරක්ෂකයන්ට පවරා දෙන ලද වාරිකය	–	–	–	–		–	–
නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරික සඳහා සංචිතවල වෙනස	–	238,271	–	–	–	–	–
ශුද්ධ ඉපයූ වාරිකය	–	19,950,931	31,301,343	–	–	–	(108,410)
වෙනත් මෙහෙයුම්වලින් ආදායම	–	–	–	14,473,921	96,630,976	234,175	(152,192)
	–	19,950,931	31,301,343	14,473,921	96,630,976	234,175	(260,602)
ප්‍රතිලාභ සහ අලාභ							
ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම්	–	(12,268,733)	(16,207,585)	–	–	–	9,269
ප්‍රතිරක්ෂණය ශුද්ධ අත්කර ගැනීමේ පිරිවැය	–	12,092	(4,739,103)	–	–	–	–
ගිවිසුම් වගකීම්වල වෙනස - ජීවිත අරමුදල	–	–	(29,078,874)	–	–	–	–
පරිපාලිත සමාගම්වල සේවා පිරිවැය	–	–	–	(8,063,098)	(84,533,023)	(68,179)	–
මුළු ප්‍රතිලාභ සහ අලාභ	–	(12,256,641)	(50,025,562)	(8,063,098)	(84,533,023)	(68,179)	9,269
වෙනත් ආදායම							
අයෝජන ආදායම	5,550,526	3,913,727	28,790,804	645,623	1,544,615	57,095	(2,526,708)
ගාස්තු සහ කොමිස් ආදායම	–	–	143,308	–	–	–	–
ශුද්ධ උපලබ්ධි/(උපලබ්ධි නොවූ) ලාභ	–	342,146	101,349	274,751	766,177	–	–
අනෙකුත් ආදායම්/(වියදම්)	2,164,880	63,692	502,647	74,299	150,128	126,953	(2,604,212)
	7,715,406	4,319,565	29,538,108	994,673	2,460,920	184,048	(5,130,920)
වියදම්							
වෙනත් මෙහෙයුම්, ආයෝජන ආශ්‍රිත සහ පරිපාලන වියදම්	(824,731)	(8,762,346)	(6,519,734)	(4,575,576)	(5,234,767)	(81,982)	224,230
බදු පෙර ලාභය	6,890,675	3,251,509	4,294,155	2,829,920	9,324,106	268,062	(5,158,023)
ආදායම් බදු වියදම	(388,412)	(723,454)	(1,978,097)	(885,552)	(2,291,075)	(86,659)	–
බදු පසු ලාභය/කොටස්හිමි අරමුදලට මාරු කිරීම්	6,502,263	2,528,055	2,316,058	1,944,368	7,033,031	181,403	(5,158,023)

	2024							
එකතුව	මව් සමාගම	ජීවිත නොවන රක්ෂණය	ජීවිත රක්ෂණය	සෞඛ්‍ය සේවා	බලශක්තිය	වෙනත්	ඉවත්කිරීම්	එකතුව
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
62,800,237	–	25,332,582	26,358,581	–	–	–	(426,693)	51,264,470
(1,854,667)	–	557,953	–	–	–	–	–	557,953
60,945,570	–	25,890,535	26,358,581	–	–	–	(426,693)	51,822,423
(10,039,977)	–	(7,252,681)	(1,027,747)	–	–	–	–	(8,280,428)
238,271	–	(567,272)	–	–	–	–	–	(567,272)
51,143,864	–	18,070,582	25,330,834	–	–	–	(426,693)	42,974,723
111,186,880	–	–	–	13,650,106	90,774,076	209,485	(233,836)	104,399,831
162,330,744	–	18,070,582	25,330,834	13,650,106	90,774,076	209,485	(660,529)	147,374,554
								–
(28,467,049)	–	(10,509,915)	(12,994,471)	–	–	–	6,027	(23,498,359)
(4,727,011)	–	(293,003)	(3,528,572)	–	–	–	–	(3,821,575)
(29,078,874)	–	–	(26,409,382)	–	–	–	–	(26,409,382)
(92,664,300)	–	–	–	(7,699,588)	(82,646,523)	(82,506)	–	(90,428,617)
(154,937,234)	–	(10,802,918)	(42,932,425)	(7,699,588)	(82,646,523)	(82,506)	6,027	(144,157,932)
37,975,682	3,282,348	5,322,486	27,466,406	678,048	826,783	63,739	(1,274,590)	36,365,220
143,308	–	–	75,965	–	–	–	–	75,965
1,484,423	(240)	(521,789)	(158,094)	(433,884)	506,279	581,674	–	(26,054)
478,387	1,334,337	116,467	523,185	50,969	139,920	500,139	(4,368,545)	(1,703,528)
40,081,800	4,616,445	4,917,164	27,907,462	295,133	1,472,982	1,145,552	(5,643,135)	34,711,603
(25,774,906)	(1,518,620)	(8,144,470)	(5,948,025)	(4,350,329)	(4,202,180)	(895,895)	1,183,573	(23,875,946)
21,700,404	3,097,825	4,040,358	4,357,846	1,895,322	5,398,355	376,636	(5,114,064)	14,052,279
(6,353,249)	(40,557)	(753,602)	(1,763,044)	(555,890)	(1,710,240)	(141,566)	–	(4,964,899)
15,347,155	3,057,268	3,286,756	2,594,802	1,339,432	3,688,115	235,070	(5,114,064)	9,087,380

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1 වාර්තාකරණ ආයතනය

1.1 ආයතනික තොරතුරු

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් (සමාගම/SLIC) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත හා පවත්වාගෙන යන සීමිත වගකීම් සහිත රාජ්‍ය සමාගමකි. සමාගමේ සහ සමූහයේ ලියාපදිංචි කාර්යාලය කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි අතර ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ 02, වොක්ෂෝල් වීදියේ අංක 21 දරන රක්ෂණ මන්දිරයේ පිහිටා ඇත.

2025 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන්වන වර්ෂය සඳහා සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ, සමාගම සහ එහි පරිපාලිත සමාගම් වලින් ("සමූහය" ලෙසින්ද, තනිව "සමූහයේ ආයතන", ලෙසින් ද හඳුන්වන ලබන) සහ සමූහයේ ආශ්‍රිත සමාගම්වලින් සමන්විත වේ. සමූහයට අයත් සියළුම සමාගම්වල මූල්‍ය ප්‍රකාශ, 2025 දෙසැම්බර් 31 න් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් සඳහා සකස් කර ඇත.

මව් සමාගමේ සාමාන්‍ය කොටස් වලින් 599,568,144 ක් (99.97%) භාණ්ඩාගාර ලේකම් සතු වන, අතර ඉතිරි කොටස් සමාගමේ සේවකයින් සහ කලින් සේවය කල සේවකයන් සතුවේ.

රක්ෂණ ව්‍යාපාරය කරගෙන යාම සඳහා බලපත්‍රය ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වෙනුවෙන් 2024 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මකව අවසන් කරන ලදී. තවද, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ජීවිත රක්ෂණ ව්‍යාපාරය කරගෙන යාමට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සමාගමට සහ ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාරය කරගෙන යාමට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්ට රක්ෂණ බලපත්‍රයක් ලබාදුන් අතර ඒවා 2024 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් තීරණය කරන ලද ගරු නීතිපතිගේ නෛතික මතය/උපදේශයට යටත්ව අංක SC SPL LA 173/24 දරන නඩුවේ අවසානය දක්වා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් යන නාමය භාවිතා කිරීමට සමාගම වෙත දීර්ඝ කිරීමක් ලැබුණි.

1.2 ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

1.2.1 සමාගම සහ සමූහය

වසර තුළ, සමූහයේ ප්‍රධාන කටයුතු වූයේ ජීවිත නොවන රක්ෂණය, ජීවිත රක්ෂණය ප්‍රාරක්ෂණය කිරීම, සෞඛ්‍යාරක්ෂක සේවා, සත්කාරක සේවා සැපයීම සහ පහත පරිදි ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් ආනයනය, පිරිසැකසුම, ගබඩාකිරීම, බෙදාහැරීම සහ අලෙවි කිරීමයි.

පරිපාලිත සමාගම්

පරිපාලිත සමාගමේ නම	ප්‍රධාන කාර්යයන්
ලංකා හොස්පිටල් කෝපරේෂන් පීඑල්සී	සෞඛ්‍යාරක්ෂාව සහ රසායනාගාර සේවා ලබාදීම
ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ්	ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LPG) ආනයනය, සැකසීම, ගබඩා කිරීම, බෙදා හැරීම අලෙවිය සහ අනෙකුත් ආනුෂංගික සේවා
ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්	ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් සඳහා තොග ගබඩාකරණ පහසුකම් සැලසීම
කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවට්) ලිමිටඩ්	වාණිජමය කාර්යයන් සඳහා කාර්යාලීය ඉඩ කඩ සැලසීම සහ ආගන්තුක සත්කාර සේවයේ කටයුතු කිරීම
මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (ප්‍රයිවට්) ලිමිටඩ් (අක්‍රීය සමාගම)	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් වෙත පඩිපත් කළමනාකරණ සේවා සැපයීම (2024 ජනවාරි සඳහා පමණි)
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය කරගෙන යාම
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්	ජීවිත රක්ෂණ ව්‍යාපාරය කරගෙන යාම

2 සකස් කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS/SLFRS) සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ හා සංශෝධිත 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS 1 පළමුවරට යොදා ගැනීමෙන් පසුව 2025 දෙසැම්බර් 31 න් අවසන් වන මූල්‍ය වසර සඳහා පළමු වරට SLFRS 9 – "මූල්‍ය උපකරණ" අනුකූලව සමාගමේ වෙන වෙනම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ LKAS 39 – "මූල්‍ය උපකරණ: හඳුනා ගැනීම සහ මැනීම" අනුකූලව සකස් කර ඇත. SLFRS 4 – "රක්ෂණ ගිවිසුම්" සංශෝධන මගින් අවසර දී ඇති පරිදි SLFRS 9 න් තාවකාලික නිදහස්වීම යොදා ගැනීමට සමූහය තෝරාගෙන ඇත. 2026 ජනවාරි 01 දින සිට සමූහය SLFRS 17 – "රක්ෂණ ගිවිසුම්" සහ SLFRS 9 එකවර යොදා ගන්නා තුරු LKAS 39 තවදුරටත් යොදා ගනු ලබයි.

මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා 2026 අප්‍රේල් 10 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවසර දෙන ලදී.

2.2 මැනීමේ පදනම

සමූහයේ සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශ, විකල්ප පදනමක් මත මිනිනු ලබන පහත දැක්වෙන ප්‍රමාණාත්මක කරුණු හැර ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කරනු ලැබ ඇත.

- ඉඩම් හා ගොඩනැගිලි සාධාරණ අගයට මිනිනු ලැබේ,
- රක්ෂණ ඔප්පු හිමියන්ගේ වගකීම් ආයුගණකව නිශ්චය කරන අගයන්ට මිනිනු ලැබ ඇත,
- නිශ්චිත ප්‍රතිලාභ සඳහා වන වගකීම ආයුගණකව අගයන, අතර නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවේ වර්තමාන වටිනාකම ලෙස පිළිගනු ලැබේ.

සමාගමට (2024 දෙසැම්බර් 31 ට පෙර) සහ සමූහයට (2025 දෙසැම්බර් 31 දක්වා) අදාළ ප්‍රතිපත්තිය

- විකිණීම සඳහා වන මූල්‍ය වත්කම් සාධාරණ අගයට මිනිනු ලැබේ.
- අලෙවිය සඳහා වන මූල්‍ය වත්කම් සාධාරණ අගයට මිනිනු ලැබේ.

2025 ජනවාරි 01 සිට සමාගමේ ගිණුම්වලට හා 2026 ජනවාරි 01 සිට සමූහයේ ගිණුම්වලට අදාළ ප්‍රතිපත්තිය

- ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නම්කළ මූල්‍ය වත්කම් සාධාරණ අගයෙන් මිනිනු ලැබේ.
- අනෙකුත් විස්තීර්ණ අදායම (FVCOI) තුළින් සාධාරණ අගයට මිනිනු ලබන ණය ආයෝජන සාධාරණ අගයෙන් මිනිනු ලැබේ.
- අනෙකුත් විස්තීර්ණ අදායම (FVCOI) තුළින් සාධාරණ අගයට මිනිනු ලබන ස්කන්ධ ආයෝජන සාධාරණ අගයෙන් මිනිනු ලැබේ.

ක්‍රමක්ෂය පිරිවැයට මිනිනු ලබන මූල්‍ය වත්කම් ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතයෙන් මිනිනු ලැබේ.

සමාගම සහ සමූහය ද්‍රවශීලතාව අනුව පුළුල්ව මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ඉදිරිපත් කරයි.

2.3 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ ව්‍යාවහාර මුදල

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර ශ්‍රී ලංකා රුපියල් සමූහයේ සහ සමාගමේ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල වේ. සියලු වටිනාකම් වෙනත් ආකාරයකින් දක්වා නොමැතිනම් ආසන්නතම රුපියල් දහසට වටයා ඇත.

2.4 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතය

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී, සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කරන ලද වත්කම්, වගකීම්, ආදායම්, සහ වියදම් යොදා ගැනීමට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන කළමනාකරණය විසින් සිදු කර ඇත. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක කරගත් උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වන ප්‍රතිශෝධනයන් අනාගතයේදි බලාපොරොත්තු විය හැකි පරිදි හඳුනාගනු ලබයි.

මූල්‍ය ප්‍රකාශවල හඳුනාගන්නා ප්‍රමාණ මත බලපෑම් කරන උපකල්පන කිරීමේ සහ ඇස්තමේන්තු පිළිබඳ තොරතුරු පහත සඳහන් සටහන් යටතේ ඇතුළත් කර ඇත:

- සටහන 26 – නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් මැනීම: ප්‍රධාන ආයුගණක උපකල්පන;
- සටහන 5, 8, 13, 14 සහ 16 – මූල්‍ය නොවන වත්කම් සහ මූල්‍යමය වත්කම් සඳහා හානිකරණ වෙන් කිරීම: ප්‍රධාන උපකල්පනයන්;
- සටහන 23 – ජීවිත රක්ෂණවල ආයුගණක ඇගයීමත ප්‍රධාන ආයුගණක උපකල්පන;
- සටහන 24 – වැයකරන ලද නමුත් වාර්තා නොකළ හිමිකම් ආයුගණක උපකල්පන ඇතුළුව ජීවිත නොවන හිමිකම් සඳහා ජීවිත රක්ෂණ වෙන් කිරීම් මැනීම;
- සටහන 17 – විලම්බිත අත්කරගැනීම් පිරිවැය මැනීම (DAC);
- සටහන 05 – ලැයිස්තුගත නොකළ සාධන පත්‍රවල සාධාරණ අගය මැනීම සහ මූල්‍ය අයෝජනයන් හි ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය මැනීම;
- සටහන 10 – ආයෝජන දේපළවල සාධාරණ අගය ගණනය;
- සටහන 3, 5, 9 සහ 1 – සමාගම මට්ටමේ මූල්‍ය වත්කම් වර්ගීකරණය සඳහා ව්‍යාපාර ආදර්ශය හා SPPI නිර්ණායක තක්සේරු කිරීම.

සාධාරණ අගයන් මැනීම

සමාගමේ සහ සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනාවරණ ගණනාවකට මූල්‍ය සහ මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් සඳහා සාධාරණ අගය මැනීම අවශ්‍ය වේ.

සාධාරණ අගයන් මැනීම සම්බන්ධයෙන් සමූහයට ස්ථාපිත පාලන රාමුවක් ඇත. මෙයට ඇගයීමේ කණ්ඩායමක් ඇතුළත් වන අතර එයට මට්ටම 3 සාධාරණ අගයන් ඇතුළුව සියලුම වැදගත් සාධාරණ අගයන් මැනීම අධීක්ෂණය සඳහා සහ ප්‍රධාන මූල්‍ය නිලධාරීට සෘජුව වාර්තා කිරීම සඳහා සමස්ථ වගකීම ඇත.

සැලකියයුතු ඇගයීමේ ගැටළු සමාගම සහ අදාළ පරිපාලිත සමාගමේ විගණන කමිටුවට වාර්තා කරනු ලබයි.

වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මැනීමේදී සමාගම සහ සමූහය හැකි තරම් නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපොළ දත්ත භාවිතා කරයි. ඇගයීමේ ශ්‍රේණිය ක්‍රම භාවිතයේදී යෙදවුම් මත පදනම් වන ධූරාවලියක් විවිධ මට්ටම්වලට සාධාරණ අගයන් පහත දැක්වෙන පරිදි වර්ගීකරණය කරනු ලැබේ.

- 1 වන මට්ටම – අනන්‍ය වත්කම් හා වගකීම් සඳහා සක්‍රීය වෙළෙඳපළෙහි නියම කරන ලද මිල (වෙනස් නොකළ),
- 2 වන මට්ටම – ඉහත මට්ටම් 1 හි ඇතුළත් නියම කරන ලද මිල හැර අනෙකුත් යෙදවුම් සෘජුව හෝ වක්‍රව වත්කම් සහ වගකීම් සඳහා නිරීක්ෂණය කළ හැකිය.
- 3 වන මට්ටම – නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපළ දත්ත මත පදනම් නොවන වත්කම් සමඟ වගවීම් සඳහා යෙදවුම් (නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්)

සාධාරණ අගයන් මැනීම සඳහා සිදු කරන ලද උපකල්පන පිළිබඳ වැඩිදුර තොරතුරු මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන් තුළ ඇතුළත් කර ඇත.

2.5 ප්‍රමාණාත්මකතාව සහ සමාහරණය

සමාන අයිතමවල සෑම ප්‍රමාණවත් වර්ගයක්ම මූල්‍ය ප්‍රකාශවල වෙනම ඉදිරිපත් කරනු ලබයි. LKAS 1 – "මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම" අවසර දී ඇති පරිදි වැදගත්නම් මිස සමාන ස්වභාවයේ හෝ වර්ගයේ අයිතම වෙනම ඉදිරිපත් කරනු ලබයි.

2.6 සංසන්දනාත්මක තොරතුරු

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අවශ්‍යතාවය පරිදි, සමාගම 2024 පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මකව සිය සාමාන්‍ය සහ ජීවිත රක්ෂණ ව්‍යාපාරය වෙන් කරන ලදී. එමනිසා, 2024 හි සමාගම යටතේ අනාවරණය කළ මූල්‍ය තොරතුරුවලට වෙන් කිරීමේ දිනය දක්වා රක්ෂණ ව්‍යාපාර තොරතුරු ඇතුළත් වේ.

වත්මන් මූල්‍ය වර්ෂයේ දී සමාගම ප්‍රථම වරට SLFRS 9 යොදා ගෙන ඇත. SLFRS 9 හි සංක්‍රාන්ති විධිවිධාන මගින් අවසර දී ඇති පරිදි, 2024 සඳහා සංසන්දනාත්මක තොරතුරු නැවත ඉදිරිපත් නොකිරීමට සමාගම තීරණය කර ඇත. ඒ අනුව, සමාගම සඳහා සංසන්දනාත්මක තොරතුරු LKAS 39 යටතේ වාර්තා කර ඇති අතර 2025 සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරු සමඟ සැසඳිය නොහැක.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා, සමූහය තාවකාලික නිදහස් කිරීම යටතේ LKAS 39 යොදා ගැනීම දිගටම කරගෙන යන බැවින් සංසන්දනාත්මක තොරතුරු ස්ථාවරව පවතී.

2.7 SLFRS 9 න් තාවකාලික නිදහස්වීම

සමාගමේ කටයුතු ප්‍රධාන වශයෙන් රක්ෂණය සමඟ සම්බන්ධ වන බැවින්, SLFRS 4 - "රක්ෂණ ගිවිසුම්" සඳහා වන සංශෝධන මගින් අවසර දී ඇති පරිදි, සමූහය SLFRS 9 - "මූල්‍ය උපකරණ" වෙතින් තාවකාලික නිදහස් කිරීම යොදා ගැනීමට තෝරාගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාගම 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි වෙනම මූල්‍ය ප්‍රකාශනවල SLFRS 9 යොදා ගෙන ඇති අතර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන LKAS 39 - "මූල්‍ය උපකරණ: පිළිගැනීම සහ මැනීම" අනුව තවදුරටත් යොදා ගනී.

මූලික තක්සේරු දිනය වන විට සමූහයේ රක්ෂණ ආශ්‍රිත වගකීම්වල ධාරණ අගය එහි මුළු වගකීම්වලින් 90% ඉක්මවා ඇති බව තහවුරු කරන ප්‍රමුඛතා පරීක්ෂණයකින් මෙම නිදහස් කිරීම සනාථ වේ. සමාගම එහි ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ පරිපාලිත සමාගම් සඳහා ධාරක ආයතනයක් බවට පරිවර්තනය වූ 2024 පෙබරවාරි මාසයේ දී ව්‍යුහාත්මක ප්‍රතිසංවිධානය කිරීම මගින් මෙම සුදුසුකම් නැවත තක්සේරු කිරීම අවශ්‍ය වන ආයතනික කටයුතුවල වෙනසක් අදහස් නොකරයි. ගිණුම්කරණ නොගැලපීම් අවම කිරීම සහ වාර්තා කිරීමේ අනුරූපතාව සහතික කිරීම සඳහා සමූහය 2026 ජනවාරි 01 වන දින SLFRS 9 සහ SLFRS 17 - "රක්ෂණ ගිවිසුම්" යන දෙකම එකවර යොදා ගනු ඇත.

2.8 SLFRS 9 පළමුවරට යොදා ගැනීම (සමාගම් මට්ටමේ)

2025 ජනවාරි 01 දින සමාගම විසින් SLFRS 9 යොදා ගැනීම ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්වලට හා මූල්‍ය ප්‍රකාශවල මෙයට පෙර හඳුනාගත් ප්‍රමාණවලට ගැලපීම්වලට හේතු වේ. ප්‍රධාන බලපෑම වූයේ:

වර්ගීකරණය: අලෙවියට තබා ඇති සහ කල්පිරෙන තෙක් තබාගන්නා වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට හෝ සාධාරණ වටිනාකම් වර්ගීකරණවලට නැවත වර්ගීකරණය

හානිකරණය: 2025 ජනවාරි 01 දිනට ආරම්භක රඳවා ගැනීමේ ඉපයීම්වලට ගැලපීමක් අවශ්‍ය වන දරන ලද අලාභ ආදර්ශයක් ඉදිරියට දකින අපේක්ෂිත ණය අලාභ ආදර්ශයකට සංක්‍රාන්තිය.

LKAS 39 යටතේ ධාරණ අගයන් SLFRS 9 යටතේ ධාරණ අගයන්ට විස්තරාත්මක සැසඳීම් සඳහා සටහන් 3, 5, 4, 9 සහ 1 බලන්න.

2.9 අඛණ්ඩතා පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් ලෙසින් අඛණ්ඩව ඉදිරියට යාමට සමාගමේ සහ සමූහයේ හැකියාව ගැන තක්සේරුවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කර තිබෙන අතර දැකියහැකි අනාගතයේදී ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාමට සම්පත් තිබෙන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්ව සිටී. තවද, අඛණ්ඩ පැවැත්මක් ලෙස පවත්වාගෙන යාමට සමාගමේ ඇති හැකියාව ගැන අවිශ්වාසයක් ඇති කළ හැකියැයි සැලකිය හැකි අවිනිශ්චිතතා පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් නැත.

ලාභදායිතාව, ආදායම් ප්‍රවාහ, කාර්ක ප්‍රාග්ධන කළමනාකරණය, ප්‍රාග්ධන වියදම, මුදල් සංචිත සහ වර්තමාන ගෝලීය සහ දේශීය ආර්ථික තත්ත්වයන් යටතේ ව්‍යාපාරය කරගෙන යාමට හැකිවීම පිණිස සමාගම විසින් ක්‍රියාත්මක කරන පිරිවැය කළමනාකරණ මූලපිරීම් වැනි පුළුල් පරාශයක සාධක සලකා බලමින්, සිය ව්‍යාපාරයේ ඔරොත්තුදීම සමාගම තක්සේරු කරමින් සිටී. ලබාගතහැකි තොරතුරු මත පදනම් විශ්ලේෂණ හා අනාගත දැක්ම මත පදනම් වී, අඛණ්ඩ පැවැත්මක් ලෙස පවත්වාගෙන යාමට සමූහයේ ඇති හැකියාව මත සැලකිය හැකි සැකයක් ඇති කරන යම් වැදගත් අවිනිශ්චිතතා පිළිබඳ අධ්‍යක්ෂවරු දැනුවත් නැත.

එම නිසා මූල්‍ය ප්‍රකාශ තවදුරටත් අඛණ්ඩ පැවැත්ම පදනම මත සකස් කරනු ලැබේ.

අතිරේක තොරතුරු මූල්‍ය ප්‍රකාශයන්හි සටහන 50 හි අනාවරණය කර ඇත.

3 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරු

මෙම මූල්‍ය ප්‍රකාශයේ ඉදිරිපත් කරන සියළුම කාලසීමා සඳහා පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සමූහය හා සමාගම විසින් අඛණ්ඩ වශයෙන් යොදා ගෙන ඇත.

3.1 ඒකාබද්ධකරණ පදනම

3.1.1 ව්‍යාපාර සංයෝජන

පාලනය සමූහයට පවරා දෙන විට අත්පත්කර ගැනීමේ ක්‍රමය භාවිතා කරමින් ව්‍යාපාර සංයෝජනය සඳහා සමූහය සලකා බලයි. හඳුනාගත හැකි ශුද්ධ වත්කම් අත්කරගන්නා පරිදි අත්පත් කර ගැනීම්වල ප්‍රතිලාභ මාරුකිරීම සාමාන්‍යයෙන් සාධාරණ අගයට මනිනු ලැබේ. මතුවන කිසියම් කීර්තිනාමයක් වේනම් හානිකරණය සඳහා වාර්ෂිකව පරීක්ෂා කරනු ලැබේ. කේවල්කර මිලදී ගැනීම මත ලැබෙන යම් ප්‍රතිලාභයක් ලාභ හෝ අලාභ වලදී වහාම හඳුනා ගනු ලැබේ. ණය සහ ස්කන්ධ සුරැකුම්වල ගැටළු වලට අදාළ වන්නේ නම් හැර ගනුදෙනු පිරිවැය දරා ඇති පරිදි වියදම් කෙරේ.

පෙර පැවති සම්බන්ධතා පියවීමට අදාළ ප්‍රමාණ මාරුකළ ප්‍රතිඵලවාට ඇතුළත් නොකෙරේ. එම ප්‍රමාණ සාමාන්‍යයෙන් ලාභ හෝ අලාභය තුළ හඳුනාගනී.

3.1.2 පාලනය නොවන අයිතිය (NCI)

පාලනය නොවන අයිතිය අත්පත්කර ගන්නා දිනට අත්පත්කර ගන්නාගේ හඳුනාගත හැකි ශුද්ධ වත්කම්වල සමානුපාතික කොටස්වලට මනිනු ලබයි.

පාලනය අහිමිවීමක් සිදුනොවන, පරිපාලිත සමාගමක් තුළ මව් සමාගමේ අයිතියේ වෙනස්වීම් ස්කන්ධ ගනුදෙනු ලෙස සලකනු ලැබේ.

3.1.3 අනුබද්ධ සමාගම්වල ආයෝජන

පරිපාලිත සමාගම් යනු මව් සමාගම මඟින් පාලනය කරනු ලබන ආයතන වෙති. මව් සමාගමට යම් ආයතනයක කටයුතුවලින් ප්‍රතිලාභ ලබා ගැනීමට එහි මූල්‍ය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති පාලනය කිරීමේ බලය දරන අවස්ථාවේ පාලනය පවතී. පාලනය තක්සේරු කිරීමේදී, වර්තමානයේ ක්‍රියාත්මක කළ හැකි විභව ඡන්ද අයිතීන් සැලකිල්ලට ගනු ලැබේ. පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශ, සමූහය විසින් ඒවා පාලනය ආරම්භ කළ දිනයේ සිට පාලනය අවසන් කරන දින දක්වා වන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවලට ඇතුළත් කරනු ලැබේ.

පරිපාලිත සමාගම්වල ආයෝජනයන් සමාගමේ මූල්‍ය ප්‍රකාශයන් හි හානිකිරීම් අඩුකළ පිරිවැයට ඉදිරියට ගෙන ලැබේ.

3.1.4 පාලනය අහිමිවීම

පරිපාලිත සමාගමක පාලනය සමූහයට/සමාගමට අහිමි වූ විට එම පරිපාලිත සමාගමේ වත්කම් සහ වගකීම් සහ කිසියම් අදාළ පාලනය නොවන අයිතිය සහ වෙනත් ස්කන්ධයේ සංරචක හඳුනා නොගනී. ඇතිවන ලාභය හෝ අලාභය ලාභය හෝ අලාභය තුළ හඳුනාගනී. පෙර පරිපාලිත සමාගම තුළ රඳවා ගන්නා ලද යම් අයිතිය පාලනය අහිමි වන අවස්ථාවේ සාධාරණ අගයට මනිනු ලැබේ.

3.1.5 ආශ්‍රිත සමාගම්වල ආයෝජන

ආශ්‍රිත සමාගමක් යනු පරිපාලිත සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් නොවන නමුත් සමාගමට එය සැළකිය යුතු බලපෑමක් ඇති කල හැකි ආයතනයකි. සමූහය/සමාගම විසින් අයෝජකයාගේ සමාගමේ ඡන්දය දීමේ බලයෙන් 20% හෝ ඊට වැඩි ප්‍රමාණයක් දරනු ලබන අවස්ථාවේදි සැලකිය යුතු බලපෑමක් සිදු කල හැකි යැයි උපකල්පනය කරන අතර එසේ නොවන්නේ නම් මෙය අදාළ නොවන බව පැහැදිලිව පෙන්වා දිය හැකිය.

සමූහයේ මූල්‍ය ප්‍රකාශනවල, ආශ්‍රිත සමාගමේ අයිතිය ස්කන්ධ ක්‍රමය භාවිතයෙන් ගණනය කරනු ලැබේ. ඒවා මූලිකව පිරිවැයට හඳුනාගනු ලබන අතර එයට ගණුදෙනු පිරිවැය ඇතුලත් වේ. මූලික හඳුනා ගැනීමෙන් පසුව, එකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් හි සමූහයේ ලාභය හෝ අලාභයේ කොටස සහ ස්කන්ධය ගණනය කළ අයෝජකයන්ගේ අනෙකුත් විස්තීරණ ආදායම සැලකිය යුතු බලපෑමක් හෝ සමූහ පාලනය අවසන් වන දිනය තෙක් ඇතුලත් වේ.

ආශ්‍රිත සමාගම තුළ අයෝජනයන් සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් හි හානිකරණය අඩු කළ පිරිවැයට ගෙනයනු ලැබේ.

3.1.6 ඒකාබද්ධවීම මත අත්හරින ගනුදෙනු

අන්තර් සමූහ ගනුදෙනුවලින් ඇතිවන අන්තර් සමූහ ශේෂ හා ගනුදෙනු සහ කිසියම් උපලබ්ධි නොවූ ආදායම් සහ වියදම් ඉවත් කරනු ලැබේ. ස්කන්ධය ගණනය කළ ආයෝජිතයින් සමඟ කරන ගනුදෙනුවලින් ඇතිවන උපලබ්ධි නොවූ ලැබීම්, ආයෝජකයා කෙරෙහි සමූහයේ බැඳියාවේ ප්‍රමාණයට කරනු ලබන ආයෝජනයට අනුව ඉවත් කරනු ලැබේ. උපලබ්ධි නොවූ අලාභ උපලබ්ධි නොවූ ලැබීම් ආකාරයෙන්ම ඉවත් කරනු ලබන නමුත් හානිකරණය පිළිබඳ සාක්ෂි නොමැති ප්‍රමාණය දක්වා එසේ කරනු ලැබේ.

3.2 විදේශ මුදල් ගනුදෙනු

විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු එම ගනුදෙනුවේ දිනවල පවතින විනිමය අනුපාත අනුව සමාගම සහ සමූහය යොදාගන්නා ව්‍යවහාර මුදල් බවට පරිවර්තනය කරනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදල්වලට නම්කළ මූල්‍ය වත්කම් හා වගකීම්, වාර්තාකරණ දිනයට පවතින විනිමය අනුපාතයට අනුව ක්‍රියාකාරී මුදල්වලට පරිවර්තනය කරනු ලැබේ.

විදේශ ව්‍යවහාර මුදල්වලින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය නොවන වත්කම් හා වගකීම්, සාධාරණ අගය තීරණය කරන විට පැවති විනිමය අනුපාතයට අනුව ක්‍රියාකාරී මුදල්වලට පරිවර්තනය කරනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදල්වල ඓතිහාසික පිරිවැය මත පදනම්ව මනිනු ලබන මූල්‍ය නොවන අයිතම ගනුදෙනුවේ දිනයට ඇති විනිමය අනුපාතයට අනුව පරිවර්තනය කරනු ලැබේ.

විදේශ ව්‍යවහාර මුදල්වල වෙනස්වීම් සාමාන්‍යයෙන් ලාභය සහ අලාභය තුළ හඳුනාගනු ලැබේ.

3.3 රක්ෂණ ගිවිසුම්

නිෂ්පාදන වර්ගීකරණය

පවරන ලද රක්ෂණ අවදානමේ ප්‍රමාණය මත පදනම්ව රක්ෂණකරුවන් විසින් ඵලඹෙන ගිවිසුම් හෝ "රක්ෂණ ගිවිසුම්"හෝ "ආයෝජන ගිවිසුම්" ලෙස වර්ගීකරණය කිරීම ශ්‍රී.ලං.ම.නි.ප්‍ර 4 අනුව අවශ්‍ය ය.

රක්ෂණ ගිවිසුම යනු, ඔප්පු හිමිකරුවන් නිශ්චිතව සඳහන් කරන ලද අනාගත අවිනිශ්චිත අවස්ථාවලදී (රක්ෂිත සිදුවීමකදී) ඔවුන්ට එල්ලවන අහිතකර බලපෑමක් සඳහා වන්දි ලබාදීමට එකඟ වී සමාගම (රක්ෂකයා) විසින් තවත් පාර්ශවයකින් (ඔප්පුහිමියන්) ඉදිරිපත්වන සුවිශේෂී රක්ෂණ අවදානමක් පිළිගැනීමයි. සාමාන්‍ය මාර්ගෝපදේශයක් ලෙස රක්ෂිත සිදුවීම් සිදුනොවුනහොත් ගෙවන ලද ප්‍රතිලාභය ගෙවිය යුතු ප්‍රතිලාභය සමඟ සංසන්දනය කර එම සිදුවීමෙන් සුවිශේෂී රක්ෂණ අවදානමක් තිබේද යන්න තීරණය කරනු ලැබීම දැක්විය හැකිය. රක්ෂණ ගිවිසුම් මූල්‍ය අවදානමට මාරු කිරීමටද හැකිය.

ගිවිසුමක් රක්ෂණ ගිවිසුමක් ලෙස වර්ගීකරණය කළ පසු, සියලුම අයිතිවාසිකම් හා බැඳීම් ශූන්‍ය වී හෝ ඉකුත්වී නැත්නම් එම කාලසීමාව තුළ රක්ෂණ අවදානම සුවිශේෂී ලෙස අඩු වී තිබුණද එය රක්ෂණ ගිවිසුමක් ලෙස ගිවිසුම් ගත කාලය අවසන් වන තුරු පවතී. එහෙත් ආයෝජන ගිවිසුම් ආරම්භ කිරීමෙන් පසු රක්ෂණ අවදානම සැලකිය යුතු මට්ටමකට පත්වන්නේ නම් එම ගිවිසුම් ද රක්ෂණ ගිවිසුම් ලෙස වර්ගීකරණය කළ හැකිය.

සමාගම විසින් අලෙවිකර ඇති සියලුම නිෂ්පාදන රක්ෂණ ගිවිසුම් වන අතර එහෙයින් ඒවා ශ්‍රී.ලං.මු.වා.ප්‍ර 4 (SLFRS 4), යටතේ රක්ෂණ ගිවිසුම් ලෙස වර්ගීකරණය කරනු ලබයි. එසේම වාර්තා කරන දිනයට සමාගමේ නිෂ්පාදන කළඹ තුළ සමාගමට කිසිදු ආයෝජන ගිවිසුමක් නොමැත.

3.3.1 රක්ෂණ ගිවිසුම් වගකීම්වලින් කොටස්හිමියන්ට මාරුකරන අතිරික්ත ලාභය

එක් එක් වාර්තාකරණ කාල සීමාව තුළ කොටස්හිමියන් වෙත පැවරිය හැකි සංචිත භාවිත කරමින් කොටස්හිමියන්ගේ වටිනාකම සමාගම විසින් තක්සේරු කරනු ලැබේ. සංචිතවල ආරම්භක හා අවසන් කිරීමේ ශේෂයන් අතර වෙනස කොටස්කරුවන් වෙත පැවරිය හැකි අතිරික්ත ලාභය ලෙස සළකනු ලබන අතර එය වාර්තාකරණ දිනයට රක්ෂණ ගිවිසුම් වගකීමෙන් අඩු කරනු ලැබේ. කොටස්හිමියන් වෙත පැවරිය හැකි අතිරික්ත ලාභය පහත දැක්වෙන පරිදි ආකාර දෙකකින් සමන්විත වේ;

- ඔප්පුහිමියන්ගේ අරමුදලෙන් කොටස්හිමියන් වෙත පැවරිය හැකි අතිරික්ත ලාභය
- කොටස්හිමියන්ගේ වත්කම්වලින් ඉපැයූ ලාභය

ඔප්පුහිමියන්ගේ අරමුදලින් කොටස්හිමියන්ට පැවරිය හැකි අතිරික්ත ලාභය

ස්වාධීන උපදේශක ආයුගණකවරයකුගේ නිර්දේශය මත ආයුගණක ඇගයීමකින් අතිරික්තය ව්‍යුත්පන්න වේ.

කොටස්හිමියන්ගේ වත්කම්වලින් ඉපයූ ලාභය

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත, අභ්‍යන්තර ආයුගණක දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත කොටස්හිමියන්ගේ වත්කම්වලින් ඉපයූ ලාභ පදනම් වේ.

3.4 ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය

3.4.1 ආදායම හඳුනා ගැනීම

3.4.1.1 දළ ලිඛිත වාරිකය (GWP)

(අ) ජීවිත රක්ෂණ දළ ලිඛිත වාරිකය

ජීවිත රක්ෂණ ගිවිසුම් මත දළ පුනරාවර්ත රක්ෂණ වාරික ඔප්පු හිමියන් විසින් ගෙවනු ලබන විට ආදායමක් ලෙස හඳුනා ගනී. (දින 30 ක සහන කාලය ඇතුළත ඔප්පු අයවීමක් ලෙස සලකනු ලැබේ). නියමිත දිනට කලින් ලැබෙන රක්ෂණ වාරික ආදායමක් ලෙස වාර්තා නොකරන අතර එවැනි රක්ෂණ වාරික ආදායමක් ලෙස පිළිගැනීමට අදාළ ප්‍රතිපත්තිමය කොන්දේසිවලට අනුව අවශ්‍ය නොවන්නේ නම් එම රක්ෂණ වාරික අයවීමක් ලෙස තිබෙන තුරු වගකීමක් ලෙස සටහන් කරනු ලබයි. එම ඔප්පුවල තක්සේරු කළ ජීව කාලය මත ලාභ හඳුනාගැනීම සඳහා එකී ආදායම්වලට අනුව ප්‍රතිලාභ හා වියදම් සපයනු ලබයි.

තනි රක්ෂණ වාරික ව්‍යාපාර සඳහා, ඔප්පුව ක්‍රියාත්මක වන දින සිට ආදායම හඳුනා ගනී.

(ආ) ජීවිත නොවන රක්ෂණ දළ ලිඛිත වාරිකය

දළ ලිඛිත වාරිකය ගිණුම්කරණ කාල සීමාවේ දී ඇතුළත් වූ ගිවිසුම්වලින් ලබා දෙන රක්ෂණාවරණයේ සම්පූර්ණ කාල සීමාව සඳහා ලැබිය යුතු මුළු රක්ෂණ වාරිකවලින් සමන්විත වේ. ඒවා ඔප්පුව ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට හඳුනා ගනී. ගිවිසුම් ආරම්භ කිරීම මත, රක්ෂණ වාරික ලිඛිත ලෙස වාර්තා කරනු ලබන අතර අදාළ ඔප්පු ආවරණයේ කාලසීමාව පුරා සමානුපාතික පදනමක් මත මූලිකව උපයා ගනී.

හිමිකම් නොපැමේ ප්‍රතිදාන වැනි රක්ෂණ වාරික අනුපාත වල කොටස් වන ප්‍රතිදාන, දළ ලිඛිත වාරික වලින් අඩුකරනු ලැබේ.

නොඉපයූ වාරික සංචිතය (UPR)

නොඉපයූ වාරික යනු වාර්තාකරණ දිනයට පසු අවදානම් කාල සීමාවට අදාළ වර්ෂයකදී ලියනලද රක්ෂණ වාරිකවලට සමානුපාතික රක්ෂණ වාරිකයයි. නොඉපයූ වාරික සංචිතය වසර තුළ ලියන ලද වාරිකයේ කොටස නියෝජනය කරන නමුත් ආවරණයේ කල් නොපිරුණු කාලයට අදාළ වේ.

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතට අනුව නොඉපයූ වාරික දින 365 පදනම මත ගණනය කෙරේ. කෙසේවෙතත්, ගිවිසුම්ගත කාලයෙන් අවදානම් කාලසීමාව සැලකියයුතු ලෙස වෙනස්වන ගිවිසුම් සඳහා, ලබාදෙන ලද රක්ෂණ ආරක්ෂාවේ ප්‍රමාණයට සමානුපාතිකව අවදානම් කාලසීමාව පුරා වාරිකය උපයා ගනී. පසුකාලසීමාවන්ට අදාළ වන කොටස වගකීම් යටතේ ඇතුළත් කරන නොඉපයූ වාරිකය සඳහා වෙන් කිරීමක් ලෙස විලම්භනය කෙරේ.

3.4.1.2 ප්‍රතිරක්ෂණ වාරිකය

රක්ෂණ ගිවිසුම් මත දළ ප්‍රතිරක්ෂණ වාරික, රක්ෂණ වාරික ගෙවනු ලැබිය යුතු දිනයට හෝ රක්ෂණ ඔප්පුව ක්‍රියාත්මක වන දිනයට හෝ පෙර වියදමක් ලෙස හඳුනා ගනී. ප්‍රතිරක්ෂණ වාරික, ප්‍රතිරක්ෂකයින් සමඟ එකඟවූ අනුපාත මත පදනම් වී තීරණය කරනු ලැබේ.

(අ) ජීවිත නොවන රක්ෂණ ප්‍රතිරක්ෂණ වාරිකය

ලිඛිත ප්‍රතිරක්ෂණ වාරික, කාල සීමාව සඳහා ඇතුළත් වූ ගිවිසුම මඟින් ලබා දෙන සම්පූර්ණ ආවරණය සඳහා ගෙවිය යුතු මුළු රක්ෂණ වාරිකවලින් සමන්විත වන අතර රක්ෂණ ඔප්පුව ආරම්භවන දිනයේදී හඳුනා ගනී.

(ආ) නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරික සංචිතය

නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරික යනු, වාර්තාකරණ දිනයට පසු අවදානම් කාලසීමාවට අදාළ වර්ෂයක ලියන ලද රක්ෂණ වාරිකවලට සමානුපාතික රක්ෂණ වාරිකයි. නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරික, (2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත අනුව දින 365 පදනම භාවිතා කරමින්) අවදානම් බැඳුණු ගිවිසුම් සඳහා පාදක සෘජු රක්ෂණ ඔප්පුවල කාලය පුරා විලම්භනය කෙරේ. එසේවුවද, අවදානම් කාලසීමාව ගිවිසුම්ගත කාලසීමාවෙන් සැලකිය යුතු ලෙස වෙනස්වන ගිවිසුම් සඳහා, ලබා දෙන රක්ෂණ ආරක්ෂණයේ ප්‍රමාණයට සමානුපාතිකව අවදානම් කාලසීමාව පුරා රක්ෂණ වාරික උපයා ගනු ලැබේ.

(ආ) ජීවිත රක්ෂණ ප්‍රතිරක්ෂණ වාරිකය

ජීවිත රක්ෂණයේ ප්‍රතිරක්ෂණ වාරික, රක්ෂණ වාරික ගෙවිය යුතු දිනයට හෝ රක්ෂණ ඔප්පුව ක්‍රියාත්මක වන දිනයට හෝ පෙර වියදමක් ලෙස හඳුනා ගනී.

3.4.1.3 ගාස්තු සහ කොමිස් ආදායම

(අ) ප්‍රතිරක්ෂණ කොමිස් ආදායම

බැහැර ප්‍රතිරක්ෂණ ගිවිසුම් මත ප්‍රතිරක්ෂණ කොමිස් ආදායම ලැබෙන අවස්ථාවේ ආදායමක් සේ හඳුනා ගනී. මූලික හඳුනා ගැනීමෙන් පසු, බැහැර ප්‍රතිරක්ෂණ ගිවිසුම් මත ප්‍රතිරක්ෂණ කොමිස් ආදායම අපේක්ෂිත ගෙවිය යුතු රක්ෂණ වාරික කාලය පුරා සරල මාර්ගික පදනමක් මත විලම්භනය කර ක්‍රමක්ෂය කරනු ලැබේ.

(ආ) අනෙකුත් ගාස්තු ආදායම

රක්ෂණ ගිවිසුම් ඔප්පු හිමියන්ගෙන් ඔප්පු පරිපාලන සේවා සඳහා සහ අනෙකුත් ගිවිසුම් ගාස්තු සඳහා අයකරනු ලබයි. මෙම ගාස්තු ලැබීම් මත හෝ හිඟ බවට පත්වන විට ආදායම් ලෙස සලකනු ලබයි.

3.4.1.4 ආයෝජන ආදායම්

ආයෝජන ආදායම ආයෝජනය කළ අරමුදල් වලින් ලැබෙන පොලී ආදායම්, ලාභාංශ ආදායම්, FVTPL ට මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ හෝ අලාභ, සහ විදේශ මුදල් ලාභ හෝ අලාභ ඇතුළුව FVOCI ණය උපකරණ මත උපලබ්ධි ලාභ හෝ අලාභවලින් සමන්විත වේ.

(ඉ) පොලී ආදායම්

සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් ලාභය සහ අලාභය තුළ පොලී ආදායම් හඳුනා ගනු ලැබේ. සඵල පොලී අනුපාතය යනු, මූල්‍ය වත්කම්වල ධාරණ අගයට මූල්‍ය වත්කමේ (යෝග්‍ය අවස්ථාවලදී කෙටි කාල සීමාවක්) අපේක්ෂිත ජීව කාල මඟින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ලැබීම් හා ගෙවීම් සත්‍ය වශයෙන්ම වට්ටම් කරන අනුපාතයයි. සඵල පොලී අනුපාතය ගණනය කිරීමේදී, සමාගම සහ සමූහය මූල්‍ය සාධන පත්‍රවල, සියලුම ගිවිසුම්ගත නියමයන් සැලකිල්ලට ගනිමින් අනාගත ණය අලාභ නොවන, නමුත් අනාගත ණය මූල්‍ය ප්‍රවාහ ඇස්තමේන්තු කරයි.

සඵල පොලී අනුපාත ගණනය කිරීමට සඵල පොලී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක් වන සියලුම ගනුදෙනු පිරිවැය සහ ගාස්තු සහ ගෙවූ සහ ලැබුණු සමායන ඇතුළත් වේ. ගනුදෙනු පිරිවැයට, මූල්‍ය වත්කමක් අත්කර ගැනීමේ දී හෝ නිකුත් කිරීමේදී සෘජුවම ආරෝපනය වන වර්ධනීය පිරිවැය ඇතුළත් වේ.

පහත දැ හැර වත්කමේ දළ ධාරණ අගයට සඵල පොලී අනුපාතය යොදා ගනී:

- මිලදීගත් හෝ ජනනය වූ ණය – හානිකරණය වූ (POCI) මූල්‍ය වත්කම් – සමූහය මූලික හඳුනා ගැනීමේ සිට වත්කමේ ක්‍රමක්ෂය පිරිවැයට ණය-ගලපන ලද සඵල පොලී අනුපාතය යොදා ගනී.
- අදියර 3 (ණය – හානිකරණය වූ) මූල්‍ය වත්කම් – පසුකාලීනව ණය – හානිකරණයට පත්ව ඇති වත්කම් සඳහා, පොළී ආදායම ක්‍රමක්ෂය පිරිවැයට සඵල පොලී අනුපාතය යොදා ගනිමින් ගණනය කෙරේ. (අපේක්ෂිත ණය අලාභ (ECL) දීමනාව).

(අ) ලාභාංශ ආදායම

ආදායම් ලැබීමේ හිමිකම ස්ථාපිත කරනු ලබන විට ලාභාංශ ආදායම හඳුනාගනු ලැබේ.

(අ) ලාභ සහ අලාභ

ආයෝජන ආදායමේ වාර්තා කර ඇති ප්‍රාග්ධන ලාභ සහ අලාභවලට මූල්‍ය වත්කම් විකිණීමේදී ලැබෙන ලාභ සහ අලාභ ඇතුළත් වේ. ඒවා ශුද්ධ විකුණුම් ආදායම සහ මුල් හෝ ක්‍රමක්ෂය පිරිවැය අතර වෙනස ලෙස ගණනය කරනු ලබන අතර විකුණුම් ගනුදෙනුව සිදු කරන අවස්ථාවේදී වාර්තා කරනු ලැබේ. තවද, ප්‍රාග්ධන ලාභ සහ අලාභවලට දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම් මත සාධාරණ වටිනාකම් ලාභ සහ අලාභ ඇතුළත් වේ.

3.4.1.5 ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් ආදායම

අදාල භාණ්ඩ හෝ සේවා හුවමාරු කිරීමට නියමිත යැයි සමූහය අපේක්ෂා කරනු ලබන ප්‍රතිලාභය දක්වන මුදලකට භාණ්ඩ හා සේවා පාලනය පාරිභෝගිකයා වෙත මාරු කරන අවස්ථාවේදී පාරිභෝගිකයා සමග පවතින ගිවිසුම්වලින් ලැබෙන ආදායම හඳුනා ගනී.

3.4.1.6 රෝහල් ආදායම්

සමූහය විසින් සපයන ප්‍රතිලාභයන් පාරිභෝගිකයා විසින් ලබා ගනිමින් පරිභෝජනය කරන බැවින්, සේවය පිළිබඳ පූර්ණ තෘප්තිමත්භාවයේ ප්‍රගතිය මැනීම සඳහා යෙදවුම් ක්‍රමයක් භාවිත කරමින් රෝහල් සේවා මගින් ලැබෙන ආදායම කාලසීමාව පුරාවට සමූහය විසින් හඳුනාගනු ලැබේ.

ආදායමේ කොටසක් නොසාදන සමූහය විසින් අභ්‍යන්තර සහ බාහිර උපදේශන වෙනුවෙන් එකතුකළ උපදේශන ගාස්තු ආදායමෙන් ඉවත් කරනු ලබයි.

3.4.1.7 භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම

වත්කමේ පාලනය පාරිභෝගිකයාට පැවරෙන අවස්ථාවේදී සාමාන්‍යයෙන් උපකරණය බෙදා හැරීමේදී භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනාගනී. ගනුදෙනු මිලෙන් කොටසක් වෙන් කළ යුතු වෙනම කාර්යසාධන බැඳීම් වන ගිවිසුමේ වෙනත් පොරොන්දු තිබේද යන්න සමූහය සලකා බලයි. භාණ්ඩ විකිණීම සඳහා ගනුදෙනු මිල තීරණය කිරීමේදී, සමූහය විචල්‍ය ප්‍රතිඵල්‍යාවේ බලපෑම සහ සැලකිය යුතු මූල්‍ය සංරචකවල පැවැත්ම තක්සේරු කරනු ලබයි.

(i) විචල්‍ය ප්‍රතිඵල්‍යාව

ගිවිසුමක් තුළ ප්‍රතිඵල්‍යාවක විචල්‍ය ප්‍රමාණයක් ඇතුළත් වන්නේ නම්, භාණ්ඩය පාරිභෝගිකයා වෙත මාරු කිරීම සඳහා හුවමාරුව තුළ හිමිකම ලබන ප්‍රතිඵල්‍යාවේ ප්‍රමාණය සමූහය විසින් ඇස්තමේන්තු කරයි. විචල්‍ය ප්‍රතිඵල්‍යාව ගිවිසුම ආරම්භයේ දී තක්සේරු කරන අතර විචල්‍ය ප්‍රතිඵල්‍යාව සමඟ සම්බන්ධිත අවිනිශ්චිතතාව පසුව විසඳන විට හඳුනාගත් සමුච්චිත ආදායම් ප්‍රමාණයෙන් සැලකිය යුතු ආදායම් ආපසු හැරවීමක් සිදු නොවන බවට වැඩි සම්භාවිතාවක් ඇති වන තෙක් එය සීමා කර ඇත. භාණ්ඩ විකිණීම සඳහා වන සමහර ගිවිසුම් මගින් ගනුදෙනුකරුවන්ට ආපසු එවීමේ අයිතිය ලබාදේ. ආපසු එවීමේ අයිතිවාසිකම් විචල්‍ය ප්‍රතිඵල්‍යාවට හේතු වේ.

(ii) ආපසු එවීමේ අයිතිවාසිකම

සමහර ගිවිසුමක් මගින් නිශ්චිත කාල සීමාවක් තුළ භාණ්ඩ ආපසු එවීමේ අයිතිය පාරිභෝගිකයාට ලබා දේ. ආපසු ලබා නොදෙන භාණ්ඩ තක්සේරු කිරීම සඳහා සමූහය අපේක්ෂිත වටිනාකම් ක්‍රමය භාවිතා කරයි, එයට හේතුව මෙම ක්‍රමය මඟින් සමූහයට හිමිකම් ලබන විචල්‍ය ප්‍රතිඵල්‍යාවේ ප්‍රමාණය මැනවින් පුරෝකථනය කිරීමයි. ගනුදෙනු මිලට ඇතුළත් කළ හැකි විචල්‍ය ප්‍රතිඵල්‍යාවේ ප්‍රමාණය තීරණය කිරීම සඳහා විචල්‍ය ප්‍රතිඵල්‍යාවේ සංරෝධක ඇස්තමේන්තු පිළිබඳ SLFRS 15 හි අවශ්‍යතා ද අදාළ කර ගනී. ආදායම වෙනුවට ආපසු එවනු ඇතැයි අපේක්ෂා කරන භාණ්ඩ සඳහා, සමූහය මුදල් ආපසු ගෙවීමේ වගකීමක් හඳුනා ගනී.

(iii) සැලකියයුතු මූල්‍ය සංරචකය

සාමාන්‍යයෙන් සමූහයට තම ගනුදෙනුකරුවන්ගෙන් කෙටි කාලීන අත්තිකාරම් ලැබේ. SLFRS 15 හි ප්‍රායෝගික උපයෝගීතාව භාවිතා කරමින්, ගිවිසුම ආරම්භයේ දී, පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවාව පාරිභෝගිකයාට පැවරීම සහ පාරිභෝගිකයා එම භාණ්ඩ හෝ සේවාව සඳහා ගෙවන අවස්ථාව අතර කාලසීමාව වසරක් හෝ ඊට අඩු වනු ඇතැයි අපේක්ෂා කරන්නේනම්, සැලකිය යුතු මූල්‍යකරණ සංරචකයක බලපෑම් සඳහා සමූහය පොරොන්දු වූ ප්‍රතිඵල්‍යාවේ ප්‍රමාණය ගලපනු නොලබයි.

3.4.1.8 ආයෝජන දේපළවලින් ලැබෙන කුලී ආදායම

ආයෝජන දේපළවලින් ලැබෙන කුලී ආදායම, බදු කාලය පුරා සරල මාර්ගික පදනමක් මත ආදායමක් ලෙස හඳුනා ගනී. ලබා දෙන කල්බදු දිරිදීමනා බදු කාලය පුරා මුළු කුලී ආදායමේ අත්‍යවශ්‍ය කොටසක් ලෙස හඳුනා ගනී.

3.4.1.9 දේපළ, පිරියත හා උපකරණ බැහැර කිරීම මත ලාභය/අලාභය

දේපළ, පිරියත සහ උපකරණ බැහැරලීම මත ලාභ/අලාභ අලෙවිය සිදුවන කාල සීමාවේදී හඳුනා ගන්නා අතර අනෙකුත් ආදායම් යටතේ වර්ගීකරණය කරනු ලබයි.

3.4.2 ප්‍රතිලාභ, හිමිකම් සහ වියදම්

3.4.2.1 දළ ප්‍රතිලාභ, සහ හිමිකම්

(අ) ජීවිත රක්ෂණ ව්‍යාපාරය

මරණ හා කල්පිරීම මඟින් ලැබෙන හිමිකම් මරණය හෝ කාල පරිච්ඡේදය ඉකුත්වීමේ දැන්වීම මත ආදායම අනුව අයකරනු ලැබේ. අන්තර් ගෙවීම් හා පවාරණ පියවීම් කරන අවස්ථාව සඳහා පමණක් ගණනය කරනු ලැබේ.

ජීවිත රක්ෂණය සඳහා වන වියදම් අත්පත් කර ගැනීමේ වියදම්වලට අදාළ වන අතර, ජීවිත රක්ෂණ ව්‍යාපාරය නඩත්තු කිරීම සඳහා වන වියදම්, ආයෝජන ආශ්‍රිත වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කෙරෙන ආයෝජන ප්‍රාග්ධන පිරිවැයේ කොටසක් ලෙස නොසලකයි.

(ආ) ජීවිත නොවන රක්ෂණ ව්‍යාපාරය

ජීවිත නොවන රක්ෂණ හිමිකම්වලට හිමිකම් සැකසීම හා පියවීමට සෘජුවම අදාළවන හිමිකම් මෙහෙයුම් පිරිවැය සමඟ වාර්තා කළ හෝ නොකළ වසර තුළ ඇතිවන සියලුම හිමිකම්, සුන්බුන් අගය හා අනෙකුත් අයකිරීම් සඳහා අඩු කිරීමක් සහ පසුගිය වසරවල සිට හිඟව පවතින හිමිකම්වලට යම් ගැලපීම් ඇතුළත් වේ. හිඟව පවතින හිමිකම්, පුද්ගල හිමිකම් ගොනු සමාලෝචනය මඟින් සහ පියවමින් තිබෙන හිමිකම්වල අත්‍යන්ත පිරිවැය තුළ වෙනස් වීම් තක්සේරු කරගනිමින් තක්සේරු කරනු ලැබේ.

වැය කරන ලද නමුත් වාර්තා නොකළ හිමිකම් (IBNR) සහ වැය කරන ලද නමුත් ප්‍රමාණවත් තරම් වාර්තා නොකළ හිමිකම් (IBNFR) අදාළ ප්‍රතිපාදන, අතීත අත්දැකීම් සහ ප්‍රවනතා මත පදනම්ව අනාගත වගකීම් වඩාත් යථාර්ථවාදී ලෙස ඇස්තමේන්තු කිරීම තහවුරු කිරීම සඳහා ආයුගණකව අගයනු ලැබේ. ආයුගණක ඇගයීම් කාර්තුමය පදනමක් මත සිදුකරනු ලබයි.

හිමිකම් සඳහා ප්‍රතිපාදන වර්තමානයේ පවතින තොරතුරු මත පදනම් වී සාධාරණව දැක්විය යුතු බවට අධ්‍යක්ෂවරුන් සලකනු ලබන අතර පසුකාලීන තොරතුරු හා සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස අවසාන වගකීම් වෙනස්වනු ඇත. මෙය ලබා දෙන ප්‍රමාණයන් හි ගැලපීම්වලට හේතු වනු ඇත. එවැනි ප්‍රමාණයන් එකී කාලසීමාව සඳහා වන මූල්‍ය ප්‍රකාශවල පිළිබිඹු කරනු ලබයි.

හිමිකම් ඇස්තමේන්තු කිරීමට භාවිතා කළ ක්‍රමය සහ සකස් කළ ඇස්තමේන්තු නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලබයි.

3.4.2.2 ප්‍රතිරක්ෂණ හිමිකම්

අදාළ ගිවිසුම්වල නියමයන්ට අනුව අදාළ දළ රක්ෂණ හිමිකම් හඳුනාගන්නා අවස්ථාවේදී ප්‍රතිරක්ෂණ හිමිකම් හඳුනාගනු ලැබේ.

3.4.2.3 ශුද්ධ විලම්භිත අත්කර ගැනීමේ වියදම්

කොමිස් මුදල් නියෝජනය කරන අත්පත් කර ගැනීමේ වියදම් ව්‍යාපාරයේ නිෂ්පාදනය සමඟ වෙනස්වන අතර ව්‍යාපාරයේ නිෂ්පාදනවලට සෘජුවම අදාළ වේ.

ජීවිත නොවන රක්ෂණ ගිවිසුම්වලට අදාළ අත්පත් කරගැනීමේ වියදම් අදාළ ලිඛිත වාරික උපයා ගනු ලබන කාලය තුළදී විලම්භනය කර ක්‍රමක්ෂය කරනු ලබයි. ප්‍රතිරක්ෂණ කොමිස් මුදල් ද විලම්භිත අත්පත්කර ගැනීමේ පිරිවැය තුළ ඒ ආකාරයෙන්ම සලකනු ලැබේ.

3.4.2.4 ජීවිත රක්ෂණ අරමුදලේ ආයුගණනය ඇගයීම

ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ සිය වාර්ෂික පරීක්ෂණය අධ්‍යයනය කරමින් ස්වාධීන විශේෂඥ ආයුගණකගේ නිර්දේශය මත වසර අවසානයේදී සමූහය සඳහා දිගු කාලීන රක්ෂණ වෙන් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය එකඟ වී ඇත. ආයුගණක තක්සේරුව සියලුම වගකීම් සැලකිල්ලට ගනු ලැබ ඇති අතර වියදම් ස්වාධීන විශේෂඥ ආයුගණක විසින් අනුමත කළ උපකල්පන මත පදනම් වී ඇත.

3.4.2.5 වියදම්

වියදම් උපචිත පදනම මත හඳුනා ගනී. ව්‍යාපාරය පවත්වාගෙන යාමට සහ දේපළ, පිරියත හා උපකරණ නඩත්තු කිරීමට වැය කරනු ලබන සියලුම වියදම් ලාභ හෝ අලාභ ප්‍රකාශයට අයකරනු ලැබ ඇත.

3.4.3 සේවක ප්‍රතිලාභ

(අ) කෙටිකාලීන ප්‍රතිලාභ

අදාළ සේවාව සපයන බැවින්, කෙටි කාලීන සේවක ප්‍රතිලාභ වැය කරනු ලබයි. සේවකයා විසින් පූර්ව සේවා ලබාදීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම ප්‍රමාණය ගෙවීමට සමූහයට නීතිමය හෝ ගිවිසුම්ගත බැඳීමක් ඇත්නම්, සහ එම බැඳීම් සත්‍ය වශයෙන්ම ඇස්තමේන්තු කළ හැකිනම්, කෙටි කාලීන මුදල් ප්‍රසාද දීමනා හෝ ලාභ බෙදා ගැනීමේ සැලැස්මක් යටතේ ගෙවීමට අපේක්ෂා කරනු ලබන ප්‍රමාණයට වගකීමක් හඳුනාගනු ලබයි.

(ආ) නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලසුම යනු පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලසුමකි. මේ යටතේ යම් ආයතනයක් වෙනත් ආයතනයකට ස්ථාවර දායකත්ව ගෙවන අතර ඊට වැඩිපුර ප්‍රමාණයක් ගෙවීම සඳහා නීතිමය හෝ ගිවිසුම්ගත බැඳීමක් ඇති නොවේ. නිශ්චිත දායකත්ව සැලසුම්වලට දායකත්වයන් සඳහා වන බැඳීම්, සේවකයන් විසින් සේවා සපයන කාලසීමාවේ දී ලාභ හෝ අලාභ ප්‍රකාශයේ සේවක ප්‍රතිලාභ වියදම් ලෙස හඳුනා ගනු ලබයි.

- **සේවක අර්ථසාධක අරමුදල**
  ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්, ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් සහ ලිට්‍රෝ ටර්මිනල් ලංකා (පුද්) සමාගමේ සේවකයින් විසින් පිළිවෙළින් 15% සහ 10% ක් බැගින් එක් එක් සේවකයින්ගේ වැටුප මත අනුමත අර්ථසාධක අරමුදලට දායක වේ.

  සමූහයේ අනෙකුත් ආයතන සහ සමූහයේ අනෙකුත් සමූහ ආයතනවල සේවකයින් වෙනුවෙන් සෑම කෙනෙකුගේම වැටුපෙන් 12% ක් සහ 8% බැගින් අනුමත අර්ථසාධක අරමුදලට දායක වේ.

- **සේවා නියුක්තියන්ගේ භාර අරමුදල**
  සමූහය විසින් සෑම සේවකයකුගේම වැටුපෙන් 3% ක් සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට දායක වේ.

(ඇ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැලස්මක් යනු නිශ්චිත දායකත්ව සැලසුමක් නොවන පශ්චාත්-සේවා නියුක්ති ප්‍රතිලාභ සැලසුමකි.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනාගන්නා වගකීම්, වාර්තාකරණ දිනට නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගය වේ. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් ගණනය කිරීම සුදුසුකම්ලත් ආයුගණකවරයෙකු විසින් LKAS 19 - "සේවක ප්‍රතිලාභ" නිර්දේශ කර ඇති පරිදි ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය (PUC) භාවිතා කරමින් වාර්තාකරණ දිනට වාර්ෂිකව සිදුකරනු ලබයි. ආයුගණක ඇගයීම වට්ටම් අනුපාතය, වැටුප් වර්ධක අනුපාතය සහ සේවකයින්ගේ ඉතිරි සේවා කාලය පිලිබඳ කරනු ලබන උපකල්පන හා සම්බන්ධ වේ. සැලසුම්වල දිගු කාලීන ස්වභාවය හේතුවෙන් එවැනි තක්සේරු සැලකියුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ.

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ, වසර 5ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීම මත පමණක් සේවකයකුට මෙම වගකීම ඇති වේ. මෙම වගකීමට බාහිර අරමුදල් නොමැත.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වලට අදාළ ශුද්ධ පොලී වියදම සහ අනෙකුත් වියදම් ලාභය හෝ අලාභය තුළ හඳුනාගනු ලබයි. නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක පියවීම් සිදුවන අවස්ථාවේදී සමූහය යම් ලාභ හෝ අලාභ හඳුනාගනු ලබයි.

ආයුගණක ලැබීම් සහ අලාභවලින් සමන්විත ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ ප්‍රතිප්‍රමාණනය වෙනත් විස්තීර්ණ ආදායම තුළ වහාම හඳුනාගනු ලබයි.

3.4.4 ආදායම් බදු වියදම

ආදායම් බදු වියදම් ප්‍රවර්තන සහ විලම්බිත බදුවලින් සමන්විත වේ. ප්‍රවර්තන සහ විලම්හිත බදු ස්කන්ධය තුළ හෝ වෙනත් විස්තීර්ණ ආදායම තුළ සෘජුව හඳුනාගනු ලබන අයිතමවලට අදාළවන ප්‍රමාණයට හැර ලාභය හෝ අලාභය තුළ හඳුනාගනු ලබයි.

3.4.4.1 ආදායම් බදු

ආදායම් බදු සඳහා වෙන් කිරීම මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති පරිදි ආදායම් හා වියදම්වල අංගයන් මත පදනම් වන අතර 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ සහ එයට පසුකාලීනව සිදුකළ සංශෝධන ප්‍රකාරව ගණනය කරනු ලැබේ.

ප්‍රවර්තන ආදායම් බද්ද යනු වර්ෂය සඳහා බදු ගෙවිය යුතු ආදායම හෝ අලාභය මත ගෙවිය යුතු හෝ ලැබිය යුතු අපේක්ෂිත බද්ද සහ පෙර වසරවලට අදාළව ගෙවිය යුතු හෝ ලැබිය යුතු බදු සඳහා යම් ගැලපීම් වේ. වාර්තා කරන දිනයේ පනවන ලද බදු අනුපාත භාවිතා කරමින් එය මනිනු ලබයි.

අදාළ බදු රෙගුලාසි අර්ථ නිරූපණයට යටත් වන අවස්ථා සම්බන්ධයෙන් බදු වාර්තාවල ගනු ලබන ස්ථාන කළමනාකරණය වරින් වර ඇගයීමට ලක් කරන අතර සුදුසු අවස්ථාවලදී විධි විධාන ස්ථාපිත කරයි.

3.4.4.2 විලම්බිත බදු

මූල්‍ය වාර්තාකරණ අරමුණ සහ බදු අරමුණ සඳහා භාවිතාකළ ප්‍රමාණ සඳහා වත්කම් සහ වගකීම්වල ධාරණ අගය අතර තාවකාලික වෙනස්වීම් සම්බන්ධයෙන් විලම්හිත බදු හඳුනාගනු ලබයි.

විලම්හිත බදු වත්කම් සහ වගකීම්, සියලුම තාවකාලික වෙනස්වීම්, ඉදිරියට ගෙනා භාවිතා නොකළ බදු බැර, භාවිතා නොකළ බදු අලාභ සඳහා අනාගත බදු අය කළ හැකි ලාභ ඒවා භාවිතා කිරීමට ලබාගත හැකි ප්‍රමාණයට හඳුනා ගනී.

විලම්හිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනකදීම සමාලෝචනය කරනු ලබන අතර අදාළ බදු ප්‍රතිලාභ තවදුරටත් උපලබ්ධි කිරීම කළ නොහැකි ප්‍රමාණයට අඩුකරනු ලැබේ. එම අඩුකිරීම් අනාගත බදු අය කළ හැකි ලාභ ලැබීමේ සම්භාවිතාව වර්ධනය වන විට ප්‍රතිවර්තනය කරනු ලැබේ.

විලම්හිත බදු, වාර්තාකරණ දිනයට පනවනු ලැබ ඇති සහ නිත්‍ය වශයෙන් පනවනු ලැබ ඇති බදු අනුපාත භාවිතා කරමින් තාවකාලික වෙනස්වීම් ප්‍රතිවර්තනය කරන විට ඒවාට අදාළ කරගැනීමට අපේක්ෂිත බදු අනුපාතවලට මනිනු ලැබේ.

හඳුනා නොගත් විලම්හිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනයකම නැවත තක්සේරු කරනු ලබන අතර ඒවා භාවිතයට ගත හැකි ප්‍රමාණයට අනුව අනාගත බදු අය කළ හැකි ලාභ ලබාගැනීමට හැකිවන ප්‍රමාණයට හඳුනා ගනු ලබයි.

විලම්හිත බදු වත්කම් සහ විලම්හිත බදු වගකීම්, ප්‍රවර්තන බදු වගකීම්වලට අනුව ප්‍රවර්තන බදු වත්කම් හිලව් කිරීමට නීත්‍යානුකූලව බලාත්මක අයිතිවාසිකමක් පවතින සහ විලම්හිත බදු එම බදුකළ හැකි ආයතනයට සහ එකම බදුකරණ අධිකාරියකට අදාළ වන විට හිලව් කරනු ලැබේ.

3.4.4.3 බෝග රක්ෂණ අයබදු (CIL)

2013 අංක 12 දරන මූල්‍ය පනතේ 14 වන වගන්තියේ විධිවිධාන යටතේ බෝග රක්ෂණ අයබදු හඳුන්වනු ලැබ ඇති අතර 2013 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වේ. එය ජාතික රක්ෂණ භාර අරමුදලට ගෙවිය යුතු අතර 1% ක බදු පසු ලාභයකට බැඳී සිටී.

3.5 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

3.5.1 දේපළ, පිරියත හා උපකරණ (PPE)

3.5.1.1 මූලික හඳුනා ගැනීම සහ මැනීම

දේපළ, පිරියත හා උපකරණ අයිතම, සමුච්චිත ක්ෂය කිරීම සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පිරිවැයට මනිනු ලබයි. දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය යනු එම වත්කම ඉන් අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකරවීමේ තත්ත්වයට පත්කිරීම දක්වා දරන ලද යම් වියදම් ද සමඟ එම වත්කම් අත්පත්කර ගැනීමට හෝ ඉදිකිරීමට දරන ලද පිරිවැයයි.

වත්කම අත්පත්කර ගැනීමේ දී සෘජුවම ආරෝපිත වන වියදම පිරිවැයට ඇතුළත්ය. ස්වයං ඉදිකිරීම් වත්කම්වල පිරිවැයට පහත සඳහන් පිරිවැයද ඇතුළත් වේ:

- අමුද්‍රව්‍ය හා සෘජු කම්කරු පිරිවැය
- වත්කම ඉන් අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකරවීමේ තත්ත්වයට පත්කිරීම දක්වා සෘජුවම දරන ලද යම් වෙනත් පිරිවැය
- වත්කම ඉවත් කිරීමට හෝ වැඩ බිම ප්‍රතිස්ථාපනය සඳහා සමූහයට බැඳීමක් ඇති අවස්ථාවක දී එම අයිතම කඩා ඉවත් කිරීමේ සහ ඒවා ස්ථාපනය කර තිබූ භූමිය ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය

බැහැරකිරීම මත කිසියම් ලැබීමක් හෝ අලාභයක් ලාභය හෝ අලාභය තුළ වෙනත් මෙහෙයුම් ආදායමෙහි හඳුනා ගනු ලබයි.

3.5.1.2 පසුකාලීන වියදම සහ ප්‍රතිෂ්ඨාපනය

දේපළ, පිරියත හා උපකරණ අයිතමවල යම් කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය, එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ලැබීමේ සම්භාවිතාවක් ඇත්නම් සහ එහි පිරිවැය විශ්වාසී ලෙස මැනිය හැකි නම් ධාරණ අගය තුළ හඳුනා ගනියි. ප්‍රතිෂ්ඨාපිත කොටසේ ධාරණ අගය හඳුනා නොගනී. දේපළ, පිරියත හා උපකරණවල එදිනෙදා සේවා කිරීමේ පිරිවැය දරා ඇති බවට ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.

3.5.1.3 දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය

සාධාරණ අගය විශ්වාස ලෙස මැනියහැකි වත්කමක්, ඉඩම් හා ගොඩනැගිලි හඳුනා ගැනීමෙන් පසුව පසුකාලීන යම් සමුච්චිත ක්ෂය කිරීම් සහ පසුකාලීන යම් සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ ප්‍රත්‍යාගණන දිනයට ප්‍රත්‍යාගණන වටිනාකමට ගෙන ගොස් ඇත. ප්‍රත්‍යාගණන වත්කමක සාධාරණ අගය වාර්තාකරණ දිනයට එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මකව වෙනස් නොවන බව තහවුරුකිරීම සඳහා තක්සේරු කිරීම් සිදු කරනු ලබයි.

ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීම් වෘත්තීමය වශයෙන් සුදුසුකම් ලත් තක්සේරුකරුවන් විසින් අවම වශයෙන් වසර තුනකදී සිදු කරනු ලබන අතර සාධාරණ අගයේ වෙනස්වීම් හේතුවෙන් ඇති වන්නා වූ ලාභ හෝ අලාභ ඒවා ඇති වන වසරේ අනෙකුත් විස්තීරණ ආදායම් තුළ ඇතුලත් කෙරේ.

ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් වශයෙන් ධාරණ අගයේ යම් වැඩිවීමක්, අනෙකුත් විස්තීර්ණ ආදායම තුළ හඳුනාගනු ලබන අතර ප්‍රත්‍යාගණන සංචිතයේ ශීර්ෂය යටතේ ස්කන්ධය තුළ සමුච්චිත කෙරේ. කෙසේ වුවද, එම වැඩිවීම ලාභ හා අලාභය තුළ කලින් හඳුනාගත් එම වත්කමේම ප්‍රත්‍යාගණන අඩුකිරීමක් ආපසු හරවන ප්‍රමාණයට ලාභය හෝ අලාභය තුළ හඳුනාගනී.

ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් වශයෙන් වන ධාරණ අගයේ අඩුවීමක් ලාභය හෝ අලාභය තුළ හඳුනාගනී. කෙසේ වුවද, එම අඩුවීම එම වත්කමට අදාලව ප්‍රත්‍යාගණන අතිරික්තය තුළ පවතින කිසියම් බැර ශේෂයක ප්‍රමාණයට වෙනත් විස්තීර්ණ අදායම තුළ හඳුනා ගනී.

ඊට අමතරව, ප්‍රත්‍යාගණන දිනට සමුච්චිත ක්ෂයවීම වත්කමේ දළ ධාරණ අගයට අනුව ඉවත් කරනු ලබන අතර ශුද්ධ අගය වත්කමේ ප්‍රත්‍යාගණන අගයට නැවත සඳහන් කරනු ලබයි. බැහැරලීම මත, විකුණනු ලබන කිසියම් විශේෂිත වත්කමකට අදාළ කවර හෝ ප්‍රත්‍යාගණන සංචිතයක් සෘජුවම රඳවාගත් ඉපැයීම්වලට මාරු කරනු ලබයි.

3.5.1.4 ක්ෂය කිරීම

දේපළ, පිරියත සහ උපකරණවල තක්සේරු කරන ලද ඵලදායී ජීව කාලය පුරා සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින් තක්සේරු කළ සුන්බුන් වටිනාකම අඩු කළ දේපළ, පිරියත සහ උපකරණ අයිතමවල පිරිවැය කපා හැරීම සඳහා ක්ෂයවීම් ගණනය කරනු ලබන අතර එය සාමාන්‍යයෙන් ලාභය හෝ අලාභය තුළ හඳුනාගනු ලබයි. මෙයින් වත්කමක අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව ඉතා හොඳින් පෙන්නුම් කරයි.

වර්තමාන සහ සංසන්දනාත්මක කාල සීමාව සඳහා තක්සේරු කරන ලද ඵලදායී ජීව කාලය පහත දැක්වේ:

වත්කමේ විස්තරය	කාලසීමාව
ගොඩනැගිලි	වසර 20-40
ලීබඩු හා සවිකිරීම්	වසර 5-10
කාර්යාල සහ අනෙකුත් උපකරණ	වසර 5-10
විදුලි ජනක යන්ත්‍ර සහ වායු සමීකරණ පිරියත	වසර 5-10
මෝටර් රථ	වසර 4-5
වැද්දුම සහ සවිකිරීම්	වසර 6 2/3
පිරියත සහ යන්ත්‍ර	වසර 20
පරිගණක හා පරිගණක උපාංග	වසර 4-7
එල්පී ගෑස් ගබඩා ටැංකි, නළ මාර්ග හා සවිකිරීම්	වසර 25
එල්පී ගෑස් සිලින්ඩර්	වසර 10
අනෙකුත් ස්ථිර වත්කම්	වසර 3-12

ක්ෂයවීම් ක්‍රම, ඵලදායී ජීව කාල සහ සුන්බුන් අගයන් සෑම වාර්තාකරණ දිනයකදී සමාලෝචනය කරනු ලබන අතර උචිත අවස්ථාවලදී ගැළපීම කරනු ලබයි.

3.5.1.5 හඳුනා නොගැනීම

බැහැර කිරීම්, මත හෝ එහි භාවිතයෙන් හෝ බැහැරලීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කර නොමැති විට දේපළ, පිරියත සහ උපකරණවල අයිතමයක ධාරණ අගය හඳුනාගනු නොලබයි. දේපළ, පිරියත සහ උපකරණයක යම් අයිතමයක් හඳුනා නොගැනීමෙන් ඇතිවන ලැබීම් හෝ අලාභය අයිතමය හඳුනා නොගන්නා අවස්ථායේදී ලාභයට හෝ අලාභයට ඇතුළත් කරනු ලබයි.

3.5.1.6 හානිකරණය

පවත්නා සාර්ව-ආර්ථික සාධකවල බලපෑම සළකා බලමින්, 2025 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණවල ඇතිවිය හැකි හානිකරණය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කර ඇත. එම තක්සේරුව පදනම් කරගෙන, දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් වාර්තාකරණ දිනයට මූල්‍ය ප්‍රකාශවලට කිසිදු හානිකරණ වෙන් කිරීමක් සිදු කිරීමට අවශ්‍යතාවක් නොමැත.

3.5.1.7 කාරක ප්‍රාග්ධනය

කාරක ප්‍රාග්ධනය පිරිවැයට සඳහන් කරනු ලබයි. මෙම වියදම් ප්‍රාග්ධනකරණය අපේක්ෂාවෙන් ගොඩනැගිලි ඉදිකිරීමේදී, සෘජුවම දරන ලද ප්‍රාග්ධනයක ස්වභාවයේ වියදම් වේ.

3.5.2 අස්පෘශ්‍ය වත්කම්

වත්කමට ආරෝපිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ගලා ඒනම් සහ පිරිවැය විශ්වාසදායකව මැනීමට හැකිනම් අස්පෘශ්‍ය වත්කමක් හඳුනා ගනී.

3.5.2.1 කීර්තිනාමය

පරිපාලිත සමාගම් අත්කර ගැනීම මත ඇතිවන කීර්තිනාමය සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පිරිවැයට මනිනු ලබයි.

කීර්තිනාමය හානිකරණය

ව්‍යාපාර සංයෝජනයකින් අත්කර ගන්නා කීර්තිනාමය ධාරණ අගය හානිවියහැකි බව හැඟවෙන වාතාවරණයකදී හානිකරණය සඳහා වාර්ෂික පරීක්ෂාවන් කරනු ලබයි. කීර්තිනාමයට අදාළ වන සෑම මුදල් උපයන ඒකකයකම අයකළහැකි අගය තක්සේරු කිරීම මඟින් කීර්තිනාමය සඳහා හානිකරණය නිශ්චය කරනු ලැබේ. මුදල් උපයන ඒකකයේ අයකළහැකි අගය එහි ධාරණ අගයට වඩා අඩුවන විට හානිකරණ අලාභයක් ලාභය හෝ අලාභය තුළ හඳනා ගනු ලබයි. කීර්තිනාමය මත හානිකරණ අලාභය ප්‍රතිවර්තනය කරනු නොලැබේ.

3.5.2.2 මෘදුකාංගය

සමූහය විසින් අත්කර ගනු ලබන සහ සීමිත ඵලදායී ජීවිත කාලයක් ඇති අනෙකුත් අස්පෘශ්‍ය වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ යම් සමුච්චිත හානිකරණ අලාභය අඩුකළ පිරිවැයට මනිනු ලබයි. සීමිත ඵලදායී ජීවිත කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම්, එම වත්කම් හානිකරණයට ලක්විය හැකි බවට හැඟවීමක් ඇති අවස්ථාවක දී හානිකරණය සඳහා තක්සේරු කරනු ලබයි. අවිනිශ්චිත ඵලදායී ජීව කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් තනි තනිව හෝ මුදල් උපයන ඒකක මට්ටමින් හානිකරණය සඳහා වාර්ෂිකව පරීක්ෂා කරනු ලබයි.

සමූහයට වාර්තාකරණ දිනයට අනෙකුත් අස්පෘශ්‍ය වත්කම් ලෙස වෙනම අත්කරගත් මෘදුකාංග ඇත.

පසුකාලීන වියදම්

මෘදුකාංග මත පසුකාලීන වියදම් ඊට අදාළ විශේෂිත වත්කමක අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ එම මෘදුකාංගය මඟින් වර්ධනය කරනු ලබන විට පමණක් ප්‍රාග්ධනනියකරණය කරනු ලබයි. අනෙකුත් සියලුම වියදම් එම වියදම් දරා ඇති පරිදි ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.

ක්‍රමක්ෂය

තක්සේරු කළ ඵලදායී ජීව කාලය පුරා සරල මාර්ගික ක්‍රමය භාවිතා කරමින් ඒවායෙහි තක්සේරු කළ සුන්බුන් වටිනාකමට අඩුකළ අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය කපාහැරීම සඳහා ක්‍රමක්ෂය ගණනය කරනු ලබන අතර ඒවා ලාභය හෝ අලාභය තුළ හඳුනාගනු ලබයි. මෘදුකාංගවල තක්සේරු කළ ඵලදායී ජීව කාලය වසර පහකි.

ක්‍රමක්ෂය ක්‍රම, ඵලදායී ජීව කාල සහ සුන්බුන් වටිනාකම් සෑම වාර්තාකරණ දිනයකටම සමාලෝචනය කරනු ලබන අතර උචිත අවස්ථාවලදී ගැළපීම කරනු ලබයි.

හඳුනා නොගැනීම

බැහැරකිරීම මත හෝ භාවිතයෙන් හෝ බැහැරකිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කර නොමැති විට අස්පෘශ්‍ය වත්කමක් හඳුනා නොගනියි. එම අස්පෘශ්‍ය වත්කම් හඳුනා නොගැනීමෙන් ඇතිවන ලැබීම හෝ අලාභය, එම අයිතමය හඳුනා නොගන්නා අවස්ථාවේදී ලාභයට හෝ අලාභයට ඇතුලත් කරනු ලැබේ.

සමූහය විසින් 2025 දෙසැම්බර් 31 වන දිනට ආර්ථික අර්බුදයෙන් ඇති වූ බලපෑම ඇතුළුව අස්පෘශ්‍ය වත්කම්වලට වියහැකි හානිකරණ දර්ශක තක්සේරු කොට ඇත. එම ඇගයීම මත පදනම්ව, කිසිදු හානිකරණ දර්ශකයක් හඳුනා නොගන්නා ලදී.

3.5.3 භාවිතයට අයිතිය ඇති වත්කම

SLFRS 16 පරිදි, ගිවිසුමක් ආරම්භ කරන අවස්ථාවේ, සමූහය විසින් යම් ගිවිසුමක් කල්බද්දක්ද හෝ කල්බද්දක් අන්තර්ගතව පවතියිද යන්න තක්සේරු කරයි. ගිවිසුම තුළ ප්‍රතිෂ්ඨාව වෙනුවෙන් යම් කාල සීමාවකට හඳුනාගත් වත්කමේ භාවිතය පිළිබඳ පාලනය ඇතුළත්නම් යම් ගිවිසුමක් කල්බද්දකි නැතිනම් කල්බද්දක් අන්තර්ගතව පවතියි. යම් ගිවිසුමක හඳුනාගත් වත්කමක පාලනය කිරීමට අයිතිය ඇතුළත්ද යන්න තක්සේරු කිරීමට, සමූහය විසින්:

- ගිවිසුම හඳුනාගත් වත්කමක් භාවිතය හා සම්බන්ධව ද යන්න
- සමාගමට එම වත්කම භාවිතා කරන මුළු කාල සීමාව පුරාවටම එහි සියලූ ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමට අයිතිය තිබේ ද යන්න සහ
- සමාගමට එම වත්කම භාවිතය හැසිරවීමට අයිතිය තිබේ ද යන්න සලකා බලයි.

සමූහය විසින් භාවිතයට අයිතිය ඇති වත්කමක් හා කල්බදු වගකීමක් කල්බද්ද ආරම්භ වන දිනයේදී හඳුනා ගනී. සමූහයේ භාවිතයට අයිතිය ඇති වත්කම් LKAS 17 යටතේ මෙහෙයුම් කල්බදු ලෙස මෙයට පෙර හඳුනාගත් කුලිය මත ගන්නා ලද ශාඛා පරිශ්‍රවලින් සමන්විත වේ.

මූලික අගය කිරීම

සමූහය විසින් භාවිතයට අයිතිය ඇති වත්කමක් සහ කල්බදු වගකීමක් කල්බදු ආරම්භ වන දිනයේ හඳුනා ගනී. භාවිතයට අයිතිය ඇති වත්කම් මූලිකව පිරිවැයට හඳුනා ගන්නා අතර එයට ආරම්භක දිනයට හෝ පෙර යම් කල්බදු ගෙවීම් සඳහා ගලපන ලද කල්බදු වගකීමේ මුල් මුදල් ප්‍රමාණය සමඟ දරන ලද යම් මූලික සෘජු පිරිවැය සහ ඊට පාදක වූ වත්කම කොටස් කිරීමට සහ හෝ එය පිහිටි වැඩ භූමියෙන් ඉවත් කිරීමට හෝ පාදක වූ වත්කම ප්‍රතිෂ්ඨාපනය කිරීමට වූ වියදම් ඇස්තමේන්තුවකින් සමන්විත වේ.

කල්බදු වගකීම කල්බද්දට ඇතුලත් පොලී අනුපාත භාවිතා කරමින් හෝ එම අනුපාතය පහසුවෙන් නියම කළ නොහැකිනම්, සමූහයේ වර්ධනීය ණය ගැනීමේ අනුපාතය භාවිතා කරමින් වට්ටම් කළ කල්බද්ද ආරම්භ වූ දිනයේ නොගෙවූ කල්බදු ගෙවීම්වල වර්තමාන අගයට මූලිකව මනිනු ලබයි. පොදුවේ සමූහය එහි වර්ධනීය ණය ගැනීමේ අනුපාතය වට්ටම් අනුපාතය ලෙස භාවිතා කරයි.

පරිපාලිත සමාගමකට සමාගම විසින් කුලියට ලබාදුන් දේපළක ප්‍රතිඵලයක් ලෙස සමාගමේ පරිපාලිත සමාගමකට භාවිතයට අයිතිය ඇති වත්කම් හා කල්බදු වගකීමක් ඇති අවස්ථාවක, එකී භාවිතයට අයිතිය ඇති වත්කම හා කල්බදු වගකීම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවලින් ඉවත් කෙරේ.

පසුකාලීන ගණනය කිරීම

භාවිතයට අයිතිය ඇති වත්කම පසුව කල් බද්ද ආරම්භ වූ දිනයේ සිට භාවිතයට අයිතිය ඇති වත්කමේ ඵලදායී ජීව කාල අවසානය හෝ කල් බදු කාල සීමාවේ අවසානය යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා සරල මාර්ගික ක්‍රමය යොදා ගෙන ක්ෂය කෙරේ. භාවිතයට අයිතිය ඇති වත්කමේ ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය එම දේපළ සහ උපකරණ ගණනය කරන ආකාරයෙන්ම තීරණය කරනු ලැබේ. ඊට අමතරව, භාවිතයට අයිතිය ඇති වත්කම කලින් කලට හානිකරණ අලාභ ඇත්නම් ඒ මගින් අඩු කෙරෙන අතර, කල්බදු වගකීමේ සමහර නැවත මැනීම් සඳහා ගැලපීම් සිදු කෙරේ.

කල්බදු වගකීම සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ. එය අනාගත කල්බදු ගෙවීම්වල දර්ශකයක් හෝ අනුපාතයක වෙනසක් හේතුවෙන් ඇතිවන වෙනස්කමක් හෝ, තක්සේරු කරන ලද සුන්බුන් වටිනාකම් යටතේ ගෙවිය යුතු මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් සමූහයේ ඇස්තමේන්තු කිරීම වෙනස් වීම හේතුවෙන් හෝ, සමූහය මිලදී ගැනීමක්, දීර්ඝ කිරීමක් හෝ අවසන් කිරීමක් සම්බන්ධයෙන් එහි ඇගයීමක් වෙනස් කළහොත් නැවතත් ගණනය කෙරේ.

භාවිතයට අයිතිය ඇති වත්කම් හානිකරණය

වාර්තාකරණ දිනයට, රජයේ විධානයන් පිළිපදිමින් සහ ඒවාට සහය වෙමින් එක් එක් ව්‍යාපාර ඒකකය විසින් හැකිතාක් දුරට සමාගමේ අවදානම් කළමනාකරණ උපායමාර්ග අනුව ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් යටතේ ක්‍රියාත්මක වන බැවින් ආර්ථික අර්බුදය හේතුවෙන් භාවිතයට අයිතිය ඇති වත්කම සම්බන්ධයෙන් කිසිදු හානිකරණ අලාභයක් සමූහය විසින් හඳුනා ගෙන නොමැත.

3.5.4 ආයෝජන දේපළ

ආයෝජන දේපළක් යනු කුලී ආදායමක් ලැබීමට හෝ ප්‍රාග්ධන අගය වැඩිවීම සඳහා හෝ ඒ දෙක සඳහාම හෝ හිමිකරගත් දේපළකි. ආයෝජන දේපළ මූලික වශයෙන් පිරිවැයට අගය කරන අතර පසුව ලාභය හෝ අලාභය තුළ හඳුනා ගන්නා යම් වෙනස්වීමක් සමඟ වාර්ෂික පදනම මත සාධාරණ අගයට අගයනු ලබයි.

ආයෝජන දේපළ, ඒවායින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකිරීම හේතුවෙන් බැහැර කරනු ලැබ හෝ ස්ථිරවම භාවිතයෙන් ඉවත් කර ඇතිවිට හඳුනා නොගනී. ආයෝජන දේපළ බැහැර කිරීම මත යම් ලැබීමක් හෝ අලාභයක් (බැහැරකිරීමෙන් ලද ශුද්ධ මුදල සහ අයිතමයේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කරන ලද) ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී. මෙයට පෙර දේපළ, පිරියත සහ උපකරණ ලෙස වර්ගීකරණ කරන ලද ආයෝජන දේපළක් විකුණන ලබන විට, ප්‍රත්‍යාගණන සංචිතය තුළ ඇතුළත් යම් අදාළ ප්‍රමාණය රඳවාගත් ඉපයීම්වලට මාරු කරනු ලබයි.

භාවිතයේ වෙනසක් ඇතිවිට ආයෝජන දේපළවල මාරුකිරීම් සිදු කරනු ලබයි. පරිපාලිත සමාගමක ආයෝජන දේපළවලින් සැළකිය යුතු කොටස් සමූහයේ යම් සමාගම විසින් බුක්ති විඳිනු ලබන විට, එකී ආයෝජන දේපළ දේපළ, පිරියත සහ උපකරණ ලෙස ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සලකන අතර, ශ්‍රී.ලං.ගි.ප්‍ර 16 – "දේපළ, පිරියත හා උපකරණ" (LKAS 16) පරිදි ගණනය කෙරේ.

3.5.5 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම වාර්තා කරන දිනයකදීම සමූහය විසින් එහි මූල්‍ය නොවන වත්කම්වල ධාරණ අගය (ආයෝජන දේපළ, භාණ්ඩ තොග සහ විලම්භිත බදු වත්කම් හැර) එම වත්කම්වලට යම්කිසි හානිකරණය පිළිබඳ යම් හැඟවීමක් තිබේද යන්න නිශ්චය කර ගැනීම සඳහා සමාලෝචනය කරනු ලබයි. එවැනි යම් හැඟවීමක් ඇත්නම්, එම වත්කමේ අයකර ගත හැකි අගය තක්සේරු කරනු ලබයි. කීර්තිනාමය හානිකරණය සඳහා වාර්ෂිකව පරීක්ෂා කරනු ලබයි.

යම් වත්කමක හෝ මුදල් උපයන ඒකකයක (CGU) අයකර ගත හැකි ප්‍රමාණය යනු එහි භාවිත අගය සහ එහි විකුණුම් පිරිවැය අඩුකළ සාධාරණ අගය යන දෙකෙන් ඉහළ අගය වේ. භාවිත අගය තක්සේරු කිරීමේදී, මුදලේ කාලීන අගයේ සහ වත්කමට හෝ මුදල් උපයන ඒකකයට ඇති නිශ්චිත අවදානම්වල ප්‍රවර්තන වෙළෙඳපළ තක්සේරු කිරීම් පෙන්නුම් කරන පූර්ව බදු වට්ටම් අනුපාතයක් භාවිතා කරමින් තක්සේරු කළ අනාගත මුදල් ප්‍රවාහ ඒවායෙහි වර්තමාන අගයට වට්ටම් කරනු ලබයි.

වත්කමක හෝ මුදල් උපයන ඒකකයක (CGU) ධාරණ අගය එහි අයකරගත හැකි අගය ඉක්මවන්නේනම් හානිකරණ අලාභයක් හඳුනා ගනු ලබයි. හානිකරණ අලාභ ලාභය හෝ අලාභය තුළ හඳුනාගනී. මුලින්ම මුදල් උපයන ඒකකයට (CGU) වෙන්කළ ඇති කවර හෝ කීර්තිනාමයක ධාරණ අගය අඩු කිරීමටත් සහ ඉන්පසුව සමානුපාතික පදනමක් මත මුදල් උපයන ඒකකය (CGU) අනෙකුත් වත්කම්වල ධාරණ අගය අඩු කිරීමටත් වෙන් කෙරේ.

කීර්තිනාමය සම්බන්ධ හානිකරණ අලාභයක් ප්‍රතිවර්තනය නොකෙරේ. අනෙකුත් වත්කම් සඳහා, හානිකරණ අලාභයක් ප්‍රතිවර්තනය කරනු ලබන්නේ, වත්කමේ ධාරණ අගය වත්කම්වල හානිකරණ අලාභයක් හඳුනාගෙන නොතිබුනේ නම් ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය අඩුකරමින් නිශ්චය කරනු ලැබ තිබෙන ධාරණ අගය ඉක්මවා යන ප්‍රමාණය දක්වා පමණි.

3.5.6 භාණ්ඩ තොග

භාණ්ඩ තොගවලට අඩු පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි කළ හැකි අගය යටතේ දක්වනු ලබන පාරිභෝජන භාණ්ඩ ඇතුළත් වේ.

සමූහය සතු භාණ්ඩ තොගවල ස්වභාවය පරීක්ෂා කිරීමෙන් අනතුරුව, ආර්ථික අර්බුදයෙන් ඇති වූ ගම්‍යාර්ථ හේතුවෙන් භාණ්ඩ තොගවල ශුද්ධ උපලබ්ධි කළ හැකි අගයට කිසියම් බලපෑමක් සිදුවී තිබේද යන්න සමූහය තක්සේරු කර ඇති අතර, භාණ්ඩ තොගවල ධාරණ අගයට ගැලපීමක් සිදු කිරීමට අවශ්‍යද යන්න සමූහය විසින් ඇස්තමේන්තු කර ඇත. භාණ්ඩ තොගවල ධාරණ අගය අඩු කිරීමට ගැලපීම් අවශ්‍ය වන්නා වූ කිසිදු අවස්ථාවක් සමූහය විසින් හඳුනා ගෙන නොමැත.

3.5.7 මූල්‍ය උපකරණ – LKAS 39

සමූහය සිය කටයුතු ප්‍රධාන වශයෙන්ම රක්ෂණය හා සම්බන්ධ වන බැවින්, SLFRS 4 රක්ෂණ ගිවිසුම් විසින් අවසර දී ඇති පරිදි SLFRS 9 න් තාවකාලික නිදහස්වීම යොදා ගැනීමට තෝරා ගෙන ඇත. ඉන්පසුව, 2026 ජනවාරි 01 දිනට අපේක්ෂිත SLFRS 17 රක්ෂණ ගිවිසුම් හි බලාත්මක දිනය දක්වා සිය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල LKAS 39 මූල්‍ය උපකරණ: හඳුනා ගැනීම සහ මැනීම සමූහය තවුරටත් යොදා ගනී.

කෙසේවෙතත්, සමාගම තනි ආයතනයක් ලෙස, එහි වෙනම මූල්‍ය ප්‍රකාශන සඳහා SLFRS 9 යොදා ගෙන ඇත.

සමූහය විසින් ව්‍යුත්පන්න නොකළ වත්කම්, පහත සඳහන් පරිදි වර්ගීකරණය කරනු ලබයි. එනම් විකිණීමට ඇති මූල්‍ය වත්කම්, ණය සහ ලැබීම්. කල්පිරීම දක්වා තබා ඇති මූල්‍ය වත්කම් හා ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයේ දී මූල්‍ය වත්කම්ය.

සමාගම ව්‍යුත්පන්න නොකළ මූල්‍ය වගකීම්, අනෙකුත් මූල්‍ය වගකීම් කාණ්ඩ ලෙසින් වර්ගීකරණය කරයි.

3.5.7.1 ව්‍යුත්පන්න නොවන මූල්‍ය උපකරණ

සමූහය විසින් ණය හා ලැබීම් සහ උත්පාදනය වන ආරම්භක දිනයේ දී නිකුත්කළ ණය සුරුකුම් පත් මූලිකව හඳුනා ගනු ලබයි. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් (ලාභය හෝ අලාභය අතුරින් සාධාරණ අගයේදී නම් කරන ලද වත්කම් ඇතුළුව) එම උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශවයක් බවට සමූහය පත්වන වෙළෙඳ දිනයේ දී මූලිකව හඳුනා ගනී.

මූල්‍ය වත්කමක්, මූලිකවම එහි සාධාරණ අගයට මනින අතර, ලාභ හෝ අලාභය තුළින් සාධාරණ අගයක් නොමැති වත්කමක් සඳහා, එය අත්කර ගැනීමේදී හෝ නිකුත් කිරීමේදී සෘජුව ම ආරෝපණය වන ගනුදෙනු පිරිවැය ද එකතුව අගයනු ලබයි.

මූල්‍ය වත්කමක් එයින් ලැබෙන මුදල් ප්‍රවාහවලට ඇති ගිවිසුම්ගත අයිතියක් අවසන්වන විට හෝ මූල්‍ය වත්කමේ හිමිකාරිත්වයේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සත්‍ය වශයෙන් ම මාරු කරනු ලබන ගනුදෙනුවක මූල්‍ය වත්කම් මත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලබා ගැනීමට ඇති අයිතිය මාරු කරන විට සමූහය විසින් එය හඳුනා නොගනී. සමූහය විසින් නිර්මාණය කළ හෝ රඳවාගනු ලබන මාරුකළ මූල්‍ය වත්කමක යම් පොළිය වෙනම වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනා ගනී.

වටිනාකම හිලව් කිරීමට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම උපලබ්ධි කිරීමට අපේක්ෂා කරන්නේනම් සහ ඊට සමගාමීව වගකීම පියවීමට නීත්‍යානුකූලව බලාත්මක අයිතියක් සමූහයට පවතින්නේ නම් පමණක් මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කර ශුද්ධ ප්‍රමාණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ඉදිරිපත් කරනු ලබයි.

පසුකාලීන අගය කිරීම

(අ) විකිණීමට ඇති මූල්‍ය වත්කම් (AFS)

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන යනු වෙළෙඳාම සඳහා රඳවා ගෙන ඇති ලෙස වර්ගීකරණය නොකරන ලද හා ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයක් නියම කර නොමැති ආයෝජන වේ.

සාධාරණ අගයට මූලික අගැයීමෙන් පසු, විකිණීමට ඇති මූල්‍ය ආයෝජන පසුව සාධාරණ අගයේදී මනිනු ලබන අතර එහි වෙනස්වීම්, අනෙකුත් විස්තීර්ණ ආදායම් වලදී හඳුනාගෙන, විකිණීමට ඇති සංචිතයට සමුච්චිත කරනු ලබයි. මෙම වත්කම් හඳුනා නොගන්නා විට ස්කන්ධය තුළ සමුච්චිත වන ලාභය හෝ අලාභය ලාභය හෝ අලාභයට නැවත වර්ගීකරණය කරනු ලබයි.

විකිණීමට ඇති මූල්‍ය වත්කම් ආසන්න කාලයේදී අලෙවි කිරීමේ හැකියාව සහ අභිලාශය තවමත් උචිතද යන්න නිශ්චය කර ගැනීමට සමූහය විසින් එහි විකිණීමට ඇති මූල්‍ය වත්කම් ඇගයීම සිදු කරනු ලබයි. අක්‍රිය වෙළෙඳපොළ හේතුවෙන් මෙම මූල්‍ය වත්කම් විකිණීමට සමාගමට නොහැකි වන අවස්ථාවලදී සහ දැකිය හැකි අනාගතයේදී එසේ කිරීමට කළමනාකරණයේ අභිප්‍රාය වෙනස්වන අවස්ථාවක, මෙම මූල්‍ය වත්කම් දුර්ලබ වාතාවරණයන් හී නැවත වර්ගීකරණය කිරීමට සමාගම තෝරා ගනු ඇත. මූල්‍ය වත්කම් ණය සහ ලැබීම් යන නිර්වචනය සපුරාලන විට සහ මෙම වත්කම් දැකියහැකි අනාගතය සඳහා හෝ කල්පිරෙනතුරු රඳවා ගැනීමේ අභිලාෂයක් සහ හැකියාවක් කළමනාකරණයට ඇති විට ණය සහ ලැබීම් නැවත වර්ගීකණයට ඉඩ ලබා දේ. මූල්‍ය වත්කම කල් පිරෙනතුරු රඳවා ගැනීමේ හැකියාව සහ අභිලාෂය ආයතනයට ඇති විට පමණක් කල්පිරෙන තුරු රඳවාගත් ලෙස නැවත වර්ගීකරණය කිරීමට අවසර දෙනු ලබයි.

සමාගමේ විකිණීමට ඇති මූල්‍ය ආයෝජනය, විකිණීම සඳහා රඳවා ගෙන ඇති ලෙස වර්ගීකරණය කර නොමැති සහ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී නම් කර නොමැති ස්කන්ධය සහ ණය සුරුකුම් වලින් සමන්විත වේ.

(ආ) ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම් (FVTPL)

මූල්‍ය වත්කමක් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කමක් ලෙසින් වර්ගීකරණය කරන්නේ එය වෙළඳාම සඳහා රඳවා ගෙන ඇති ලෙස වර්ගීකරණය කරන්නේනම් හෝ මූලික හඳුනාගැනීමේදී එය එසේ නම් කරනු ලබන්නේනම් පමණි. සෘජුවම ආරෝපනය වන ගනුදෙනු පිරිවැය ලාභය හෝ අලාභය තුළ දරන ලද වියදමක් ලෙස හඳුනාගනු ලබයි. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම්, සාධාරණ අගයට මනින අතර පොළිය හෝ ලාභාංශ ආදායම් ඇතුළුව එහි වෙනස්වීම් ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.

වත්කම් හා වගකීම් යනු සමාගමේ මූල්‍ය වත්කම් සහ වගකීමක හෝ මේ දෙකෙහි කොටස වන අතර, සමූහයේ උපායමාර්ග යට අනුකූලව ඒවා කළමනාකරණය කර ඒවායේ කාර්යසාධනය සාධාරණ අගය පදනම මත අගයනු ලබයි. සමාගමේ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී මූල්‍ය වත්කම්, ලැයිස්තුගත ස්කන්ධ ආයෝජන වලින් සමන්විත වේ.

(ඇ) කල්පිරෙනතුරු රඳවාගන සිටින මූල්‍ය වත්කම් (HTM)

මෙම මූල්‍ය වත්කම් ස්ථාවර සහ නිශ්චය කරනු ලැබිය හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොකළ වත්කම් වන අතර සමූහයට එම වත්කම් කල්පිරෙනතුරු රඳවා ගැනීමේ අභිලාෂය සහ හැකියාව තිබෙන විට ස්ථිර කල්පිරීම්, කල්පිරීම සඳහා රඳවාගත් ලෙස වර්ගීකරණය කරනු ලබයි. මෙම වත්කම් මූලික වශයෙන් සාධාරණ අගය සමඟ කවර හෝ සෘජුව අත්කර ගත හැකි ගනුදෙනු පිරිවැයද එකතුව හඳුනා ගනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් පසුව, එම වත්කම් ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට අගයනු ලැබේ.

කල්පිරීම සඳහා රඳවාගත් මූල්‍ය වත්කම් භාණ්ඩාගාර බිල්පත් වලින් හා සමූහය විසින් කරනු ලැබ ඇති භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනවලින් සමන්විත වේ.

(ඈ) ණය සහ ලැබීම්

ණය සහ ලැබීම් යනු, සක්‍රිය වෙළෙඳපොළ තුළ ලැයිස්තුගත නොකළ ස්ථාවර හෝ නිශ්චය කරනු ලැබිය හැකි මූල්‍ය වත්කම් වේ. මෙම වත්කම් මූලික වශයෙන් සාධාරණ අගය සමඟ කවර හෝ සෘජුව අත්කරගත හැකි ගනුදෙනු පිරිවැය ද එකතුව හඳුනාගනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, ණය සහ ලැබීම් ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට අගයනු ලබයි.

ණය සහ ලැබීම්, ලැයිස්තුගත නොකළ ආයතනික ණය, කාලීන තැන්පතු, වත්කම් ඇප සුරුකුම්පත්, සංවර්ධන බැඳුම්කර, වාණිජ පත්‍රිකා අනෙකුත් ණය සහ ලැබීම්, මුදල් සහ මුදලට සමාන දෑ වලින් සමන්විත වේ.

- **ලැබිය යුතු ප්‍රතිරක්ෂණ**

  සමාගම සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලියේදී ඇතිවන රක්ෂණ අවදානම් විධිමත් ප්‍රතිරක්ෂණ වැඩපිළිවෙල තුළින් හඳුනාගත් ප්‍රතිරක්ෂකයින් වෙත පවරා දේ.

  ප්‍රතිරක්ෂණ වත්කම්වලට, ගෙවූ සහ නොගෙවූ අලාභ සඳහා ප්‍රතිරක්ෂණ සමාගම්වලින් අයවීමට ඇති හිඟ ශේෂ සහ අලාභ ගැළපීමේ වියදම් ඇතුළත් වේ. ප්‍රතිරක්ෂකයින්ගෙන් අයකර ගැනීමට ඇති ප්‍රමාණ ප්‍රතිරක්ෂකයින්ගේ ඔප්පු හා බැඳුණු හිඟ හිමිකම් වෙන් කිරීම් හෝ නොපියවූ හිමිකම් සමඟ අනුරූපවන ආකාරයකට සහ අදාළ ප්‍රතිරක්ෂණ ගිවිසුමට අනුව ඇස්තමේන්තු කරනු ලබයි.

  ප්‍රතිරක්ෂණ හිලව් කිරීමේ හිමිකමක් නොපවතින්නේ නම් මිස, ප්‍රතිරක්ෂණයක් දළ වශයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වාර්තා කරනු ලබයි.

  ප්‍රතිරක්ෂණ වත්කම්, වාර්තාකරණ වර්ෂය තුළදී හානිකරණය පිළිබඳ හැඟවීමක් මතුවුවහොත් සෑම වාර්තාකරණ දිනයකදීම හෝ නිතර නිතර හානිකරණ සඳහා සමාලෝචන කරනු ලබයි. ප්‍රතිරක්ෂණ වත්කම් මූලික වශයෙන් හඳුනාගැනීමෙන් පසුව සිදුවන සිදුවීමක ප්‍රතිඵල ලෙස, ගිවිසුමේ කොන්දේසි යටතේ අයවීමට ඇති සියලුම නොපියවූ ප්‍රමාණ සමූහයට නොලැබිය හැකි බවට විෂයමූලික සාක්ෂි ඇති විට සහ එම සිදුවීමෙන් ප්‍රතිරක්ෂකගෙන් සමූහයට ලැබීමට ඇති ප්‍රමාණ මත සත්‍ය වශයෙන්ම සැලකිය යුතු බලපෑමක් ඇති විට හානිකරණයක් සිදුවෙයි. හානිකරණ අලාභයක් ඇත්නම් ලාභය හෝ අලාභය තුළ වාර්තා කරනු ලබයි.

  පවරන ලද ප්‍රතිරක්ෂණ වැඩපිළිවෙල ඔප්පු හිමියන්ට සමූහයේ ඇති බැඳීම් වලින් සමූහය මුදා හැරීමක් සිදු නොකරයි.

  ගිවිසුම්ගත අයිතිවාසිකම් ශූන්‍ය වූ විට හෝ ඉකුත් වූ විට හෝ ගිවිසුම වෙනත් පාර්ශවයකට මාරු කරන විට ප්‍රතිරක්ෂණ වත්කම් හා වගකීම් හඳුනා නොගනී.

- **ලැබියයුතු වාරික**

  ලැබිය යුතු රක්ෂණය අයවීමට ඇති අවස්ථාවේදී හඳුනා ගන්නා අතර ලැබිය යුතු ප්‍රතිඡ්ඨාවේ සාධාරණ අගයේදී මූලික හඳුනාගැනීම මත අගය කරයි. රක්ෂණ වාරික අයකර ගත හැකි බව අබණ්ඩ පදනමින් සමාලෝචනය කරනු ලබයි.

  ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද රක්ෂණ වාරික ගෙවීමේ ප්‍රතිඥා උපදේශයට අනුව, ජීවිත නොවන රක්ෂණ ඔප්පු, රක්ෂණ වාරික ගෙවීමේ ප්‍රතිඥාභාරයන්ට යටතේ නිකුත් කරන අතර රක්ෂණ වාරික නොපියවන්නේනම් දින 60 ක් ඉකුත්වීමෙන් පසු අවලංගු කරනු ලබයි.

  සමූහය විසින් ජීවිත රක්ෂණ, වාරික උපචිත පදනම මත ගිණුම්ගත කරයි. ඒ අනුව, අයවීමට ඇති ජීවිත රක්ෂණ වාරික (දින 30 ක සහන කාලසීමාව තුළ අයවීමට ඇති රක්ෂණ වාරික පමණි) සෑම වාර්තාකරණ දිනයකදීම හඳුනා ගනු ලබන අතර අනතුරුව එළඹෙන මාසයේදී රක්ෂණ වාරික පියවන්නේ නැත්නම් ඒවා ප්‍රතිවර්තනය කරනු ලබන අතර එසේම, සමූහයේ ප්‍රතිපත්ති අනුව එම ඔප්පු අවලංගු වී යයි.

  සාර්ව-ආර්ථික සාධකවල අවිනිශ්චිතතාවල ආර්ථික ගම්‍යතාර්ථ සළකා බලමින් 2025 දෙසැම්බර් 31 වන දිනට අයවිය යුතු රක්ෂණ වාරිකවල වියහැකි හානිකරණ අලාභය සමූහය තක්සේරු කර ඇත. එම අගැයීම මත පදනම් ව, වාර්තාකරණ දිනය වන විට අයවිය යුතු රක්ෂණ වාරික සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශවලට කිසිදු හානිකරණ වෙන් කිරීමක් ඇතුලත් කිරීම අවශ්‍ය නොවේ.

- **සම්බන්ධිත පාර්ශවයන්ගෙන් වෙනත් ලැබීම් සහ අයවියයුතු දෑ**

  සම්බන්ධිත පාර්ශවයන්ගෙන් වෙනත් ලැබීම් සහ අයවිය යුතු දෑ ලැබියයුතු බොල් සහ අඩමාන ණය සඳහා දීමනාව අඩුකළ පිරිවැයට හඳුනා ගනු ලබයි.

- **මුදල් හා මුදලට සමාන දෑ**

  මුදල් සහ මුදලට සමාන දෑ ප්‍රතිවර්තන ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් සහ සාධාරණ අගයේ වෙනස්වීම්වල නොසැලකිය යුතු අවධානමකට යටත්වන අත්කරගත් දිනයේ සිට මාස තුනක් හෝ ඊට අඩුවෙන් කල් පිරුණු මුදල් ශේෂ සහ ඒක්ෂණ තැන්පතුවලින් සමන්විත වන අතර සමූහය එහි කෙටිකාලීන බැඳීම් කළමනාකරණය කිරීමේදී භාවිතා කරයි.

3.5.7.2 ව්‍යුත්පන්න නොවන මූල්‍ය වගකීම්

සමූහය නිකුත් කරන ලද ණය සුරැකුම් සහ ද්විතියික වගකීම් ඒවා උත්පාදනය කරන දිනයේදී මූලිකව හඳුනා ගනියි. අනෙකුත් සියලුම වගකීම් මූලිකව වෙළෙඳ දිනයේ දී එනම් උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවල සමූහය පාර්ශවකරුවෙකු වන දිනයේ දී හඳුනා ගනී.

අනෙකුත් මූල්‍ය වගකීම් මූලික වශයෙන් සෘජුවම ආරෝපනය වන ගනුදෙනු පිරිවැය අඩුකළ සාධාරණ අගයේදී මනිනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් පසුව මෙම වගකීම්, ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට අගයනු ලබයි.

සමූහය විසින් මූල්‍ය වගකීමක්, එහි ගිවිසුම්ගත බැඳීම්වලින් නිදහස් කරනු ලබන විට, අවලංගු කරනු ලබන විට හෝ ඉකුත් වූ විට හඳුනා නොගනී.

සමූහයේ අනෙකුත් මූල්‍ය වගකීම්, ණය හා ණය ගැණුම්, බැංකු අයිරා සහ වෙළෙඳ හා අනෙකුත් ගෙවීම්වලින් සමන්විත වේ.

3.5.8 මූල්‍ය වත්කම් හානිකරණය (ව්‍යුත්පන්න නොවන)

SLFRS 9 – මූල්‍ය උපකරණ යටතේ අපේක්ෂිත ණය අලාභ (ECL) ආදර්ශය සමඟ අනුකූලව මූල්‍ය වත්කම් මත හානිකරණ අලාභ සමාගම හඳුනා ගනී.

අපේක්ෂිත ණය අලාභ ආදර්ශයට යටත් මූල්‍ය වත්කම් වලට පහත දැ ඇතුළත්ය:

- ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන ණය උපකරණ, සහ
- අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට (FVOCI) මනිනු ලබන ණය උපකරණ

මූලික හඳුනා ගැනීමේ සිට ණය අලාභවල සැලකියයුතු වැඩිවීමක් තිබේද යන්න මත රැඳෙමින් මාස 12 අපේක්ෂිත ණය අලාභ හෝ ජීවකාල අපේක්ෂිත ණය අලාභ ලෙස අපේක්ෂිත ණය අලාභ මනිනු ලබයි. අපේක්ෂිත ණය අලාභ ආදර්ශයට ඉදිරිය දකින ප්‍රවේශයක් භාවිතයෙන් ණය අලාභ හඳුනා ගැනීම අවශ්‍ය වන අතර, එම ප්‍රවේශයට ඓතිහාසික අත්දැකීම්, වත්මන් තත්ත්වයන් සහ අනවශ්‍ය පිරිවැය හෝ උත්සාහය නොමැතිව අදාළ සහ ලබා ගත හැකි අනාගත ආර්ථික තත්ත්වයන් පිළිබඳ සාධාරණ සහ සහාය දැක්විය හැකි තොරතුරු ඇතුළත් වේ.

හානිකරණ අලාභ ලාභ හෝ අලාභය තුළ හඳුනාගෙන මූල්‍ය වත්කම්වල දළ නිරාවරණයෙන් අඩු කරනු ලබන අතර, අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ණය උපකරණ සඳහා අනුරූප දීමනාව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම්වල ධාරණ අගය අඩු නොකර අනෙකුත් විස්තීරණ ආදායම තුළ හඳුනා ගනී.

SLFRS 9 – මූල්‍ය උපකරණ යටතේ, අපේක්ෂිත ණය අලාභ ආදර්ශයට යටත් මූල්‍ය වත්කම් මූලික හඳුනාගැනීමේ සිට ණය අවදානමේ වෙනස්වීම් මත පදනම්ව අදියර තුනකට වර්ගීකරණය කර ඇත.

මූල්‍ය වත්කමක ණය අවදානම ආරම්භයේ සිට සැලකියයුතු ලෙස වැඩි වී තිබේද යන්න තීරණය කිරීමේදී, සමාගම ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු යන දෙකම සලකා බලයි. මෙයට පහත දැ ඇතුළත් වේ:

- පසුගිය හිඟ තත්ත්වය – ගිවිසුම්ගත ගෙවීම් දින 30ට වඩා හිඟනම්, ණය අවදානම සැලකියයුතු ලෙස වැඩි වී ඇතැයි උපකල්පනය කරන විට හදිසි ආරක්ෂක පියවරක් යොදා ගනී.
- ණය ශ්‍රේණිගතකරණය – අභ්‍යන්තර හෝ බාහිර ණය ශ්‍රේණිගතකරණය තුළ පිරිහීම
- පුරෝකථන – තාක්ෂණික, වෙළෙඳපොල, ආර්ථික හෝ නෛතික පරිසරය තුළ ණයකරුගේ මෙහෙයුම් ප්‍රතිඵලවල අහිතකර වෙනස්වීම් හෝ සැලකියයුතු වෙනස්වීම්

ණය ගැණුම්කරුට තම ණය බැඳීම් සම්පූර්ණයෙන්ම ගෙවීමට අපහසු වූ විට, ආරක්ෂාව මුදාහැරීම වැනි ක්‍රියාමාර්ග සමාගමේ උපායන් නොමැති විට හෝ මූල්‍ය වත්කම නියමිත දින 90කට වඩා කල් ඉකුත් වී ඇති විට සමූහය මූල්‍ය වත්කමක් පැහැර හැර ඇති බව සලකයි.

LKAS 39 ට අනුව, විකිණීමට ඇති ලෙස වර්ගීකරණය කළ සක්‍රීය ආයෝජන සඳහා, හානිකරණය පිළිබඳ විෂය මූලික සාක්ෂිවලට ආයෝජනයේ සාධාරණ වටිනාකමට පහළ එහි පිරිවැයට තුළ "සැලකිය යුතු" හෝ "දිගු" පහත වැටීමක් ඇතුළත් වේ. "සැලකිය යුතු" හෝ "දිගු" යනු කුමක්දැයි තීරණය කිරීම සඳහා විනිශ්චය අවශ්‍ය වේ.

ඊට වෙනස්ව, SLFRS 9 යටතේ, ස්කන්ධ උපකරණ සාධාරණ අගයට මනිනු ලබන අතර, සමාගම ඒවා මත හානිකරණ අලාභ හඳුනා නොගනී. FVOCI හි නම් කර ඇති ස්කන්ධ සඳහා, සියලුම සාධාරණ අගයේ වෙනස්වීම් වෙනත් විස්තීර්ණ ආදායම (OCI) හි හඳුනා ගන්නා අතර ඒවා කිසි විටෙකත් ලාභ හෝ අලාභයට නැවත වර්ගීකරණය නොකෙරේ.

අදියර	මූලික නිර්ණායක/දර්ශක	අපේක්ෂිත ණය අලාභ මැනීම	පොලී ආදායම් හඳුනා ගැනීම
අදියර 1 (සක්‍රීය වත්කම්)	මූලික හඳුනාගැනීම මත ණය අවදානමේ සැලකියයුතු වැඩිවීම	මාස 12 අපේක්ෂිත ණය අලාභ	ඵලදායී පොලී අනුපාතය භාවිතයෙන් දළ ධාරණ අගය මත හඳුනාගත්
	වත්කම ණය හානිකරණය නොවේ		
අදියර 2 (අක්‍රීය වත්කම්)	මූලික හඳුනාගැනීමේ සිට ණය අවදානමේ සැලකියයුතු වැඩිවීම	ජීවකාල අපේක්ෂිත ණය අලාභ	ඵලදායී පොලී අනුපාතය භාවිතයෙන් දළ ධාරණ අගය මත හඳුනාගත්
	ණය ශ්‍රේණිගතකරණයේ පිරිහීම		
	පසුගිය හිඟ තත්ත්වය (උදා. > දින 30)		
	ණයකරු හෝ ආර්ථික තත්ත්වයන් හී අහිතකර වෙනස්වීම්		
අදියර 3	ණයකරු විසින් පැහැර හැරීම හෝ යුතුකම ඉටු නොකිරීම	ජීවකාල අපේක්ෂිත ණය අලාභ	ශුද්ධ ධාරණ අගය මත හඳුනාගත් (අපේක්ෂිත ණය අලාභ අඩුකළ දළ ප්‍රමාණය)
	බුන්වත්බව හෝ මූල්‍යමය ප්‍රතිසංවිධානය පිළිබඳ දර්ශක		
	ගෙවීම් තත්ත්වයන් හී අහිතකර වෙනස්වීම්		
	මූල්‍ය දුෂ්කරතාව හේතුවෙන් සක්‍රිය වෙළෙඳපොල නොපෙනී යාම		
	අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහවල නිරීක්ෂණය කළහැකි අඩුවීම		

3.5.8.1 ක්‍රමක්ෂය පිරිවැයට ගෙන ආ මූල්‍ය වත්කම්

මෙම වත්කම් සඳහා හානිකරණ සාක්ෂිය තනි තනි මට්ටමේදී සහ සමූහ මට්ටමේදී සලකා බලයි. තනි තනිව සැලකියයුතු සියලුම වත්කම් හානිකරණය සඳහා තනි තනිව තක්සේරු කරනු ලබයි. හානිකරණයට ලක් නොවුණු බවට සොයා ගන්නා ලද සියලුම වත්කම් ඉන් පසුව වැය කරන ලද නමුත් තවම තනිව හඳුනා නොගත් යම් හානිකරණයක් සඳහා සාමූහිකව තක්සේරු කරනු ලබයි. තනි තනිව නොසැලකියයුතු වත්කම් හානිකරණය සඳහා සාමූහිකව තක්සේරු කරනු ලබයි. සාමූහික තක්සේරු කිරීම එකම අවදානම් ලක්ෂණ සහිත වත්කම් සමූහයක් ලෙසට එකට එක් කරමින් සිදු කරනු ලබයි.

සාමූහික මට්ටමේදී, අපේක්ෂිත ණය අලාභ පැහැර හැරීමේ සම්භාවිතාවයේ විපාකය, අලාභ දෙන පැහැර හැරීම, සහ පැහැර හැරීමට නිරාවරණය ලෙස ගණනය කරනු ලබන අතර, ලාභය හෝ අලාභය තුළ හඳුනා ගෙන අත්තිකාරම් ගිණුමක පෙන්නුම් කරනු ලබයි. හානිකරණ අලාභයක අගය පසුව අඩුවන්නේ නම් සහ එම අඩුවීම, හානිකරණය හඳුනාගත් පසු සිදුවූ සිදුවීමකට විෂය මූලික වශයෙන් සම්බන්ධ විය හැකිනම්, එවිට පෙර හඳුනාගත් හානිකරණ අලාභය ලාභය හෝ අලාභය තුළින් ප්‍රතිවර්තනය කරනු ලබයි.

ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද අනෙකුත් මූල්‍ය වත්කම්

නව අපේක්ෂිත ණය අලාභ ආදර්ශය ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද අනෙකුත් මූල්‍ය වත්කම්වලට ද යොදා ගනී. වාර්තාකරන දිනයට අඩු ණය අවදානමක් ඇතැයි තීරණය කරන ආයෝජන සඳහා හැර සමාගම ජීවකාල අපේක්ෂිත ණය අලාභයට සමාන ප්‍රමාණයකට අලාභ දීමනාව මනිනු ලබයි. ණය ශ්‍රේණිගතකරණය "ආයෝජන ශ්‍රේණිය" යන ගෝලීයව හඳුනාගත් නිර්වචනයට සමාන වන අවස්ථාවේදී, ණය සුරැකුමක් අඩු ණය අවදානමක් ඇති බවට සලකනු ලබයි.

සමූහය අපේක්ෂිත ණය අලාභ ගණනය සඳහා යෙදවුමක් ලෙස බාහිර ණය ආයතනවල තොරතුරු භාවිතා කරන අතර ඉදිරිය දකින තොරතුරු සහ ආර්ථික අවස්ථාව පිළිබිඹු කිරීමට එය ගලපනු ලබයි.

3.5.8.2 විකිණීමට ඇති මූල්‍ය වත්කම් (AFS)

විකිණීමට ඇති මූල්‍ය වත්කම් මත හානිකරණ අලාභ විකිණීමට තබා ඇති සංචිතයේ සමුච්චිත අලාභ, ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කරමින් හඳුනා ගනු ලබයි. එම ප්‍රතිවර්ගීකරණය කරන ලද අගය යනු, අත්කර ගැනීමේ පිරිවැය (යම් ප්‍රධාන මුදල ආපසු ගෙවීමක සහ ක්‍රමක්ෂයවල ශුද්ධ අගය) සහ ලාභය හෝ අලාභය තුළ පෙර හඳුනා ගන්නා යම් හානිකරණ අලාභය අඩුකළ වර්තමාන සාධාරණ අගය අතර වෙනස වේ.

හානිකරණයට ලක්වූ විකිණීමට තබා ඇති ණය සුරැකුම්පතක සාධාරණ අගය පසුව වැඩිවන්නේ නම් සහ එම වැඩිවීම, හානිකරණ අලාභය හඳුනා ගැනීමෙන් පසුව සිදු වූ සිදුවීමකට විෂය මූලිකව සම්බන්ධ විය හැකි නම්, එවිට එම හානිකරණ අලාභය, ලාභය හෝ අලාභය මඟින් ප්‍රතිවර්තනය කරනු ලබයි. විකිණීමට තබා ඇති ලෙස වර්ගීකරණය කළ ස්කන්ධ උපකරණයක ආයෝජනයක් සඳහා ලාභය හෝ අලාභය තුළ හඳුනා ගන්නා හානිකරණ අලාභ, ලාභය හෝ අලාභය මඟින් ප්‍රතිවර්තනය කරනු නොලබයි.

3.5.9 මූල්‍ය උපකරණ - SLFRS 09

සමාගම 2025 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි එහි වෙනම මූල්‍ය ප්‍රකාශනවල SLFRS 9 – "මූල්‍ය උපකරණ" යොදාගෙන ඇත. මෙම ප්‍රමිතිය LKAS 39 – "මූල්‍ය උපකරණ: හඳුනාගැනීම සහ මැනීම" ප්‍රතිස්ථාපනය කරයි.

SLFRS 9 හි සංක්‍රාන්ති විධිවිධාන මඟින් අවසර දී ඇති පරිදි, සංසන්දනාත්මක තොරතුරු නැවත සඳහන් නොකර, සමාගම අතීතානුයෝගීව අවශ්‍යතා යොදා ගැනීමට තෝරාගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2025 ජනවාරි 1 දිනට LKAS 39 යටතේ පෙර ධාරණ අගයන් සහ SLFRS 9 යටතේ නව ධාරණ අගයන් අතර යම් වෙනස්වීම් සෘජුවම ආරම්භක රඳවා ගත් ඉපැයීම් තුළ හඳුනාගෙන ඇත.

මූලික යොදා ගැනීමේ දිනයේදී (2025 ජනවාරි 01) පැවති කරුණු සහ තත්ත්වයන් මත පදනම්ව පහත තක්සේරු කිරීම් සිදු කරන ලදී:

- මූල්‍ය වත්කමක් පවත්වාගෙන යන ව්‍යාපාර ආකෘතිය තීරණය කිරීම
- ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට (FVTPL) මනිනු ලබන ඇතැම් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්වල පෙර නම් කිරීම් සහ අවලංගු කිරීම
- අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට (FVOCI) මනිනු ලබන වෙළෙඳාම සඳහා තබා නොගත් සක්න්ධ උපකරණවල ඇතැම් ආයෝජන නම් කිරීම

පරිපාලිත සමාගම සඳහා තාවකාලික නිදහස් කිරීම

සමාගම SLFRS 9 යොදා ගෙන ඇති අතර, එහි පරිපාලිත සමාගම් වන ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්, SLFRS 4 යටතේ SLFRS 9 හි තාවකාලික නිදහස් කිරීම සඳහා තවදුරටත් සුදුසුකම් ලබයි. මෙයට හේතුව ඔවුන්ගේ කටයුතු ප්‍රධාන වශයෙන් රක්ෂණය සමඟ සම්බන්ධ වී ඇති බැවින් සහ SLFRS 17 – රක්ෂණ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබීමයි. මෙම පරිපාලිත සමාගම් 2026 ජනවාරි 01 වන දින ආරම්භ වන මූල්‍ය වර්ෂය සඳහා SLFRS 9 යොදා ගනු ඇත.

3.5.9.1 LKAS 39 සිට SLFRS 9 දක්වා මූල්‍ය වත්කම් වර්ගීකරණයේ සංක්‍රාන්තිමය බලපෑම

2025 ජනවාරි 01 දිනට සමූහයේ මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්වල එක් එක් පන්තිය සඳහා LKAS 39 යටතේ මුල් මිනුම් වර්ගීකරණ සහ SLFRS 9 යටතේ නව මිනුම් වර්ගීකරණ පහත වගුව සහ එහි සඳහන් සටහන් මඟින් පැහැදිලි කෙරේ.

මූල්‍ය වත්කම්	LKAS 39 යටතේ මුල් වර්ගීකරණය	SLFRS 09 යටතේ නව වර්ගීකරණය	LKAS 39 යටතේ මුල් ධාරණ අගය	නැවත මැනීම/ අපේක්ෂිත ණය අලාභ	SLFRS 09 යටතේ නව ධාරණ අගය
මුදල් හා මුදලට සමාන දෑ	ණය සහ ලැබීම්	ක්‍රමක්ෂය පිරිවැය	555,913	–	555,913
වාණිජ පත්‍රිකා	අලෙවියට තබා ඇති	ක්‍රමක්ෂය පිරිවැය	15,179,581	(4,096)	15,175,485
කාලීන තැන්පතු	ණය සහ ලැබීම්	ක්‍රමක්ෂය පිරිවැය	2,146,539	(308)	2,146,231
ලැයිස්තුගත කොටස්	අලෙවියට තබා ඇති	FVOCI	25,900,124	–	25,900,124
ලැයිස්තුගත නොකළ කොටස්	අලෙවියට තබා ඇති	FVOCI	5,934	–	5,934
ලැයිස්තුගත කොටස්	ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය	FVTPL	2,010,130	–	2,010,130
අනෙකුත් වත්කම්	ණය සහ ලැබීම්	ක්‍රමක්ෂය පිරිවැය	10,975,039	(1,987,645)	8,987,394
එකතුව			56,773,260	(1,992,049)	54,781,211

LKAS 39 සිට SLFRS 9 දක්වා සංක්‍රාන්තිය මූලික ගැලපීම් දෙකකට හේතු වේ:

නැවත වර්ගීකරණය: සමාගමේ ව්‍යාපාර ආකෘතිය වන්නේ මූල් මුදල සහ පොලිය (SPPI) පමණක් සමන්විත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා මෙම වත්කම් රඳවා ගැනීම බැවින්, පෙර විකිණීමට ඇති ලෙස වර්ගීකරණය කරන ලද වාණිජ පත්‍රිකා ක්‍රමක්ෂය කළ පිරිවැයට නැවත වර්ගීකරණය කරන ලදී. සාධාරණ අගයේ වෙනස්වීම් වලින් ආදායම් ප්‍රකාශනයේ අස්ථාවරත්වය වැළැක්වීම සඳහා උපායමාර්ගික ස්කන්ධ ආයෝජන ආපසු හැරවිය නොහැකි ලෙස FVOCI ලෙස නම් කරන ලදී.

නැවත මැනීම (අපේක්ෂිත ණය අලාභ බලපෑම (ECL)): සමාගම විසින් ආරම්භක රඳවා ගත් ඉපැයීම්වල රු. 1,992,049,000 ක මුළු ගැලපීමක් හඳුනා ගන්නා ලදී. මෙයට වාණිජ පත්‍රිකා සහ කාලීන තැන්පතු සඳහා මාස 12 ක ECL (අදියර 1) ඇතුළත් වේ. නැවත මැනීමෙන් සැලකිය යුතු කොටසක් (රු. 1,987,645,000) කැන්විල් හෝල්ඩින් හි බැහැර කිරීමෙන් ලැබිය යුතු දෙයට අදාළ වේ. මෙම වත්කම දැනට ක්‍රමක්ෂය පිරිවැය යටතේ වර්ගීකරණය කරන බැවින්, සමාගම එහි වර්තමාන වටිනාකම පිළිබිඹු කිරීම සඳහා එය නැවත මැන ඇත. කල් දැමූ ගෙවීම් නියමයන්ට ආවේණික මූල්‍යකරණ සංරචකය සඳහා ගිණුම්ගත කිරීම සඳහා සළුල පොලී අනුපාතය ක්‍රමය භාවිතා කර ගණනය කළ ආපසු අයකිරීමේ කාලය පුරා මෙම ගැලපීම මුදල්වල කාලීන වටිනාකම පිළිබිඹු කරයි.

SLFRS 9 හි සංක්‍රාන්ති විධිවිධානවලට අනුකූලව (7.2.15 ඡේදය), පසු දැක්මේ ප්‍රතිලාභය නොමැතිව එසේ කිරීම ප්‍රායෝගික නොවන බැවින්, සමාගම සංසන්දනාත්මක තොරතුරු නැවත ප්‍රකාශ නොකර ප්‍රමිතියේ වර්ගීකරණය සහ මැනීම් අවශ්‍යතා යොදා ගෙන ඇත.

තවද, SLFRS 9 හි 7.2.15 ඡේදයට අනුකූලව, පසු දැක්ම භාවිතා නොකර අතීතානුයෝගී යොදා ගැනීම හැකි වූ අවස්ථාවක, මූල්‍ය ප්‍රකාශන ඒ අනුව ගලපනු ලැබ ඇත. පෙර ධාරණ අගයන් සහ SLFRS 9 යටතේ තීරණය කරන ලද අගයන් අතර යම් වෙනස්වීම් 2025 ජනවාරි 01 දිනය වන මූලික යොදා ගැනීමේ දිනයේදී ආරම්භක රඳවා ගත් ඉපැයීම් තුළ හඳුනාගෙන ඇත.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් යන පරිපාලිත සමාගම් SLFRS 17 යොදා ගැනීම අවශ්‍ය වේ. ඒ අනුව, මෙම ආයතන රක්ෂණ ක්ෂේත්‍රය තුළ ආයතන සඳහා ලබා ගත හැකි තාවකාලික නිදහස් කිරීම සඳහා තවදුරටත් සුදුසුකම් ලබන අතර, SLFRS 9 යොදා ගැනීම අතිරේක වසරක් සඳහා කල් දමා ඇත. මෙම පරිපාලිත සමාගම් 2026 ජනවාරි 01 වන දින ආරම්භ වන මූල්‍ය වර්ෂයේ සිට SLFRS 9 භාවිතා කරනු ඇත.

3.5.9.2 වර්ගීකරණය හා මැනීම

මූලික හඳුනා ගැනීම

සමාගම උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවලට පාර්ශවකරුවෙකු වන අවස්ථාවේදී මූල්‍ය වත්කම් හඳුනාගනු ලබයි. මූලික හඳුනා ගැනීමේදී, ඒවා සාධාරණ වටිනාකමට මනිනු ලැබේ.

- ක්‍රමක්ෂය කළ පිරිවැය/FVOCI: සාධාරණ අගය සහ සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය.
- FVTPL: සාධාරණ අගය, ලාභය හෝ අලාභය තුළ වහාම වියදම් කළ ගනුදෙනු පිරිවැය සමඟ

වර්ගීකරණ නිර්ණායක

වත්කම් කළමනාකරණය සඳහා වන ව්‍යාපාර ආදර්ශය සහ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ (SPPI පරීක්ෂණය) මත පදනම්ව වර්ගීකරණය තීරණය වේ.

වර්ගීකරණය		ව්‍යාපාර ආදර්ශය/මුදල් ප්‍රවාහ ලක්ෂණ
ක්‍රමක්ෂය පිරිවැය		ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීමට තබාගන්නා (මුල් මුදල හා පොලිය)
FVOCI	ණය	ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීමේ හා මූල්‍ය වත්කම් විකිණීම මගින් අරමුණු සාක්ෂාත් කර ගන්නා ව්‍යාපාර ආදර්ශයක් තුළ තබාගන්නා
	සක්‍රීයත්වය	උපායමාර්ගික, අලෙවි නොකරන ස්කන්ධ ආයෝජන (වෙනස්කළ නොහැකි තේරීම)
FVTPL		අලෙවිය සඳහා තබා ගන්නා හෝ ගිණුම්කරණ නොගැලපීම් අඩුකිරීමට නම්කළ

- ක්‍රමක්ෂය පිරිවැයට හෝ FVOCI අනුව මනින ලද මූල්‍ය වත්කම්: සාධාරණ අගය සහ සෘජුවම ආරෝපනය වන ගනුදෙනු පිරිවැයට මනින ලද
- ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට (FVTPL) මනින ලද මූල්‍ය වත්කම්: සාධාරණ අගය සහ ලාභය හෝ අලාභය තුළ වහාම වියදම්කළ ගනුදෙනු පිරිවැයට මනින ලද

3.5.9.3 පසුකාලීන මැනීම

මූල්‍ය වත්කම්වල පසුකාලීන මැනීම මූලික හඳුනාගැනීමේදී ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් (ණය උපකරණ)

පහත සඳහන් කොන්දේසි දෙකම සපුරා ඇත්නම්, සමාගම ක්‍රමක්ෂය කළ පිරිවැයට මූල්‍ය වත්කම් මනිනු ලබයි:

- ව්‍යාපාර ආදර්ශය: ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා මූල්‍ය වත්කම් තබා ගැනීම අරමුණ වන ව්‍යාපාර ආකෘතියක් තුළ මූල්‍ය වත්කම තබා ගනී.
- SPPI පරීක්ෂණය: මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත නියමයන් හිඟ මුල් මුදල මත මුල් මුදල සහ පොලී ගෙවීම් (SPPI) පමණක් වන මුදල් ප්‍රවාහ සඳහා නිශ්චිත දිනවල ඇති කරයි.

මෙම වත්කම් පසුව හානිකරණය සඳහා වන යම් දීමනාවක් අඩු කළ, ඵලදායී පොලී අනුපාත ක්‍රමය (EIR) භාවිතයෙන් ක්‍රමක්ෂ පිරිවැයට මනිනු ලැබේ. පොලී ආදායම, විදේශ විනිමය ලාභ සහ අලාභ සහ හානිකරණය ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනී.

ක්‍රමක්ෂය කළ පිරිවැයට සමාගමේ මූල්‍ය වත්කම්වලට මුදල් සහ කෙටිකාලීන තැන්පතු, වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දේ සහ කැන්විල් හෝල්ඩින් බැහැර කිරීමෙන් පැන නගින ලැබිය යුතු ශේෂය ඇතුළත් වේ.

ප්‍රතිවක්‍රීයකරණය සමඟ අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් (ණය උපකරණ)

පහත සඳහන් කොන්දේසි දෙකම සපුරා ඇත්නම් සමාගම FVOCI ට ණය උපකරණ වර්ගීකරණය කරයි:

ව්‍යාපාර ආදර්ශය: ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීම යන දෙකෙන්ම අරමුණ සාක්ෂාත් කරගනු ලැබීම; සහ

SPPI පරීක්ෂණය: ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ SPPI නිර්ණායක සපුරාලීම.

මෙම උපකරණ සාධාරණ වටිනාකමට මනිනු ලැබේ. පොලී ආදායම (සළුල පොළි අනුපාත ක්‍රමය භාවිතයෙන් ගණනය කරනු ලැබේ), විදේශ විනිමය ලාභ/අලාභ, සහ හානිකරණ අලාභ හෝ ආපසු හැරවීම් ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනා ගනී. අනෙකුත් සියලුම සාධාරණ අගයේ වෙනස්වීම් අනෙකුත් විස්තීර්ණ ආදායම් (OCI) තුළ හඳුනා ගනී.

හඳුනා නොගැනීමෙන් පසු, අනෙකුත් විස්තීර්ණ ආදායම තුළ පෙර හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ ලාභ හෝ අලාභ ප්‍රකාශයට ස්කන්ධයෙන් නැවත වර්ගීකරණය කෙරේ.

ප්‍රතිවක්‍රීයකරණය නොමැතිව අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට නම්කළ මූල්‍ය වත්කම් (ණය උපකරණ)

මූලික හඳුනාගැනීම මත, අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයට ස්කන්ධ ආයෝජන (LKAS 32 යටතේ ස්කන්ධය යන අර්ථ දැක්වීම සපුරාලන සහ වෙළෙඳාම සඳහා තබා නොගන්නා) ලෙස නම් කිරීම සඳහා අවලංගු කළ නොහැකි තේරීමක් සිදුකළ හැකිය. මෙම වර්ගීකරණය උපකරණයෙන් උපකරණය පදනමක් මත තීරණය කෙරේ.

මෙම වත්කම් සාධාරණ අගයට මනිනු ලැබේ. අනෙකුත් විස්තීර්ණ ආදායම තුළ හඳුනාගෙන ඇති ලාභ සහ අලාභ හඳුනා නොගැනීම මත ලාභ හෝ අලාභ ප්‍රකාශයට නැවත වර්ගීකරණය නොකෙරේ. (ප්‍රතිවක්‍රීකරණය කරනු ලැබේ). ආදායම මූල්‍ය වත්කමේ පිරිවැයෙන් කොටසක් අයකර ගැනීම නියෝජනය කරන විට හැර, ගෙවීමේ අයිතිය ස්ථාපිත කර ඇති විට ලාභාංශ ලාභ හෝ අලාභ ප්‍රකාශයේ වෙනත් ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ. FVOCI ට නම් කර ඇති ස්කන්ධ උපකරණ හානිකරණ තක්සේරුවට යටත් නොවේ.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් (FVTPL)

FVTPL ට මූල්‍ය වත්කම්වලට වෙළෙඳාම සඳහා තබා ඇති මූල්‍ය වත්කම්, FVTPL ට මූලික පිළිගැනීම මත නම් කරන ලද මූල්‍ය වත්කම් හෝ සාධාරණ අගයට මැනිය යුතු අනිවාර්ය මූල්‍ය වත්කම් (උදා: SPPI පරීක්ෂණයෙන් අසමත් වන වත්කම්) ඇතුළත් වේ.

මෙම වත්කම් ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනාගෙන ඇති සාධාරණ අගය තුළ වෙනස්වීම් සමඟ සාධාරණ අගයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා ඇත. මෙම වර්ගීකරණයට ඒකක භාර සහ FVOCI ලෙස නම් නොකළ ලැයිස්තුගත ස්කන්ධ ආයෝජන ඇතුළත් වේ.

3.5.9.4 අපේක්ෂිත ණය අලාභ (ECL) මූලධර්ම පිළිබඳ දළ විශ්ලේෂණය

මූල්‍ය උපකරණයක ණය අවදානම, මූලික හඳුනාගැනීමේ සිට සැලකිය යුතු ලෙස වැඩි වී තිබේද යන්න පිළිබඳව, මූල්‍ය උපකරණයේ ඉතිරි ජීවකාලය පුරා සිදුවන පැහැර හැරීමේ අවදානමේ වෙනස සලකා බලමින්, සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසානයේම තක්සේරුවක් සිදු කිරීම සඳහා සමූහය ප්‍රතිපත්තියක් ස්ථාපිත කර ඇත.

ආරම්භයේ සිට ණය අවදානම තුළ (SICR) සැලකිය යුතු වැඩිවීමක් සිදුවී නොමැති නම් මිස, අපේක්ෂිත ණය අලාභ දීමනාව වත්කමේ (ජීවිත කාල ECL හෝ LTECL) ජීව කාලය පුරාවට ඇති වේයැයි අපේක්ෂා කරන ණය අලාභ මත පදනම් වේ. එවැනි අවස්ථාවන්හිදී, දීමනාව මාස 12 ක අපේක්ෂිත ණය අලාභයට (මාස 12 ECL) සීමා වේ.

මාස 12 ECL: වාර්තාකරණ දිනයෙන් පසු මාස 12 තුළ සිදුවිය හැකි පැහැර හැරීමේ සිදුවීම්වලින් ඇතිවන අපේක්ෂිත ණය අලාභ නියෝජනය කරන LTECL.

LTECL: මූල්‍ය උපකරණයේ අපේක්ෂිත ජීව කාලය තුළ සිදුවිය හැකි සියලුම පැහැර හැරීමේ සිදුවීම් හේතුවෙන් ඇති වන අපේක්ෂිත ණය අලාභ.

LTECL සහ මාස 12 ECL යන දෙකම පාදක වූ කළඹේ ස්වභාවය මත රැඳෙමින් තනි හෝ සාමූහික පදනමක් මත ගණනය කරනු ලබයි.

අදියර වර්ගීකරණය

සමාගම පහත අදියරවලට සිය මූල්‍ය වත්කම් බාණ්ඩ කරයි:

අදියර 1 – මූලික හඳුනාගැනීම මත, සමාගම මාස 12 ECL මත පදනම් වූ දීමනාවක් හඳුනා ගනී. මෙම අදියරට ණය අවදානම වැඩිදියුණු වී ඇති සහ වත්කම අදියර 2 සිට නැවත වර්ගීකරණය කර ඇති පහසුකම් ද ඇතුළත් වේ.

අදියර 2 – උපකරණයක් ආරම්භයේ සිට ණය අවදානමේ සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කරන විට, සමාගම LTECLs සඳහා දීමනාවක් වාර්තා කරයි. ණය අවදානම පසුව වර්ධනය වන්නේනම්, වත්කම අදියර 1 වෙත නැවත වර්ගීකරණය කළ හැකිය.

අදියර 3 – ණය-හානිකරණය වූ ලෙස සැලකෙන මූල්‍ය වත්කම්. මෙම වත්කම් සඳහා සමාගම LTECL හඳුනා ගනී.

POCI – මිලදී ගත් හෝ උත්පාදිත ණය හානිකරණය වූ (POCI) වත්කම් යනු මූලික හඳුනා ගැනීම මත ණය හානිකරණය වූ මූල්‍ය වත්කම් වේ. POCI වත්කම් මූලික හඳුනා ගැනීමේදී සාධාරණ අගයට වාර්තා කරනු ලබන අතර ණය-ගැලපුම් කළ සළුල පොලී අනුපාතයක් මත පදනම්ව පොලී ආදායම පසුව හඳුනා ගනු ලැබේ. අපේක්ෂිත ණය අලාභ හඳුනාගනු ලබන්නේ හෝ මුදා හරිනු ලබන්නේ අපේක්ෂිත ණය අලාභවල පසුකාලීන වෙනසක් ඇති තාක් දුරට පමණි.

අපේක්ෂිත ණය අලාභ (ECL) ගණනය කිරීම

සමාගම විසින් සළුල පොලී අනුපාතයට ආසන්න අගයකින් වට්ටම් කළ අපේක්ෂිත මුදල් හිඟයන් මැනීම සඳහා ECLs ගණනය කරනු ලබයි. මුදල් හිඟයක් යනු ගිවිසුමට අනුකූලව ආයතනයකට ගෙවියයුතුවන මුදල් ප්‍රවාහ සහ ආයතනය ලැබීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහ අතර වෙනසයි.

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ ශිල්ප ක්‍රම පහත දක්වා ඇති අතර ප්‍රධාන අංග පහත පරිදි වේ.

පැහැර හැරීමේ සම්භාවිතාව (PD):

පැහැර හැරීමේ සම්භාවිතාව යනු දෙන ලද කාල සීමාවක් තුළ පහසුකමක් පැහැර හැරීමේ සම්භාවිතාව පිළිබඳ ඇස්තමේන්තුවකි. පහසුකම කලින් හඳුනා නොගෙන ඇත්නම් සහ එය කළඹ තුළ පවතී නම් තක්සේරු කරන ලද කාල සීමාව තුළ නිශ්චිත අවස්ථාවක දී පමණක් පැහැර හැරීමක් සිදුවිය හැකිය. සමාගම ප්‍රධාන වශයෙන් ප්‍රමාණාත්මක සාධක සහ ඉදිරි දැක්මක් සහිත ගුණාත්මක තක්සේරු කිරීම් යන දෙකම ඇතුළත් බාහිර හෝ අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම් වලින් ව්‍යුත්පන්න වන පැහැර හැරීමේ සම්භාවිතාව භාවිතා කරයි.

පැහැර හැරීමේ නිරාවරණය (EAD)

පැහැර හැරීමේ නිරාවරණය වීම යනු වාර්තාකරණ දිනයෙන් පසු අපේක්ෂිත වෙනස්වීම් සැලකිල්ලට ගනිමින්, විභව පැහැර හැරීමක් සිදුවන අවස්ථාවේ ප්‍රතිපාර්ශවයකට නිරාවරණය වීම පිළිබඳ ඇස්තමේන්තුවකි. මෙම වෙනස්වීම් වලට මූල් මුදල හා සහ පොලී ආපසු ගෙවීම් (ගිවිසුමෙන් හෝ වෙනත් ආකාරයකින් නියමිත), බැඳුණු පහසුකම් මත අපේක්ෂිත අඩු කිරීම්, මග හැරුණු ගෙවීම් වලින් උපචිත පොලිය සහ ගිවිසුම යටතේ අවසර දී ඇති යම් ක්‍රමක්ෂය හෝ ගැලපීම් ඇතුළත් විය හැකිය.

පැහැර හැරීමේ නිරාවරණය පැහැර හැරීමේ සිදුවීමක් තුළ අපේක්ෂිත නිරාවරණය නියෝජනය කරන අතර විභව වෙනස්වීම් සඳහා ගලපන ලද ප්‍රතිපාර්ශවයට වත්මන් නිරාවරණයෙන් ව්‍යුත්පන්න වේ. මූල්‍ය වත්කමක් සඳහා, පැහැර හැරීමේ නිරාවරණය සාමාන්‍යයෙන් එහි දළ ධාරණ අගයෙන් මනිනු ලබයි.

අලාභ දෙන පැහැර හැරීම (LGD)

2020 පෙබරාවරි 14 දින නිකුත්කළ 2020 අංක 01 දරන මූල්‍ය ව්‍යාපාර පනත් නියෝගය පරිදි මහ බැංකුවේ රෙගුලාසි අනුගමනය කරමින්, සමාගම 2025 දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා 45%ක් ලෙස අලාභ දෙන පැහැර හැරීම භාවිතා කරයි.

සමාගම පහත ප්‍රතිඡ්ඨාවන් මත පදනම් වී මෙම නියාමන රාමුව යොදා ගැනීමට තෝරා ගෙන ඇත:

- සමාගම ඓතිහාසික පැහැර හැරීම් සිදුවීම් අඩු වාරගණනක් සහිත ආයෝජන දරන ආයතනයක් වන බැවින්, සංඛ්‍යානමය වශයෙන් වැදගත් හෝ පුරෝකථන අභ්‍යන්තර අලාභ දෙන පැහැර හැරීමේ ආකෘතියක් සංවර්ධනය කිරීම සඳහා දැනට ප්‍රමාණවත් අභ්‍යන්තර ඓතිහාසික දත්ත නොමැත.
- ආයතන-විශේෂිත අලාභ අත්දැකීම් නොමැති විට, නියාමන ස්ථරය භාවිතා කිරීමෙන් අපේක්ෂිත මුදල් හිඟයන් මැනීම සඳහා ස්ථාවර සහ විචක්ෂණශීලී පදනමක් සහතික කරයි.
- පැහැර හැරීමක් තිබේ නම් සිදුවිය හැකි අලාභයේ විශාලත්වය අලාභ දෙන පැහැර හැරීම වේ. පැහැර හරින ලද ප්‍රතිපාර්ශවයන්ට එරෙහිව හිමිකම් අයකර ගැනීමේ අනුපාතවල ඉතිහාසය මත පදනම්ව සමූහය අලාභ දෙන පැහැර හැරීමේ පරාමිතීන් ඇස්තමේන්තු කරයි.

අපේක්ෂිත ණය අලාභ ක්‍රමයේ යාන්ත්‍රණය පහත සාරාංශ කෙරේ.

අදියර 1 – වාර්තාකරණ දිනයෙන් පසු මාස 12 තුළ මූල්‍ය උපකරණයක් මත පැහැර හැරීමේ සිදුවීම් හේතුවෙන් ඇති වන අපේක්ෂිත ණය අලාභ නියෝජනය කරන LTECLs වල කොටස ලෙස මාස 12 අපේක්ෂිත ණය අලාභ ගණනය කරනු ලබයි. වාර්තාකරණ දිනයෙන් පසු මාස 12 තුළ සිදුවන පැහැර හැරීමක අපේක්ෂාව මත පදනම්ව සමූහය මාස 12 අපේක්ෂිත ණය අලාභ දීමනාව ගණනය කරයි. මෙම අපේක්ෂිත මාස 12 පැහැර හැරීමේ සම්භාවිතාව පුරෝකථන පැහැර හැරීමේදී නිරාවරණයට යොදා ගෙන අපේක්ෂිත අලාභ දෙන පැහැර හැරීම මගින් ගුණ කර මුල් සළුල පොලී අනුපාතයට ආසන්න අගයකින් වට්ටම් කරනු ලැබේ.

අදියර 2 – ණයක් උත්පාදනයේ සිට ණය අවදානමේ සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කර ඇති විට, සමූහය ජීව කාල අපේක්ෂිත ණය අලාභ සඳහා දීමනාවක් වාර්තා කරයි. මෙම ශිල්ප ක්‍රමය ඉහත පැහැදිලි කළ ඒවාට සමාන වන අතර, බහු අවස්ථා භාවිතා කිරීම ඇතුළුවන නමුත් PDs සහ LGDs උපකරණයේ ජීව කාලය පුරාවට ඇස්තමේන්තු කර ඇත. අපේක්ෂිත මුදල් හිඟයන් මුල් සළුල පොලී අනුපාතයට ආසන්න අගයකින් වට්ටම් කරනු ලැබේ.

අදියර 3 – ණය-හානිකරණය වූ ලෙස සැලකෙන ණය සඳහා, සමූහය මෙම ණය සඳහා ජීව කාල අපේක්ෂිත ණය අලාභ හඳුනා ගනී. මෙම ක්‍රමය අදියර 2 වත්කම් සඳහා වන ක්‍රමයට සමාන වන අතර, පැහැර හැරීමේ සම්භාවිතාව 100% ලෙස සකසා ඇත.

තනි තනිව එදිරිව සාමූහික තක්සේරු කිරීම

සමාගම සාමාන්‍යයෙන් අපේක්ෂිත ණය අලාභ මැනීම සඳහා සාමූහික ආකෘතියක් භාවිතා කරන අතර, ඇතැම් නිරාවරණ තනි පදනමක් මත තක්සේරු කෙරේ. පහත කරුණු සහ එයටම සීමා නොවූ නිශ්චිත ණය අවදානම් දර්ශක හේතුවෙන් සමීප නියාමනය අවශ්‍ය කරන පරිදි සමාගම හඳුනාගෙන ඇති මූල්‍ය වත්කම් සඳහා මෙම ප්‍රවේශය යොදා ගනු ලබයි:

- ණය ගැනුම්කරුගේ මූලික මූල්‍ය මිනුම්, ද්‍රවශීලතා තත්ත්වය හෝ ශුද්ධ වත්කම් වටිනාකමෙහි සැලකිය යුතු අහිතකර වෙනස්කම්.
- ණය ගැනුම්කරුගේ නිශ්චිත ආර්ථික අංශය හෝ භූගෝලීය කලාපය තුළ පද්ධතිමය අවදානම් වලට නිරාවරණය වීම ඉහළ යාම.
- මූල් මුදල හෝ පොලිය ආපසු ගෙවීමේදී පැහැර හැරීම් හෝ සැලකිය යුතු ප්‍රමාදයන් සිදුවීම හෝ අනෙකුත් සීමාකාරී ගිවිසුම් උල්ලංඝනය කිරීම්.

තනි පදනමක් මත තක්සේරු කළ වත්කම් සඳහා, වත්කම්වල සළුල පොලී අනුපාතයට වට්ටම් කර, අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම තක්සේරු කිරීමෙන් හානිකරණ අවශ්‍යතාවය තීරණය කෙරේ.

මෙම මුදල් ප්‍රවාහ තීරණය කිරීමේදී, සමාගම පහත දෑ ඇතුළුව විවිධ අවස්ථා සලකා බලයි:

- සාර්ථක මූල්‍ය ප්‍රතිව්‍යුහගතකරණයක සම්භාවිතාව;
- ණය ගැනුම්කරුගේ මෙහෙයුම් වලින් අපේක්ෂිත ආපසු ගෙවීම්වල කාලය සහ ප්‍රමාණය; සහ
- ණය වැඩිදියුණු කිරීම් ලෙස තබා ඇති ඕනෑම පාදක ඇපකරයක හෝ තෙවන පාර්ශවීය ඇපකරයක ශුද්ධ උපලබ්ධිකළ හැකි වටිනාකම (NRV)

3.5.9.5 මූල්‍ය වගකීම්

මූලික හඳුනා ගැනීම සහ මැනීම

මූල්‍ය වගකීම් මූලික හඳුනාගැනීමේදී FVTPL ට මූල්‍ය වගකීම් ලෙස හෝ ණය, ණය ගැනීම් සහ ගෙවිය යුතු දේ ලෙස වර්ගීකරණය කරනු ලබයි. සියලුම මූල්‍ය වගකීම් මුලින් සාධාරණ අගයට සහ ණය සහ ණය ගැනීම් සහ ගෙවිය යුතු දේ සම්බන්ධයෙන්, සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැයේ ශුද්ධ අගයට හඳුනා ගනු ලබයි.

පසුකාලීන මැනීම

මූල්‍ය වගකීම් මැනීම ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී:

ක්‍රමක්ෂය කළ පිරිවැය අනුව මූල්‍ය වගකීම්: සමාගමට වඩාත්ම අදාළ කාණ්ඩය මෙයයි. මූලික හඳුනාගැනීමෙන් පසුව, මේවා පසුව සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැය අනුව මනිනු ලැබේ. වගකීම් හඳුනා නොගත් විට ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ මෙන්ම සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය කිරීමේ ක්‍රියාවලිය හරහා ලාභ සහ අලාභ හඳුනා ගනී. මෙයට වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ සහ බැංකු අයිරා ඇතුළත් වේ.

FVTPL ට මූල්‍ය වගකීම්: මේවා සාධාරණ අගයට මනිනු ලැබේ. වෙළෙඳාම සඳහා තබා ඇති වගකීම් මත ලාභ හෝ අලාභ ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ හඳුනා ගනී. FVTPL නම් කර ඇති වගකීම් සඳහා, සමාගමට අයත් ණය අවදානමේ වෙනස්වීම් වලට ආරෝපණය කළ හැකි සාධාරණ අගයෙහි වෙනසේ කොටස අනෙකුත් විස්තරාත්මක ආදායමෙහි හඳුනා ගනී.

3.5.9.6 මූල්‍ය උපකරණ හඳුනා නොගැනීම

මූල්‍ය වත්කම්

මුදල් ප්‍රවාහ සඳහා ගිවිසුම්ගත අයිතිවාසිකම් කල් ඉකුත් වූ විට හෝ මාරු කළ විට මූල්‍ය වත්කමක් හඳුනා නොගනු ලැබේ.

ක්‍රමක්ෂය කළ පිරිවැය/FVTPL; ලාභ හෝ අලාභය තුළ හඳුනාගත් ලාභ/අලාභ.

FVTPL ට ණය: සමුච්චිත OCI ලාභ/අලාභ හෝ අලාභයට නැවත වර්ගීකරණය කරනු ලබයි (ප්‍රතිවක්‍රීකරණය කරනු ලබයි).

FVOCI ට ස්කන්ධය: සමුච්චිත ලාභ/අලාභ නැවත වර්ගීකරණය නොකරන අතර ස්කන්ධය තුළ සෘජුවම මාරු කරනු ලැබේ.

මූල්‍ය වගකීම්

වගකීම යටතේ ඇති බැඳීම නිදහස් කරන විට හෝ අවලංගු කරන විට හෝ කල් ඉකුත් වන විට මූල්‍ය වගකීමක් හඳුනා ගනු නොලැබේ. පවතින මූල්‍ය වගකීමක් එකම ණයහිමියාගෙන් සැලකිය යුතු ලෙස වෙනස් කොන්දේසි මත වෙනත් අයෙකු විසින් ප්‍රතිස්ථාපනය කරන විට හෝ පවතින වගකීමක නියමයන් සැලකිය යුතු ලෙස වෙනස් කරන විට, එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම හඳුනා නොගැනීම සහ නව වගකීමක් හඳුනා ගැනීම ලෙස සලකනු ලැබේ.

අදාළ ධාරණ අගයන් හී වෙනස ආදායම් ප්‍රකාශයේ හඳුනා ගනු ලබයි.

හඳුනා නොගැනීම මත ලාභ හෝ අලාභ

මූල්‍ය වත්කමක් හඳුනා නොගැනීමෙන් ලැබෙන ලාභය හෝ අලාභය ලාභය හෝ අලාභය ලෙස හඳුනා ගන්නා අතර ලැබුණු ප්‍රතිෂ්ඨාව (උපකල්පනය කරන ලද යම් නව වගකීම අඩු කළ ලබාගත් යම් නව වත්කම ඇතුළුව) සහ හඳුනා නොගැනීමේ දිනයට මූල්‍ය වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස එය මනිනු ලබයි.

හඳුනා නොගැනීම මත ලාභ හෝ අලාභ පිළිබඳ ගිණුම්කරණ සැලකීම මූල්‍ය උපකරණයේ වර්ගීකරණය මත රඳා පවතී:

- ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම්: හඳුනා නොගැනීම මත ලාභ හෝ අලාභ ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.
- FVOCI ට වර්ගීකරණය කරන ලද ණය උපකරණ: අනෙකුත් විස්තීර්ණ ආදායම තුළ පෙර හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ හඳුනා නොගැනීම මත ලාභ හෝ අලාභයට නැවත වර්ගීකරණය කෙරේ.
- FVOCI ට නම් කරන ලද ස්කන්ධ උපකරණ: අනෙකුත් විස්තීර්ණ ආදායම තුළ හඳුනාගත් ලාභ හෝ අලාභ හඳුනා නොගැනීම මත ලාභ හෝ අලාභයට නැවත වර්ගීකරණය නොකරන අතර, ඒවා රඳවා ගත් ඉපැයීම් හෝ වෙනත් ස්කන්ධ සංරචකයකට සෘජුවම මාරු කරනු ලැබේ.
- FVTPL ට මනිනු ලබන මූල්‍ය වත්කම්: හඳුනා නොගැනීම මත පැන නගින ලාභ හෝ අලාභ සෘජුවම ලාභ හෝ අලාභයට හඳුනා ගනී.

3.5.9.7 කපා හැරීමේ ප්‍රතිපත්තිය

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් අයකර ගැනීමේ සාධාරණ අපේක්ෂාවක් නොමැති විට මූල්‍ය වත්කම් (අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන්) කපා හරිනු ලැබේ. ණය ගැණුම්කරුට මුදල් ආපසු ගෙවීමට ප්‍රමාණවත් මුදල් ප්‍රවාහයන් ජනනය කළ හැකි වත්කම් හෝ ආදායම් මාර්ග නොමැති බව සමාගම තීරණය කරන අවස්ථාවේදී මෙය සාමාන්‍ය තත්ත්වයකි. කෙසේ වෙතත්, කපා හරිනු ලබන මූල්‍ය වත්කම් ගෙවිය යුතු මුදල් අය කිරීම සඳහා සමාගමේ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම සඳහා බලාත්මක කිරීමේ කටයුතුවලට යටත් විය හැකිය.

3.5.10 විලම්බිත වියදම්

විලම්බිත අත්කර ගැනීමේ පිරිවැය (DAC)

විලම්බිත අත්කරගැනීමේ පිරිවැය ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් සඳහා පමණක් අදාළ කරගත හැකිය. අත්කර ගැනීමේ පිරිවැය උපයාගත් ආදායම් අනුව දරනු ලබන බැවින් ජීවිත රක්ෂණ ගිවිසුම් සඳහා විලම්බිත අත්කර ගැනීමේ පිරිවැය ගණනය කිරීම සිදු නොකරයි.

රක්ෂණ ගිවිසුම් ලේඛණගත කිරීමෙන් හෝ අලුත් කිරීමෙන් ඇතිවන මූල්‍ය කාලසීමාවේ දී දරනු ලබන සෘජු සහ වක්‍ර පිරිවැය අදාළ ආදායම් උපයනු ලබන කාලසීමාව තුළ විලම්බිත කිරීම හෝ හිලව් කිරීම සිදුකරනු ලබයි. අනෙකුත් සියලුම අත්කර ගැනීම් පිරිවැය ඒවා දරනු ලබන අවස්ථාවේදී වියදමක් ලෙස හඳුනා ගනු ලබයි.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නියාමන මාර්ගෝපදේශ අනුව යමින් විලම්බිත අත්කර ගැනීමේ පිරිවැය දින 365 පදනම මත පදනම්ව ගණනය කරනු ලබයි.

අදාළ ගිවිසුම පියවනු ලබන විට හෝ ඉවත් කරනු ලබන විට විලම්බිත අත්කර ගැනීම් පිරිවැය හඳුනා ගනු නොලබයි.

3.5.11 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස් ස්කන්ධය ලෙස වර්ගීකරණය කරනු ලබයි. සාමාන්‍ය කොටස් නිකුත් කිරීමට සෘජුවම ආරෝපනය වන වර්ධනීය පිරිවැය යම් බදු බලපෑම්වලින් ශුද්ධ ස්කන්ධයේ අඩුකිරීමක් ලෙස හඳුනා ගනු ලබයි.

කොටස් නැවත මිලදී ගැනීම

2007 අංක 07 පනත යටතේ, පනතේ විධිවිධානවලට අනුකූලව හෝ උසාවි නියෝගයක් මත පදනම් වී සමාගමට තමන්ට අයත් කොටස් මිලදී ගැනීමට හෝ අත්කර ගැනීමට හැකියාව ඇත. මෙම විධිවිධානය මගින් නෛතික සහ නියාමන අවශ්‍යතාවයන්ට යටත්ව සිය කොටස් ප්‍රාග්ධනය හා හිමිකාරත්ව ව්‍යුහය කළමනාකරණය කිරීමේදී සමාගමට නම්‍යතාවයට ඉඩ ලබා දේ.

3.5.12 වගකීම් සහ වෙන් කිරීම්

3.5.12.1 රක්ෂණ ගිවිසුම් බැඳීම්

රක්ෂණ වෙන් කිරීම – ජීවිත රක්ෂණය

ජීවිත රක්ෂණ වගකීම් ගිවිසුම්වලට ඇතුළත් වී වාරික අයකරන අවස්ථාවේදී හඳුනා ගනී. මෙම වගකීම් ශුද්ධ වාරික ක්‍රමය භාවිතයෙන් මනිනු ලබයි. භාවිතා කරන ලද ඇගයීම් උපකල්පන මත පදනම්ව අනාගත මුදල් ප්‍රවාහ සපුරාලීමට අවශ්‍ය විය හැකි අපේක්ෂිත අනාගත රක්ෂණ වාරිකවල වට්ටම් කළ වටිනාකම අඩුකළ අපේක්ෂිත අනාගත ප්‍රතිලාභවල වට්ටම් කළ වටිනාකමේ එකතුව ලෙස වගකීම තීරණය කරනු ලබයි.

මුදල් ප්‍රවාහ කාර්තුමය පදනමක් සහ වාර්ෂික පදනමක් මත IRCSL විසින් ලබාදුන් අනුපාත මත පදනම් වී වට්ටම් කෙරේ. ඇගයීම් උපකල්පන අහිතකර අපගමනවලට ඉඩ සලසන නියමිත අවදානම් රුචියක් සහිත හොඳම තක්සේරු අත්දැකීම මත පදනම්ව ඇගැයීම් උපකල්පන ව්‍යුත්පන්න කරනු ලබයි. සහභාගි නොවන වගකීම් අවදානම් රහිත ඉපයීම් භාවිතා කරමින් වට්ටම් කෙරේ.

සහභාගි රක්ෂණ ඔප්පු වගකීම්වල අගය, සහභාගි රක්ෂණ අරමුදල මට්ටමේදී ව්‍යුත්පන්න කරන ලද සහතික කළ ප්‍රතිලාභ වගකීමේ සහ මුළු ප්‍රතිලාභ වගකීමේ වටිනාකම් ඉහළ අගය වේ. සහතික කළ ප්‍රතිලාභ වගකීම ගණනය කිරීමේදී සහතික කළ ප්‍රතිලාභ පමණක් සැලකිල්ලට ගනු ලබන අතර අවදානම් රහිත පොලී අනුපාත ඵලදායී චක්‍රය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ වට්ටම් කරනු ලබයි. මුළු ප්‍රතිලාභ වගකීමට, සියලුම සහතික කළ සහ සහතික නොකළ ප්‍රතිලාභ ඇතුළත්වන අතර සහභාගි රක්ෂණ අරමුදල පදනම් ඵලදාව භාවිතා කරමින් මුදල් ප්‍රවාහ වට්ටම් කරනු ලබයි.

තවද, වර්තමානයේ ඉකුත් වී ගොස් ඇති ගිවිසුම් අනාගතයේදී සමාලෝචනය කිරීමේදී පැන නැගිය හැකි සුදුසු වගකීම් ග්‍රහණය කර ගැනීම සඳහා ගැළපීම් සිදු කරනු ලබයි.

SLFRS 4 අනුව - "රක්ෂණ ගිවිසුම්" අවශ්‍ය කරන පරිදි බාහිර ආයුග ණකවරයෙකුගේ සහය ඇතිව ජීවිත රක්ෂණ ගිවිසුම් වගකීම්වලට අදාළව වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂාවක් සමාගම විසින් සිදුකර ඇත. මෙම වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂාව සිදුකිරීමේදී හිමිකම් පරිහරණය හා රක්ෂණ ඔප්පු පරිපාලන වියදම්, රක්ෂණ ඔප්පුහිමි විකල්ප හා ඇප මෙන්ම එවැනි වගකීම්වල ආදේශක වත්කම්වලින් ලැබෙන ආයෝජන ආදායම් ඇතුළත් අනාගත ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහවල වර්තමාන ප්‍රශස්ථ ඇස්තමේන්තු භාවිතා කරනු ලබයි.

රක්ෂණ වෙන් කිරීම – ජීවිත නොවන රක්ෂණය

ජීවිත නොවන රක්ෂණවල වගකීම්වලට, වැය කරන ලද නමුත් වාර්තා නොකළ (IBNR) සහ වැය කරන ලද නමුත් ප්‍රමාණවත් තරම් වාර්තා නොකළ (IBNER), ඇතුළු නොපියවූ වගකීම් ප්‍රතිපාදන, නොඉපයූ රක්ෂණ වාරික සඳහා ප්‍රතිපාදන සහ රක්ෂණ වාරික ඌනතා සඳහා ප්‍රතිපාදන ඇතුළත් වේ.

නොඉපයූ වාරික සංචිත ඇගයීම, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ (එනම් දින 365 පදනම, පදනම් කරගෙන) මාර්ගෝපදේශ අනුව අගයනු ලබයි. එසේ වුවද, අවදානම් කාල සීමාව ගිවිසුම් කාල සීමාවෙන් සැළකිය යුතු තරම් වෙනස්වන ගිවිසුම් සඳහා, ලබා දී ඇති රක්ෂණ ආවරණයේ අගයට සමානුපාතිකව අවදානම් කාල සීමාවේදී වාරික උපයා ගනු ලබයි.

වැය කරන ලද නමුත් වාර්තා නොකළ (IBNR) සහ වැය කරන ලද නමුත් ප්‍රමාණවත් තරම් වාර්තා නොකළ (IBNER) වගකීම් සංචිතය ආයුගණකව ගණනය කරනු ලැබේ.

සමථකරණය හෝ විපත්තිකර සංචිත සඳහා ප්‍රතිපාදන හඳුනා නොගනී. හිමිකමකට ගෙවීමට ඇති බැඳීම කල් ඉකුත්වන, නිදහස් කරනු ලබන හෝ අවලංගු කරනු ලබන විට වගකීම් හඳුනා නොගනී.

SLFRS 4 අනුව – රක්ෂණ ගිවිසුම්වලට අවශ්‍ය පරිදි, බාහිර ආයුගණකවරයෙකුගේ සහය ඇතිව ජීවිත නොවන රක්ෂණ වගකීම්වලට අදාළව වගකීම් ප්‍රමාණාත්මතා පරීක්ෂාවක් සමාගම විසින් සිදුකරනු ලබයි.

3.5.12.2 හිමිකම් රක්ෂණ සංචිත

හිමිකම් රක්ෂණ ඔප්පුවලින් ඇතිවන විභව හිමිකම් සඳහා ගෙවීම් සිදුකිරීමට සමාගම විසින් හිමිකම් රක්ෂණ සංචිතය පවත්වාගෙන යනු ලබයි. සාමාන්‍යයෙන් හිමිකම් රක්ෂණ ඔප්පු වසර පහ හෝ ඊට වැඩි දිගු කාලසීමාවක් සඳහා නිකුත් කරනු ලබයි. පළමු වසරේ සිදුවන හිමිකම්වල විභවතාව ඉහළ වුවත් ඔප්පුවේ පළමු වසර තුළ කිසිදු ලාභයක් හඳුනා නොගනී. දෙවැනි වසරේ සිට ඉදිරියට, ලද වාරික ක්‍රමක්ෂය කරමින් ලාභය හඳුනා ගන්නා අතර සරල මාර්ගික ක්‍රමය භාවිතා කරමින් ඔප්පුවේ ඉතිරි කාලසීමාව පුරා බෙදාහරිනු ලැබේ. පළමු වසර සඳහා ලාභය දෙවැනි වසරේදී පමණක් හඳුනා ගන්නා අතර ඉන්පසුව නිරන්තරයෙන් හඳුනා ගනී.

නිකුත්කළ හිමිකම් රක්ෂණ ඔප්පුවක අනුරූප ණය කල්පිරීමට පෙර නිරවුල් කළහොත්, එකී ණය නිරවුල් කළ දිනයට ඉතිරිව ඇති එකී ඔප්පුවල සම්පූර්ණ වාරිකය අදාළ බැංකුව විසින් එය තහවුරු කිරීම මත ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී.

3.5.12.3 වෙන් කිරීම් (රක්ෂණ ගිවිසුම් හැර)

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමාගමට සහ සමූහයට නෛතික හෝ ප්‍රයෝජනවත් බැඳීමක් ඇති විට සහ වගකීම පියවා ගැනීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලා යාම අවශ්‍ය වන සහ එය විශ්වාසදායක ලෙස මැනිය හැකිනම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වෙන් කිරීම් හඳුනාගනී. රක්ෂණ ගිවිසුම් හැරුණු විට මුදල්වල කාල වටිනාකමේ වර්තමාන වෙලෙඳපොල තක්සේරුව සහ එම වගකීමට විශේෂිත අවදානම් පිළිබිඹු කරන පූර්ව බදු අනුපාතයකට අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙන් වෙන් කිරීම් තීරණය කරනු ලබයි.

3.6 බැඳීම් සහ අසම්භාව්‍ය බැරකම්

අසම්භාව්‍ය වගකීම් යනු සමාගමේ සහ සමූහයේ පාලනය යටතේ නොමැති අවිනිශ්චිත අනාගත සිදුවීම් සිදුවීමෙන් හෝ සිදු නොවීමෙන් පමණක් පැවැත්ම තහවුරු වන විය හැකි බැඳීම් වේ. නැතහොත් ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීම සිදුවිය නොහැකි හෝ විශ්වාසදායක ලෙස මැනිය නොහැකි වර්තමාන බැඳීම් වේ.

සමාගමේ සහ සමූහයේ ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්වල අනාවරණය කරනු ලබයි.

4TH FULL PROOF

3.7 බණ්ඩමය වාර්තාකරණය

මෙහෙයුම් බණ්ඩයක් යනු ව්‍යාපාර කටයුතුවල නිරතවන සමූහයේ එක් සංරචකයක් වන අතර එයින්, සමූහයේ අනෙකුත් කිසියම් සංරචකයක් සමඟ සිදු කරනු ලබන ගනුදෙනුවලට අදාළ ආදායම් සහ වියදම් ඇතුළුව ආදායම් ඉපයීම සහ වියදම් දැරීම සිදු කරයි. බණ්ඩවලට වෙන්කළ යුතු සම්පත් සම්බන්ධයෙන් තීරණ ගැනීමට සහ එහි කාර්යසාධනය තක්සේරු කිරීමට සහ ප්‍රශස්ථ මූල්‍ය තොරතුරු ලබාගැනීමට සැලැස්වීම සඳහා ප්‍රධාන විධායක නිලධාරි (CEO) විසින් සියලුම මෙහෙයුම් ප්‍රතිඵල නිතිපතා සමාලෝචනය කරනු ලබයි.

ප්‍රධාන විධායක නිලධාරිට වාර්තා කරනු ලබන බණ්ඩ ප්‍රතිඵලවලට බණ්ඩයකට සෘජුවම ආරෝපනය කළ හැකි අයිතම මෙන්ම සාධාරණ පදනම මත වෙන් කරනු ලැබිය හැකි අයිතම ඇතුළත් වේ. ඒ අනුව, සමූහයේ බණ්ඩමය තොරතුරු වලින් ජීවිත නොවන රක්ෂණ, ජීවිත රක්ෂණය, සොබ්‍ය ආරක්ෂාව, බලශක්ති සහ අනෙකුත් බණ්ඩ පිළිබිඹු කරයි. බණ්ඩ අතර මාරුකිරීම් සාධාරණ වෙළෙඳපොල මිළ ගණන් මත පදනම් වේ.

3.8 කොටසක ඉපයීම (EPS)

සමූහය එහි සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට කොටසකට මූලික සහ තනුක ඉපයීම් පිළිබඳ දත්ත ඉදිරිපත් කරයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 33 (LKAS 33) අනුව තීරණය කළ සාමාන්‍ය කොටස්වල සාමාන්‍ය බරතබන ලද ගණන මගින් සමූහයේ සාමාන්‍ය කොටස් හිමියන්ට හිමිවිය යුතු ලාභය හෝ අලාභය බෙදමින් කොටසකට මූලික ඉපැයීම් ගණනය කරනු ලබයි. කොටස්වල තනුක බලපෑම් කොටසක තනුක ඉපයීම් ගණනය කිරීමේදී සලකනු ලබයි.

3.9 යෝජිත ලාභාංශ

වාර්තාකරණ දිනට පසුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා කරනු ලබන ලාභාංශ වගකීමක් ලෙස හඳුනා නොගන්නා අතර මූල්‍ය ප්‍රකාශවලට සටහනක් ලෙස පමණක් අනාවරණය කරනු ලබයි. ලාභාංශය සඳහා වෙන් කිරීම් වාර්ෂික මහ සභා රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා කරනු ලැබ ඇති ලාභාංශය කොටස්හිමියන් විසින් අනුමත කළ කාලසීමාවේදී පමණක් හඳුනා ගනු ලබයි.

3.10 වාර්තා කරන දිනයෙන් පසු සිදුවීම්

වාර්තාකරණ කාල සීමාවෙන් පසු සිදුවීම් යනු හිතකර සහ අහිතකර සිද්ධීන් වුවද, එම සිද්ධීන් වාර්තාකරණ දිනය සහ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා බලය දෙන දිනය දක්වා කාල සීමාව තුළ ඇතිවන සිද්ධීන්ය. වාර්තාකරණ දිනයට පසුව සිදුවන සියලුම වැදගත් සිද්ධි සලකා බලනු ලැබ තිබෙන අතර අවශ්‍ය අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයේ අදාළ සටහන්වල ගැළපීම් හෝ අනාවරණ සිදු කරනු ලැබ ඇත. වැඩිදුර තොරතුරු සටහන 48හි ඇතුලත් වේ.

3.11 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 7 (LKAS-7), "මුදල් ප්‍රවාහ ප්‍රකාශනය" අනුකූලව මූදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කිරීමේ වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මූදල් ප්‍රකාශ සකස් කරනු ලැබ ඇත.

මූදල් ප්‍රවාහ අරමුණ සඳහා, මුදල් හා මුදලට සමාන දෑ බැංකු අයිරාවෙන් ශුද්ධව ඉදිරිපත් කරනු ලබයි.

4 නිකුත් කරන ලද නමුත් වාර්තාකරණ දිනයට බලාත්මක නොවූ ගිණුම්කරණ ප්‍රමිති

4.1 ගිණුම්කරණ ප්‍රමිතිවල වෙනස්වීම්

සමූහය පළමුවරට සමහර ප්‍රමිති සහා සංශෝධන යොදා ගෙන ඇති අතර ඒවා 2025 ජනවාරි 01 හෝ ඉන්පසුව ආරම්භවන වාර්ෂික කාලසීමා සඳහා බලාත්මක වේ.

ගිණුම්කරණ ප්‍රමිතිය	විස්තරය	බලාත්මක දිනය
LKAS 21 සංශෝධන විනිමය හුවමාරු අනුපාතවල වෙනසේ බලපෑම්	හුවමාරු කිරීමේ හැකියාවේ අඩුව	2025 ජනවාරි 01
SLFRS S1 – තිරසාරතාවයට අදාළ මූල්‍ය තොරතුරු අනාවරණය සඳහා පොදු අවශ්‍යතා	තීරණ ගැනීමේදී පොදු අරමුණු මූල්‍ය වාර්තාවල පරිශීලකයින්ට ප්‍රයෝජනවත් වන තිරසාරතාවයට අදාළ අවදානම් හා අවස්ථා පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම	2025 ජනවාරි 01
SLFRS S2 දේශගුණික – අදාළ අනාවරණ	තීරණ ගැනීමේදී පොදු අරමුණු මූල්‍ය වාර්තාවල පරිශීලකයින්ට ප්‍රයෝජනවත් වන දේශගුණයට අදාළ අවදානම් හා අවස්ථා පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම්	2025 ජනවාරි 01
SLFRS 9 සහ SLFRS 7	මූල්‍ය උපකරණ වර්ගීකරණය හා මැනීම	2026 ජනවාරි 01

4.2 නිකුත් කරන ලද නමුත් බලපෑමක් ඇතිවිය හැකි බලාත්මක නොවූ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරී ආයතනය පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ නව ප්‍රමිති නිකුත් කරනු ලැබ ඇති අතර මෙම ප්‍රමිති 2026 ජනවාරි 1 වන දින හෝ ඉන් පසුව හෝ ඊට පසු වෙනත් දිනයකින් ආරම්භවන මූල්‍ය කාලසීමාවක් සඳහා ඒවා අදාළ වේ.

නිකුත් කරන ලද නමුත් මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන දිනයට බලාත්මක නොවූ නව සහ සංශෝධිත ප්‍රමිති පහත දැක්වේ.

ගිණුම්කරණ ප්‍රමිතිය	විස්තරය	බලාත්මක දිනය
SLFRS 18 ට සංශෝධන	මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම සහ අනාවරණය	2027 ජනවාරි 01
SLFRS 19 ට සංශෝධන	පොදු වගකීම් නොමැති පරිපාලිත සමාගම්: අනාවරණ	2027 ජනවාරි 01
SLFRS 17 – රක්ෂණ ගිවිසුම්	වර්තමාන ඉටුකිරීමේ වටිනාකමට රක්ෂණ ගිවිසුම් වගකීම මැනීම සහ සියලු රක්ෂණ ගිවිසුම් සඳහා වඩාත් ඒකීය මිනුමක් සහ ඉදිරිපත් කිරීමේ ප්‍රවේශයක් ලබාදීම	2026 ජනවාරි 01

4.3 බණ්ඩමය තොරතුරු

බණ්ඩයක් යනු සමූහයේ කැපී පෙනෙන සංරචකයකි. බණ්ඩය අදාළ නිෂ්පාදන හෝ සේවා සැපයීමේ (ව්‍යාපාර අංශය) හෝ විශේෂිත ආර්ථික පරිසරයක් තුළ නිෂ්පාදන හෝ සේවා සැපයීමේ නියැලී සිටින අතර එය අනෙකුත් බණ්ඩවලින් වෙනස්වන අවදානම් සහ ප්‍රතිලාභවලට යටත් වේ. බණ්ඩමය වාර්තාකරණය සඳහා සමූහයේ මූලික ආකෘතිය ව්‍යාපාර බණ්ඩ මත පදනම් වේ. ව්‍යාපාර බණ්ඩ සමූහයේ කළමනාකරණය සහ අභ්‍යන්තර වාර්තාකරණ ව්‍යුහය මත පදනම් වී තීරණය කරනු ලබයි.

බණ්ඩමය ප්‍රතිඵල, වත්කම් සහ වගකීම්වලට බණ්ඩයකට සෘජුවම ආරෝපණය කළ හැකි අයිතම මෙන්ම සාධාරණ පදනමක් මත වෙන් කළ හැකි අයිතම ඇතුළත් වේ.

කළමනාකරණ අරමුණ සඳහා, සමූහය සිය නිෂ්පාදන සහ සේවා මත පදනම්ව ව්‍යාපාර ඒකකවලට සංවිධානය කර ඇති අතර වාර්තා කළ හැකි මෙහෙයුම් කොටස් පහත පරිදි වේ.

වාර්තාකළ හැකි ආරම්භක පැහැදිලි කිරීම අංශය	
ජීවිත රක්ෂණය	SLIC වෙන් කිරීමෙන් පසු ජීවිත රක්ෂණ ව්‍යාපාරය කරගෙන යාම සඳහා පිහිටුවන ලදී
ජීවිත නොවන රක්ෂණයෑ	SLIC වෙන් කිරීමෙන් පසු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය කරගෙන යාම සඳහා පිහිටුවන ලදී
සෞඛ්‍යාරක්ෂාව	සෞඛ්‍ය සේවා සහ රසායනාගාර සේවා සැපයීම සඳහා පිහිටුවන ලදී
ආගන්තුක සත්කාර	වාණිජ අරමුණු සඳහා කුලියට කාර්යාල අවකාශය සැපයීමට සහ ආගන්තුක සත්කාර වෙළඳාමේ නියැලීමට පිහිටුවන ලදී
බලශක්තිය	ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LPG) ආනයනය කිරීම, සැකසීම, ගබඩා කිරීම, බෙදා හැරීම සහ විකිණීම සහ අනෙකුත් අතුරු සේවා සැපයීම සඳහා පිහිටුවන ලදී.

5 මූල්‍යමය ආයෝජන

දෙසැම්බර් 31 දිනට	සටහන	සමූහය				සමාගම			
		2025		2024		2025		2024	
		ධාරණ අගය රු '000	සාධාරණ අගය රු '000	ධාරණ අගය රු '000	සාධාරණ අගය රු '000	ධාරණ අගය රු '000	සාධාරණ අගය රු '000	ධාරණ අගය රු '000	සාධාරණ අගය රු '000
මූල්‍ය ආයෝජන									
කල්පිරීමට තබා ඇති මූල්‍ය වත්කම් (HTM)/ක්‍රමක්ෂය පිරිවැය	5.1	**100,997,990**	**98,868,659**	82,805,116	83,506,647	–	–	–	–
ණය හා ලැබීම් (L හා R)/ ක්‍රමක්ෂය පිරිවැය	5.2	**47,501,234**	**47,501,234**	52,926,445	52,926,445	**6,940,469**	**6,940,469**	2,146,539	2,146,539
විකිණීමට සඳහා පවතින මූල්‍ය වත්කම්/FVOCI	5.3	**185,938,704**	**185,938,704**	160,387,039	160,387,039	**33,136,692**	**33,136,692**	41,085,639	41,085,639
ලාභ හෝ අලාභ තුළින් සාධාරණ වටිනාකමට (FVTPL) මූල්‍ය වත්කම්	5.4	**24,685,462**	**24,685,462**	20,278,447	20,278,447	**1,608,850**	**1,608,850**	2,010,130	2,010,130
(-) අපේක්ෂිත ණය අලාභ දීමනාව	5.4.1	–	–	–	–	**(1,508)**	**(1,508)**	–	–
මුළු මූල්‍ය ආයෝජන		**359,123,390**	**356,994,059**	316,397,047	317,726,678	**41,684,503**	**41,684,503**	45,242,308	45,242,308
5.1 කල්පිරීමට තබා ඇති (HTM) මූල්‍ය වත්කම්/ක්‍රමක්ෂය පිරිවැය									
භාණ්ඩාගාර බැඳුම්කර		**53,511,062**	**55,441,369**	62,077,643	62,359,174	–	–	–	–
ලැයිස්තුගත ණයකර		**47,486,928**	**43,427,290**	20,727,473	21,147,473	–	–	–	–
		100,997,990	**98,868,659**	82,805,116	83,506,647	–	–	–	–
5.2 ණය හා ලැබීම් (L and R)/ක්‍රමක්ෂය පිරිවැය									
ලැයිස්තුගත නොකළ ණයකර		**26,548,908**	**26,548,908**	29,544,425	29,544,425	–	–	–	–
නියෝජිත ණය		**571,570**	**571,570**	478,667	478,667	–	–	–	–
කාලීන තැන්පතු		**18,417,432**	**18,417,432**	20,718,817	20,718,817	**2,578,054**	**2,578,054**	2,146,539	2,146,539
කාර්ය මණ්ඩල ණය සහ ලැබීම්		**1,963,324**	**1,963,324**	2,184,536	2,184,536	–	–	–	–
වාණිජ පත්‍රිකා		–	–	–	–	**4,362,415**	**4,362,415**	–	–
සංවර්ධන බැඳුම්කර		–	–	–	–	–	–	–	–
		47,501,234	**47,501,234**	52,926,445	52,926,445	**6,940,469**	**6,940,469**	2,146,539	2,146,539

5.3 විකිණීම සඳහා තබා ඇති (AFS)/FVOCI

	සමූහය				සමාගම			
දෙසැම්බර් 31 දිනට	2025		2024		2025		2024	
සමාගම/සමූහය	ධාරණ අගය රු '000	සාධාරණ අගය රු '000	ධාරණ අගය රු '000	සාධාරණ අගය රු '000	ධාරණ අගය රු '000	සාධාරණ අගය රු '000	ධාරණ අගය රු '000	සාධාරණ අගය රු '000
ලැයිස්තුගත කොටස්	**62,775,884**	**62,775,884**	47,551,164	47,551,164	**33,130,758**	**33,130,758**	25,900,124	25,900,124
ලැයිස්තුගත නොකළ කොටස්	**5,934**	**5,934**	6,389,015	6,389,015	**5,934**	**5,934**	5,934	5,934
ඒකක භාර	**2,609,411**	**2,609,411**	2,808,088	2,808,088	**–**	**–**	–	–
ලැයිස්තුගත ණයකර	**18,884,933**	**18,884,933**	20,694,685	20,694,685	**–**	**–**	–	–
වාණිජ පත්‍රිකා	**27,732,390**	**27,732,390**	38,485,072	38,485,072	**–**	**–**	15,179,581	15,179,581
භාණ්ඩාගාර බැඳුම්කර	**73,930,152**	**73,930,152**	44,459,015	44,459,015	**–**	**–**	–	–
	185,938,704	**185,938,704**	160,387,039	160,387,039	**33,136,692**	**33,136,692**	41,085,639	41,085,639

5.4 ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය (FVTPL)

	සමූහය				සමාගම			
දෙසැම්බර් 31 දිනට	2025		2024		2025		2024	
	ධාරණ අගය රු '000	සාධාරණ අගය රු '000	ධාරණ අගය රු '000	සාධාරණ අගය රු '000	ධාරණ අගය රු '000	සාධාරණ අගය රු '000	ධාරණ අගය රු '000	සාධාරණ අගය රු '000
ලැයිස්තුගත කොටස්	**17,770,395**	**17,770,395**	16,284,581	16,284,581	**1,343,362**	**1,343,362**	2,010,130	2,010,130
භාණ්ඩාගාර බැඳුම්කර	**6,915,067**	**6,915,067**	3,993,866	3,993,866	**265,488**	**265,488**	–	–
	24,685,462	**24,685,462**	20,278,447	20,278,447	**1,608,850**	**1,608,850**	2,010,130	2,010,130

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය මත ආයෝජනය සහ විකිණීම සඳහා පවතින ආයෝජන සාධාරණ අගය මත මිනුම් කර ඇත.
කල් පිරීම සඳහා පවතින ආයෝජන සහ ණය හා ලැබිය හැකි මුදල් ක්‍රමක්ෂය පිරිවැය මත මිනුම් කර ඇත.

5.4.1 අපේක්ෂිත ණය අලාභ දීමනාව

	සමූහය		සමාගම	
	2025 රු '000	2024 රු '000	2025 රු '000	2024 රු '000
වාණිජ පත්‍රිකා	**–**	–	**1,177**	–
ස්ථාවර තැන්පතු	**–**	–	**331**	–
	–	–	**1,508**	–

**SLFRS 9යොදා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ආයෝජන සඳහා හැර මූල්‍ය ආයෝජන නැවත වර්ගීකරණය කර නොමැත.*

කල්පිරීමේ විස්තරය සඳහා 43.5.1 බලන්න

5.5 මූල්‍ය ආයෝජනවල ධාරණ අගයන් හී වෙනස්වීම

සමාගම	විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් රු '000	ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් රු '000	කල් පිරීම සඳහා පවතින මූල්‍ය වත්කම් රු '000	ණය හා ලැබීම් රු '000	එකතුව රු '000
2025 ජනවාරි 01 දිනට	**41,085,639**	**2,010,130**	**–**	**2,146,539**	**45,242,308**
SLFRS 9 හේතුවෙන් වර්ගීකරණ වෙනස	**(15,179,581)**	**–**	**–**	**15,179,581**	**–**
SLFRS 9 පරිදි අපේක්ෂිත ණය අලාභ දීමනාවේ ආරම්භක ගැලපීම	**–**	**–**	**–**	**(4,403)**	**(4,403)**
මිලදී ගැනීම්	**–**	**250,000**	**–**	**6,385,727**	**6,635,727**
කල්පිරීම්	**–**	**–**	**–**	**(15,926,801)**	**(15,926,801)**
බැහැර කිරීම්	**–**	**(853,546)**	**–**	**–**	**(853,546)**
වෙනත් විස්තීර්ණ ආදායමෙහි වාර්තාකළ සාධාරණ අගයේ ලාභය	**7,230,634**	**–**	**–**	**–**	**7,230,634**
උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ/(අලාභ)	**–**	**20,858**	**–**	**–**	**20,858**
ආදායම් ප්‍රකාශයට හඳුනාගත් පොලී ආදායම	**–**	**–**	**–**	**1,225,544**	**1,225,544**
SLFRS 9 පරිදි අපේක්ෂිත ණය අලාභ දීමනාව කපා හැරීම	**–**	**–**	**–**	**2,894**	**2,894**
ආදායම් ප්‍රකාශය තුළ ලාභ	**–**	**181,407**	**–**	**–**	**181,407**
පොලිය/කුපන් ලැබීම්	**–**	**–**	**–**	**(2,070,120)**	**(2,070,120)**
2025 දෙසැම්බර් 31 දිනට	**33,136,692**	**1,608,849**	**–**	**6,938,961**	**41,684,502**
2024 ජනවාරි 01 දිනට	102,644,036	16,592,639	72,571,730	59,300,583	251,108,987
වෙන් කිරීමේ මාරු කිරීම්	(92,108,553)	(13,984,125)	(69,535,415)	(49,782,390)	(225,410,483)
මිලදී ගැනීම්	19,590,144	590,171	–	2,674,285	22,854,600
කල්පිරීම්	(250,000)	–	(2,900,000)	(1,726,200)	(4,876,200)
බැහැර කිරීම්	–	(1,746,527)	–	(6,874,409)	(8,620,936)
වෙනත් විස්තීර්ණ ආදායමෙහි වාර්තාකළ සාධාරණ අගයේ ලාභය	(1,901,798)	–	–	19,343	(1,882,455)
උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ/(අලාභ)	12,727,026	705,804	–	–	13,432,830
ක්‍රමක්ෂය ගැලපීම	40,003	–	2,130	–	42,133
ලාභය	–	209,706	–	–	209,706
ආදායම් ප්‍රකාශයට හඳුනාගත් පොලී ආදායම	536,766	–	679,855	1,614,018	2,830,639
විදේශ විනිමය ගනුදෙනු පරිවර්තන ගැලපීම්	(40,173)	(13,325)	–	(77,786)	(131,284)
පශ්චාත් වෙන් කිරීමේ ගැලපීම්	–	103,673	–	(103,673)	–
පොලිය/කුපන් ලැබීම්	(151,812)	(447,886)	(818,300)	(2,897,232)	(4,315,230)
2024 දෙසැම්බර් 31 දිනට	41,085,639	2,010,130	–	2,146,539	45,242,308

5. මූල්‍ය ආයෝජන (ඉතිරි කොටස)

5.5. මූල්‍ය ආයෝජනවල ධාරණ අගයන් හී වෙනස්වීම (ඉතිරි කොටස)

සමූහය	විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් රු '000	ලාභය හෝ අලාභය තුළින සාධාරණ අගයට මූල්‍ය වත්කම් රු '000	කල් පිරීම සඳහා පවතින මූල්‍ය වත්කම් රු '000	ණය හා ලැබීම් රු '000	එකතුව රු '000
2025 ජනවාරි 01 දිනට	**160,387,039**	**20,278,447**	**82,805,116**	**52,926,445**	**316,397,047**
SLFRS 9 හේතුවෙන් වර්ගීකරණ වෙනස	**(15,179,581)**	**–**	**–**	**15,179,581**	**–**
වෙන් කිරීමේ මාරු කිරීම්	**–**	**–**	**–**	**–**	**–**
වෙන් කිරීමේ අවස්ථාවේදී සත්‍ය වත්කම් වෙන්කිරීම මත බලපෑම	**–**	**–**	**–**	**–**	**–**
මිලදී ගැනීම්	**61,152,910**	**6,537,360**	**26,846,184**	**22,094,025**	**116,630,479**
කල්පිරීම්	**(25,679,569)**	**–**	**(6,521,375)**	**(35,719,513)**	**(67,920,457)**
බැහැර කිරීම්	**(8,279,480)**	**(5,087,281)**	**(3,305,869)**	**–**	**(16,672,630)**
නැවත වර්ගීකරණය	**4,362,415**	**–**	**–**	**(4,362,413)**	**2**
වෙනත් විස්තීර්ණ ආදායමෙහි වාර්තාකළ ශුද්ධ සාධාරණ අගයේ ලාභය	**3,530,992**	**–**	**–**	**–**	**3,530,992**
වෙනත් විස්තීර්ණ ආදායමෙහි වාර්තාකළ සාධාරණ අගයේ ලාභය	**5,393,838**	**–**	**–**	**–**	**5,393,838**
උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ/(අලාභ)	**889,520**	**186,767**	**110,795**	**–**	**1,187,081**
උපලබ්ධි නොවූ ලාභ/(අලාභ)	**–**	**2,286,619**	**–**	**–**	**2,286,619**
ණයකර සඳහා ලද පොලී පරතරය	**–**	**–**	**(31,709)**	**–**	**(31,709)**
ලාභය හෝ අලාභය තුළ වාර්තාකළ සාධාරණ අගයේ ලාභය සහ විදේශ විනිමය පරිවර්තනයී	**102,946**	**302,142**	**–**	**174,435**	**579,523**
සාධාරණ අගයේ ගැලපීම	**–**	**–**	**–**	**(30,898)**	**(30,898)**
උපචිත පොලියේ ශුද්ධ වෙනස	**(182,973)**	**–**	**205,272**	**(67,208)**	**(44,909)**
ක්‍රමක්ෂය ගැලපීම	**42,522**	**–**	**1,286**	**–**	**43,809**
ආදායම් ප්‍රකාශයට හඳුනාගත් පොලී ආදායම	**10,468,489**	**–**	**9,789,078**	**5,016,935**	**25,274,502**
විදේශ විනිමය ගනුදෙනු ගැලපීම්	**36,684**	**–**	**–**	**64,693**	**101,377**
අපේක්ෂිත ණය අලාභ දීමනාව	**–**	**–**	**–**	**–**	**–**
ආදායම් ප්‍රකාශය තුළ ලාභ	**–**	**181,407**	**–**	**–**	**181,407**
පොලිය/කුපන් ලැබීම්	**(11,107,048)**	**–**	**(8,900,789)**	**(7,774,847)**	**(27,782,684)**
2025 දෙසැම්බර් 31 දිනට	**185,938,704**	**24,685,461**	**100,997,990**	**47,501,234**	**359,123,389**
2024 ජනවාරි 01 දිනට	102,644,036	16,592,639	72,571,730	66,276,591	258,084,995
වෙන් කිරීමේ අවස්ථාවේදී සත්‍ය වත්කම් වෙන්කිරීම මත බලපෑම	3,722	(94,184)	–	94,184	3,722
මිලදී ගැනීම්	35,259,065	1,551,354	15,023,597	20,288,967	72,122,983
කල්පිරීම්	(2,761,974)	–	(5,250,018)	(23,837,609)	(31,849,601)
බැහැර කිරීම්	(7,009,127)	(572,499)	–	(6,874,409)	(14,456,035)
නැවත වර්ගීකරණය	–	–	–	179,221	179,221
දායකත්ව හිමිකම ක්‍රියාත්මක කිරීම (හිමිකම් නිකුතුව)	747,755	27	–	–	747,782
වෙනත් විස්තීර්ණ ආදායමෙහි වාර්තාකළ සාධාරණ අගයේ ලාභය	8,662,255	–	–	19,343	8,681,598
උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ/(අලාභ)	12,728,181	2,127,146	–	–	14,855,327
ලාභය හෝ අලාභය තුළ වාර්තාකළ සාධාරණ අගයේ ලාභය සහ විදේශ විනිමය පරිවර්තනය	–	821,796	–	(215,052)	606,744
සාධාරණ අගයේ ගැලපීම	–	–	–	87,988	87,988
උපචිත පොලියේ ශුද්ධ වෙනස	346,627	–	(69,769)	(148,544)	128,314
ක්‍රමක්ෂය ගැලපීම	31,410	–	8,758	–	40,168
ලාභය	–	209,706	–	–	209,706
ආදායම් ප්‍රකාශයට හඳුනාගත් පොලී ආදායම	8,907,054	–	8,107,936	6,435,631	23,450,621
විදේශ විනිමය ගනුදෙනු ගැලපීම්	(78,074)	(13,325)	–	(163,933)	(255,332)
කැන්විල් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි ආයෝජනය	6,383,081	–	–	–	6,383,081
පශ්චාත් වෙන් කිරීමේ ගැලපීම්	–	103,673	–	(103,673)	–
පොලිය/කුපන් ලැබීම්	(5,476,972)	(447,886)	(7,587,118)	(9,112,260)	(22,624,236)
2024 දෙසැම්බර් 31 දිනට	160,387,039	20,278,447	82,805,116	52,926,445	316,397,047

6 අනුබද්ධිත සමාගම්වල ආයෝජන

දෙසැම්බර් 31 දිනට	අනු සටහන	සමාගම 2025 රු '000	සමාගම 2024 රු '000
පිරිවැයට			
ලැයිස්තුගත අනුබද්ධිත සමාගම්	6.1	**12,297,588**	2,764,196
ලැයිස්තුගත නොකළ අනුබද්ධිත සමාගම්	6.2	**37,160,338**	37,160,338
		49,457,926	39,924,534

6.1 ලැයිස්තුගත අනුබද්ධිත සමාගම්

	2025				2024			
	කොටස් සංඛ්‍යාව	මව් සමාගම සතු අයිතිය %	පිරිවැය රු '000	සාධාරණ අගය රු '000	කොටස් සංඛ්‍යාව	මව් සමාගම සතු අයිතිය %	පිරිවැය රු '000	සාධාරණ අගය රු '000
ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පීඑල්සී	**114,861,951**	**51.34**	**12,297,588**	**12,297,588**	114,861,951	51.34	2,764,196	9,081,453
			12,297,588	**12,297,588**			2,764,196	9,081,453

**SLFRS 9යොදා ගැනීම මත – මූල්‍ය උපකරණ, සමාගම SLFRS 9 ට අනුකූලව ලැයිස්තුගත අනුබද්ධිත සමාගමේ තම ආයෝජනය සාධාරණ අගයට මැනීමට තෝරාගෙන ඇත. ඒ අනුව, ලැයිස්තුගත අනුබද්ධිත සමාගමේ ආයෝජනය SLFRS 9 හි අවශ්‍යතාවයන්ට අනුකූලව වාර්තා කරන දිනයට සාධාරණ අගයට සිදු කෙරේ.*

6.2 ලැයිස්තුගත නොකළ අනුබද්ධිත සමාගම්

	2025			2024		
	කොටස් සංඛ්‍යාව	මව් සමාගම සතු අයිතිය %	ධාරණ අගය රු '000	කොටස් සංඛ්‍යාව	මව් සමාගම සතු අයිතිය %	ධාරණ අගය රු '000
දෙසැම්බර් 31 දිනට						
ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ්	**35,976,853**	**99.94**	**3,510,063**	35,976,853	99.94	3,510,063
ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්	**158,710,945**	**100.00**	**5,280,188**	158,710,945	100.00	5,280,188
මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (ප්‍රයිවට්) ලිමිටඩ්	**5**	**100.00**	**–**	5	100.00	–
කැන්විල් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	**–**	**0.00**	**–**	–	0.00	–
කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවට්) ලිමිටඩ්	**87,008,686**	**100.00**	**870,087**	87,008,686	100.00	870,087
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්	**1,400,000,000**	**100.00**	**15,000,000**	1,400,000,000	100.00	15,000,000
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්	**1,250,000,000**	**100.00**	**12,500,000**	1,250,000,000	100.00	12,500,000
			37,160,338			37,160,338

6.2.1 කැන්විල් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ඉවත් කිරීම

වසර තුළ, සමූහය ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ් විසින් දරන ලද කැන්විල් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි සිය ඉතිරි 23.98% ක හිමිකාරිත්වය මහා භාණ්ඩාගාරය වෙත පවරන ලදී.

මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිෂ්ඨාව	5,000,000
ආයෝජනයේ ධාරණ අගය	(6,383,081)
ඉවත් කිරීමේ අලාභය	(1,383,081)

6.3 ප්‍රධාන අනුබද්ධිත සමාගම්වල සමූහයේ අයිතිය

NCI විසින් දරනු ලබන සමූහයේ සංයුතිය සහ හිමිකාරිත්වයේ ප්‍රමාණය පහත දැක්වෙන වගුවේ අනාවරණය වේ.

සමාගම	ප්‍රධාන ක්‍රියාකාරකම්	අයත් කොටස් වර්ගය	සමූහ අයිතිය		පාලනය නොවන අයිතිය	
			2025 %	2024 %	2025 %	2024 %
ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පීඑල්සී	සෞඛ්‍යාරක්ෂාව සහ රසායනාගාර සේවා	සාමාන්‍ය	**51.34**	51.34	**48.66**	48.66
ලංකා හොස්පිටල්ස් ඩයනොස්ටික්ස් ලිමිටඩ්	සෞඛ්‍යාරක්ෂාව සහ රසායනාගාර සේවා	සාමාන්‍ය	**51.34**	51.34	**48.66**	48.66
ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ්	ද්‍රව පෙට්ට්‍රෝලියම් ගෑස් (LPG) ආනයනය, සැකසීම, ගබඩා කිරීම, බෙදා හැරීම, විකිණීම සහ වෙනත් ආනුෂාංගික සේවා සැපයීම	සාමාන්‍ය	**99.94**	99.94	**0.06**	0.06
ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්	ද්‍රව පෙට්ට්‍රෝලියම් ගෑස් සඳහා තොග ගබඩා පහසුකම් සැපයීම	සාමාන්‍ය	**100.00**	100.00	**0.00**	0.00
කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවට්) ලිමිටඩ්	හෝටල් ව්‍යාපාර	සාමාන්‍ය	**100.00**	100.00	**0.00**	0.00
මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (ප්‍රයිවට්) ලිමිටඩ්	කළමනාකරණ සේවා	සාමාන්‍ය	**100.00**	100.00	**0.00**	0.00
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්	රක්ෂණය	සාමාන්‍ය	**100.00**	100.00	**0.00**	0.00
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්	රක්ෂණය	සාමාන්‍ය	**100.00**	100.00	**0.00**	0.00

6.4 පාලනය නොවන අයිතිය

6.4.1 වැදගත් පාලනය නොවන අයිතිය සහිත අනුබද්ධිත සමාගම්

පහත වගුවෙන් සමූහයට වැදගත් පාලනය නොවන අයිතියක් ඇති සමූහයේ අනුබද්ධිත සමාගම්වලට අදාළ තොරතුරු සාරාංශ කෙරේ. ප්‍රමාණාත්මක සහ ගුණාත්මක පදනමින් ව්‍යාපාර සමූහයට අදාළ කිසියම් පාලනය නොවන අයිතියක් සමූහය විසින් හඳුනාගෙන ඇත.

අනුබද්ධිත සමාගමේ නම	ද ලංකා හොස්පිටල්ස් කොපරේෂන් පීඑල්සී රු '000	ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ් රු '000
NCI හිමිකාර අයිතිය	48.66%	0.06%
සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය		
ජංගම නොවන වත්කම්	7,327,729	21,624,758
ජංගම වත්කම්	13,086,850	28,300,054
ජංගම නොවන වගකීම්	(1,889,443)	(14,116,247)
ජංගම වගකීම්	(3,150,804)	(11,872,749)
ශුද්ධ වත්කම්	15,374,332	23,935,817
NCI ට ආරෝපනය කළ හැකි ශුද්ධ වත්කම් (අන්තර සමූහ ඉවත්කිරීම්වලට පෙර)	7,481,297	15,390
සාරාංශගත විස්තීරණ ආදායම් ප්‍රකාශය		
ආදායම	14,473,921	94,451,315
වසර සඳහා ලාභය	1,944,368	5,507,580
අනෙකුත් විස්තරාත්මක ආදායම්/(වියදම්)	34,632	1,916,116
මුළු විස්තීරණ ආදායම්	1,979,000	7,423,696
NCI ට වෙන් කළ ලාභය	946,148	2,652
NCI ට වෙන්කළ වෙනත් විස්තීරණ ආදායම්	16,852	1,232

4TH FULL PROOF

6. අනුබද්ධිත සමාගම්වල ආයෝජන (ඉතිරි කොටස)
6.4. පාලනය නොව අයිතිය (ඉතිරි කොටස)

අනුබද්ධිත සමාගමේ නම	ද ලංකා හොස්පිටල්ස් කොපරේෂන් පීඑල්සී රු '000	ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ් රු '000
සාරාංශගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය		
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්/(භාවිතා කරන ලද) මුදල් ප්‍රවාහ	2,472,463	15,085,219
ආයෝජන ක්‍රියාකාරකම් වලින්/(භාවිතා කරන ලද) මුදල් ප්‍රවාහ	(1,896,518)	3,214,030
මූල්‍ය ක්‍රියාකාරකම් වලින්/(භාවිතා කරන ලද) මුදල් ප්‍රවාහ	(454,904)	(830,608)
මුදල් හා මුදලට සමාන දේවල ශුද්ධ වැඩිවීම	121,040	17,468,641

6.4.2 පාලනය නොවන අයිතියේ වෙනස්වීම

දෙසැම්බර් 31 දිනට	සමූහය	
	2025 රු '000	2024 රු '000
වසර ආරම්භයේදී ශේෂය	**7,422,979**	13,233,465
වසර සඳහා ලාභය	**948,800**	621,359
අනෙකුත් විස්තීරණ ආදායම බද්දෙන් ශුද්ධ	**18,084**	(37,717)
වසර සඳහා NCI වෙත ගෙවන ලද ලාභාංශ	**(381,046)**	(482)
NCI හා අනුබද්ධිත ආයතනයන් සඳහා බැහැර කිරීම	**–**	(6,393,646)
වසර අවසානයේදී ශේෂය	**8,008,817**	7,422,979

7 ආශ්‍රිත සමාගම්වල ආයෝජන

සමූහය/සමාගම	2025				2024			
	කොටස් සංඛ්‍යාව	මවී සමාගම සතු අයිතිය %	ධාරණ අගය රු '000	සාධාරණ අගය රු '000	කොටස් සංඛ්‍යාව	මවී සමාගම සතු අයිතිය %	ධාරණ අගය රු '000	සාධාරණ අගය රු '000
සීබෑන්ක් ඇසට් මැනේජ්මන්ට් ලිමිටඩ්	**759,998**	**26.57**	**191,295**	**199,169**	759,998	26.57	191,295	191,295
සිලෝන් ඇසට් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්	**1,250,000**	**18.95**	**7,378**	**15,036**	1,250,000	18.95	7,378	7,378
			198,673	**198,673**			198,673	198,673

**ඉහත ආයෝජන මනිනු ලබන්නේ (විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව) ආයෝජකයාගේ ශුද්ධ වත්කම් වටිනාකමෙන් (NAV) SLIC කොටස් මත වන අතර වටිනාකම්වල වෙනස්කම් වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. සමූහයේ බදු ගෙවීමෙන් පසු ලාභය හෝ EPS හෝ මුදල් මත සැලකිය යුතු බලපෑමක් නොමැත.*

8 දේපළ, පිරියත හා උපකරණ

8.1 සමූහය

දෙසැම්බර් 31 දිනට	සටහන	2025 රු '000	2024 රු '000
ධාරණ අගය		**49,964,620**	41,350,026
නොනිමි වැඩ	8.1.3	**480,643**	566,814
		50,445,263	41,916,840

8. දේපළ, පිරියත හා උපකරණ (ඉතිරි කොටස)

8.1. සමූහය (ඉතිරි කොටස)

දෙසැම්බර් 31 දිනට	ඉඩම්	සින්නක්කර ඉඩම් තුල ඉදිකරන ලද ගොඩනැගිලි	කල්බදු ඉඩම් තුල ඉදිකරන ලද ගොඩනැගිලි	උපකරණ	ලීබඩු හා සවිකිරීම්	මෝටර් රථ
	රු '000	රු '000	රු '000	රු '000	රු '000	රු '000
පිරිවැය/ඇගයීම						
2025 ජනවාරි 01 දිනට ශේෂය	16,673,441	3,693,891	3,313,022	7,742,782	1,304,354	1,059,539
වසර තුළ එකතු කිරීම්	–	69,699	12,056	916,026	84,823	–
ප්‍රත්‍යාගණනය	1,855,781	292,616	–	–	–	388,485
ප්‍රත්‍යාගණන වත්කම් මත සමුච්චිත ක්ෂයකිරීම් මාරු කිරීම	–	(115,359)	–	1,846	(4,686)	(219,960)
අනුබද්ධිත සමාගම්වල බැහැර කිරීමට අදාළ දේපළ, පිරියත වටිනාකම	–	–	–	–	–	–
බැහැර කිරීම්	–	–	–	(29,828)	(4,988)	–
වසර තුළ මාරු කිරීම්	–	(851)	–	55,274	3,159	–
පිරිවැයට කරන ලද ගැලපුම්	–	–	–	–	–	–
භාවිතයට අයිතිය ඇති වත්කර මාරු කිරීම්	–	–	–	–	–	–
නොනිමි වැඩවලින් මාරු කිරීම්	–	180,563	–	6,046	345	–
2025 දෙසැම්බර් 31 දිනට ශේෂය	18,529,222	4,120,559	3,325,078	8,692,146	1,383,007	1,228,064
සමුච්චිත ක්ෂය කිරීම						
2025 ජනවාරි 01 දිනට ශේෂය	–	557,069	8,211	4,416,625	764,085	353,782
වසර තුළ ක්ෂයකිරීමේ ගාස්තුව	–	172,636	159,977	655,616	108,484	274,758
අනුබද්ධිත සමාගම්වල බැහැර කිරීමට අදාළ දේපළ, පිරියත වටිනාකම	–	–	–	–	–	–
ප්‍රත්‍යාගණන වත්කම් මත සමුච්චිත ක්ෂයකිරීම් මාරු කිරීම	–	(115,359)	–	1,846	(4,686)	(219,960)
බැහැර කිරීම්	–	–	–	(24,761)	(4,921)	–
සමුච්චිත ක්ෂයකිරීමට ගැලපීම	–	(851)	–	909	–	–
භාවිතයට අයිතිය ඇති වත්කර මාරු කිරීම්	–	–	–	–	–	–
ප්‍රත්‍යාගණනය	–	–	–	–	–	–
2025 දෙසැම්බර් 31 දිනට ශේෂය	–	613,495	168,188	5,050,235	862,962	408,580
ශුද්ධ පොත් අගය						
2024 දෙසැම්බර් 31 දිනට	16,673,441	3,136,822	3,304,811	3,326,157	540,269	705,757
2025 දෙසැම්බර් 31 දිනට	18,529,222	3,507,064	3,156,890	3,641,911	520,045	819,484

8.1.1 ඉඩම්

ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පීඑල්සී – ප්‍රත්‍යාගණන මුදලට

ස්ථානය	ප්‍රමාණය (පර්චස්)	තක්සේරු කළ ක්‍රමය	දේපළ තක්සේරුකරු
හත්බෝධිය, කිරුල පාර, නාරාහේන්පිට, කොළඹ 05	10.35	විවෘත වෙළෙඳපොල ඇගයීම් ක්‍රමය	ඒ ඒ එම් ෆාතිහු මහතා (FIV), වරලත් තක්සේරුකරු
හත්බෝධිය, කිරුල පාර, නාරාහේන්පිට, කොළඹ 05	10.00	විවෘත වෙළෙඳපොල ඇගයීම් ක්‍රමය	ඒ ඒ එම් ෆාතිහු මහතා (FIV), වරලත් තක්සේරුකරු

4TH FULL PROOF

විදුලිජනක යන්ත්‍ර මගී සෝපාන	වැද්දුම් සහ සවිකිරීම්	වායු සම්කරණ යන්ත්‍ර	පිරියත හා යන්ත්‍ර	ගබඩා, ටැංකි, පොම්ප කල, නළ මාර්ග සහ පොම්පාගාර	එල්පී ගෑස් සිලින්ඩර්	වෙනත්	එකතුව 2025	එකතුව 2024
රු '000	රු '000	රු '000	රු '000	රු '000	රු '000	රු '000	රු '000	රු '000
102,358	5,211	210,581	2,263,569	3,849,953	18,649,158	705,326	**59,573,185**	60,970,504
34,433	–	12,720	–	–	–	47,001	**1,176,758**	1,712,476
–	–	–	1,142,937	4,859,962	–	–	**8,539,781**	4,124,465
–	–	–	(577,462)	(2,786,412)	9,012	–	**(3,693,021)**	(490,466)
–	–	–	–	–	–	–	**–**	(8,348,975)
–	–	–	–	–	(3,926)	(3,970)	**(42,712)**	(155,758)
–	–	–	(77,463)	19,929	–	–	**48**	–
–	–	–	–	–	–	–	**–**	–
–	–	–	–	–	–	–	**–**	–
–	–	–	67,709	21,966	1,577,069	–	**1,853,698**	1,760,939
136,791	5,211	223,301	2,819,290	5,965,398	20,231,313	748,357	**67,407,737**	59,573,185
46,474	378	92,997	659,541	1,260,510	9,625,307	438,180	**18,223,159**	16,869,205
13,196	1,661	27,866	236,329	462,191	760,400	76,692	**2,949,806**	2,249,286
–	–	–	–	–	–	–	**–**	(4,998)
–	–	–	(577,462)	(2,786,412)	9,012	–	**(3,693,021)**	(490,466)
–	–	–	–	–	(3,901)	(3,292)	**(36,875)**	(90,306)
–	–	–	–	(10)	–	–	**48**	–
–	–	–	–	–	–	–	**–**	–
–	–	–	–	–	–	–	**–**	(309,562)
59,670	2,039	120,863	318,408	(1,063,721)	10,390,818	511,580	**17,443,117**	18,223,159
55,884	4,833	117,584	1,604,028	2,589,443	9,023,851	267,146	**–**	41,350,026
77,121	3,172	102,438	2,500,882	7,029,119	9,840,495	236,777	**49,964,620**	–

තක්සේරුව බලාත්මක දිනය	නිරීක්ෂණය කළ නොහැකි වැදගත් යෙදවුම්	2025 දෙසැම්බර් 31 දිනට ධාරණ අගය රු '000	ප්‍රත්‍යාගණන අතිරික්තය රු '000	පිරිවැයට ධාරණ අගය රු '000
2024 දෙසැම්බර් 31	පර්චසයක තක්සේරු මිල රු. 6,325,000.00	53,402,948	46,934,502	6,468,447
2024 දෙසැම්බර් 31	පර්චසයක තක්සේරු මිල රු. 6,325,000.00	51,597,052	45,347,345	6,249,706
		105,000,000	92,281,847	12,718,153

8.1.2 කල්බදු ඉඩම මත ගොඩනැගිලි

දේපළ, පිරියත හා උපකරණවල තක්සේරු කිරීමේ විස්තර

ද ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පීඑල්සී

සමාගමේ කල්බදු ඉඩම මත ඉදිකළ ගොඩනැගිල්ල වර්තමාන ප්‍රතිෂ්ඨාපන පිරිවැය පදනම මත 2024 දෙසැම්බර් අදාළ ස්ථානයේදී දේපළ තක්සේරුව පිළිබඳ සුදුසු පළපුරුද්ද සහිත ස්වාධීන වරලත් තක්සේරුකරුවෙක් වන ඒ ඒ එම් ෆාතිහු මහතා (MRICS) විසින් තක්සේරු කරන ලදී.

සමාගමේ සින්නක්කර ඉඩම වර්තමාන වෙළෙඳපොල වටිනාකම පදනම මත 2024 දෙසැම්බර් වරලත් තක්සේරුකරුවෙක් වන ඒ ඒ එම් ෆාතිහු මහතා (MRICS) විසින් තක්සේරු කරන ලදී.

ස්ථානය	දේපළ ස්වභාවය	තක්සේරු ක්‍රමය	තක්සේරුවේ බලාත්මක දිනය	දේපළ තක්සේරුකරු	නිරීක්ෂණය කළ නොහැකි වැදගත් යෙදවුම්	2025 දෙසැම්බර් 31 දිනට ධාරණ අගය රු.	වත්කම පිරිවැයට ගෙන ගියේනම් සමුච්චිත ක්ෂයකිරීම රු.	ශුද්ධ ධාරණ අගය රු.
අංක 578, ඇල්විටිගල මාවත, කොළඹ 05	ගොඩනැගිල්ල	වර්තමාන ප්‍රතිස්ථාපන පිරිවැය පදනම	2025 දෙසැම්බර් 31	ඒ ඒ එම් ෆාතිහු මහතා වරලත් තක්සේරුකරු	වර්ග අඩියට ඇස්තමේන්තු වටිනාකම රු.7,500 – 17,500	**2,176,166,580**	599,867,756	1,576,298,823

8.1.3 නොනිමි ප්‍රාග්ධනය

දෙසැම්බර් 31 දිනට	සමූහය		සමාගම	
	2025 රු '000	2024 රු '000	2025 රු '000	2024 රු '000
වසර ආරම්භයේදී	**566,814**	30,707,140	–	–
වසර තුළදී දරන ලද පිරිවැය	**1,670,775**	1,097,988	–	–
වසර තුළදී ප්‍රාග්ධනීකරණය කළ මුදල	**(1,756,946)**	(1,628,986)	–	–
වත්කම් ප්‍රත්‍යාගණනය	–	(1,075,635)	–	–
අනුබද්ධිත සමාගම බැහැර කිරීම	–	(28,533,693)	–	–
වසර අවසානයේදී	**480,643**	566,814	–	–

4TH FULL PROOF

8.1.4 දේපළ, පිරියත හා උපකරණ හානිකරණය

සමාගම 2025 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණවල විභව හානිකරණය තක්සේරු කර ඇත. තක්සේරුව මත පදනම් වී, දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් වාර්තාකරන දිනයට මූල්‍ය ප්‍රකාශවල හානිකරණ වෙන් කිරීම් සිදුකිරීමට අවශ්‍ය නොවීය.

8.1.5 පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම්

ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පීඑල්සී

2025 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත සහ උපකරණවලට රුපියල් බිලියන 3.05ක (2024 - බි.2.61) ක දළ ධාරණ අගයක් (පිරිවැය) සහිත පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම් ඇතුළත් විය.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්

වාර්තාකරණ දිනයට භාවිතයෙහි පවතින පූර්ණ වශයෙන් ක්ෂය වූ දේපළ, පිරියත සහ උපකරණවල මූලික පිරිවැය පහත පරිදි වේ:

වත්කම් පන්තිය	2025 රු '000	2024 රු '000
ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	**81,610**	81,563
කාර්යාල හා වෙනත් උපකරණ	**20,299**	19,395
මෝටර් රථ	**31,010**	–
පරිගණක උපාංග	**104,683**	112,519
එකතුව	**237,602**	213,477

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්

වාර්තාකරණ දිනයට භාවිතයෙහි පවතින පූර්ණ වශයෙන් ක්ෂය වූ දේපළ, පිරියත සහ උපකරණවල මූලික පිරිවැය පහත පරිදි වේ:

වත්කම් පන්තිය	2025 රු '000	2024 රු '000
මෝටර් රථ	**18,000**	–
ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	**83,989**	42,256
කාර්යාල හා වෙනත් උපකරණ	**856**	856
පරිගණක උපාංග	**201,033**	98,970
එකතුව	**303,878**	142,082

ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ්

දේපළ, පිරියත සහ උපකරණවලට තවමත් භාවිතයෙහි පවතින පූර්ණ වශයෙන් ක්ෂය කළ වත්කම් ඇතුළත් වන අතර 2025 දෙසැම්බර් 31 දිනට එහි පිරිවැය රු. 1,999,541,835.57 කි.

(2024 දෙසැම්බර් 31 - රු. 2,167,039,256).

ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

2025 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත සහ උපකරණවලට තවමත් භාවිතයෙහි පවතින පූර්ණ වශයෙන් ක්ෂය වූ වත්කම් ඇතුළත් වන අතර එහි පිරිවැය රු. 111,582,374/-කි.

8.1.6 වත්කම් ප්‍රතියෝග්‍යතාකරණය

ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ්

ගබඩා ටැංකි, නලමාර්ග, පොම්පාගාර, උපකාරක උපකරණ, බව්සර් ටැංකි හා පිරියත සහ යන්ත්‍රෝපකරණ වැනි ඇතැම් වර්ගවල වත්කම් ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LPG) කර්මාන්තයේ දී භාවිතා කිරීම සඳහා අදාළ ආරක්ෂක ප්‍රමිති සමඟ අනුකූලතාව සහතික කිරීම සඳහා කලින් කල පරීක්ෂා කිරීම්, ඇගයීම් සහ ප්‍රතියෝග්‍යතාකරණය සිදුකිරීම අවශ්‍යය. යම් වත්කමක් ප්‍රතියෝග්‍යතාකරණය සඳහා නියමිත වන අවස්ථාවේදී, අදාළ සමුච්චිත ක්ෂයවීම ඇතුළුව පවත්නා වත්කමේ ධාරණ අගය හඳුනා නොගනියි. සාර්ථක ප්‍රතියෝග්‍යතාකරණ මත, වත්කමේ පෙර ලේඛනගත වටිනාකම සහ ප්‍රතියෝග්‍යතාකරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් දරන ලද අමතර පිරිවැය, වත්කම සමාගම වෙනුවෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ තවදුරටත් ජනනය කරනු ඇති බව අපේක්ෂා කරනු ලබන හෙයින් ප්‍රාග්ධනීකරණය කරනු ලබයි.

ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

ගබඩා ටැංකි, නලමාර්ග, පොම්පාගාර, උපකාරක උපකරණ, බව්සර් ටැංකි හා පිරියත සහ යන්ත්‍රෝපකරණ වැනි ඇතැම් වර්ගවල වත්කම් ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LPG) කර්මාන්තයේ දී භාවිතා කිරීම සඳහා අවශ්‍ය ආරක්ෂක ප්‍රමිති සපුරාලන බව සහතික කිරීමට කලින් කල පරීක්ෂා කිරීම්, ඇගයීම් සහ ප්‍රතියෝග්‍යතාකරණය සිදුකිරීම අවශ්‍යය. යම් වත්කමක් භාවිතය සඳහා ප්‍රතියෝග්‍යතාකරණය නියමිත වන අවස්ථාවේදී, වත්කමට අදාළ පිරිවැය සහ සමුච්චිත ක්ෂයවීම හඳුනා නොගනියි. ප්‍රතියෝග්‍යතාකරණයෙන් පසුව, වත්කමේ පෙර ලේඛනගත වටිනාකම සහ වත්කම ප්‍රතියෝග්‍යතා කිරීමට දරන ලද අමතර පිරිවැය, වත්කම හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලබා එනු ඇති බව අපේක්ෂා කරනු ලබන හෙයින් ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ.

8.1.7 දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය

ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ්

සමාගමේ ප්‍රතිපත්තිය අනුව, මූල්‍ය ප්‍රකාශනවල ධාරණ අගයන් වර්තමාන සාධාරණ අගය නිවැරදිව පිළිබිඹු වන්නේද යන්න සහතික කිරීම සඳහා සමාගම සිය දේපළ, පිරියත සහ උපකරණ සඳහා වසර තුනකට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතුය. ඉඩම්, ගොඩනැගිලි හා මෝටර් රථ සඳහා අවසාන ප්‍රත්‍යාගණනය 2021 දෙසැම්බර් 31 දිනට ස්වාධීන ආයතනයක් වන, IJVR කන්සල්ටන්සි (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් සිදුකරන ලදී.

වෙනත් වත්කම්	16	**22,732,189**	18,422,206	**10,813,765**	10,966,118
මුදල් හා මුදලට සමාන දෑ	18	**50,419,844**	33,130,712	**12,232,045**	555,913
		424,672,430	359,154,649	**56,176,568**	37,422,155

කල්පිරෙන තෙක් තබා ගන්නා (HTM)

කල්පිරෙන තෙක් තබා ගන්නා මූල්‍ය වත්කම් සමාගම විසින් සිදුකළ භාණ්ඩාගාර බිල්පත්, ලැයිස්තුගත ණයකර හා භාණ්ඩාගාර බැදුම්කර ආයෝජනවලින් සමන්විත වේ. මේවා ස්ථිර හෝ තීරණයකළ හැකි ගෙවීම් සහ ස්ථිර කල්පිරීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වන අතර, සමාගමට කල්පිරෙන තෙක් තබා ගනීමේ අපේක්ෂාව සහ හැකියාව ඇති විට කල්පිරෙන තෙක් තබා ගන්නා ලෙස වර්ගීකරණය කෙරේ. මෙම වත්කම් සාධාරණ අගය සමඟ යම් සෘජුව ආරෝපනය වන ගනුදෙනු පිරිවැයට මූලිකව හඳුනා ගනී.

රජයේ සුරැකුම්පත්

රජයේ සුරැකුම්පත් ස්වභාවය අනුව අවදානම් රහිත උපකරණ වශයෙන් හඳුන්වන භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැදුම්කර සහ ප්‍රති මිලදි ගැනීමේ ගිවිසුම් වල ආයෝජනවලින් සමන්විත වේ.

ණය සහ ලැබීම් (L&R)

ණය හා ලැබීම් ලයිස්තුගත නොකළ ආයතනික ණය, කාලීන තැන්පතු, වත්කම් පිටුබලය සහිත සුරැකුම්පත්, සංවර්ධන බැඳුම්කර, වාණිජ පත්‍රිකා, වෙනත් ණය හා ලැබීම්, මුදල් හා මුදලට සමාන දෑ හි ආයෝජනවලින් සමන්විත වේ. ණය හා ලැබීම් සක්‍රීය වෙළෙඳපොල තුළ ලයිස්තුගත නොකළ ස්ථිර හෝ තීරණයකළ හැකි ගෙවීම් සහිත මූල්‍ය වත්කම් වේ. මෙම වත්කම් සාධාරණ අගය සමඟ යම් සෘජුව ආරෝපනය වන ගනුදෙනු පිරිවැයට මූලිකව හඳුනා ගනී.

අලෙවියට තබා ඇති (AFS)

අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම්වලට ණය සුරැකුම්පත් ඇතුළත් වේ. මෙම වර්ගීකරණය තුළ සුරැකුම්පත් යනු කල්පිරීම දක්වා තබා ගැනීමට අදහස් කරන සහ ද්‍රවශීලතාවයේ අවශ්‍යතාවයට ප්‍රතිචාර වශයෙන් හෝ වෙළෙඳපොල තත්ත්වයන්හි වෙනස්වීම් වලට ප්‍රතිචාර වශයෙන් විකුණනු ලබන ඒවා වෙති. සමාගමේ අලෙවියට තබා ඇති මූල්‍ය ආයෝජනවලට ස්කන්ධය සහ ණය සුරැකුම්පත්වලින් සමන්විත වන අතර ඒවා අලෙවිය සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කර නොමැති අතර ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට නම් කර නොමැත.

ආයතනික ණය සුරැකුම්පත්.

ආයතනික ණය සුරැකුම්පත් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කරන සහ දේශීය හා විදේශීය ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය විසින් සහතික කරන ආයතනික ණයකරවලින් සමන්විත වේ. ණය සුරැකුම්පත් නිකුත් කරන්නන්ගේ ණය ශ්‍රේණිගත කිරීම පිළිබඳ විශ්ලේෂණයක් මෙම සටහනේ දක්වා ඇත.

ඔප්පුහිමියන්ට ණය

ඔප්පු හිමියන්ට දෙන ලද ණයවලට අදාළ ණය අවදානම යනු ඔප්පුහිමියන් විසින් ණය නිරවුල් නොකිරීම හේතුකොට ගෙන පැන නැගිය හැකි මූල්‍ය අලාභයන් වේ.

ඔප්පුවේ පාවාරන අගය ඇප ලෙස සලකා බලමින් ඔප්පු හිමියන්ට සමුහය විසින් ණය නිකුත් කර ඇත. වාර්තාකරන දිනට, ලබා දී ඇති ඔප්පු ණයවල ධාරණ අගය රුපියල් මිලියන 1.978 වන අතර එයට අදාල පවාරණ අගය රුපියල් මිලියන 3.731 කි.

ලැබියයුතු ප්‍රතිරක්ෂණ

මෙය ප්‍රතිරක්ෂකයන් විසින් සමුහය වෙත ඇති ඔවුන්ගේ මූල්‍ය බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වීමේ අවදානමයි.

ප්‍රතිරක්ෂකයන්ගේ ණය යෝග්‍යතාව කලමණාකාරිත්වය විසින් නිරන්තර පදනමක් මත තක්සේරු කරන අතර ප්‍රතිරක්ෂිත වත්කම්වල හානිකරණය සඳහා සුදුසු ප්‍රතිපාදන නිශ්චය කරයි.

ප්‍රතිරක්ෂණ ලැබීම් සම්බන්ධයෙන් වාර්තා කරන දිනයට මූල්‍ය ප්‍රකාශයන් හි ප්‍රතිරක්ෂණ ලැබීම්වල වියහැකි හානිකරණ අලාභය සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කර ඇත.

ලැබියයුතු වාරිකය

හිඟ මුදල් නිරවුල් නොකිරීම හෝ එවා නිරවුල් කිරීමට සැහෙන කාලයක් ගත කිරීම හේතුකොටගෙන මූල්‍ය අලාභ අවදානම ඇති කරන ඔප්පුහිමියන් සහ අතර මැදියන්ගෙන් ලැබිය හැකි වාරික මෙයට අයත් වේ.

ජීවිත රක්ෂණයෙදි ඔප්පුව නිකුත් කිරීමට පෙර වාරික නිකුත් කරන බැවින් ණය අවදානම අවම වේ. සමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේදී වාරිකය දින 60ක් ඇතුලත නිරවුල් නොකල හොත් හිමිකම ගෙවිය නොහැකි බව දැක්වෙන වාරික වගකීම් වගන්තිය මගින් ණය අවදානම බොහෝ දුරට අඩුකර ඇත.

වාර්තාකරන දිනට ලැබියයුතු වාරික මත වියහැකි හානිකරණ අලාභය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරුකර ඇති අතර ප්‍රමාණවත් වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශයන් හී සිදුකර ඇත.

වෙනත් ලැබියයුතු

සමුහයේ ණය අවදානමට නිරාවරණය ප්‍රධාන වශයෙන් එක් එක් පාරිභෝගිකයාගේ තනි පුද්ගල ගතිලක්ෂණ මගින් ඇතිවේ. වෙළෙඳ සහ වෙනත් ලැබීම් හා සම්බන්ධව දරණ ලද අලාභ ඇස්තමේන්තු නියෝජනය කරන හානිකරණය සඳහා සමුහය විසින් දීමනාවක් ස්ථාපිත කර ඇත.

මුදල් හා මුදලට සමාන දෑ

වාර්තාකරන දිනට ඇති කෙටිකාලීන ආයෝජන, බැංකුවේ ඇති මුදල් සහ අතැති මුදල් වලින් මෙය සමන්විත වේ. කෙටිකාලීන තැන්පතුවලට බැංකු සහ මූල්‍ය ආයතනයන් හි පවත්නා ස්ථාවර තැන්පතු සහ ඒක්ෂණ තැන්පතු අයත් වේ. තවද, බැංකුවල ඇති මුදල්වලට ප්‍රධාන වශයෙන් පුද්ගලික සහ රජයේ වාණිජ බැංකුවල හිතකර ශේෂයන් පවතින ඉතිරි කිරීමේ හා ජංගම ගිණුම් අයත් වේ.

ශ්‍රේණිගත කිරීමේ අයතනයන් හි ණය ශ්‍රේණිගත කිරීම් සහ ගනුදෙනු සිදු කිරීමේ කාර්යක්ෂමතාව සළකා බැලීම මගින් සමුහය විසින් එහි බැංකුකරුවන් තෝරාගෙන ඇත. 2025 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 50,419 ක් මුදල් සහ මුදලට සමාන දෑ සමුහය සතුව පැවති (2024 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 33,131) අතර ඉන් මෙම වත්කම් මත උපරිම ණය නිරාවරණය නියෝජනය කරයි.

ණය අවදානම් නිරාවරණය – ජීවිත රක්ෂණ ව්‍යාපාරය

දෙසැම්බර් 31 දිනට	2025 රු.'000	වෙන්කිරීමේ %	2024 රු.'000	වෙන්කිරීමේ %
මූල්‍ය ආයෝජන				
ණය සුරැකුම්පත් - ණය සහ ලැබීම්	**28,104,257**	**26**	34,368,649	36
ණය සුරැකුම්පත් - කල්පිරෙන තෙක් තබා ගන්නා	**40,156,640**	**37**	18,708,638	20
සේවක හා නියෝජිත ණය	**1,237,779**	**1**	1,205,253	1
ණය සුරැකුම්පත් - විකිණිමට තබා ඇති	**39,740,932**	**36**	41,018,556	43
	109,239,607	**100**	95,301,096	100

4TH FULL PROOF

45. රක්ෂණය හා මූල්‍ය අවදානම් කළමනාකරණය (ඉතිරි කොටස)
45.3 ණය අවදානම (ඉතිරි කොටස)

ණය අවදානම් නිරාවරණය – සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

දෙසැම්බර් 31 දිනට	2025 රු.'000	වෙන්කිරීමේ %	2024 රු.'000	වෙන්කිරීමේ %
මූල්‍ය ආයෝජන				
ණය සුරැකුම්පත් - ණය සහ ලැබීම්	**2,983,782**	**21**	5,880,018	54
ණය සුරැකුම්පත් - කල්පිරෙන තෙක් තබා ගන්නා	**8,838,891**	**62**	2,018,835	19
ණය සුරැකුම්පත් - විකිණීමට තබා ඇති	**2,513,976**	**18**	2,981,620	27
	14,336,649	**100**	10,880,473	100

ණය සුරැකුම්වල වෙන්කිරීම ණය ශ්‍රේණිගත කිරීම් අනුව

ජීවිත රක්ෂණ ව්‍යාපාරය

දෙසැම්බර් 31 දිනට	2025		2024	
ශ්‍රේණිගතකරණය	රු . මි	එකතුවෙන් %	රු . මි	එකතුවෙන් %
AAA	**21,824**	**20**	21,894	23
AA+	**–**	**0**	–	0
AA	**–**	**0**	–	0
AA-	**21,906**	**20**	17,950	19
A+	**7,239**	**7**	9,411	10
A	**40,243**	**37**	26,579	28
A-	**671**	**1**	1,724	2
BBB+	**16,120**	**15**	16,381	17
BBB	**–**	**0**	157	0
BBB-	**–**	**0**	–	0
BB+	**–**	**0**	–	0
BB-	**–**	**0**	–	0
ශ්‍රේණිගත නොකල	**1,238**	**1**	1,205	1
එකතුව	**109,240**	**100**	95,301	100

ස්ථිර තැන්පත් මත ණය අවදානම බැංකුවෙහි ණය අවදානම මත පදනම් වේ.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

දෙසැම්බර් 31 දිනට	2025		2024	
Rating	රු . මි	එකතුවෙන් %	රු . මි	එකතුවෙන් %
AAA	**1,167**	**8**	–	0
AA+	**–**	**0**	3,049	28
AA-	**6,652**	**46**	4,089	38
A+	**–**	**0**	–	0
A	**3,908**	**27**	2,980	27
A-	**2,103**	**15**	255	2
BBB+	**507**	**4**	507	5
එකතුව	**14,337**	**100**	10,880	100

** ස්ථිර තැන්පත් මත ණය අවදානම බැංකුවෙහි ණය අවදානම මත පදනම් වේ.*

45.4 ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අනුපාතය යනු මුදල් හෝ වෙනත් මුල්‍යමය වත්කමක් ලබාදීමෙන් නිරවුල් කරන සිය මූල්‍ය වගකීම් හා බැඳුණු බැදියාවන් සපුරාලීම සඳහා සමූහයට මුහුණදීමට සිදුවන දුෂ්කරතාව පිළිබඳ අවදානමයි.

කල්පිරීම් විශ්ලේෂණ

ගෙවීමට ඇති පොලිය සහ ලැබීමට ඇති පොලිය ඇතුලත්ව ඉතිරිව ඇති වට්ටම් රහිත ගිවිසුම් බැඳීම් මත පදනම් කරගත් ව්‍යුහපත්න නොවන මූල්‍ය වගකීම් සහ මූල්‍ය වගකීම්වල කල්පිරීමේ පැතිකඩ පහත වගුවෙන් සාරාංශ කරයි.

2025 දෙසැම්බර් 31 දිනට සමාගම	ධාරණ අගය රු.'000	ස්ථිර කාල ගණන රු.'000	වසර 1 දක්වා රු.'000	වසර 1 - 2 දක්වා රු.'000	වසර 2 - 5 දක්වා රු.'000	වසර 5 10 දක්වා රු.'000	වසර 10ට වැඩි රු.'000	එකතුව රු.'000
මූල්‍ය වත්කම්								
ණය හා ලැබීම් (L&R)	**4,362,415**		**2,578,054**	–	–	–	–	**6,940,469**
විකිණීමට තබා ඇති (AFS)	**33,136,692**	**33,136,692**	–	–	–	–	–	**33,136,692**
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය (FVTPL)	**1,608,850**	**1,608,850**	–	–	–	–	–	**1,608,850**
වෙනත් වත්කම්	**10,823,062**	–	**10,823,062**	–	–	–	–	**10,823,062**
මුදල් හා මුදලට සමාන දෑ	**12,232,045**	–	**12,232,045**	–	–	–	–	**12,232,045**
	64,741,118	**39,107,957**	**25,633,161**	–	–	–	–	**64,741,118**
මූල්‍ය වගකීම්								
වර්තන බදු වගකීම්	**947,304**	–	**947,304**	–	–	–	–	**947,304**
වෙනත් වගකීම්	**540,266**	–	**540,266**	–	–	–	–	**540,266**
	1,487,570	–	**1,487,570**	–	–	–	–	**1,487,570**

2024 දෙසැම්බර් 31 දිනට සමාගම	ධාරණ අගය රු.'000	ස්ථිර කාල ගණන රු.'000	වසර 1 දක්වා රු.'000	වසර 1 - 2 දක්වා රු.'000	වසර 2 - 5 දක්වා රු.'000	වසර 5 10 දක්වා රු.'000	වසර 10ට වැඩි රු.'000	එකතුව රු.'000
මූල්‍ය වත්කම්								
ණය හා ලැබීම් (L&R)	2,146,539	–	2,027,691	19,110	–	–	–	2,046,801
විකිණීමට තබා ඇති (AFS)	41,085,639	25,906,058	13,880,000	–	–	–	–	39,786,058
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය (FVTPL)	2,010,130	2,010,130	–	–	–	–	–	2,010,130
වෙනත් වත්කම්	10,975,039	–	10,975,039	–	–	–	–	10,975,039
මුදල් හා මුදලට සමාන දෑ	555,913	–	555,913	–	–	–	–	555,913
	56,773,260	27,916,188	27,438,643	19,110	–	–	–	55,373,942
මූල්‍ය වගකීම්								
වර්තන බදු වගකීම්	907,421	–	907,421	–	–	–	–	907,421
වෙනත් වගකීම්	1,496,998	–	1,496,998	–	–	–	–	1,496,998
	2,404,419	–	2,404,419	–	–	–	–	2,404,419

46 බැඳීම්, අසම්භාව්‍යතා සහ ඇපකර

46.1 බැඳීම්

පහත විස්තර කර ඇති ඒවා හැර වාර්තාකරණ දිනයට සැළකිය යුතු ප්‍රාග්ධන බැඳීම් සමුහය සතුව නොමැත:

ලංකා හොස්පිටල් කෝර්පරේෂන් පීඑල්සී

මූල්‍ය වසර අවසානයට සහ 2025 දෙසැම්බර් 31 දිනට දැනට ක්‍රියාත්මක වෙමින් පවතින නමුත් වියදම් කර නොමැති ව්‍යාපෘති සම්බන්ධයෙන් සමූහයේ සහ සමාගමේ ප්‍රාග්ධන බැඳීම් රුපියල් මිලියන 81කි. (2024 රු.මි. 232කි)

ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ්

2025 දෙසැම්බර් 31 දිනට, 2025 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ ප්‍රාග්ධන වියදම රු. මිලියන 10.4කි (2024 දෙසැම්බර් 31: රු. මිලියන 8.6කි) මෙම බැඳීම් දේපළ, පිරියත, උපකරණ සහ අනෙකුත් ප්‍රාග්ධන ව්‍යාපෘතිවල අඛණ්ඩ සහ සැලසුම්ගත ආයෝජන සඳහා අදාළ වේ. ඔක්සිජන් සිලින්ඩර මිලදී ගැනීම සඳහා සිදුකළ රු.මිලියන 20 ක අත්තිකාරම් ගෙවීමක් සම්බන්ධයෙන් සමාගම ඉදිරියට යන නීතිමය කාරණයකට ද සම්බන්ධ වී සිටී. මෙම කාරණයේ අවසාන ප්‍රතිඵලය දැනට අවිනිශ්චිත වන අතර, නීතිමය ක්‍රියාමාර්ග විසඳන තෙක් මෙම අත්තිකාරම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවලට කිසිදු ගැලපීමක් සිදු කර නොමැත.

ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

2025 දෙසැම්බර් 31 දිනට, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ ප්‍රාග්ධන වියදම රු. බිලියන 5කි (2024: රු. බිලියන 8.4කි)

46.2 අසම්භාව්‍ය වගකීම් සහ ඇපකර

පහත විස්තර කරන දෑට වඩා මූල්‍ය ප්‍රකාශණයන් හි සැසැඳීම් කිරීම හෝ අනාවරණය කිරීම අවශ්‍ය වන සැලකියයුතු සම්භාව්‍ය බැඳීම් සහ ඇපකර නොමැති අතර වාර්තාකරණ දිනට වෙන් කිරීම් ගිණුම්වල ඇතුළත් කර නොමැති හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නොමැති නමුත් ගිවිසුම්ගත නොවූ සැළකිය යුතු අසම්භාව්‍ය වගකීම් සහ ඇපකර නොමැත.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලකතුකළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු තක්සේරු කිරීම්

සාමාන්‍ය රක්ෂණය සඳහා විදේශීය ප්‍රතිරක්ෂණ සමාගම්වලින් ලබා ගන්නා ලද ප්‍රතිරක්ෂණ හිමිකම් ඉල්ලීම් එකතුකළ අගය මත බද්දට යටත් වන බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අදහසයි. ඒ අනුව, 2004/2005 සහ 2005/2006 තක්සේරු වර්ෂ සඳහා අනුපිළිවෙළින් රු. 318,099,913/- ක් සහ රු. 26,903,739/- ක් වන ප්‍රතිරක්ෂණ හිමිකම් ඉල්ලීම් සඳහා එකතුකළ අගය මත බදු (VAT) තක්සේරුවක් සමාගමට ලැබී තිබුණි.

මෙය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ නිරතව සිටින බහුතර රක්ෂණ සමාගම් සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන පොදු තක්සේරුවකි. කෙසේ වුවද, සාමාන්‍ය රක්ෂණ කර්මාන්තයේ නිරත වූ සමාගම්වල අදහස වන්නේ ප්‍රතිරක්ෂණ හිමිකම් ඉල්ලීම් මත ඔවුන් එකතුකළ අගය මත බදු ගෙවීමට යටත් නොවන බවයි.

සමාගම විසින් බදු උපදේශකයන්ගේ උපදෙස්වලට අනුකූලව, මෙම තක්සේරු කිරීම්වලට එරෙහිව වලංගු අභියාචනා ගොනු කරන ලදී. සමාලෝචන කමිටුව 2010 ජූලි 21 දිනැති ලිපිය මගින් තක්සේරු කිරීම් වලංගු බව නිර්ණය කරන ලදී. සමාගම මගින් සමාලෝචන කමිටුවේ තීරණය අභියෝගයට ලක් කරමින් අභියාචනාධිකරණයට ඇප අයදුම්පතක් යොමු කරන ලදී. අභියාචනාධිකරණයේ තීරණය අපේක්ෂාවෙන් සමාගම රු.මිලියන 345 ක් වෙන් කර ඇත.

2002 අංක 14 දරණ වැට් බදු පනතේ 25 ඇ වගන්තිය මත පදනම්ව මූල්‍ය සේවය සඳහා අගය එකතු කළ බදු සහ ජාතිය ගොඩනැගීමේ බද්ද සඳහා සමාගම බැඳී සිටින බව පවසමින් සමාගමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් නිල දැණුම් දීමක් ලැබී ඇත. ඒ අනුව 2012, 2013, 2017 සහ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාල සීමා සඳහා සමාගමට මූල්‍ය සේවය සඳහා වූ වැට් බද්ද සහ මූල්‍ය සේවය පිළිබඳ ජාතිය ගොඩනැගීමේ බද්ද පිළිබඳ තක්සේරුවක් ලැබුණු අතර අදාළ මුදල් ප්‍රමාණ පිළිවෙලින් රු. මිලියන 192 ක් සහ රු. මිලියන 232, රු. මිලියන 509, රු. මිලියන 665 සහ රු. මිලියන 920ක් විය.

සමාගම බදු උපදේශකයින්ගේ උපදෙස් ඇතිව මෙම ඇගයීම්වලට එරෙහිව නිසි ලෙස අභියාචනයක් ඉදිරිපත් කර ඇත. 2012 සහ 2013 කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය සේවා සඳහා වැට් බදු සඳහා නිකුත් කරන ලද තක්සේරුව පිළිවෙලින් 2020 අගෝස්තු 27 සහ 2023 ජනවාරි 27 වන දින සිට වලංගු බව බදු අභියාචනා කොමිසම තීරණය කර ඇත. අභියාචනාධිකරණයේ එම තීන්දුවලට එරෙහිව සමාගම අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර, බැංකු ඇපකරය මුදල් කිරීම සඳහා වන බදු අභියාචනා කොමිෂන් සභාවේ තීරණය නතර කිරීම සඳහා සමාගම විසින් අභියාචනාධිකරණයෙන් රිට් නියෝගයක් ඉල්ලා සිටී. එකී රිට් අයදුම්පත්වල තීරණ ද ලැබීමට නියමිතව පවතී. එක් එක් නඩුවේ තත්ත්වයන් සහ ඇගයීම් පහත පරිදි වේ.

තක්සේරු වසර	තක්සේරුවේ තත්ත්වය	අසම්භාව්‍ය වගකීමේ ස්වභාවය	සමාගමට සිදුවන අසම්භාව්‍ය වගකීම මැනීම
2012/2013	අභියාචනාධිකරණයේ තීන්දුව විභාග වෙමින් පවතී	මූල්‍ය සේවා මත වැට් බද්ද	රු.මි.192 ක අතිරේක බදු වගකීමක්
2013/2014	අභියාචනාධිකරණයේ තීන්දුව විභාග වෙමින් පවතී	මූල්‍ය සේවා මත වැට් බද්ද	රු.මි.232 ක අතිරේක බදු වගකීමක්
2017/2018	බදු අභියාචනා කොමිෂන් සභාවේ තීන්දුව අපේක්ෂාවෙන් සිටී	මූල්‍ය සේවා මත වැට් බද්ද සහ ජාතිය ගොඩ නැගීමේ බද්ද	රු.මි.449 ක අතිරේක බදු වගකීමක්
2019/2020	බදු අභියාචනා කොමිෂන් සභාවේ අභියාචනයක් කිරීමේ අපේක්ෂාවෙන් සිටී	මූල්‍ය සේවා මත වැට් බද්ද	රු.මි.665 ක අතිරේක බදු වගකීමක්
2021/2022	කොමසාරිස් ජනරාල්ගේ අභියාචන පරීක්ෂණය අපේක්ෂාවෙන් සිටී	මූල්‍ය සේවා මත වැට් බද්ද	රු.මි.920 ක අතිරේක බදු වගකීමක්
2022/2023	කොමසාරිස් ජනරාල්ගේ අභියාචන පරීක්ෂණය අපේක්ෂාවෙන් සිටී	මූල්‍ය සේවා මත වැට් බද්ද	රු.මි.1,152 ක අතිරේක බදු වගකීමක්

කෙසේ වෙතත්, 2010 සහ 2011 වසර සඳහා තක්සේරු කළ මූල්‍ය සේවා මත වැට් බදු සම්බන්ධ මෙම කාරණය සමාගමට හිතකරව අභියාචනාධිකරණය විසින් තීරණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2014, 2015 සහ 2016 වසරවලට අදාළ තක්සේරු බදු අභියාචනා කොමිෂන් සභාව විසින් සමාගමට හිතකරව විසඳන ලද අතර 2018 වසර සඳහා රු.බිලියන 4.4ක් වූ එක් තක්සේරුවක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සමාගමට හිතකරව නියම කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම පවත්නා කරුණු වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල අතිරේක ප්‍රතිපාදන වෙන් කර නොමැත.

ආදායම් බදු

ජීවිත රක්ෂණ බදුකරණයට අදාළව 2011/2012 සිට 2019/2020 දක්වා තක්සේරු වර්ෂය සඳහා සමාගමට ආදායම් බදු තක්සේරුව ලැබී ඇති අතර එම කාලපරිච්ඡේදවල තක්සේරු කිරීම් පහත වගුවේ දක්වා ඇත. මෙම තක්සේරුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2016 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 92 වන වගන්තියට පටහැනිව නිකුත් කරන ලදී. තවද මෙය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රක්ෂණ ක්ෂේත්‍රයේ ඇති ජීවිත රක්ෂණ සමාගම් සඳහා නිකුත් කර ඇති පොදු ආදායම් බදු තක්සේරුවකි. ක්ෂේත්‍රය, සමාගම සහ සමාගමේ බදු උපදේශකයින්ගේ මතය වන්නේ එම තක්සේරුව ක්‍රියාත්මක නොවනු ඇති බවයි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල අතිරේක ප්‍රතිපාදන වෙන් කර නොමැත.

සමාගමේ බදු උපදේශකයින්ගේ උපදෙස් ඇතිව සමාගම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අදාළ තක්සේරුවලට එරෙහිව නිසි ලෙස අභියාචනයක් ඉදිරිපත් කර ඇත. 2011/12, 2012/2013 සහ 2013/2014 කාල සීමාව සඳහා ආදායම් බදු තක්සේරුකිරීම් වලංගු බව පිළිවෙලින් 2020 අගෝස්තු 18, 2021 දෙසැම්බර් 14, සහ 2023 ජනවාරි 17 දිනැති ලිපිවලින් බදු අභියාචනා කොමිෂන් සභාව තීරණය කර ඇත. මෙම තීරණවලට සමාගම අභියාචනාධිකරණයේ අභියාචනා ගොනු කර ඇත.

2014/2014 වසර සඳහා ආදායම් බදු තක්සේරුකිරීම් සම්බන්ධයෙන්, බදු අභියාචනා කොමිෂන් සභාව, ඔවුන්ගේ 2024 පෙබරවාරි 27 දිනැති ලිපිය මගින්, සමාගමේ අභියාචනයට අර්ධ ලෙස ඉඩ දී ඇත. පසුව, ආදායම් දෙපාර්තමේන්තුව විසින් මෙම තීරණවලට එරෙහිව අභියාචනාධිකරණයේ අභියාචනයක් ගොනු කර ඇත. 2016/2017 වසර සඳහා ආදායම් බදු තක්සේරුකිරීම් සම්බන්ධයෙන්, බදු අභියාචනා කොමිෂන් සභාව, ඔවුන්ගේ 2023 සැප්තැම්බර් 12 දිනැති ලිපිය මගින්, සමාගමට හිතකර තීරණයක් නිකුත් කර ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මෙම තීරණවලට එරෙහිව අභියාචනාධිකරණයේ අභියාචනයක් ගොනු කර ඇත. මේ අනුව, බදු අභියාචනා කොමිෂන් සභාව පිළිවෙලින් ඔවුන්ගේ 2023 නොවැම්බර් 22 හා 2024 ජූනි 25 දිනැති ලිපි මගින්, 2014/2015 සහ 2016/2017 වසරවලට අදාළ තක්සේරු සඳහා තබාගත් බැංකු ඇපකර මුදා හරින ලදී.

තක්සේරු වසර	තක්සේරුවේ තත්ත්වය	අසම්භාව්‍ය වගකීමේ ස්වභාවය	සමාගමට සිදුවන අසම්භාව්‍ය වගකීම මැනීම
2011/2012	අභියාචනාධිකරණයේ තීන්දුව විභාග වෙමින් පවතී	ආදායම් බදු	රු. මි. 524 ක අතිරේක බදු වගකීමක්
2012/2013	අභියාචනාධිකරණයේ තීන්දුව විභාග වෙමින් පවතී	ආදායම් බදු	රු. මි. 296 ක අතිරේක බදු වගකීමක්
2013/2014	අභියාචනාධිකරණයේ තීන්දුව විභාග වෙමින් පවතී	ආදායම් බදු	රු. මි. 768 ක අතිරේක බදු වගකීමක්
2014/2015	අභියාචනාධිකරණයේ තීන්දුව විභාග වෙමින් පවතී	ආදායම් බදු	රු. මි. 1,036 ක අතිරේක බදු වගකීමක්
2015/2016	බදු අභියාචනා කොමිෂන් සභාවේ තීන්දුව අපේක්ෂාවෙන් සිටී	ආදායම් බදු	රු. මි. 1,374 ක අතිරේක බදු වගකීමක්
2016/2017	අභියාචනාධිකරණයේ තීන්දුව විභාග වෙමින් පවතී	ආදායම් බදු	රු. මි. 1,823 ක අතිරේක බදු වගකීමක්
2017/2018	දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ තීරණය අපේක්ෂාවෙන් සිටී	ආදායම් බදු	රු. මි. 2,170 ක අතිරේක බදු වගකීමක්
2018/2019	බදු අභියාචනා කොමිෂන් සභාවේ තීන්දුව අපේක්ෂාවෙන් සිටී	ආදායම් බදු	රු. මි. 626 ක අතිරේක බදු වගකීමක්
2019/2020	බදු අභියාචනා කොමිෂන් සභාවේ තීන්දුව අපේක්ෂාවෙන් සිටී	ආදායම් බදු	රු. මි. 493 ක අතිරේක බදු වගකීමක්
2020/2021	අභියාචන පරීක්ෂණය අපේක්ෂාවෙන් සිටී	ආදායම් බදු	රු. මි. 48 ක අතිරේක බදු වගකීමක්

පවත්නා ශ්‍රේෂ්ඨාධිකරණ නඩු

සමාගම 1994 සහ 2003 අතර නිකුත් කරන ලද ප්‍රතිපත්ති සඳහා තැරැව්කරු විසින් එකතු කරන ලද නමුත් නොගෙවන ලද රක්ෂණ වාරික නියෝජනය කරමින්, රු. 1,981,883/- ක මුදලක් අයකර ගැනීම සඳහා නඩු අංක SC/HCCA/LA 14/2023 යටතේ Ceyexxe තැරැව්කරුවන්ට එරෙහිව සිවිල් නඩුවක් ගොනු කර ඇත. දිස්ත්‍රික් උසාවිය සහ සිවිල් අභියාචනාධිකරණය යන දෙකම සමාගමට පක්ෂව තීන්දුවක් ලබා දී ඇත. තැරැව්කරු ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර, නඩුව 2025 සැප්තැම්බර් 10 දින ඇසීම සඳහා නියම කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකර අභියාචනය අංක 107/2014 යටතේ, වැලිගම ශාඛා පරිශ්‍රය සම්බන්ධයෙන් සමාගම සහ විත්තිකරු අතර කුලී ආරවුලක් ඇති වී තිබේ. චෝදනා කරන ලද බදු කුලී හිඟ මුදල් අයකර ගැනීම සඳහා විත්තිකරු සිවිල් නඩුවක් ගොනු කර ඇති අතර, සමාගම විත්තිකරු බදු ගිවිසුමේ නියමයන් උල්ලංඝනය කළ බවට තර්ක කරයි. දිස්ත්‍රික් අධිකරණයේ සහ සිවිල් අභියාචනාධිකරණ උසාවියේ තීන්දු සමාගමට අහිතකර විය. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අභියාචනා අයදුම්පතක් සඳහා අවසර ලබා දී ඇති අතර, නඩුව සිදුවෙමින් පවතී.

රක්ෂණ සංවිධායකයෙකු විසින් සේ.අ.ඇ සහ සේ.නි.අ. සහ පාරිතෝෂික හිමිකම් ඉල්ලා නඩු අංක SC/APL/0036/24 ගොනු කරන ලදී. ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට යාමට අවසර දී ඇති අතර, වාද කිරීම් 2025 නොවැම්බර් 21 දිනට නියමිතයි.

නඩු අංක SC/SPL/LA/173/24 යටතේ, සමාගමේ වෘත්තීය සංගමයක් සමාගමේ වෙන් කිරීමේ නියෝගය අභියෝගයට ලක් කරමින් පෙත්සමක් ගොනු කර ඇත. නඩුව 2024 ජූලි 09 වන දින ශ්‍රේෂ්ඨාධිකරණයේ ඇසීම සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය.

ලංකා හොස්පිටල් කෝපරේෂන් පීඑල්සී

වගකීම්

ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී ට එරෙහිව නඩු පැවරීම සඳහා උපරිම වගකීම වාර්තා කරන දිනට අනුව මිලියන 918.7 ක් ව පවතී. දැනට පවතින තොරතුරු මත පදනම්ව සමාගමට එහි නීති කවුන්සිලය විසින් උපදෙස් දී ඇත්තේ එවැනි නීතිමය ක්‍රියා පටිපාටිවල අවසාන විසඳුම සමාගමේ මෙහෙයුම්, මූල්‍ය තත්ත්වය හෝ ද්‍රවශීලතාවයේ ප්‍රතිඵල කෙරෙහි ප්‍රමාණාත්මක අහිතකර බලපෑමක් ඇති නොකරනු ඇති බවයි. ඒ අනුව, මේ සම්බන්ධයෙන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කිසිදු වගකීමක් සඳහා වෙන් කිරීම් සිදුකර නොමැත.

වත්කම්

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ අනාවරණය කිරීම් අවශ්‍ය වන ප්‍රමාණාත්මක අසම්භාව්‍ය වත්කම් වාර්තාකරණ දිනට නොමැත.

47 වෙන්කිරීම

2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝදන) පනතට අනුව සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කළ වෙන් කිරීමේ මාර්ගෝපදේශ අනුව, සහ අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ලෙස වෙන් කරන ලදී. (අමාත්‍ය මණ්ඩල තීරණ අංක. 23/0431/604/046 (2023 මාර්තු 17) සහ අංක 23/2397/604/239 (2023 දෙසැම්බර් 18). දිස්ත්‍රික් උසාවියේ, වාණිජ මහාධිකරණයේ සහ කොටස්හිමියන්ගේ අනුමැතිනිත්ට පසුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් යන ආයතන දෙකට 2024 පෙබරවාරි 01 දින සිට රක්ෂණ බලපත් ලබා දෙන ලදී.

සමාගම

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි නමේ වෙනස

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ 96 වගන්තියට අනුව, "රක්ෂණකරුවෙකු, මෙම පනත යටතේ ලියාපදිංචි කර ඇති තැරැව්කරුවෙකු හෝ එවැනි රක්ෂණකරුවෙකුගේ හෝ තැරැව්කරුවෙකුගේ රක්ෂණ නියෝජිතයෙකු නොවන වෙනත් කිසිදු තැනැත්තෙකු විසින් මණ්ඩලයේ ලිඛිත අනුමැතිය නොමැතිව, ස්වකීය නාමයේ, අභිධානයේ හෝ විස්තරයේ කොටසක් වශයෙන් "රක්ෂණය" යන වචනය හෝ එම වචනයේ ව්‍යුත්පන්න කිසිවක් හෝ වෙනත් භාෂාවක ඒ වචනයට සමාන වෙනත් යම් වචනයක් ඒ නාමයෙන් අභිධානයෙන් හෝ විස්තරයෙන් ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරය කරගෙන යන බව පෙන්නුම් කිරීම පිණිස භාවිතා කිරීම හෝ ඒ ප්‍රතිඵලය ගෙන දෙන නිරූපන කිසිවක් යම් බිල්පත් ශීර්ෂයක, ලිපි ශීර්ෂයක, දැන්වීමක හෝ ප්‍රචාරණ කිරීම හෝ නොකළ යුතුය."

2024 පෙබරාවරි 01 දින, 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝදන) පනතට අනුව සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කළ වෙන් කිරීමේ මාර්ගෝපදේශ අනුව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ලෙස වෙන් කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් 2024 පෙබරාවරි 01 දින සිට ක්‍රියාත්මකව රක්ෂණ ව්‍යාපාර සිදු නොකරයි.

ඒ අනුව, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ 96 වගන්තියට අනුකූලවීම සඳහා, සමාගම ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් යන නමින් "රක්ෂණ" යන වචනය ඉවත් කිරීම අවශ්‍ය වේ.

කෙසේවෙතත්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව SC SPL LA173/24 දරන උසාවි නඩුවේ නිගමනය තෙක් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් වෙත දීර්ඝ කිරීමක් ලබා දී ඇත. 2025 සැප්තැම්බර් 04 දින, ඉකී උසාවි නඩුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිෂ්ප්‍රභා කරන ලදී. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය එහි 2026 මාර්තු 23 දින පැවති රැස්වීමේදී, පශ්චාත් ප්‍රතිව්‍යූහගතකරණ තත්ත්වයන්ට අනුව සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කළ නියාමන උපදෙස්වලට අනුකූලව සමාගමේ ආයතනික නම වෙනස් කිරීමේ යෝජනාවක් සලකා බලන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකාවේ ගරු නීතිපතිතුමාගේ මතය ලබා ගැනීමට යටත්ව යෝජිත නමේ වෙනස සඳහා මූලික අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, අවශ්‍ය නීතිමය මතය ලබා ගැනීමට අවශ්‍ය පියවර ආරම්භ කර ඇති අතර මෙම ක්‍රියාවලිය දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.

සමූහය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් (SLICLL)

- හිමිකාර සමාගමෙන් (SLIC) සිට SLICLL දක්වා මූල්‍ය ආයෝජනවල පරිපාලන නමේ වෙනස.

වැඩපිළිවෙල යෝජනා ක්‍රමය පරිදි, රු.බිලියන 194.7ක් වටිනා මුල්‍ය ආයෝජන 2024 පෙබරවාරි 01 දිනට සමාගම (SLICLL) වෙත මාරු කරන ලදී. එයට සමගාමීව, හිමිකාර සමාගමෙන් මෙම මූල්‍ය උපකරණවල හිමිකාරත්වය මාරු කිරීමට සියලුම ගතහැකි ක්‍රියාමාර්ග ගෙන ඇත. කෙසේවෙතත්, ලැයිස්තුගත කොටස් හා ලැයිස්තුගත ණයකර පරිපාලන වශයෙන් හිමිකාර සමාගමේ නම යටතේ තවමත් පවතී. 2025 දෙසැම්බර් 31 සහ 2026 පෙබරවාරි 28 දිනට මාරු කිරීමේ ක්‍රියාවලියේ තත්ත්වය පහත පරිදි වේ:

මූල්‍ය උපකරණ වර්ගය	සටහන	බැංකුව/ආයතනය	2025 දෙසැම්බර් 31 දිනට ශේෂය රු '000	2026 පෙබරවාරි 28 දිනට අවසන් කළ ශේෂය රු '000	2026 පෙබරවාරි 28 දිනට ක්‍රියාත්මක ශේෂය රු '000	2024 දෙසැම්බර් 31 දිනට ශේෂය රු '000
ලැයිස්තුගත කොටස්	අ	CDS ගිණුම	**30,708,885**	–	30,708,885	25,605,476
ලැයිස්තුගත ණයකර	අ	CDS ගිණුම	**58,032,969**	–	58,032,969	38,139,646
ලැයිස්තුගත නොකළ ණයකර		ලංකා බැංකුව	**6,038,849**	6,038,849	–	6,052,065
		DFCC බැංකව පීඑල්සී	**–**	–	–	1,857,062
		මහජන බැංකුව	**16,153,459**	16,153,459	–	16,206,888
		ජාතික ඉතිරි කිරීමේ බැංකුව	**2,847,997**	2,847,997	–	2,858,630
වාණිජ පත්‍රිකා		LOLC හෝල්ඩින්ග්ස් පීඑල්සී	**21,864,602**	21,864,602	–	21,587,539
කාලීන තැන්පතු		ලංකා බැංකුව	**1,158,744**	1,158,744	–	2,389,315
		මහජන බැංකුව	**742,591**	742,591	–	690,277
		DFCC බැංකව පීඑල්සී	**–**	–	–	1,188,744
		ලංකා ඔරික්ස් ලීසින් කම්පැනි පීඑල්සී	**–**	–	–	697,685
		පීපල්ස් ලීසින්	**–**	–	–	2,423,361
		කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී	**4,962**	4,962	–	4,624
		කාගිල්ස් බැංකුව	**1,157,654**	1,157,654	–	–
ඒකක භාර		සිලෝන් ඇසට් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්	**3,155,097**	3,155,097	–	2,047,025
		ජේබී ෆිනැන්සියල් (ප්‍රයිවට්) ලිමිටඩ්	**1,799,970**	1,799,970	–	1,659,009

4TH FULL PROOF

47. වෙන්කිරීම (ඉතිරි කොටස)

මූල්‍ය උපකරණ වර්ගය	බැංකුව/ආයතනය	2025 දෙසැම්බර් 31 දිනට රු '000	2026 පෙබරවාරි 28 දිනට රු '000	2026 පෙබරවාරි 28 දිනට රු '000	2024 දෙසැම්බර් 31 දිනට රු '000
භාණ්ඩාගාර බැඳුම්කර	ලංකා බැංකුව	**9,403,017**	9,403,017	–	10,003,697
	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	**163,813**	163,813	–	460,676
	මහජන බැංකුව	**9,505,104**	9,505,104	–	9,679,732
	DFCC බැංකුව පීඑල්සී	**3,129,154**	3,129,154	–	4,061,209
	හැටන් නැෂනල් බැංකුව පිඑල්සී	**–**	–	–	631,154
	කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී	**63,687,475**	63,687,475	–	33,416,195
	සෙලාන් බැංකුව	**–**	–	–	296,451
	තීව්‍රර සුරැකුම්පත්	**–**	–	–	4,156,936
	කැපිටල් එලායන්ස්	**12,550,810**	12,550,810	–	10,225,424
	ෆස්ට් කැපිටල් සිකියුරිටීස්	**–**	–	–	6,425,034
	පැන් ඒෂියා	**7,431,557**	7,431,557	–	8,376,155
	වෙල්ත් ට්‍රස්ට්	**13,315,979**	13,315,979	–	7,575,934
ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම්	කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී	**3,852,610**	3,852,610	–	10,655,487

සටහන අ

ගනුදෙනු ගාස්තු කපා හැරීමක් සඳහා ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාවේ අවශ්‍ය අනුමැතිය ප්‍රමාද වී ඇති SLIC සිට SLICGL CDS ගිණුම් දක්වා සමාගම වර්තමානයේ ලැයිස්තුගත කොටස් සහ ණයකරවල මාරු කිරීම SLIC ආයතනික කළමනාකරණය සහ SEC අතර සාකච්ඡා කිහිපයකින් පසු 2026 මාර්තු 17 දින අනුමත කරන ලදී. ඒ අනුව, ලබාදුන් අනුමැතියට අනුකූලව මාරුකිරීම ක්‍රියාත්මක කිරීම සමාගම ඉදිරියට ගෙන යනු ලබයි.

වැඩපිළිවෙල යෝජනා ක්‍රමය පරිදි, බැංකු ගිණුම්වල නීතිමය අයිතිය 2024 පෙබරාවරි 01 දිනට සමාගම (SLICLL) වෙත මාරු කරන ලදී. නවද, ප්‍රධානගණනාවක පරිපාලන නාම 2026 පෙබරාවරි 28 දිනට වෙනස් කර ඇති අතර SLIC වෙතින් ඉතිරි පහත බැංකු ගිණුම් පහේ පරිපාලන නාමයේ වෙනස් කිරීම තුළ කළමනාකරණය නිරතව සිටී.

බැංකුව	බැංකු ගිණුම් ගණන	2026 පෙබරවාරි 28 දිනට අවසන් කළ	අවසන් කිරීම %
නේෂන්ස් ට්‍රස්ට් බැන්ක්	2	–	–
ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැන්ක්	3	–	–
එකතුව	5	–	–

වෙන් කිරීමට අදාළ පරිපාලන නාමය වෙනස් කිරීම ඇතුළු ඇතැම් පරිපාලනමය කරුණු තවමත් සිදුවෙමින් පවතින බැවින් හා පුළුල් පශ්චාත් වෙන් කිරීමේ ක්‍රියාත්මක කිරීමේ කොටසක් ලෙස සහ විගණක වාර්තාවේ දිනට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙන් ලිඛිත ප්‍රතිචාරයක් ලැබීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස කටයුතු කරන බැවින්, සමාගම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙන් (IRCSL) දීර්ඝ කිරීමක් ඉල්ලා ඇත.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් (SLICGL)

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 30 වගන්තිය සමඟ සම්පූර්ණ අනුකූලතාව සහතික කිරීමට, SLICGL හි කළමනාකාරිත්වය පුළුල් පරිපාලන නම වෙනස් කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. 2025 දෙසැම්බර් 31 වන විට, කළමනාකාරිත්වය මෙම පරිපාලන යාවත් කිරීම්වලින් 90%ට වඩා සාර්ථකව අවසන් කර ඇත.

පරිපාලන නම වෙනස් කිරීමේ ක්‍රියාවලියේ අවසන් අදියර තුළ දැනට පවතින මූල්‍ය වත්කම් හා වගකීම්වල තත්ත්වය පහත වගුවෙන් සාරාංශ කෙරේ:

මූල්‍ය උපකරණ වර්ගය	බැංකුව/ආයතනය	2025 දෙසැම්බර් 31 දිනට ශේෂය රු '000	2026 පෙබරවාරි 28 දිනට අවසන් කළ ශේෂය රු '000	2026 පෙබරවාරි 28 දිනට ක්‍රියාත්මක ශේෂය රු '000	2024 දෙසැම්බර් 31 දිනට ශේෂය රු '000
ලැයිස්තුගත කොටස්	CDS ගිණුම*	**15,363,274**	–	15,363,274	10,319,746
ලැයිස්තුගත ණයකර	CDS ගිණුම*	**8,338,891**	–	8,338,891	3,282,503
ලැයිස්තුගත නොකළ ණයකර	ලංකා බැංකුව	**–**	–	–	1,001,589
	DFCC බැංකව පීඑල්සී	**–**	–	–	1,061,178
	මහජන බැංකුව	**–**	–	–	507,014
වාණිජ පත්‍රිකා	LOLC හෝල්ඩින්ග්ස් පීඑල්සී	**–**	–	–	1,717,952
කාලීන තැන්පතු	ලංකා බැංකුව	**2,886,702**	2,775,809	110,893	3,049,286
	කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී	**12,363**	12,363	–	203,043
	හැටන් නැෂනල් බැංකුව	**84,717**	84,717	–	57,908
ඒකක භාර	සිලෝන් ඇසට් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්	**4,303,923**	4,303,923	–	3,095,920
භාණ්ඩාගාර බැඳුම්කර	ලංකා බැංකුව **	**1,820,223**	–	1,820,223	3,791,483
	හැටන් නැෂනල් බැංකුව පිඑල්සී **	**1,702,436**	–	1,702,436	2,457,800
	කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී **	**3,455,893**	2,128,729	1,327,165	3,944,310
	වෙල්ත් ට්‍රස්ට් **	**159,330**	–	159,330	1,034,484
	එච්එන්බී සිකියුරීස් **	**1,010,450**	–	1,010,450	–
	පෑන් ඒෂියා බැංකුව **	**105,972**	–	105,972	–
ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම්	කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී	**–**	–	–	2,602,341

**ගනුදෙනු ගාස්තු කපා හැරීමක් සඳහා ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාවේ අවශ්‍ය අනුමැතිය ප්‍රමාද වී ඇති SLIC සිට SLICGL CDS ගිණුම් දක්වා සමාගම වර්තමානයේ ලැයිස්තුගත කොටස් සහ ණයකරවල මාරු කිරීම SLIC ආයතනික කළමනාකරණය සහ SEC අතර සාකච්ඡා කිහිපයකින් පසු 2026 මාර්තු 17 දින අනුමත කරන ලදී. ඒ අනුව, ලබාදුන් අනුමැතියට අනුකූලව මාරුකිරීම ක්‍රියාත්මක කිරීම සමාගම ඉදිරියට ගෙන යනු ලබයි.*

***සමාගම SLICGL නම යටතේ සහ අලුතින් විවෘත කරන CDS ගිණුම් සඳහා SLIC නම යටතේ සුරැකුම්පත් මාරු කිරීමේ ක්‍රියාවලිය තුළ, මහ බංකුවේ CDS ගිණුම් විවෘත කර ඇත. අලුතින් මිලදීගත් භාණ්ඩාගාර බැඳුම්කර SLICGL නම යටතේ පවතී.*

මූල්‍ය උපකරණ වර්ගය	බැංකුව/ආයතනය	වෙනත්
ජංගම ගිණුම්	කාර්ගිල්ස් බැංකුව	වැඩපිළිවෙල යෝජනා ක්‍රමය අනුව, බැංකු ගිණුම් 2024 පෙබරවාරි 01 දින සිට සමාගම (SLICGL) වෙත මාරු කරන ලදී. තවද, සැලකියයුතු බැංකු ගිණුම් ගණනාවක පරිපාලන නම් 2026 පෙබරවාරි 28 දිනට වෙනස් කර ඇති අතර කළමනාකාරිත්වය SLIC වෙතින් පවතින බැංකු ගිණුම්වල පරිපාලන නම් වෙනස් කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටී.
	චීන බැංකුව	
	DFCC බැංකව	
	නේෂන්ස් ට්‍රස්ට් බැන්ක්	
	සෙලාන් බැංකුව	
	ස්ටැන්ඩර්ට් චාර්ටඩ් බැංකුව	

48 නියාමන අවශ්‍යතා සමඟ අනුකූලතාව – අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාව විසින් නිකුත් කළ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නියමයන් 9.8.2. (අ) වගන්තිය සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කළ රක්ෂකයින් සඳහා ආයතනික පාලන රාමුව පිළිබඳ 2022 අංක 02 දරන නියෝගය සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කළ ආයතනික පාලන මනා පරිච සංග්‍රහයේ අ 5.3 මූලධර්මය අනුව, සමාගම් විසින් අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනත්වය පිළිබඳ අර්ථ දැක්වීමට අනුකූලව, අධ්‍යක්ෂ මණ්ඩලයේ අවම ස්වාධීන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව අවම වශයෙන් තුනෙන් එකක් හෝ අවම වශයෙන් දෙදෙනෙක් යන ගණනින් ඉහළ අගයට පවත්වා ගත යුතුය.

වාර්තාකරන දිනයට, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් හි (SLICLL) සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් හි (SLICGL) අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරු හය (06) දෙනෙකුගෙන් සමන්විත වූ අතර ඔවුන් සියලු දෙනාම විධායක නොවන අධ්‍යක්ෂවරු විය. ඒ අනුව, SLICLL සහ SLICGL වාර්තාකරන දිනයට ස්වාධීන අධ්‍යක්ෂවරුන්ට අදාළ ඉහත නියාමන අවශ්‍යතාවන්ට සම්පූර්ණයෙන් අනුකූල වී නොමැත.

- නියාමන සන්නිවේදනය හා සහන කාලය හා වර්තමාන තත්ත්වය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සමාගමේ මෙම අනුකූල නොවීමේ කාරණය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට (SLIC) සහ එහි පරිපාලිත සමාගම් වෙත විධිමත්ව දන්වා ඇති අතර, සමාගම්වලට සිය තත්ත්වය නිවැරදි කර ගැනීමට හා අදාළ අවශ්‍යතාවන්ට අනුකූලවීම සඳහා 2026 අප්‍රේල් 06 දක්වා සහන කාලයක් ලබා දී ඇත. SLICLL සහ SLICGL පහත සඳහන් කළමනාකරණයේ යෝජිත කාර්යය පිළිබඳව භාණ්ඩාගාර ලේකම්ගේ මඟ පෙන්වීම ලබාදෙන ඇත.

- කළමනාකරණයේ යෝජිත ක්‍රියාමාර්ගය

දැනට සිටින අධ්‍යක්ෂ මණ්ඩල ව්‍යුහයේ කාර්යක්ෂමතාව සහ සමතුලිතතාවය පවත්වා ගනිමින් අනුකූලතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා, සමාගම පහත ක්‍රියාමාර්ග යෝජනා කර ඇත. (මූදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ භාණ්ඩාගාර ලේකම් වෙත දැනුම් දී ඇති පරිදි):

1. අධ්‍යක්ෂවරු නැවත නම් කිරීම : නියමිත ස්වාධීන නිර්ණායක සපුරාලීමට යටත්ව දැනට සිටින විධායක නොවන ස්වාධීන නොවන අධ්‍යක්ෂවරු දෙදෙනෙක් (02) ස්වාධීන අධ්‍යක්ෂවරු ලෙස නැවත නම් කිරීම සහ;
2. ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් පත් කිරීම: අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනට පවතින ඇබෑර්තු පිරවීමට අලුතින් ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් (01)පත් කිරීම.

මෙම ප්‍රවේශය මගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත ප්‍රමාණය වැඩි කිරීමක් නොමැතිව ස්වාධීන අධ්‍යක්ෂවරු තිදෙනෙක් (03) ගේ අවමයක් තබා ගැනීමේ අවශ්‍යතාවයට අනුකූලතාව සහතික කිරීම අපේක්ෂා කෙරේ.

49 වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්

සමාගම

පහත විස්තර කරන දෑ හැර මූල්‍ය ප්‍රකාශවල ගැලපීම් හෝ අනාවරණය කිරීම අවශ්‍ය වන වාර්තාකරණ දිනයෙන් පසුව වැදගත් සිදුවීම් කිසිවක් නොමැත.

සමූහය

49.1 ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ්

මූල්‍ය ප්‍රකාශවල ගැලපීම් හෝ අනාවරණය කිරීම අවශ්‍ය වන වාර්තාකරණ දිනයේ සිට කිසිදු අවස්ථාවක් මතු වී නොමැත.

49.2 ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

මූල්‍ය ප්‍රකාශවල ගැලපීම් හෝ අනාවරණය කිරීම අවශ්‍ය වන වාර්තාකරණ දිනයන් පසු සිදු වූ කිසිදු වැදගත් සිදුවීම් නොමැත.

49.3 ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී

මූල්‍ය ප්‍රකාශවල ගැලපීම් හෝ අනාවරණය කිරීම අවශ්‍ය වන වාර්තාකරණ දිනයන් පසු සිදු වූ කිසිදු වැදගත් සිදුවීම් නොමැත.

49.4 ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්

වාර්තාකරණ දිනයෙන් පසුව සිදුවීම් යනු වාර්තාකරන දිනය සහ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා බලය ලබා දෙන දිනය අතර සිදුවන හිතකර සහ අහිතකර සිදුවීම් වෙති.

47 සහ 48 සටහන් වල සඳහන් කර ඇති කරුණු හැරුණු විට, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වාර්තාකරණ කාලයෙන් පසු, ශේෂ පත්‍ර දිනයට සමාගමේ මූල්‍ය තත්ත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි කිසිදු සිදුවීමක් සිදු නොවීය.

2026 මාර්තු 23 දින, අධ්‍යක්ෂ මණ්ඩලය 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා රු. මිලියන 675ක් වූ ලාභාංශයක් යෝජනා කර ඇති අතර ඉදිරි වාර්ෂික මහ සභා රැස්වීම්වලදී කොටස්හිමියන්ගේ අනුමැතියට යටත්වන අතර වාර්තාකරන දිනයට වගකීමක් ලෙස හඳුනා ගෙන නොමැත.

49.5 ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්

වාර්තාකරණ දිනයෙන් පසුව සිදුවීම් යනු වාර්තාකරන දිනය සහ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා බලය ලබා දෙන දිනය අතර සිදුවන හිතකර සහ අහිතකර සිදුවීම් වෙති.

47 සහ 48 සටහන් වල සඳහන් කර ඇති කරුණු හැරුණු විට, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වාර්තාකරණ කාලයෙන් පසු, ශේෂ පත්‍ර දිනයට සමාගමේ මූල්‍ය තත්ත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි කිසිදු සිදුවීමක් සිදු නොවීය.

49.6 කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවට්) ලිමිටඩ්

මූල්‍ය ප්‍රකාශවල ගැලපීම් හෝ අනාවරණය කිරීම අවශ්‍ය වන වාර්තාකරණ දිනයෙන් පසුව වැදගත් සිදුවීම් කිසිවක් නොමැත.

50 අඛණ්ඩතාවය

අඛණ්ඩ පැවැත්මක් ලෙස ඉදිරියට යාමට සමූහයට ඇති හැකියාව පිළිබඳව අධ්‍යක්ෂවරුන් තක්සේරුවක් කර ඇති අතර, දැකියහැකි අනාගතය සඳහා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට සම්පත් ඇති බවට ඔවුන් සෑහීමකට පත්ව ඇත. තවද, අඛණ්ඩ පැවැත්මක් ලෙස ඉදිරියට යාමට සමූහයට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු වැදගත් අවිනිශ්චිතතාවයක් පිළිබඳව අධ්‍යක්ෂවරුන් දැනුවත් නැත. එබැවින්, මූල්‍ය ප්‍රකාශන තවදුරටත් අඛණ්ඩ පැවැත්මේ පදනම මත සකස් කරගෙන යනු ලැබේ.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, කළමනාකරණය විසින් ආර්ථික තත්ත්වයන්හි පවතින බලපෑම්, ආපසු පැවරීම සහ ජීවිත හා සාමාන්‍ය ව්‍යාපාර වෙන් කිරීම හේතුවෙන් ඇති විය හැකි බලපෑම සහ සකස් කිරීමේ අඛණ්ඩ පැවැත්මේ පදනම භාවිතා කිරීම තක්සේරු කර ඇත. වර්තමාන ගෝලීය සහ දේශීය ආර්ථික තත්ත්වයන් යටතේ ව්‍යාපාර කටයුතු කරගෙන යාමට හැකිවන පරිදි සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද ලාභදායිතාවය, ආදායම් ප්‍රවාහ, කාරක ප්‍රාග්ධන කළමනාකරණය, ප්‍රාග්ධන වියදම්, මුදල් සංචිත, සංචාරක සීමා කිරීම්, ESG ප්‍රතිෂ්ඨාවන් සහ පිරිවැය කළමනාකරණ මූලපිරීම් වැනි පුළුල් පරාසයක සාධක සලකා බලමින් සමාගම සිය ව්‍යාපාරවල ඔරොත්තු දීමේ හැකියාව ඇගයීමට ලක් කර ඇත. විශ්ලේෂණය සහ පවතින තොරතුරු මත පදනම් වූ අනාගත දැක්ම මත පදනම්ව, සමාගම අඛණ්ඩව පැවැත්මත් ලෙස ඉදිරියට යාමට සමාගමේ හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු වැදගත් අවිනිශ්චිතතාවයක් පිළිබඳව අධ්‍යක්ෂවරුන් දැනුවත් නැත.

50.1 2024 පෙබරවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙන් කිරීමෙන් පසු, කළමනාකරණ සේවා රක්ෂණ පුද්ගලික සමාගමට අනුයුක්ත කරන ලද සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්ට අනුයුක්ත කරන ලද සේවකයින්, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් වෙත විධිමත් ලෙස මාරු කර ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ් වෙන් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, 2024 පෙබරවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාගම සිය මෙහෙයුම් නතර කළ අතර එමනිසා, දැකියහැකි අනාගතය සඳහා මෙහෙයුම් තවදුරටත් කරගෙන යාමට ආයතනය අදහස් නොකරන බැවින්, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩතා පැවැත්ම පදනම නොමැතිව සකස් කර ඇත.

කෙසේවෙතත්, සේවකයින් සම්බන්ධ පවතින නීතිමය කරුණු හේතුවෙන්, මෙම අවස්ථාවේදී වසා දැමීම හෝ කපාහැරීම සහිත කාර්යයන් නොමැති නෛතික ආයතනයක් ලෙස සමාගම පවත්වා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.

පවත්නා සියලුම නෛතික සිදුවීම් නිරවුල් කිරීම මත, අධ්‍යක්ෂ මණ්ඩලය තත්ත්වය නැවත තක්සේරු කරනු ලබන අතර සමාගමේ වියහැකි වසාදැමීම සම්බන්ධව සුදුසු තීරණයක් ගනු ඇත.



පොදු තොරතුරු

ආයතනික තොරතුරු

සමාගමේ නම
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්

ලියාපදිංචි කාර්යාලය
අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 2.

ඇමතුම් විස්තර
දුරකථනය : +94 11 2357457
ෆැක්ස් : +94 11 2447742
වෙබ් අඩවිය : www.srilankainsurance.com

සමාගම ලියාපදිංචි අංකය
1982 අංක 17 සමාගම පනත යටතේ 1993 පෙබරවාරි 3 දින අංක N(PBS/CGB)/159 යටතේ සමාගම සංස්ථාපනය කරන ලද අතර, 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ 2008 අප්‍රේල් 17 දින අංක PB 289 යටතේ සමාගම නැවත ලියාපදිංචි කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලය
1. පී එන් එස් කුමරතුංග මහතා (2024 ඔක්තෝබර් 18 පත්කරන ලදී)
2. ඩී තොටවත්ත මහතා (2022 අගෝස්තු 22 පත්කරන ලදී)
3. ආර් පී බුල්ජන්ස් මහතා (2025 ජනවාරි 01 පත්කරන ලදී)
4. එන් ඩී බී උනම්බුවේ මහතා ජනාධිපති නීතිඥ (2025 ජනවාරි 01 පත්කරන ලදී)
5. එස් පලිහවඩන මහතා (2025 ජූනි 30 පත්කරන ලදී)
6. බී ඒ ටී රොද්‍රිගෝ මහතා (2025 නොවැම්බර් 13 පත්කරන ලදී)
7. ඒ කොස්වත්ත මහතා (2019 දෙසැම්බර් 26 දින පත්කළ අතර 2025 ජනවාරි 02 දින සිට ඉල්ලා අස්විය)
8. කේ ආර් ධර්මේන්ද්‍ර මහතා (2025 ජනවාරි 01 දින සිට පත්කරන ලද අතර 2025 ජූනි 23 දින ඉල්ලා අස්විය)
9. කේ ආර් පත්මප්‍රිය මහතා (2022 සැප්තැම්බර් 30 දින සිට පත්කරන ලද අතර 2025 අගෝස්තු 01 දින සිට ඉල්ලා අස්විය)
10. එස් ඒ බටගොඩ මිය (2025 අගෝස්තු 13 දින සිට පත්කරන ලද අතර 2025 නොවැම්බර් 13 දින සිට ඉල්ලා අස්විය)

නෛතිකභාවය
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් 1961 අංක 2 දරණ රක්ෂණ සංස්ථා පනතේ විධිවිධාන යටතේ රජය සතු සංස්ථාවක් ලෙස ස්ථාපිත කරන ලදී. 1993 දී, 1987 අංක 23 දරණ රාජ්‍ය සමාගම් පනත යටතේ රාජ්‍ය සමාගම් හෝ රාජ්‍ය සතු ව්‍යාපාර ආයතන රාජ්‍ය සමාගම් බවට පරිවර්තනය යටතේ, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් එහි කොටස් වලින් 100% මහා භාණ්ඩාගාරයේ ලේකම් වෙත පවරමින් පූර්ණ වශයෙන් රජය සතු සීමිත වගකීම් සහිත සමාගමක් බවට පත් කරන ලදී. රජයේ පෞද්ගලීකරණ වැඩසටහන යටතේ 2003 වසරේදී සමාගම පෞද්ගලිකරණය කරන ලද අතර වසර හයක කෙටි කාලයක් පුද්ගලික කළමනාකාරිත්වයක් යටතේ පැවතුණි. 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ සංස්ථාව නැවත ලියාපදිංචි කරන ලදී. 2009 ජූනි 04 දින පෞද්ගලිකරණය අවලංගු කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය ලද තීන්දුවට අනුව, කොටස් වලින් 99.98 ක ප්‍රතිශතයක් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාරයේ ලේකම් වෙත පවරන ලදී.

බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය (TIN)
294001590

එකතුකළ අගය මත බදු ලියාපදිංචි අංකය
294001590-7000

සමාගමේ ලේකම්
(2025 ජූලි 01 දින සිට පත්කළ)
ඩී එම් එන් ආර් සාරා දිසානායක
එල්එල්බී (KDU), නීතිඥ
දිවුරුම් කොමසාරිස් හා ප්‍රසිද්ධ නොතාරිස්

පරිපාලිත සමාගම් (2025 දෙසැම්බර් 31 දිනට)
මැනේජ්මන්ට් සර්විස් රක්ෂණ (පුද්) සමාගම
ද ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පී. එල්. සී
ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ්
ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්

උප පරිපාලිත සමාගම් (2025 දෙසැම්බර් 31 දිනට)
ලංකා හොස්පිට්ල්ස් ඩයග්නොස්ටික්ස් (පුද්ගලික) සමාගම

විගණකවරුන්
විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව

බැංකුකරුවන්
ලංකා බැංකුව
මහජන බැංකුව
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී
හැටන් නැෂනල් බැංකුව
සෙලාන් බැංකුව
ජාතික ඉතිරිකිරීමේ බැංකුව
පෑන් ඒෂියා බැංකුව

වාර්ෂික මහ සභා රැස්වීමේ නිවේදනය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්

(සමාගමේ ලියාපදිංචි අංකය. PB 289)

අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02

පනස් දෙවැනි (52) වාර්ෂික මහ සභා රැස්වීමේ නිවේදනය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි පනස් දෙවැනි (52) වාර්ෂික මහ සභා රැස්වීම පහත සඳහන් අරමුණු වෙනුවෙන්, වර්ෂ 2026 වූ මැයි 25 වන සඳුදා දින ප.ව. 12.30 ට කොළඹ 02, වොක්ෂෝල් වීදිය, අංක 21 දරණ ස්ථානයේ සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ (ශ්‍රවනාගාරය - 07 වැනි මහල) දී පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ:

යෝජනා

(1) අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව සහ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ සහ එහි ඇති විගණකවරුන්ගේ වාර්තාව පිළිගැනීම සහ සලකා බැලීම.

(2) අධ්‍යක්ෂවරුන් විසින් නිර්දේශිත පරිදි, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු. 503,699,838.77 වන කොටසකට රු. 0.84ක් වන අවසන් ලාභාංශයක් ප්‍රකාශයට පත් කිරීම.

(3) සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 92 වගන්තිය සමඟ කියවියයුතු 93 වගන්තිය අනුව, වටමාරුව අනුව විශ්‍රාම යන අධ්‍යක්ෂ, පලවින්නේගේ නුසිත් සමරසී කුමාරතුංග මහතා නැවත පත්කිරීම.

"සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 92 වගන්තිය සමඟ කියවියයුතු 93 වගන්තිය අනුව, සමාගමේ පනස් දෙවැනි (52) වාර්ෂික මහ සභා රැස්වීමේදී වටමාරුව අනුව විශ්‍රාම යාමට සුදුසුකම් ලබන පලවින්නේගේ නුසිත් සමරසී කුමාරතුංග මහතා (ජා.හැ.අංක 693431514V) සමාගමේ අධ්‍යක්ෂවරයෙක් ලෙස මෙයින් නැවත පත් කර සිටින බවට **යෝජනා කර සිටී**".

(4) සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 92 වගන්තිය සමඟ කියවියයුතු 93 වගන්තිය අනුව, වටමාරුව අනුව විශ්‍රාම යන අධ්‍යක්ෂ, දුෂ්මන්ත තොටවත්ත මහතා නැවත පත් කිරීම.

"සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 92 වගන්තිය සමඟ කියවියයුතු 93 වගන්තිය අනුව, සමාගමේ පනස් දෙවැනි (52) වාර්ෂික මහ සභා රැස්වීමේදී වටමාරුව අනුව විශ්‍රාම යාමට සුදුසුකම් ලබන දුෂ්මන්ත තොටවත්ත මහතා (ජා.හැ. අංක 583530428V) සමාගමේ අධ්‍යක්ෂවරයෙක් ලෙස මෙයින් නැවත පත් කර සිටින බවට **යෝජනා කර සිටී**".

(5) සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 98 වගන්තිය අනුව, වටමාරුව අනුව විශ්‍රාම යන අධ්‍යක්ෂ බස්තියන් කොරාලලාගේ ඇන්ටනී තුෂාර රොද්‍රිගෝ මහතා නැවත පත්කිරීම.

"සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 98 වගන්තිය අනුව, සමාගමේ පනස් දෙවැනි (52) වාර්ෂික මහ සභා රැස්වීමේදී නැවත පත් කිරීම සඳහා සුදුසුකම් ලබන බස්තියන් කොරාලලාගේ ඇන්ටනී තුෂාර රොද්‍රිගෝ මහතා (ජා.හැ.අංක 723541026V) සමාගමේ අධ්‍යක්ෂවරයෙක් ලෙස මෙයින් නැවත පත් කර සිටින බවට **යෝජනා කර සිටී**".

(6) ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයට සෝමදාස පලිහවඩන මහතා (වයස අවුරුදු හැත්තෑවට (70) ට වැඩි) නැවත පත් කිරීම.

2007 අක 07 දරන සමාගම පනතේ 212 වගන්තිය යටතේ සෝමදාස පලිහවඩන මහතාගෙන් ඔහුට වයස අවුරුදු 72 ක් වන බවටත් 2026 ජූනි 07 දින 73ට ලඟා වෙන බවටත් සමාගමට විධිමත් දැනුම්දීමක් ලැබී ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 අක 7 දරන සමාගම පනතේ 211 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයට සෝමදාස පලිහවඩන මහතා පත් කිරීමට යෝජනා කර සිටී.

එමනිසා, යම් වෙනස්කිරීමක් ඇතිව හෝ නොමැතිව "විශේෂ යෝජනාවක්" ලෙස කොටස්හිමියන් තුළින් පහත සඳහන් යෝජනාව සම්මත කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ කර සිටී:

"2007 අක 7 දරන සමාගම පනතේ 210 වගන්තියෙහි දක්වා ඇති වයස් සීමාව 2026 ජූනි 07 දින 73ට ලඟා වෙන සෝමදාස පලිහවඩන මහතාට (ජා.හැ.අංක 195315901011V) අදාළ නොවන බවට සහ ඉදිරි වාර්ෂික මහ සභා රැස්වීම අවසානය දක්වා තනතුර දැරීමට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් ලෙස සෝමදාස පලිහවඩන මහතා මෙයින් පත් කර සිටින බවට හා සුදුසුනම්, කොටස්හිමියන්ගේ අනුමැතියට යටත්ව ඔහු නැවත පත් කිරීමට මෙයින් **යෝජනා කර සිටී**".


(7) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව බාහිර විගණක ලෙස විගණකාධිපතිවරයා නැවත පත් කිරීම.

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විගණකාධිපති සමාගමේ පනස් දෙවැනි (52) වාර්ෂික මහ සභා රැස්වීම අවසානයේ සිට ඉදිරි වාර්ෂික මහ සභා රැස්වීම අවසානය දක්වා තනතුර දැරීමට බාහිර විගණක ලෙස මෙයින් නැවත පත් කර සිටින බවට හා අදාළ ක්‍රියාවලි සහ ක්‍රියාපටිපාටි පරිදි ඔවුන්ගේ පාරිශ්‍රමිකය තීරණය කිරීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මෙයින් බලය ලබා දෙන බවට **යෝජනා කර සිටී**".

(8) 2025 වසර සඳහා සහ ඉදිරි වාර්ෂික මහ සභා රැස්වීමේ දිනය දක්වා පරිත්‍යාග තීරණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මෙයින් බලය ලබාදීම.

(9) විධිමත් දැනුම් දීමක් ලබා දී ඇති වෙනත් කරුණු.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



සමාගම් ලේකම්

2026 අප්‍රේල් 02

සටහන්

පෙරකලාසි පත්‍රය

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන්

(සමාගමේ ලියාපදිංචි අංකය. PB 289)

අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02

පෙරකලාසි ආකෘතිය

..... වන මම/අපි* ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි සාමාජිකයෙක්/සාමාජිකයින්* වශයෙන් .....
හෝ ඔහුට/ඇයට* නොහැකිනම්

කොළඹ පි එන් එස් කුමාරතුංග මහතා - හෝ ඔහුට නොහැකිනම්

කොළඹ ඩී තොටවත්ත මහතා - හෝ ඔහුට නොහැකිනම්

කොළඹ එන් ඩී බී උනම්බුවේ මහතා - හෝ ඔහුට නොහැකිනම්

කොළඹ ආර් පී බුල්ජන්ස් මහතා - හෝ ඔහුට නොහැකිනම්

කොළඹ එස් පලිහවඩන මහතා - හෝ ඔහුට නොහැකිනම්

කොළඹ බී ඒ ටී රොද්‍රිගෝ මහතා - හෝ ඔහුට නොහැකිනම්

2026 මැයි 25 වන සඳුදා දින සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ (ශ්‍රවනාගාරය - 07 වැනි මහල) ප.ව. 12.30 ට පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් සමාගමේ පනස් දෙවැනි (52) වාර්ෂික මහ සභා රැස්වීමේදී මාගේ/අපගේ පෙරකලාසිකරු ලෙස මා/අප නියෝජනය කිරීමට මා/අප වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට සහ එය කල්තැබීමේදී සහ ඉහත රැස්වීමේ ප්‍රතිඵලයක් ලෙස ගතහැකි සෑම ඡන්ද විමසීමකදීම භාවිතා කළ හැකිය.

යෝජනා	පක්ෂව	විපක්ෂව
1. අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව සහ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ සහ එහි ඇති විගණකවරුන්ගේ වාර්තාව පිළිගැනීම සහ සම්මත කිරීම.	☐	☐
2. අධ්‍යක්ෂවරුන් විසින් නිර්දේශිත පරිදි, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු. 503,699,838.77 වන කොටසකට රු. 0.84ක් වන අවසන් ලාභාංශයක් ප්‍රකාශයට පත් කිරීම	☐	☐
3. සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 92 සහ 93 වගන්තිය අනුව, වටමාරුව අනුව විශ්‍රාම යන අධ්‍යක්ෂ, පලවින්නේගේ නුසිත් සමරසී කුමාරතුංග මහතා නැවත පත් කිරීම.	☐	☐
4. සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 92 සහ 93 වගන්තිය අනුව, වටමාරුව අනුව විශ්‍රාම යන අධ්‍යක්ෂ, දුෂ්මන්ත තොටවත්ත මහතා නැවත පත් කිරීම	☐	☐
5. සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 98 වගන්තිය අනුව, වටමාරුව අනුව විශ්‍රාම යන අධ්‍යක්ෂ බස්තියන් කොරාලලාගේ ඇන්ටනි තුෂාර රොද්‍රිගෝ මහතා නැවත පත් කිරීම.	☐	☐
6. 2007 අක 7 දරන සමාගම පනතේ 211 වගන්තිය යටතේ විශ්‍රාම යන අධ්‍යක්ෂ, සෝමදාස පලිහවඩන මහතා නැවත පත් කිරීම.	☐	☐
7. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව බාහිර විගණක ලෙස විගණකාධිපතිවරයා නැවත පත් කිරීම.	☐	☐
8. 2025 වසර සඳහා සහ ඉදිරි වාර්ෂික මහ සභා රැස්වීමේ දිනය දක්වා පරිත්‍යාග තීරණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බලය ලබාදීම.	☐	☐

2026 ..... මස ..... දින ..... හිදී අත්සන් කරනු ලැබීය.

.....

කොටස්හිමියාගේ/කොටස්හිමියන්ගේ අත්සන

** කරුණාකර අදාළ නොවන වචන කපාහරින්න*

සටහන:

(1) රැස්වීමට පැමිණ ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ඇති සාමාජිකයෙකුට ඔහු/ඇය වෙනුවට සහභාගී වීමට හා ඡන්දය ප්‍රකාශ කිරීමට පෙරකලාසිකරුවෙක් පත් කිරීමට අයිතිය ඇත.

(2) පෙරකලාසිකරුවෙක් සමාගමේ සාමාජිකයෙක්වීම අවශ්‍ය නැත.

(3) සම්පූර්ණ කළ පෙරකලාසි ආකෘතිය වාර්ෂික මහා සභා රැස්වීමට නියමිත වේලාවට පැය 48 කට නොඅඩු කාලයකදී කොළඹ 02, වොක්ෂෝල් වීදියේ අංක 21 දරණ ස්ථානයේ 07 වන මහලේ පිහිටි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්හි සමාගම් ලේකම් කාර්යාලයේ සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ තැන්පත් කළ යුතුය.

4TH
FULL
PROOF

GSARN©
www.gsarn.org
Global Standard Annual Report Number©
LKA8532SLICX0250000S112

SMART MEDIA
The ANNUAL REPORT Company

Produced by Smart Media,
a GHG-neutral company
since 2011

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්
පියෙකු මෙන් මවක මෙන්

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්
අංක 21, වොක්ෂෝල් වීදිය,
කොළඹ 2.

www.srilankainsurance.com